# SAHASSAVATTHU PAKARANA

BY

VEN. RATTHAPALA OF GUTTAVANKA PIRIVENA
IN ANURADHAPURA.

*Edited by*

AGGAMAHAPANDITA
**BUDDHADATTA MAHANAYAKATHERA**
OF AMBALANGODA.
ASSISTED BY
**Mr. K. D. SOMADASA,** B. A., M. S.
*(Assistant Librarian of the University of Ceylon)*

PUBLISHED BY
**MESSRS ANANDA BOOK COMPANY**
AMBALANGODA

PRINTED AT
**ANULA PRESS**
MARADANA

# හැඳින්වීම හා පෙරවදන

ස-හස්සවත්ථුව වනාහි දුර්ලභ පොතකි. සිංහල අකුරෙන් ලියූ ඒ පොතේ පිටපතක් මා විසින් තවම නොදක්නා ලදී. මෙහි තිබෙන **සහස්ස** යන වචනයේ තේරුම "දහස" නොවේ; ස-හස්ස (=හර්ෂ සහිත) යන්නයි. හස්ස-ශබ්දය පාලියෙහි තිබේ; "හස්සඛිඩ්ඩාරති සමාපන්නා" ආදි තැන්හි එය පෙනේ. හර්ෂය නම් සතුටයි, ප්‍රීතියයි. සතුට උපදවන කථා "සහස්සවත්ථු" නම් වෙති. සහ හස්සෙන යො වත්තතෙ, සො සහස්සො (=යමක් හර්ෂය හා එක්ව පවත්නේ නම් එය **සහස්ස** නම් වේ;) බහුව්‍රීහිසමාසපදයකි. මහාචාර්ය මලලසේකර පඬිතුමා ආදීහු ද මේ අදහසට එකඟ වෙති.

මේ පොතේ ඇත්තේ කථා අනූපහකි. මෙහි බොහෝ ව්‍යාකරණ දෝෂ ඇත්තාහ. ලාංකිකයන්ට පාලියෙන් ලිවීම හුරු නොවූ කාලයක මෙය ලියනලදී. අප අතර ප්‍රකට වූ **රසවාහිනී** නමැති පාලිපොත සම්පාදිත වූයේ මේ ස-හස්සවත්ථුව සකස් කිරීමෙනි. ඒබව රසවාහිනී ආරම්භයේදී එහි කර්තෘ වූ **වේදේහ** ස්වාමිපාදයන් විසින්:

1. තත්ථ තත්ථුප්පන්නානි වත්ථූනි අරහා පුරෙ
   අභාසුං, දීපභාසාය තං ඨපෙසුං පුරාතනා.

2. මහාවිහාරෙ තං ගුත්තවංසපරිවෙණවාසිකො
   රට්ඨපාලොති නාමෙන සීලාචාරගුණාකරො
   හිතාය පරිවත්තෙසි පජ්ජං පාළිභාසතො.

3. පුනරුත්තාදිදොසෙහි තමාසි සබ්බමාකුලං;
   අනාකුලං කරිස්සාමි, තං සුණාථ සමාහිතා.

"ඒ ඒ තැන්වල සිදුවූ කථාප්‍රවෘත්ති පෙර සිටි රහතන් වහන්සේ ප්‍රකාශ කළහ. පුරාතනයෝ ඒ කථා හෙළදිව් බසින් තැබූහ. මහාවිහාරයෙහි **ගුත්තවංසපිරිවෙන්වැසි** වූ,

ශීලාචාරාදි ගුණයන්ට ආකරවූ, **රඨපාල** නම් තෙරනම මහාජනයාට හිත පිණිස එය පාලිභාෂාවට නැගීය. නමුත් එය පුනරුක්තාදි දෝෂවලින් ආකුලය; මම එය නිරාකුල කරමි. සමාහිතව එය අසව්" යන වචනවලින් දක්වන ලදී. එය නිරාකුල කරන වේදේහසවාමිපාදයෝ දඹදිව කථාවස්තු හා ලක්දිව කථාවස්තු වෙන් කළහ. ව්‍යාකරණදෝෂ දුරුකොට තවත් විස්තර යෙදූහ. බොහෝ තැන්වල ගාථාබන්ධයෙන් දහම්කොටස් ආදිය දැක්වූහ. ලක්දිව විසූ තෙරවරු රසවාහිනියෙන් තෘප්තියට පැමිණි නිසා ස-හස්සවත්ථුව නොසලකා හැරියාහ. ස-හස්සවත්ථුව ටත් වඩා පුරාණ වූ **සීහලවත්ථුවට** සිදුවූයේත් මේ විකමය. නමුත් මහපැරකුම්බා-සවෙනි පැරකුම්බා කාලවලදී මෙහෙන් බුරුම-සියම්රටවලට ලියාගෙන ගිය පොත් එවැනි අව මානයකට පත් නොවී සුරක්ෂිත වූහ. දැන් අපට මේ පරණ පොත් ලබාගත හැක්කේ ඒ රටවලිනි.

"රසවාහිනිය ලියූ වේදේහ සවාමිපාදයෝ මූලටීකාව ලියූ **වනරතන ආනන්ද** මහාසථවිරතුමාගේ ශිෂ්‍යයෙකි. ඒ මූලටීකාවට අනුටීකාවක් ලිව්වෝ බදරතිර්ථවාසි ධම්පාලාචාර්යයෝය. විශුද්ධිමාර්ගටීකාව ද ලියූ ඒ ධම්පාලාචාර්යතුමා ක්‍රි. ව. 976 පමණේදී විසූ බව මාවිසින් "පාලිසාහිත්‍යය" නම් පොතෙහි දක්වනලදී. එවිට "සහස්සවත්ථුව" **ඒ කාලයට** පෙර හෙවත් දහවෙනි ශතවර්ෂයට පෙර සම්පාදනය විය යුතුය. මේ පොතේ නාමය මහාවංශටීකාවේ සතර තැනක සඳහන්වී තිබෙන බැවින් මෙය මහාවංශටීකාවටත් පුරාණය. කර්තෘනාමය පොතේ සඳහන්වී නැතත් රසවාහිනියෙහි කීසේ මහාවිහාරයේ ගුත්තවංකපිරිවෙන්හි විසූ **රඨපාල**තෙරනම යයි පිළිගත යුතුය.

**මහාවංශටීකාවේ** සුරනිම්මලගේ විස්තර දක්වන තැන්හි ඔහු පෙර ජාතියේ කළ කුශලකර්මයේ විස්තර සහස්සවත්ථුවෙන් උපුටා දක්වන ලදී. නමුත් ස-හස්ස

වත්ථුවේ තිබෙන වාක්‍ය එසේම උපුටා නොගෙන තමාගේ වචනවලින් කාරණය දක්වා තිබේ. එහි "සහස්සවත්ථු අට්ඨකථා" යන නමින් මේ පොත අඳුන්වා තිබේ.

ගොඨසිම්බරගේ කථාවෙහි ද මේ නම කියවේ. ඒ ටීකාවේ සාලිකුමරුගේ කථාව විස්තර කරන තැන සහස්සවත්ථුවෙන් උපුටා කී කරුණු රාශියක් තිබේ. දැන් තිබෙන ස-හස්සවත්ථු පිටපත්හි සාලිකුමාරවත්ථුවේ විස්තර මහාවංසට්ඨකථාවෙන් බලාගත යුතු යයි කියවේ. මෙය පුදුම සිද්ධියකි. මුලදී ස-හස්සවත්ථුවේ තිබුණු ඒ කථාව පසු කලකදී එයින් ඉවත් කරනලද බව මෙයින් ඔප්පු වේ. මහාවංශටීකාවේ තිබෙන සේ ඒ කථාව සංක්ෂේපයෙන් මෙහි දැක්වීම යුතුයයි පෙනේ:—

මේ භවයෙන් ඉහත ජාතියෙහි මේ දෙදෙන අඹුසැමියෝ වූහ. සාලි කුමාරතෙමේ ලක්දිව "මාලිය උන්න" නම් විහාරය අසළවූ "මූණ්ඩගංගා" නමැති මහගමේ තිස්ස නම් ලෝකුරුවෙක් විය. ඔහුගේ කිරිය **නාගා** නැමැත්තීය. ඒ දෙදෙන ශ්‍රද්ධාවන්තයෝ වූහ. එක් දිනක් වැද්දෙකු විසින් ඔහුට ගෙවිය යුතු කුලිය වශයෙන් උඟරකු මරා ගෙනැවිත් දෙන ලදී. හෙතෙම මෙය සංඝයාට පරිභෝග කරවිය යුතු යයි සිතා තෙල්මස්, රසමස්, සූපමස්, බැදිමස්, ආදි වශයෙන් පිසවා තබා "මේ ලෝකයෙහි සෘද්ධිමත් රහතන් වහන්සේ සිටිත් නම් එයින් අටනමක් හෙට මාගේ ගෙට වඩිත්වා"යි කියා ආරාධනාවක් කොළේය. පසුද උදය පූවගුදිවයින්හි විසූ වාලඞ්ගතිස්සපබ්බතවිහාරවාසී[1] **ධම්මදින්න** තෙරතම තමන්ගේ උපාධ්‍යායවූ ගොඨියමහාතිස්ස තෙරුන්ට[2] මේ කාරණය දන්වා ඒ තෙරුන් ද මූදුවිහාර

1 රසවාහිනී. "රොහණ ජනපදෙ තලඞ්ගරවාසී" යයි පෙනේ. සද්. "රුහුණු ජනපදයෙහි තලගුරු වෙහෙර වසන".

2. රස. ගොධත්ථෙරස්ස සද්. "ගොධම්ම තෙරුන්වහන්සේ"

† රසවාහිනී-සද්ධර්මාලංකාරදෙක්හි "මූණ්ඩවාසා" යයි පෙනේ. එය මහවැලිගඟ සමීපයෙහි යයිද එහි කියවේ.

යෙහි නිවැසි මහානාගතෙර ද කාළවල්ලිමණ්ඩපයෙහි[3] මහානාගතෙර ද චොරකණ්ඩකවිහාරවාසී[4] මහාසංඝරක්ඛිත තෙරුන් ද පොළොව කම්පා කළ ධම්මගුත්ත තෙරුන්ද භාතියවංක නම් තැන විසූ මහානාග තෙරුන් ද ගොඨපබ්බතවාසී මලියමහාදේව තෙරුන් ද රැගෙන අහසින් අවුත් උපාසකයා වසන ගම්දොර අසළට බැස්සේය. උපාසකයා මහත් ප්‍රීතියෙන් ඒ තෙරුන් වැඩමවා ගෙන ගොස් ඒ ඌරුමස් සහිත දානය පිළිගැන්වීය. ඒ දානානිසංසයෙන් හෙතෙම ඉන් පසු භවයෙහි දුටුගැමුණු රජුගේ පුත්‍රයාව උපන්නේය.

ඔහුගේ බිරිය ඉන් පෙර ජාතියකදී සියමවට කළ අපහාසයක් නිසා අනුරාධපුරයේ බටහිර දොර සමීපයෙහි පිහිටි සාලි නමැති වඩුගමේ ප්‍රධාන වඩුතැනගේ දුවක්ව උපණී. පෙර ජාතියකදී මවට කළ අපහාසය නම්:- දූන් සත්දෙනෙකුන් ඇති මවකගේ බාල දූව ඉපද සිටි ඕ එක් දිනක් මව සමග විහාරයට ගොස් මල් පුදා මව විහාරයේ සිටියදීම ගෙදර දුව ගොස් සොහොයුරියන් හා එක්ව කෑද බීය. එතැන ඉඳුල් තිබියදී නැගිට ගිය බැවින් මව ඇවිත් "මේ ඉඳුල් දමා ගිය සැඬොලිය කවරියක්දෑ" යි ඇසී. එයින් කිපුණු දූරිය උඹ සැඬොලියක්" යයි මවට ආක්‍රොශ කළාය. ඒ කාරණය නිසා ඈ පහත් කුලයක උපණී.

දුටුගැමුණුරජුගේ පුත්‍රයා උපන් දිනෙහි මුළු ලක්දිව තිබුණු බත්සැළි ඇල්බත්බවට පෙරළුණාහ; වී කොටු ඇල් වීවලින් පිරුණාහ. ඉන් පසු සිදුකළ බත්කැවිලි-නම් තැබීම් ආදී මංගලඅවස්ථා හතකදී‡ ද මෙසේම සිදුවීයයි

3. රස. කාලවෙලම්බකවාසී. සඛ "කාලවෙලම්මක විහාරයෙහි."

4. රස. උපරිඛණ්ඩ විහාරවාසී. සඛ. "උඩුකඩ විහාරයෙහි වසන.

‡ රසවාහිනියෙහි හා සද්ධර්මාලංකාරයෙහි මේ මංගල සත මෙසේ දැක්වේ: "උදක් ඔවුන් උපන් දවස මිතු නොවෙයි. ඒ කුමාරයන්ට තුන් මසින්, සත් මසින්, නව මසින්, කළමනා ඒ ඒ මඟුල් දිනයෙහිද බත් කැවීම්, කන් විදීම්, යුවරජතැන් ලැබීම ආදිවූ ඒ ඒ මඟුල් දිනයෙහිද."

සහස්සවත්ථුඅට්ඨුවාවෙහි කියනලදී. එබැවින් පියරජ ඔහුට "සාලිකුමාර" යයි නම් තැබීය. (මින් පසු කුමරු වැඩිවිය පැමිණි කල පඬුරු ලැබුණ සැටි මහාවංශටීකාවෙහි විස්තර කරන ලදී.)

අසෝකමාලාව සාලිකුමරුට මගුල් උයනේදී අසෝක ගසක් අසලදී හමුවීය යන්න සීහලවත්ථුවෙහි හෝ මහාවංශටීකාවේ කියවෙනසේ සහස්සවත්ථුවෙහි හෝ නැත. සීහලවත්ථුවේ කියවෙන්නේ ඇය නුවරදෙරටුව අසලදී හමුවූ බවයි. ඇගේ පියා චඬුවෙකැයි මහාවංශටීකාවේ කියවේ. රසවාහිනියෙහි "හෙල්ලෝලිගම" අධිපතියාවූ ලෝකුරු–වෙකැයි කියවේ. කම්බුරුකුලය ද සැඩොල් කුලයක්සේ සැලකූ බව මෙයින් පෙනේ. රසවාහිනියෙහි තිබෙන:

"සාමි, හෙල්ලෝලිගාමස්මිං ඉස්සරස්ස සුතා අහං
කම්මාරධීතා චණ්ඩාලී ඉති මඤ්ඤන්ති මං ජනා"

යන ගාථාවෙහි "ලෝකුරු දූවක්වූ සැඩොලියක් යයි මා හැඳින ගනිත්" යයි කියවේ. මහාවංශටීකාවේ 438 වෙනි පිටේ තිබෙන "පණ්ඩුකාභයරඤ්ඤා නිවාසාපිතෙ චණ්ඩාලගාමෙ අසොකනාමිකාය චණ්ඩාලධීතුයා සත්තවවසෙන ලගෙහා පටිබද්ධචිත්තො අහොසි" යන වාක්‍යයෙන් "පණ්ඩුකාභය රජුවිසින් පිහිටුවනලද සැඩොල්ගමෙහි **අසොකා** නමින් යුත් සැඩොල් දූරිය හා පෙර එක්ව විසීම් වශයෙන් පිළිබඳසිත් ඇත්තේ වීයයි කියවෙන බැවින් ඒ දූරියගේ නම **අසොකා** වීයයි පැහැදිලි වේ.

තවද රජකුමරුන් යන මගුල් උයනකට සැඩොලියන්ට යන්ට අවසර තිබුණේද යන්නත් විමසිය යුත්තකි. කුලීනයන් සතු ඉඩමකට ඇතුල්වෙන්ට වත් ඔහුන්ට අවකාශ නුදුන් බව නොයෙක් කරුණුවලින් පෙනේ. එබැවින් රසවාහිනියෙහි කථාව රසවත් කිරීම සඳහා ඒ වර්ණනාව ලියන ලදැයි සිතමි. ඇ සිනාසෙන විට අසෝකමල් කෙසුරු වැනි රශ්මියක් විහිදුණු බැවින් ඇය කුඩාකල සිටම

"අසෝකමාලා" නමින් ප්‍රකට වියයි සිහලවත්ථුවෙහි කියන ලදී. මහාවංශටීකාවෙහි සාලි නමැති වඩුනමේ යයි කිය වෙතත් රසවාහිනියෙහි "හෙල්ලොලිගම" යයි කියවේ.

ස-හස්සවත්ථුව ගැන මට මුලින් දැනගන්ට ලැබුණේ 1908 දී රැන්ගුන්නුවර නැවතී සිටි කාලයේදීය. ඒ කාල-යේදී එය කියවා බලන්ට හෝ පිටපත් කරන්ට මට අව-කාශයක් නොලැබුණි. මින් අවුරුදු විසිපහකට පමණ උඩ දී මහාචාර්ය මලලසේකර මහතා මේ පොත සකස් කිරීමට උත්සාහයක් ගත්තේය. කොළඹ කෞතුකාගාර පුස්ත-කාලයෙහි මේ පිටපත් දෙකක් ඇතැයි අසන්ට ලැබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙන පොත් දෙකක ඡායාරූප පිටපත් ද රැන්ගුමේ බර්නාඩ් නිදහස් පුස්තකාලයෙන් අත් පිටපතක් ද ලබාගෙන ඒ සංශොධනය කිරීම දැන් ප්‍රංශයේ නැවතී සිටින රාහුල සථවිරතුමාට බාර දුන්නේ යයි ද අසන්ට ලැබුණි. රාහුල සථවිරයන් පිටරට යාම ආදි කරුණු නිසා ඒ සංශොධනය සිදු නොවී ය.

මේ අතරතුරේ දී දැන් රැන්ගුන් විශ්වවිද්‍යාලයේ පාලි කථිකාචාර්යවරයෙක් වූ ද 1940 හේ සිට මාගේ මිත්‍රයෙක් වූ ද, පරලෝසැපත් මහාචාර්ය බී. ඇම්. බරුවා මහතාගේ ශිෂ්‍යයෙක් වූ ද, දේවප්‍රසාද් ගුහා මහතා මෙයින් අවුරුදු දසයකට වැඩි කලක සිට මෙය සකස් කරන්ට උත්සාහ කෙළේය. පිටපත් සොයානැනීමේ අපහසුව ඒ කෘත්‍යයෙහි බලපාන්ට විය. මාගෙන් ඉල්ලා සිටි උපකාර වශයෙන් රසවාහිනියේ පිටපතක් ඒ මහතාට යැව්වෙමි. නමුත් තවම වැඩේ නිමවාගත නොහැකි විය. ගුහා මහතා වනාහි පරණ පාලිපොත් සම්බන්ධයෙන් ඉතා උනන්දුවෙන් වැඩ කරන්නෙකි. රැන්ගුමේ දී නොයෙක් විට මා හමුවී සාකච්ඡා පැවැත් විය. පිටරටක මේ තාක් පළ නොවූ පාලි සූත්‍ර-සංග්‍රහ ග්‍රන්ථය ඒ මහතා විසින් සකස්කොට රෝමන් අකු-රෙන් ලියා දෙනලදින් දැන් ඉන්දියාවේ මුද්‍රිතව පවතී.

මින් අවුරුදු දෙකකට පමණ උඩ දී දූන් ලංකාවිශ්ව-විද්‍යාලයට අයත් පුස්තකාලයේ උපාධිකාරීව සිටින බී. ඒ., ඇම්. ඇස්. උපාධිධාරී කේ. ඩී. සෝමදාස මහතා ස-හස්ස වත්ථුව පළකරන අදහසින් ඒ පුස්තකාලයේ තිබුණ පිටපත් බලා සිංහල අකුරෙන් ලියා තවත් දුර සකස් කිරීම සඳහා මා වෙත එවීය. තවත් පුස්කොළ පිටපත් හා සසඳා බලන ලෙස ඉල්ලමින් ඒ පිටපත් තිබෙන තැන් ද දන්වා එවීය. ඒ දන්වා එවූ තැනක් වූ වැලිතර මහාකප්පිනමූදලින්ද්‍රා-රාමයෙන් ලබාගත් පිටපත හා සසඳා බලා ඒ සකස්කළ පිටපත ඒ මහතාට යවන්ට සැරසෙන විට තමාට යුරෝපයේ මාස කීපයක් ගත කරන්ට සිදුවෙන බැවින් පොතේ මුද්‍රණය පමාවිය හැකියයි කියමින් ඒ පිටපත තමාට නොඑවා මා විසින් ම පළ කරවිය හැකි පිළිවෙළක් යෙදීම මැනවැයි දන්වා එවීය. ඉන් පසු මම මෙය මුද්‍රණයට සුදුසුවෙනසේ සකස් කෙළෙමි.

## මෙහි ව්‍යාකරණානුකූල නොවූ යෙදුම්.

මෙහි තිබෙන අව්‍යක්ත යෙදුම්වල තත්වය දැනගැනීම සඳහා නිදර්ශන කීපයක් මෙසේයි: (1) සවෙති කථාවෙහි "රඤ්ඤො අග්ගමහෙසියා ඩසිත්වා" යි පෙනේ. සිංහලෙහි "අගමෙහෙසියට දෂට කොට, "මිනිසාට දෂ්ට කොට" යනාදිය යෙදෙන නමුත් පාලියෙහි එය කර්මවිභක්තියෙන් යෙදිය යුතු ය. සම්ප්‍රදානය ඒ සඳහා යෙදීම යුතු නො වේ. (2) එහිම "උදකෙන පහරිත්වා දෙවියා තිකිච්ඡං අකාසි" (= දියෙන් ගසා දේවියට පිළියම් කෙළේ ය) යි පෙනේ. මෙහි කියයුත්තේ "පැන් ඉස" යන්නයි. එයට යෙදිය යුතු පාලි වචනය **සිඤ්චිත්වා** යන්නයි. (3) **සරණගොප්පරවත්ථුවෙහි** "මාතාපිතූනං දින්නං ඉණං ගණ්හාම. තුය්හං ච මය්හං ච පස්සිත්වා ඉණායිකා ඉණං දස්සන්ති" යන්න තිබෙන සැටියට සිංහලට නැගුවොත් "මවුපියන්ට දුන් ණය ගන්නෙමු. තටත් මටත් දැක ණයකාරයෝ ණය දෙන්නාහ" යි කියයුතුය. මෙහි අදහස් කරනලද්දේ තමන්ගේ මවුපියන් අනුන්ට

දුන් ණය අයකර ගැනිමයි. ඔබත් මාත් දුටුවිට ණය ගැත්තෝ ණය දෙන්නාහ යි ඒ පුරුෂයා කීය. (4) **දානදින්න දුග්ගත වත්ථුවෙහි** "අත්තනො මාතුගාමස්ස සද්දං කත්වා තං පක්කොසාපෙත්වා" (= තමාගේ බිරියට අඩ ගා ඇය කැඳවවා) යි පෙනේ. මෙය ව්‍යක්ත ලෙස යොදතොත් "අත්තනො මාතුගාමං පක්කොසිත්වා" විය යුතු. "අඩ ගා" යන සිංහල රීතිය බලාගෙන "සද්දං කත්වා" යි යොදා තිබේ. (5) **බුද්ධවම්ම වාණිජවත්ථුවෙහි** "චාටිස්ස පිධානං විවරිත්වා" යි පෙනේ. චාටි ශබ්දය ස්ත්‍රීලිංගික බැවින් මෙය "චාටියා" වියයුතුයි. (6) **දුග්ගතතිස්සාවත්ථුවෙහි** "මම ධෙනුයා අධොතං බහු-දිවසං" යි පෙනේ. මෙහි **අධොත** යන්න "නොසෝදන ලද" යි ගැනීම නො ගැළපේ. අදහස් කරනලද්දේ "කීප දිනක් කිරි නොදෙවින ලද්දේය" යන්නයි මෙහි යෙදිය යුතු හරි වචනය **අදුද්ධං** යන්නයි. කිරි දෙවීමට පාළියෙන් "දුහනං" යි කියයුතුයි. (7) **අජියගාලතිස්ස වත්ථුවෙහි** "අජ්ජ පට්ඨාය පච්චෙකං හුත්වා අඤ්ඤස්මිං ගෙහෙ වසථ" (= අද පටන් තෙපි වෙන්වී අන් ගෙයක වසව්.) මෙහි වෙන්වී යන්නට යෙදිය යුත්තේ "විසුං හුත්වා" යන්නයි. පච්චෙක ශබ්දයේ තේරුම "වෙන් වෙන් වශයෙන්, වෙන වෙනම" යන්නයි. (8) **ධම්මා වත්ථුවෙහි** "තෙ භික්ඛූ සායං හුත්වා වනසණ්ඩං පත්වා ..... ... තත්ථ වාසං උපගමිංසු" යන තැන සායං හුත්වා" යන්න නො ගැළපේ. හවස්වූ බැවින් ඒ භික්ෂූහු එතැන විසීමට එළඹියහ. හවස් වී යන සිංහල වචන පාළියට නො ගැළපෙන සේ පෙරළා තිබේ. (9) **වෙළුසුමන වත්ථුවෙහි** "කුම්බල ගාමං" යන්න කුඹල්ගම සඳහා යෙදූවා සේ පෙනේ. රස වාහිනියෙහි "කුම්භකාරගාමං" යි දක් වේ.

තත්වය තේරුම් ගැනීමට මෙහි දක්වූ නිදර්ශන ප්‍රමාණවත් යයි සිතමි. එ වැනි අන්‍ය තැන් පොත කියවන්නාට තේරුම් ගතහැක. කර්මවිභක්තිය යෙදියයුතු බොහෝ තැන්වල සම්ප්‍රදානය යොදා තිබෙන බව පෙනේ. ගංගාශබ්දය පාළියෙහි ස්ත්‍රීලිංගික වුවත් සුරනිම්මලකථාව ආදී තැන්හි **මහාගංගෙ, පාරගංගෙයි** පුල්ලිංගයෙන් යොදා තිබෙනු පෙනේ.

## අන් පොත්වල කියවෙන දේට වෙනස් තැන්.

1. මහාවංශයේත් රසවාහිනී ආදියෙහිත් නන්දිමිත්‍ර (= නඬිමිත්ත) යෝධයා විජිතපුරයට ඇතුල්ව ගැලක මැදිරියක් ඔසවා ගෙන දෙමළුන් මැරී යයි කිය වේ. මෙහි සතර රියන් දිගැති කඩුවක් ගෙන යුධ කෙළේය යි කියවේ. එ බැවින් මෙය මහාවංශය ලියන්ට පෙර සම්පාදිතවූවක් විය යුතුයි.

2. දුටුගැමුණු රජු යුධයට යන්ට පිටත්වී තමන් සමග යාමට භික්ෂූන් ඉල්ලීම සඳහා තිස්සමහාවිහාරයට ගියේයයි රසවාහිනී ආදියෙහි කියවෙන නමුත් මෙහි කියවෙන්නේ සිතුල්පව්විහාරයට ගිය බවයි.

3. යුධ කරන අතර විජිතපුරය ගැනුමට සැරසෙන රජ යෝධයන් පරීක්ෂාකිරීම සඳහා රා තැළි සොළසක් ගෙන්වා, එක්වර එය පිය හැකි කාවදැයි විමසිය. බොහෝ යෝධයන් එය බීම ප්‍රතික්ෂෙප කළ නමුත් එසේ කිරීමට හේතු වූ කරුණු රසවාහිනී ආදියෙහි දක්වා නැත. මේ පොතෙහි තම තමාට ළදරු කාලයේ දී භය උපන් අවස්ථාවන් ඇති නිසා බොන්ට නොහැකි යයි ප්‍රතික්ෂෙප කළ බව කියමින් ඒ භය ඇති වූ සැටි විස්තර කොට තිබේ.

4. ඒ රජු වඩමන්නොට තැවතී සිටින අවස්ථාවෙහි ථෙරපුත්තාභය යෝධයා කැඳවා ගංඉවුර දිගේ උඩ අතට ගමන්කොට ඒ ඒ සතුරන් නසා "මහාකෝල" නම් පෙදෙසෙහි රජගෙයක් හා උයනක් කරවන්ට නියම කෙළේය. හෙතෙම **කෝල මහාමල** නම් තැනට ගොස් සමන්කුළු පව්වට නැගී බුදුන් සිරිපා පුද, එසින් බැස මරුකඬදතව්වෙහි විසූ දෙමළ රජු මරා **බාල්හගාමතල*** නම් තැන රජගෙයක් හා උයන් පොකුණු සාදවා රජුට දන්වා යැවිය. රජතුමා එහි ඇවිත් ටික දිනක් විසීය යි මේ පොතේ කියවේ. මේ ප්‍රවෘත්තිය අන්කිසි පොතක නොදක්නා ලදී. ශ්‍රී පාදය ගැන මහාවංශයේ සඳහන්වන්නේ නිශ්ශංකමල්ල රජුගේ කාලයේ දීය. ඉන් පෙර ඒ පිළිබඳ කිසි සටහනක් ඉතිහාස

* බලන්ගොඩද?

පොත්වල නො පෙනේ. නමුත් මෙහි එය සඳහන් වී තිබීම ඉතා වැදගත් කාරණයකි. මේ රජගෙය සෑද වූ තැන සමතල කන්දට නුදුරු තැනක් වියයුතුය.

5. සුරනිම්මල යෝධයා එළාරරජුගේ යෝධයාගේ හිස ගෙනෙන්ට ගිය ගමනේදී වඩමන් තොටෙන් එතරවෙන විට දෙමළුන් දහසක් මැරූ බැවින් එතැන්සිට එය "දහස්-තොට" යයි ද "අස්මඩලාතොට" යයි ද ප්‍රකටවූ බව සුර නිම්මලගේ කථාවෙහි කියවේ.

6. දත්තකුටුම්බිකවත්ථුවෙහි **මලියමහාදේව** තෙර පුවඟුදිවයින විසූ තෙර නමකැයි කියවේ. මේ නම ඇතැම් තැනක "මාලෙය්‍ය මහාදේවතෙර" යයි පෙනේ. 'මාලෙය්‍ය' යන්නෙන් මාලදිවයින අදහස් කරනලදැයි අදහසක් මට පහළවී තිබෙන විට ඒ අදහස ස්ථිර කරන ජෝන් සිරිමන් ද සොයිසා මහතාගේ ලිපියක් ද සිළුමිණ පත්‍රයෙහි පළවිය. දැනුත් "පුව මූලකු" නමින් හැඳින්වෙන කොදෙව්වක් ඒ මාලදිවයින් කොදෙව් රැසේ ඇති බව ඒ මහතා ප්‍රකාශකරයි.

මලියදේව තෙරනම පෙර ලක්වැසියන් අතර අතිශයෙන් ප්‍රකටවූවෙකි. එතුමා විසූවේයයි කියන බොහෝ විහාරස්ථානද ලක්දිව ඇත්තාහ. උන්වහන්සේ ලක්දිවත් වසන්ට ඇත. ලක්දිවින් ගොස් මාලදිවයින්හි පදිංචිවෙන්ටත් හැකිය. තවද **මලයවාසී මහාදේවතෙර** නමක් මෙහි විසූබව විශුද්ධිමාර්ගයේ කායගතාසතිනිද්දෙසයෙහි ද විභංගඅටුවාවේ සතිපට්ඨාන විභංගයෙහි ද කියනලදී. පසු කලක මේ මාලෙය්‍ය මහාදේව, **මලයමහාදේව** නම් දෙක පටලවා ගෙන ව්‍යවහාර කළාහයි ද සිතන්ට ඉඩ තිබේ.

මහවංසයේ 32 වෙනි පරිච්ඡේදයෙහි දුටුගැමුණු කුමාරයා කැලයේ සැඟවී සිටි අවස්ථාවක දුන් ඇඹුල් කොංගු බත පිළිගත් **මලයමහාදේව** තෙර ඒ ආහාරය ශ්‍රීපාදඅඩවියේ විසූ නවසියයක් භික්ෂූන්ට බෙදා දුන්නේයයි කියවේ. මේ

කියවෙන්නේ "මලියදෙව" තෙර නම ගැන නොව "මලයදේව" තෙරනම ගැනයි. මේ ඇඹුල්කොංගු දානය ගැන මින් පෙර මහාවංශයෙහි නොකියවේ. කියවෙන්නේ තිස්ස ඇමතියා අතේ තිබුණු ආහාර දුන්සැටි පමණයි. මේ කොංගුදානයේ විස්තරය දකින්ට ලැබෙන්නේ සීහලවත්ථුප්පකරණයෙහිය. දැන් එය මුද්‍රිතව තිබෙන බැවින් කැමති කෙනෙකුට බලාගත හැක.

තලංගරවාසී ධම්මදින්න, මංගණවාසී බුද්ධතිස්ස, මහාව්‍යග්ඝ යන තෙරවරු ද මේ ඇඹුල්කොංගු බත පිළිගත්තෝ වූහ. මෙයින් බුද්ධතිස්ස (= බුජ්ජතිස්ස = බුද්ධකතිස්ස) තෙර නමත් මහාව්‍යග්ඝ තෙරනමත් සද්ධාතිස්සරජුගේ කාලයේදී අපවත්වූ බව සීහලවත්ථුවෙන් හා ඇතැම් අටුවාවලින් පෙනේ. එය සිදුවිය හැක්කකි. තලගුරු වෙහෙර ධම්මදින්නතෙර ඒ ආහාරය පුවගුදිවයින් වැසි දසදහසක් භික්ෂූන්ට බෙදා දුන්නේයයි මහාවංශයෙහි කියවේ.

## අන්‍ය පාලිපොත්වල නැති වචන

1. 46 වෙනි මහානෙලවත්ථුවෙහි "තස්ස නාමකරණමංගලෙ නීලමහානෙලං ආහරිසුං" යන්නෙන් එ කුමරුට නම් තබන දිනයෙහි පියාගේ මිත්‍රයන් නිල්මානෙල් ගෙනාහයි කියවේ. මානෙල්වලට "මහානෙල" නමක් පාලියෙහි නොපෙනේ. සිංහල වචනය පාලියට පෙරළුවා වියහැක. නමුත් "මානෙල්" වචනය අපට ලැබුණේ කොහෙන්දැයි විමසිය යුතුය.

2. 25 වෙනි කථාවෙහි රක්ඛාචුණ්ණ යන වචනයක් තිබේ. ඒ වචනය අන් පොතක නැත. රසවාහිනියෙහි ඒ වෙනුවට තිබෙන වචනය "මනොසිලාචුණ්ණං" යන්නයි. රත් සිරියල් කුඩු එයින් කියවේ.

3. බුඩවම්මවෙළෙන්දාගේ කථාවෙහි "ඛණ්ඩසක්ඛරා" නමින් කියවෙන්නේ ගල්කණ්ඩුය. එය අන්පොත්වල ද දක්නා ලැබේ.

4\. 54 වෙනි ධම්මදින්නාමහතෙරුන්ගේ කථාවෙහි "ඓණසටකපාලපූව" යන වචනයක් වේ. එය "ඓණසතක-පාලපූව" යයි සංස්කරණය කරනලදී. කාවන්තිස්ස කථාවෙහි "ඓණපූව" යන්නක් පෙනේ. ගිතෙලින් බැදි ආස්මී (=ආස්සද) පළමු වචනයෙන් අදහස් කරනලදූයි ද දෙවෙනි වචනයෙන් සාමාන්‍ය ආස්මී කියවේයයි ද සිතමි. ආස්මී වලට අන්පොත්වල කියවෙන්නේ "ජාලපූව" යන්නයි. දෙවෙනිව කී වස්තුවෙහි කැව්ලිරාශියක නම් පෙනේ.

5\. 63 වෙනි කථාවෙහි "ලාවහාරදින්නස්ස" යන්නක් පෙනේ. එය අන්පොතක නොදක්නා ලැබේ. රසවාහිනියෙහි "ඵලකඛණ්ඩදින්නස්ස" (= ලෑලි කැබැල්ලක් දුන්නහුගේ) යයි පෙනේ. මෙය විමසිය යුත්තකි. 56 වෙනි ගැරඬියා පිළිබඳ කථාවෙහි **ගාරවිල** යන වචනයක් පෙනේ. එය ගැරඬියා සඳහා යෙදූවකි. අන් තැනක දකින්ට නො ලැබේ.

6\. **කාලසිගාල** යයි මෙහි පෙනෙන කණහිවලාගේ කථාවෙහි "පිම්බරො" යන වචනයක් පෙනේ. එය පිඹුරා සඳහා යෙදූවකි. මේ ගැන විවේචනයක් කරන ශාස්ත්‍රාචාර්‍ය්‍ය රාහුලස්ථවිරතුමා මෙය සිංහලවචනය පාලියට පෙරළීමකැයි කියයි. පිඹුරාට පාලියෙන් කියයුතු **අජගර** යන්න මේ පොතේ කර්තෘ නොදූන සිටියානම් මේ කීම පිළිගත හැක. අජගර ශබ්දය ද මේ කථාවේම යෙදී තිබෙන බැවින් එය නොදූනීම නිසා යෙදූවකැයි කිය නොහැක. "පිඹුරා" යන වචනය අපට ලැබුණේ කොහෙන්දැ යි සෙවීම ද කළ යුතුය. එය එකල භාවිතවූ කිසියම් බසක තිබෙන්ට ඇතැයි සිතමි.

7\. ගොඨසිම්බරගේ කථාවෙහි "ත්වං මයා සද්ධිං පොද්දං කීළිතුං සමත්ථො" (= තෝ මා හා පොරබදන්ට සමත් වෙහිද?) යන්නක් පෙනේ. මේ **පොද්දං** යන වචනය මේ කථාවේ සතර තැනෙක තිබෙන බැවින් අශුද්ධ වචනයකැයි

කිය නොහැක. නමුත් මේ වචනය අන්‍ය පාලිපොතක නොදක්නා ලැබේ. 1958 නොවැම්බර් මාසයේදී මා රුත්-ගුමට පැමිණ සිට් අවස්ථාවේදී මා දැකීමට පැමිණි යට නම් නම් සඳහන් කළ දේවප්‍රසාද්ගුහා (ඇම්. ඒ.) මහතා මේ ගැන කථා කරමින් පොර බැදීම කියවෙන එවැනි ව්‍යවහාර යක් දැනුත් වංගභාෂාවේ තිබෙන බව කීය. මෙය වැදගත් කාරණයකි. වැරදියයි අප සිතන ඇතැම් වචන හා භාෂාරීති ඒ කාලයේ පැතිර තිබුණු අන්‍යභාෂාවන්ගේ ආශ්‍රයෙන් ලැබුණ ඒවා විය හැක. ඒ නිසා තිබුණ වචන කපා දමා නිවැරදියයි අපට වැටහෙන වචන යෙදීමට ඉක්මන් නොවිය යුතුය.

## මේ පොතෙන් හෙළිවෙන සමාජචාරිත්‍රාදිය

ශාස්ත්‍රාචාර්‍ය සෝමදාස මහතා යුරෝපයට යන්ට පෙර මේ පොතෙන් හෙළිවෙන සමාජචාරිත්‍රාදිය විමසීම සඳහා මා වෙත ප්‍රශ්නමාලාවක් එවීය. ඒවාට දියයුතු පිළිතුරු වශයෙන් මේ කොටස ලියනු ලැබේ:-

1. උත්තරොලියවත්ථුවෙහි "සික්ඛාපදගහණමංගලෙ" යන වචනයක් පෙනේ. බව්තීස්ම කිරීම වැනි ආගමට ඇතුල්කිරීමේ උත්සවයක් තිබුණාදැයි ඒ මහතා ප්‍රශ්නකරයි. මේ ශික්ෂාපද ගැනීමේ මංගලය බුද්ධකාලයේදීත් තිබුණ බව දම්පියාඅටුවාවේ "පණ්ඩිතසාමණේරවත්ථු" ආදියෙහි කියවේ. නම් තැබීමත් එදිනම සිදුවූ බව පෙනේ. ගැමුණු කුමරුට නම් තබන දවසේදී ගෝතම නම් තෙරනමක් සරණ හා සිල් දුන්නේයයි මහාවංසයේ දෙවිසිවෙනි පරිච්ඡේදයෙහි කියවේ.

2. අංක 28 දරණ "චූලුපඨාකතිස්ස" කථාවෙහි කර කොළ හකුරු සමග මැඩ පානයක් සෑදූ" යි කියවේ ඒ කරකොළ ඇඹුලට උයාකන කරකොළදැයි අසයි. එසේ විය යුතුයි. එය පොෂණදායී කොළවර්ගයක් බව පොත පතින් පෙනේ. මා තවම ඒවා දැක නැත. කරකොළ

පමණක් තම්බා කෑ සැටි බැමිණිතියාසාය පිළිබඳ කථාවල කියවේ. පොත් ලියන්නට ගන්නා කරකොළ හා මේවායේ සම්බන්ධයක් නැත. මේරූ තල් කොළවලට කරකොළයයි ව්‍යවහාරකරති.

3. අංක 33 නේ කථාවෙහි දුගී ස්ත්‍රියක් ඉතා අමාරුවෙන් ලබාගත් වස්ත්‍රයක් වස්සාවාසික වස්ත්‍රයක් වශයෙන් පූජා කළවිට ගිරිතිම්බලවිහාරයේ වස්විසූ භික්ෂූන් අතරෙන් එක් එක් නම ඉදිරිපත්වී "එය තෙමසකට මට දෙනු මැනවි, දෙමසකට, මසකට, සතියකට, එක් දිනකට මට දෙනු මැනවැ"යි ඉල්ලුවේ වස්ත්‍ර හිඟ නිසාදැයි අසයි. වස්ත්‍ර නම් මේ කාලයේදී තරම් සුලභව ඒ කාලයේදී තිබුණු බවක් නොපෙනේ. නමුත් මෙහි ඒ ඉල්ලීම කරන ලද්දේ ඒ දුගී ස්ත්‍රියට අනුකම්පාවෙන් ඇගේ පූජාව මහත්ඵල කරනු සඳහාය. ඒ සිවුර ඇඳගෙන එක් නමත් විදසුන් වඩා එක් දිනකදී රහත් විය. ඉතිරි භික්ෂූහුද ක්‍රමයෙන් රහත් ඵලය ලැබූහ. ඒ නිසා ඒ සිවුර රජුගේ සැරසිලිවලට ඉදිරියෙන් ධ්වජයක් මෙන් බඳින්ට නියම කළහ. "භික්ෂූහු පිත් කම්වලදී විහාරය සැරසූවාහුද?" යන ප්‍රශ්නයට උත්තර මේ අවසන් කොටසින් ලැබේ.

4. **නන්දිරාජවස්තුවෙහි** කියවෙනසේ හාඳුනන අංගන්තුකයන්ට රාජ්‍යය පැවරීම එකල සිදුවීදැයි විමසයි. මළ රජුගේ පුත්‍රයෙක් හෝ සොහොයුරෙක් නැත්නම් රාජ්‍යයට සුදුස්සකු තෝරාගත නොහැකි වූ විට හිස්වූ රාජරථය අසුන්ට කැමතිසේ ඇදගෙන යන්ට සලස්වා ඒ රථය හොස් නැවතුන තැන සිටි පුද්ගලයා රජකමට පත්කර ගත් බව ජාතක කථාදියෙහි පෙනේ. රථය නැවතුණු පසු පුරෝහිතාදීන් ඒ පුද්ගලයාගේ ශරීරලක්ෂණ විමසූ බව කියවේ.

5. කාවන්තිස්ස රජුගේ කථාවෙහි කියවෙන **තිවස්සික ගන්ධසාලි** =අවුරුදු තුනක් පරණවූ සුවඳහැල් මෙන් වීවලට සුවඳ කැවීම දැනුත් තිබේදැයි අසයි. දැන් නැත. ඒ සුවඳ

කැවීම අටුවල බිම සුවඳ වගී අතුරා වීතට්ටුවක් දමා තැවත සුවඳ වගී තට්ටුවක් දැමීම ආදි වශයෙන් මහත් වියදමකින් කළ යුත්තකි. ඒ වී අවුරුදු තුනකින් පසු පාවිච්චියට ගනු ලැබේ. ඒ විස්තරය අඞ්ගුත්තරඅටුවාදියෙහි තිබේ.

6. ඒ කථාවෙහිම "තස්මිං තස්මිං මාලකෙ තත්‍ථ තත්‍ථ දිවාසයනෙ නිසින්නා භික්ඛූ වන්‍දන්තො" (= ඒ ඒ මලුවල දිවාසයනයෙහි හුන් භික්ෂූන් වඳිමින්) යයි කියවේ. එසේ දවල් නිදීමෙහි හුන් භික්ෂූන් වැඳීම නීතිවිරොධී නොවේදැයි අසයි. මලුවල හුන් බැවින් එහි නිදීමක් විය නොහැක. එළිමහනේ රැස්ව හිඳීමකි. එළිමහනේ හෝ දොර නොපියා කාමර තුළ දවල් නිදීම භික්ෂූන්ට තහනම්ය.

7. ඒ කථාවෙහිම විහාරමහාදේවිය ගිලන් සාමණේර යන් වෙත ගොස් ඔහුගේ පා පිරිමදිමින් බෙහෙත් ගැන විචාළායයි කියවේ. ස්ත්‍රියක් සාමණේර නමකගේ පා අතගෑම හරිදැයි විමසයි. පා පිරිමැදීම යන වචනය රසවාහිනියෙහි නැත. ස්ත්‍රීන් හෙරණුන් ස්පර්ශ කිරීමක් දැන් නැත. නමුත් එයින් ඇවතක් සිදුවන්නේ උපසම්පන්නයන්ටයි; රාග නිශ්‍රිත නොවූ පිරිමැදීමකින් හෙරණුන්ට සිදුවෙන වරද අසවල් එකයයි කියන්ට නොහැකිය.

8. හතළිස් හත්වෙනි මහානේල වස්තුවෙහි බත් මූලක් ගෙන ගියේ දැන් මෙන් කඩපිල් නැති නිසාදැයි අසයි. කඩ පිල් තිබුණත් පූර්වයේදී බත්කඩ හෝ මුදල් අයකරන භෝජනාගාර තිබුණේම නැතැයි සිතමි.

9. චූලගල්ලඋපාසකවස්තුවෙහි කියවෙන ආසන සාලාව අම්බලමක්දැයි විමසයි. කාටත් සාධාරණ අම්බල මක් නොවේ. පිණ්ඩපාතයේ ගිය භික්ෂූන්ට එහි පැමිණ දන් වැලඳීම සඳහා නොයෙක් තැන තිබුණු ශාලා වර්ගයකි. දැන් ඒවා දකින්ට නොලැබේ. පින් කැමැත්තෝ ආසන ශාලාවට ඇවිත් භික්ෂූන්ට අතිරේක ආහාර පිදීම, පැන් පෙරහා දීම, ශාලාව පිසදමා ශුද්ධකිරීමාදිය කළහ.

10. සංඝාමාත්‍ය වත්ථුවෙහි රජතුමා ඔහට මහවියනක් දුන්නේයයි කියවේ. එය නිලය නිසා දුන් එකක්දැයි විමසයි, නිලය නිසා දුන් එකකි. එය මහනුවර පෙළහරේ දළදා කරඬුවට අල්වන වියන වැනි උස් පොලු සතරක සවි කළ කැටයම් සහිත එකක් විය යුතුය.

11. පණ්ණත්ථුත්වෙහි දුගියාගේ කථාවෙහි "සත් හැවිරිදි දරුවකු මේ පර්ණතය මුදුනේ තෙල් පිරූ භාජනයක් ගෙනයන්නට සමර්ථවෙන කාලයේදී මෙයින් ච්‍යුතව් තව්තිසා වෙහි උපදින්නෙමු" යි කියවේ. මේ කියන්නේ මන්ත්‍ර ගුරුකමක් ගැනදැයි විමසයි. මේ කියන්නේ පර්ණතය ක්‍රමයෙන් ගෙවී යාමෙන් මහපොළොවට සමවී එතැනින් මහ මඟක් වැටුණු පසු සම බිමේ තෙල්භාජනයක් ගෙන යාම ගැනයි. තෙල්භාජන පිරවූ කරත්තයක් පැදවීමයයි රසවාහිනියෙහි පෙනේ. පොළොව ක්‍රමයෙන් විශාලවීමත්, කඳු ගෙවීයාමත් පෞරාණිකයෝ දැන සිටියෝය.

12. ධම්මසුතනෝසාද වත්ථුවෙහි "උප්පලපාසං" යන්න කුමක්දැයි විමසයි. මෙය අශුඩ පාඨයක් විය යුතුයි "අදූහල පාසං" යන්න මෙසේ වැරදී ලියවුණා විය හැක. රසවාහිනියෙහි මේ කථාව ඇතත් මේ වචනයට සමාන වචනයක් නැත.

13. කණ්ඩවනදේවියගේ කථාවෙහි "පාළිභද්දදණ්ඩං" යන්න ඉණිමගක්දැයි" යි අසයි. එය එරමුදු ලීයකින් දැමූ ඒදණ්ඩකි.

14. සහායසස ජීවිතදින්න කථාවෙහි මරණයට නියම වූ අයකු වෙනුවට අන් අයකු ඉදිරිපත් වූවහොත් ඒ ඉදිරිපත් මිනිසා මැරීම නීත්‍යානුකූලදැයි විමසයි. නීතිය කෙසේ වෙතත් එය සිදුවී තිබෙන බව නොයෙක් කථාවලින් පෙනේ.

15. තන්දිවාණිජවත්‍ථුවෙහි මන්‍ත්‍රබලයෙන් අමනුෂ්‍ය-යකු මළමිනියකට ආවේශ කොට අනිකකු මැරීම සඳහා පිල්ලියක් යැවූ බව පෙනේ.

16. සමුද්දතරිතදාරිකා වත්‍ථුවෙහි "අරියවංසපූජාව" කුමක්දැයි විමසයි. ඒ කාලයේදී ලක්දිව ප්‍රකට විහාරස්ථාන යන්හි වර්‍ෂයකට වරක් හෝ මාසකීපයකට වරක් මහා අරියවංසසූත්‍රයෙන් ධර්‍මදේශනා කිරීමක් පැවැත්තේය. මෙය අංගුත්තරනිකායේ තිබෙන සූත්‍රයකි. භික්‍ෂූන්ගේ වාම්වූ අල්පේච්ඡ පැවැත්ම මෙහි වර්‍ණිතා කරනු ලැබේ. ඒ කථාවෙහි කියවෙන උදුම්බර විහාරය දිඹුලාගල නොවිය හැක; මූද අසළ පිහිටි අන්‍ය විහාරයක් විය යුතුයි.

## අඩුවක් පෙනේ

සිවුවෙනි වර්‍ගයෙන් පසු 55 වෙනි මහානෙල වත්‍ථුවේ අග "මහානෙලවත්‍ථු පඤ්චමං" යි දක්වා එය පස්වෙනි කථාව යයි කියන ලදී. එයට අනතුරුව පෙනෙන දුට්ඨගාමිණි කථාව සවෙනි යයි කියයුතු නමුත් එය ප්‍රථම කථාවයයි ද සාලිකුමරුගේ කථාව දෙවැන්න යයි ද මෙසේ ක්‍රමයෙන් ගොස් ධම්මදින්න තෙරුන්ගේ කථාව දස වැන්නයයි දක්වා "වර්‍ගය පිරුණේය" යි කියන ලදී. කීවෙනි වර්‍ගයදැයි නො කියන ලදී. මෙයින් වැටහෙන්නේ පස්වෙනි වර්‍ගයෙහි කථා පහක් අඩු බවයි. හවෙනි වර්‍ගයෙන් ද එක් කථාවක අඩුවක් පෙනේ.

පොල්වත්තේ බුද්ධදත්ත.

අගගාරාමය
අම්බලන්ගොඩ,
11. 11. 59.

# FOREWORD

The Sahassavatthu is a work often talked about in literary circles and not yet published in any country. As its name is mentioned in the Mahavamsatika, its editor, Dr. G. P. Malalasekara M. A., PH. D , D. Litt. of the University of Ceylon, some 25 years ago made an attempt to edit this work. I believe that he had obtained two photographic copies of it from the British Musium and a handwritten copy from the Bernard Free Library in Rangoon. However, the Doctor, now the High Commissionor for Ceylon in Moscow, was too busy to afford his time for its completion. Rev. Dr. Rahula, having gone through the MS while he was in University of Ceylon, has included some details of the work in his "History of Buddhism in Ceylon."

Afterwards Mr. K. D. Somadasa B. A., M. S., Assistant Librarian of the University of Ceylon, took a keen interest in the work, transcribed the text in Sinhalese characters, and having collated it with another copy, sent his MS to me together with a Burmese MS obtained from the Bernard Free Library, for further edition and revision. He also informed me of the places where I could get more copies of the work. Although I visited these places I could get only one palm-leaf copy, from Mahakappina-mudalindarama of Balapitiya.

While I was collating his MS with these Burmese MSS Mr. Somadasa had to leave the Island for Europe on some official business. As he would be abroad for many months he entrusted me with the task of editing the work.

In editing this work I got help from the Rasvahini, the Saddharmalankaraya which is the Sinhalese version of it, and the Sihalavatthu which was recently edited by me. Rasavahini is the refined and enlarged form of the Sahassavatthu. The Saddharmalankara has a more eleborate form than the Rasv: The Sihalavatthu is an older work, relating same kind of stories, but not altogether similar.

The author's name of the Sahassavatthu is not given in the text; but the author of the Rasv., Ven. Vedeha, states tbat it is a work of Ven. Ratthapala of the Guttavanka Parivena, at Anuradhapura. As the Rasv. was based on the Sahv. the latter's date must be earlier than that of the Rasv. Rasavahini's author was a pupil of the Elder Ananda Vanaratna, who compiled the Mulatika of the Abhidhamma Commentary. The subcommentary to the Mulatika was compiled by the Elder Dhammapala of Badaratittha, whose date was fixed by me at about 976 A. D. So the date of the present work should be earlier than that.*

* See p. 193, Corrctions of Geigr's Mahavamsa Etc. published by the Ananda Book Company, Ambalangoda, 1957.

The Sihalavattu is the oldest of these three story-books. It was compiled even before the time of Buddhaghosa by an Indian Elder who lived in the Andhra country.

The Rasv. and the Sahv. were compiled in Ceylon. Although the Sihalavatthu is older, it has fewer grammatical mistakes than the Sahv. Tbe present work has some peculiar words and phrases. For instance, "**podam kilitum**," in the sense of fighting, occurs no where else in Pali works; yet it cannot be a corruption as it occurs in four places in the same story. In Sinhalese the usage "**pora badanava**" for wrestling is there, although the origin of 'pora' is unknown. Mr. Devaprasad Guha M A., lecturer in Pali at the University of Rangoon, once told me that the Bangalee language has such a phrase in the same sense. Hence great care should be taken before stamping such a word as a corruption, as it might have come in from another langauge. **Pimbaro** for boa constrictor is another such word. Rev. Dr. Rahula says that it has followed the Sinhalese word **pimbura**; but we have to find out the origin of it as it might have come from a foreign language

The name 'Sahassavatthu' does not mean "a thousand stories." Sahassa here is a compound word, sa + hassa, which means "connected with joy, "**or**" pleasure-giving." **Hasa** and **hassa** are synonyms in Pali. So the

stories that bring joy and pleasure to the reader are named 'Sahassavattu.' The name Rasavahini has the same meaning.

As many different readings, concerning Propernouns, occur in these three books, the Sahv. the Rasv. and the Saddharmalankara, I entered them in foot-notes. For a long time the present work was preserved in Burma; the Burmese copyists, who had no knowledge about place-names in Ceylon, have often corrupted them In the Burmese MSS there is the name of a story given as "**Dvayeka Vajjigama-vatthu**." The Rasv. and its Sinhalese version have it as **Ruvakavitthi-gama-vatthu.** With this instance one can understand how far these names have undergone changes

My thanks due first of all to Mr. Somadasa and Dr. Malalasekara, secondly to Rev. M. Pannasena of Mahakappina-Mudalindarama, and the publishers Messrs Ananda Book Company of Ambalangoda.

**A. P. BUDDHADATTA**

Aggarama,
Ambalangoda,
11. 11. 1959.

# සංකේත නිරූපනය

(අත් පිටපත් සඳහා යෙදූ ලකුණු.)

**බ්‍රි 1.** බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ අංක P 26103 (6601) දරන පුස්කොළ පොතේ ඡායාරූප පිටපත

**බ්‍රි 2.** එම කෞතුකාගාරයේ 26103 (4674) අංක ඇති පුස්කොළ පොතේ ඡායාරූප පිටපත

**ර.** රත්ගුත්නුවර බර්නාඩ් නිදහස් පුස්කාලයෙන් ලියවා ගෙන්වා ගත් කඩදාසි පිටපත

**කේ.** වැලිතර මහාකප්පිත මූදලින්ඤාරාමයෙන් ලබාගත් බුරුම පුස්කොළ පිටපත.

මේ පිටපත බුරුම ශකවර්ෂ 1214 දී හෙවත් බුද්ධ වර්ෂ 2398 දී "සිරිපවරවිජයානන්තයස—පණ්ඩිත මහාධම්මරාජාධිරාජයන්" හා "සිරිපවර මහාරාජින්දාධිපති රතනාදේවී" යන නම් ඇති එම අගමෙහෙසියගේ පූජාවකැයි පොතේ අග බුරුමබසින් ලියා තිබේ.

**රස. රසවාහිනී,** ලක්දිව මුද්‍රිත පොත

**සධ.** සද්ධර්මාලංකාරය 1913 දී ජේ. ඩී. ප්‍රනාන්දු විසින් මුද්‍රිතවූ පොත

බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් ලබාගත් පිටපත් දෙකෙන් එකක කථාවස්තුවල පටුනක් තිබේ. ඒ පිටපත ගින්තොට තිහුම්මිකාරාමයේ විසූ පඤ්ඤානන්ද මහාස්ථවිරතුමන් විසින් හ්‍යූ. නෙවිල් මහතාට 1894 දී පරිත්‍යාග කරනලදැයි ඉංග්‍රීසියෙන් එහි ලකුණු කොට තිබේ. ඒ තිබෙන වාක්‍යය මෙසේයි:-

"This Sahassvatthuppakarana is presented to H. Nevill Esquire, Government Agent, Anuradhapura, by S. Pannananda sthvira, Tibhummikarama, Gintota, Galle, 1 st August 1894.

# අනුක්කමනිකා.


| | | | පිට්ඨංකා |
|---|---|---|---|
| 1. | ධම්මසොණ්ඩක | වත්ථු | 1 |
| 2. | මිගපොතක | ,, | 6 |
| 3. | ධම්මසුතඋපාසිකාය | ,, | 7 |
| 4. | මිගලුද්දකස්ස | ,, | 8 |
| 5. | භුජගවිනාසිත | ,, | 8 |
| 6. | ආචාටතො නීහට | ,, | 9 |
| 7. | බුද්ධෙතියා | ,, | 12 |
| 8. | මහාඅභයථෙර | ,, | 14 |
| 9. | මිච්ඡාදිට්ඨිකස්ස | ,, | 16 |
| 10. | සරණථෙරස්ස | ,, | 17 |

**වග්ගො පඨමො.**

| | | | |
|---|---|---|---|
| 11. | වෙස්සාමිත්තාය | වත්ථු | 20 |
| 12. | සිරිනාගස්ස | ,, | 21 |
| 13. | සඞ්ඝතිස්සාමච්ච | ,, | 22 |
| 14. | සීවලිථෙරස්ස | ,, | 23 |
| 15. | සමණගාමපබ්බත | ,, | 25 |
| 16. | නන්දිමිත්තස්ස | ,, | 26 |
| 17. | මන්ධාතුමහාරාජස්ස | ,, | 29 |
| 18. | අභයථෙරස්ස | ,, | 30 |
| 19. | නාගාය | ,, | 32 |
| 20. | වත්ථුලෙය්‍ය පබ්බත | ,, | 33 |

**වග්ගො පරිපුණ්ණො**

## වග්ගො දුතියො.


| | | | |
|---|---|---|---|
| 21. | දතදින්න දුග්ගතස්ස | වත්ථු | 36 |
| 22. | උත්තරොලිය | ,, | 37 |
| 23. | මහාසෙනරඤ්ඤො | ,, | 39 |
| 24. | තම්බසුමනත්ථෙරස්ස | ,, | 40 |
| 25. | පුබ්බපබ්බතවාසිතිස්සත්ථෙර | ,, | 42 |
| 26. | බුද්ධවම්ම වාණිජස්ස | ,, | 44 |
| 27. | සුවණ්ණතිලකාය | ,, | 46 |
| 28. | චූලපඬාකතිස්ස | ,, | 49 |
| 29. | තිස්සාය (මුණ්ඩගුත්ත) | ,, | 50 |
| 30. | අරියගාලමහාතිස්ස | ,, | 53 |


## වග්ගො තතියො.


| | | | |
|---|---|---|---|
| 31. | රූපදෙවියා | ,, | 59 |
| 32. | ගාමදාරිකාය | ,, | 61 |
| 33. | දුග්ගතිත්ථියා (ධම්මාය) | ,, | 62 |
| 34. | කපණාය | ,, | 64 |
| 35. | කුණ්ඩිසංඝස්ස | ,, | 66 |
| 36. | සුසද්ධාසුමනාය | ,, | 70 |
| 37. | තන්දිරාජ | ,, | 72 |
| 38. | චොරස්ස (දින්නවත්ථු) | ,, | 76 |
| 39. | කාකවණ්ණතිස්ස I | ,, | 76 |
| 40. | වෙළුසුමනස්ස | ,, | 83 |
| | කාකවණ්ණතිස්ස II | ,, | 87 |

### වග්ගො චතුත්ථො.


| | | | |
|---|---|---|---|
| 41. | අම්බාමච්චස්ස | වත්ථු | 90 |
| 42. | සුරනිම්මලස්ස | ,, | 91 |
| 43. | මහාසොණස්ස | ,, | 93 |
| 44. | ගොඨයිම්බර | ,, | 94 |
| 45. | මහාතෙලස්ස | ,, | 100 |
| 46. | දුට්ඨගාමණිරඤ්ඤො | ,, | 104 |
| 47. | සාලිරාජකුමාර | ,, | 108 |
| 48. | විසමලොමකුමාර | ,, | 108 |
| 49. | ඉඳගුත්තත්ථෙර | ,, | 110 |
| 50. | කාකස්ස | ,, | 113 |
| 51. | ඵුස්සදෙවත්ථෙරස්ස | ,, | 115 |
| 52. | චූලනාගත්ථෙරස්ස | ,, | 117 |
| 53. | පල්ලොලෙ දුග්ගතස්ස | ,, | 120 |
| 54. | ධම්මදින්නත්ථෙරස්ස | ,, | 121 |


### වග්ගො සම්පුණ්ණො.


| | | | |
|---|---|---|---|
| 55. | රට්ඨපාලස්ස | ,, | 124 |
| 56. | ධම්මසුතගාරවිලස්ස | ,, | 125 |
| 57. | ධම්මසුතනෙසාදස්ස | ,, | 125 |
| 58. | හෙමාය | ,, | 126 |
| 59. | කණ්ඩුවනදෙවියා | ,, | 127 |
| 60. | බොධිරාජධීතාය | ,, | 129 |
| 61. | කාළසිගාලස්ස | ,, | 130 |
| 62. | ව්‍යග්ඝස්ස | ,, | 131 |
| 63. | ලාවහාරදින්නස්ස | ,, | 132 |
| 64. | චොරගෙහෙ වසිතස්ස | ,, | 133 |


### වග්ගො සම්පුණ්ණො.

| | | | |
|---|---|---|---|
| 65. | මරුත්තබ්‍රාහ්මණස්ස | වත්ථු | 135 |
| 66. | පානීයදින්න | ,, | 137 |
| 67. | සහායස්ස ජීවිතදින්න | ,, | 138 |
| 68. | යක්ඛ පලායිත | ,, | 140 |
| 69. | මිච්ඡාදිට්ඨිකස්ස | ,, | 141 |
| 70. | සරණගමන | ,, | 142 |
| 71. | උත්තරසාමණෙර | ,, | 143 |
| 72. | නන්දිවාණිජස්ස | ,, | 145 |
| 73. | කාවීර පබ්බත | ,, | 146 |
| 74. | නකුලස්ස | ,, | 148 |
| 75. | අම්බාමච්චස්ස | ,, | 149 |


**වග්ගො පරිපුණ්ණො.**


| | | | |
|---|---|---|---|
| 76. | චොරඝාතක | ,, | 150 |
| 77. | චූළගල්ලඋපාසක | ,, | 152 |
| 78. | වෙණිසාලස්ස | ,, | 158 |
| 79. | දුබ්බිසිමහාතිස්ස | ,, | 160 |
| 80. | තිස්සදහරසාමණෙර (පඨම) | | 161 |
| 81. | තිස්සදහරසාමණෙර (දුතිය) | | 163 |
| 82. | ගොළ උපාසකස්ස | | 165 |
| 83. | කුසලකම්මකත | | 167 |
| 84. | කපණමනුස්සස්ස | | 169 |
| 85. | එරාමණිමාතුගාමස්ස | | 170 |

| | | | |
|---|---|---|---|
| 86. | සංඝාමච්චස්ස | වත්ථු | 171 |
| 87. | දෙවපුත්තස්ස | ,, | 177 |
| 88. | සංඝදත්තත්ථෙර | ,, | 180 |
| 89. | රූවකණ්ඩිගාම | ,, | 181 |
| 90. | සමුද්දතරිත ගාමදාරිකාය | ,, | 183 |
| 91. | තිස්ස මහානාගත්ථෙර | ,, | 184 |
| 92. | මහාකකුධබද්ධනගාම | ,, | 185 |
| 93. | අරියාකරවිහාර | ,, | 187 |
| 94. | ධම්මාසොක මහාරාජ | ,, | 187 |
| 95 | දන්තකුටුම්බිකස්ස | ,, | 191 |


**වග්ගා පරිපුණ්ණා.**


සඤ්ඤානාමසූචි 193

# සහස්සවත්ථුප්පකරණං

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

## 1. ධම්මසොණ්ඩකවත්ථු

තිලොකනාථං වන්දිත්වා ධම්මඤ්ච සුඛමාකරං
සඞ්ඝං නිරඞ්ගණඤ්චෙව සීහළාචරියෙපි ච.

සහස්සවත්ථුං භාසිස්සං සීහළට්ඨකථානයං
ගණ්හිත්වාචරියවාදඤ්ච තං සුණාථ සමාහිතා.

බුද්ධො ච දුල්ලභො ලොකෙ සද්ධම්මසවණම්පි ච
සඞ්ඝො ච දුල්ලභො ලොකෙ,[1] සප්පුරිසා අතිදුල්ලභා.

දුල්ලභඤ්ච මනුස්සත්තං, බුද්ධුප්පාදො ච දුල්ලභො,
දුල්ලභා ඛණසම්පත්ති, සද්ධම්මො පරමදුල්ලභො.

සද්ධාධනං සීලධනං හිරිඔත්තප්පියං ධනං
සුතධනඤ්ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා
අදලිද්දොති තං ආහු; අමොඝං තස්ස ජීවිතං

තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මසාවනං
අනුයුඤ්ජෙථ මෙධාවී, එතං බුද්ධාන සාසනං

තස්මා චිත්තං පසාදෙත්වා සීලවන්තෙසු සක්කච්චං
අප්පකම්පි කතං කාරං පුඤ්ඤං හොති මහප්ඵලන්ති.

ඉමානි දුල්ලභානි සුලභානි[1] හොන්ති ති විජානනත්ථං ඉමානි වත්ථූනි කථෙතබ්බානි. පඨමං තාව ධම්මසොණ්ඩකවත්ථුම්හි අත්ථුප්පත්ති එවං වෙදිතබ්බා :

1. බී 2 අයං පාඨො නත්ථි.

අම්හාකං සම්මාසම්බුද්ධා කස්සපසම්මාසම්බුද්ධස්ස ධම්මරාජස්ස සාසනන්තරධානතො නචිරෙනෙව කාලෙන බාරාණසීරඤ්ඤො පුත්තො ධම්මසොණ්ඩකරාජකුමාරො පිතු අච්චයෙන රජ්ජෙ පතිට්ඨාය කස්සපදසබලෙන දෙසිතං ධම්මං සොතුකාමො හුත්වා මාසමත්තං රජ්ජං කත්වා දෙවනගරසදිසෙ බාරාණසීනගරෙ චක්කවත්තිරජ්ජසදිසං රජ්ජං කරොන්තො එවං චින්තෙසි: "මය්හං එවරූපං රජ්ජවිලාසං රජ්ජානුභාවඤ්ච සද්ධම්මවියොගෙන දිවාකරවිරහිතං ආකාසං විය, සසිවිරහිතා රත්ති විය, දන්තවිරහිතො ගජරාජා[2] විය, වෙලන්තවිරහිතො මහාසමුද්දො විය, චක්ඛුවිරහිතං සුසජ්ජිතවදනං විය, සුගන්ධවිරහිතං පාරිච්ඡත්තකපුප්ඵං විය චතුඅක්ඛර (නිය) මත්ත—ධම්මදෙසනාවියොගෙන[3] මය්හං ඉමං රජ්ජං න සොභතී"ති වත්වා සුවණ්ණචඞ්ගොටකෙන සහස්සත්ථවිකභණ්ඩිකං සුසජ්ජිත—මඞ්ගලහත්ථිකුම්භෙ ඨපෙත්වා බාරාණසීනගරෙ මහාවීථියං භෙරිඤ්චාරාපෙසි: "එකපදිකං වා ද්විපදිකං වා තිපදිකං වා[4] ධම්මපදං ජානන්තස්ස දම්මී"ති. එවං භෙරිඤ්චාරාපෙත්වා ධම්මජානනකං අලභිත්වා පුනප්පුනං ද්විසහස්සං තිසහස්සං යාව සතසහස්සං කොටි—ද්විකොටි—සහස්සකොටි—සතසහස්සකොටිං ගාම—නිගම—ජනපද—සෙනාපතිට්ඨානං උපරාජට්ඨානං[5], පරියොසානෙ ධම්මදෙසනකං අලභිත්වා අත්තනො සුවණ්ණපිණ්ඩක—සෙතච්ඡත්තං චජිත්වා පි ධම්මදෙසනකං අලභිත්වා රජ්ජසිරිං පහාය අත්තානං චජිත්වා ධම්මදෙසකස්ස දාසො හුත්වා පි ධම්මං සොස්සාමීති වත්වා එවම්පි ධම්මදෙසකං අලභිත්වා විප්පටිසාරී හුත්වා "කිමෙම සද්ධම්මවියොගෙන රජ්ජෙනා"ති අමච්චානං රජ්ජං නිය්‍යාදෙත්වා සද්ධම්මගවෙසකො හුත්වා ධම්මසොණ්ඩකමහාරාජා මහාවනං පාවිසි.

2. බී 2. අන්තවිරහිතො
3. සෝ. චතුඅක්ඛරනියමත්ථ —
4. බී 2. තිපදිකං (නි පදං නත්ථි.)
5. බී 2. උපරජ්ජං

ධම්මසොණ්ඩක—මහාරාජස්ස සද්ධම්මසවණත්ථාය වනං පවිට්ඨක්ඛණෙ සක්කදෙවරඤ්ඤො වෙජයන්ත-පාසාදෙ රතනකණ්ණිකාය කම්පො අහොසි; පණ්ඩුකම්බල-සිලාසනං උණ්හාකාරං දස්සෙසි. සක්කො දෙවරාජා කෙන කාරණෙන පණ්ඩුකම්බල-සිලාසනං උණ්හාකාරං අහොසීති චින්තෙත්වා අත්තනො සහස්සනෙත්තං දෙවමනුස්සෙසු විත්ථාරෙත්වා ඔලොකෙන්තො ධම්මගවෙස-කො හුත්වා වනං පවිට්ඨං ධම්මසොණ්ඩකමහාරාජානං දිස්වා චින්තෙසි: අජ්ජ මෙ අත්තානං විජහාය රක්ඛසවෙසං මාපෙත්වා එතං අනිච්චාදිපරිදීපනං ජාතිජරාව්‍යාධිමරණං සකලසරීරදෙසං[6] දස්සෙත්වා ධම්මං දෙසෙත්වා එතං[7] සක-රජ්ජෙ යෙව පතිට්ඨපෙතබ්බන්ති වත්වා සක්කො දෙවරාජා රක්ඛසරූපං මාපෙත්වා මහාසත්තස්සාභිමුඛො අවිදූරෙ අත්තානං දස්සෙසි. තං දිස්වා ධම්මසොණ්ඩක මහාරාජා එවං චින්තෙසි: එවරූපා නාම රක්ඛසා ධම්මං ජානිස්සන්තී ති වත්වා අවිදූරෙ ඨත්වා පුච්ඡාමී ති රක්ඛසෙන සද්ධිං සල්ලපන්තො[8] ආහ "සාමි මහාපුඤ්ඤ දෙවරාජ, ඉමස්මිං පන වනසටෙ වසනදෙවරාජ, කින්නුඛො ධම්මං ජානාසී"ති? දෙවතා "මහාරාජ, ධම්මං ජානාමී"ති ආහ. "යදි ධම්මං ජානාථ, මය්හං ධම්මකථං කථෙථා"ති ආහ. "මහාරාජ අහං තුය්හං ධම්මං කථෙස්සාමි. ත්වං මය්හං කීදිසං ධම්ම-කථිකස්ස සක්කාරං කරිස්සසී"ති ආහ. එවං සන්තෙ මය්හං ධම්මං කථෙත්වා පච්ඡා මය්හං සරීරමංසං ඛාදිස්සසී ති ආහ. "අහං මහාරාජ ඡාතො හුත්වා ධම්මං කථෙතුං න සක්කො-මී"ති ආහ. යදි තුම්හෙ පඨමං මංසං ඛාදථ, ධම්මං කො සුණිස්සතී ති? ආහ. පුන රක්ඛසො නාහං ධම්මං දෙසෙතුං සක්කොමී ති ආහ. පුන රාජා මය්හං ධම්මපටිලාභඤ්ච තුම්හාකං මංසපටිලාභඤ්ච තුම්හෙව ජානිත්වා මය්හං ධම්මං දෙසෙථා ති ආහ. අථ ඛො[10] සක්කො දෙවරාජා "සාධු මහාරාජා"ති වත්වා අවිදූරෙ ඨානෙ උබ්බෙධෙන තිගාවුත-

6. බි 2. සෝ. සකලසරීරෙ දෙසං. 7. බී 2. ර. සෝ. එතස්ස. 8. ර. අවිදූරෙ ඨානෙ. 9. බි 2. සල්ලපෙන්තො. 10. බී 2. 'ඛො'ති නදිස්සති

මත්තං මහන්තං අඤ්ජනපබ්බතං මාපෙත්වා එවමාහ: “සචෙ මහාරාජ ඉමං පබ්බතමුද්ධනිං ආරුය්හ ආකාසෙ උප්පතිත්වා ත්වං මම මුඛෙ පතිස්සසි, අහං තව ආකාසගතකාලෙ ධම්මං දෙසිස්සාමී ති. එවං සන්තෙ තුය්හඤ්ච ධම්ම–පටිලාභො මය්හඤ්ච මංසපටිලාභො[11] භවිස්සතීති ආහ. තස්ස කථං සුත්වා ධම්මසොණ්ඩකමහාරාජා අනමතග්ගෙ සංසාරෙ ධම්මෙන සුඤ්ඤො හුත්වා අධම්මසමංගී හුත්වා[12] අධම්මස්සෙව අත්ථාය පාණාතිපාතිකා අදින්නාදායිනො[13] කාමෙසු මිච්ඡාචාරා සූකරිකා ඔරබ්භිකා මාහිසකා[14] සාකු–ණිකා චොරා පාරදාරිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං චතූසු මහාසමුද්දෙසු උදකතො බහුතරං. මාතා–පිතුආදීනං පියමනාපානං අත්ථාය රොදන්තානං අස්සු චතූසු මහාසමුද්දෙසු උදකතොපි බහුතරං. ඉමං පන සරීරං සධම්මස්සත්ථාය වික්කිණන්තං මහප්ඵලඤ්ච මහා–පඤ්චා ති චින්තෙත්වා “සාධු මාරිස, එවං කරොමී”ති පබ්බතං ආරුය්හ පබ්බතග්ගෙ ඨිතො මම රජ්ජෙන සද්ධිං මය්හං සජීවං සරීරං සධම්මස්සත්ථාය දස්සාමී ති සොම–නස්සො හුත්වා ධම්මං කථෙථා ති සද්ධම්මස්සත්ථාය ජීවිතං පරිච්චජිත්වා ආකාසතො උප්පතිත්වා “ධම්මං කථෙථා”ති ආහ. අථ සක්කො දෙවරාජා සකභාවෙන[15] සබ්බාලඞ්කා–රෙහි පතිමණ්ඩිතො අතිවිය සොමනස්සප්පත්තො තං ආකාසතො පතන්තං දිබ්බප්ඵුසෙන[16] පරාමසන්තො උරෙන පතිගණ්හිත්වා දෙවලොකං නෙත්වා පණ්ඩුකම්බල—සිලාසනෙ නිසීදාපෙත්වා මාලාගන්ධාදීහි පූජෙත්වා ධම්මසොණ්ඩකමහා–රාජස්ස ධම්මං දෙසෙන්තො ඉමං ගාථමාහ:

අනිච්චා වත සංඛාරා, උප්පාද–වය–ධම්මිනො;
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති; තෙසං වූපසමො සුඛො ති.

---

11. බී 2. “මය්හං මංසපටිලාභො” නත්ථි. 12. බී 1. බී 2. පොත්ථකෙසු නත්ථි.
13. බී 2. අදින්නාදානා. 14. බී 2. මාහිංසකා. 15. බී 2. සක්කභාවෙන.
16. බි 2. පොත්ථකෙ නත්ථි. 17. දිබ්බඵස්සෙනා ති භවිතබ්බං.

තත්‍ථ, **අනිච්චා වත සංඛාරා** ති මහාරාජ, සඞ්ඛත-සඞ්ඛාරා පි එකන්තෙන අනිච්චා ති ගණ්හථ. **උප්පාද-වය-ධම්මිනො** ති ඉමිනා අභිසඞ්ඛතසඞ්ඛාරා පි අනිච්චා ති ගහෙතබ්බා. **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** ති ඉමිනා අනභිසඞ්ඛතසංඛාරා පි අනිච්චා ති **ගහෙතබ්බා**. **තෙසං වූපසමො සුඛො** ති, තෙසං තිණ්ණම්පි සඞ්ඛාරානං වූපසමසංඛාතො නිරොධො නිබ්බානං සුඛොති ගහෙතබ්බො. අථවා, **අනිච්චා වත සංඛාරා** ති එතෙන කායසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. උප්පාදවයධම්මිනොති එතෙන වචීසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** ති එතෙන චිත්තසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **තෙසං වූපසමො සුඛො** ති එතෙන අසංඛත-නිබ්බානං පකාසිතං හොති. අථවා, **අනිච්චා වත සංඛාරා** ති එතෙන පුඤ්ඤාභිසංඛාරානං අනිච්චතා පකාසිතා හොති. **උප්පාද-වය-ධම්මිනො** ති එතෙන අපුඤ්ඤාභිසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** ති එතෙන ආනෙඤ්ජාභිසංඛාරානං අනිච්චතා පකාසිතා හොති. [**තෙසං වූපසමො සුඛො ති** එතෙන තෙසං[18] තිවිධ-සංඛාරානං වූපසමසඞ්ඛාතො නිරොධො නිබ්බානං සුඛොති වුච්චති. අථවා **අනිච්චා වත සංඛාරාති** එතෙන අතීතසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **උප්පාද-වය-ධම්මිනො** ති එතෙන වත්තමානසංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** ති එතෙන අනාගත-සංඛාරානං අනිච්චභාවො පකාසිතො හොති. **තෙසං වූපසමො සුඛොති** එතෙන කාලවිමුත්තං නිස්සරණං නිබ්බානං දස්සිතං හොති. අථවා **අනිච්චා වත සංඛාරා** ති එතෙන සබ්බෙසම්පි සංඛාරානං අනිච්චතා පකාසිතා හොති. කස්මා උප්පාද-වය-ධම්මිනො? යස්මා උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තස්මා උප්පාද-වය-ධම්මිනො. තෙසං උප්පාද-වයප්පත්තානං ධම්මානං අනුප්පාදන-සංඛාතො ධුවො දස්සිතො. අථවා **අනිච්චා වත සංඛාරා** ති

18. අයං පාඨො බි 2. පොත්ථකෙ නත්ථි.

එතෙන උග්ඝටිතඤ්ඤුතං වුත්තං. **උප්පාද-වය-ධම්මිනො** ති එතෙන විපඤ්චිතඤ්ඤුතං වුත්තං **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති** ති එතෙන පදපරමෙය්‍යපුග්ගලං වුත්තන්ති වෙදිතබ්බං. එවං සක්කො ධම්මසොණ්ඩක-මහාරාජස්ස ධම්මං දෙසෙත්වා දෙවලොකසම්පත්තිං දස්සෙත්වා දෙවලොකතො ආනෙත්වා සකරජ්ජෙ පතිට්ඨාපෙත්වා අප්පමත්තො[19] හොහී ති ඔවදිත්වා දෙවලොකමෙව අගමාසි ති.

**ධම්මසොණ්ඩකවත්ථු පඨමං**

---

## 2. මිගපොතක වත්ථු

උද්දලොලකවිහාරෙ ධම්මසවණඝොසිතසද්දං සුත්වා නිමිත්තං ගණ්හිතමිගස්ස වත්ථුම්හි[1] අත්ථුප්පත්ති.

උද්දලොලකවිහාරවනෙ නෙසාදමනුස්සා මිගානං කොට්ඨකං බන්ධිත්වා මිගානං විජ්ඣනත්ථාය[2] අට්ඨාසි. එකො මිගො ගොචරං ගණ්හිත්වා පානීයත්ථාය තිත්ථං ගච්ඡන්තො ධම්මසවණඝොසිතසද්දං සුත්වා ධම්මස්සවණසද්දෙසු නිමිත්තං ගණ්හිත්වා උක්ඛිත්තපාදං අනික්ඛිපන්තො අට්ඨාසි. තස්මිං කාලෙ නෙසාදමනුස්සා මිගකොට්ඨකෙ ඨිතො තං මිගං විජ්ඣි. සො කාලකිරියං කත්වා උද්දලොලකවාසිමහාභය ථෙරස්ස කණිට්ඨ-භගිනියා කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හි. සො මාතුකුච්ඡිතො නික්ඛමිත්වා සත්තවස්සිකකාලෙ මාතුලථෙරස්ස සන්තිකෙ පබ්බජිත්වා ඛුරග්ගෙ යෙව අරහත්තං පාපුණිත්වා මාතුලථෙරස්ස සන්තිකං ගන්ත්වා මාතුලථෙරං වන්දං[3] හත්ථෙන පරිමජ්ජන්තං අද්දස. ථෙරො සාමණෙරං දිස්වා "එතං රක්ඛිතුං වට්ටති සාමණෙරා" ති ආහ. සාමණෙරො ථෙරෙන කථිතං සුත්වා වන්දසහස්සං ආහරිත්වා ථෙරස්ස දස්සෙත්වා "භන්තෙ වන්දසහස්සං ආහරිතුං සමත්ථො කස්මා එකං වන්දං[4]

---

19. (සබ්බෙසු) අප්පමාදෙන. 1. බී 2 මිගවත්ථුම්හි. 2. බී 2. විජ්ඣනත්ථාය. 3. (සබ්බෙසු.) මාතුලථෙරස්ස චරණං. 4. (සබ්බෙසු) චරණං.

ආහරන්තස්ස පාකටං කරිස්සතී" ති? ආහ. ථෙරො පුන දිවසෙ අත්තනො භගිනියා ගෙහං ගච්ඡන්තො තිංසසහස්සමත්තං භික්ඛුසංඝං ගහෙත්වා අගමාසි. භගිනියා පි ද්වින්නං මාතුලභාගිනෙය්‍යානං අත්ථාය ද්වෙ ආසනානි පඤ්ඤත්තානි. ද්වින්නං අත්ථාය යාගුභත්තඤ්ච සම්පාදිතං. තස්සානුභාවෙන අනන්තරඛජ්ජකඤ්ච[5] භත්තඤ්ච ආසනඤ්ච සබ්බෙසං තිංසසහස්සානං පහොනකං අහොසි. සාමණෙරො භුත්තානුමොදනං මඞ්ගලං වඩ්ඪෙන්තො ධම්මං දෙසෙසි. මාතාපිතූනං ආදිං කත්වා පඤ්චකුලසතානි සොතාපන්නානි අහෙසුං. බහූනං ධම්මදෙසනා සාත්ථිකා අහොසී ති.

**මිගපොතකවත්ථු දුතියං.**

---

## 3. ධම්මසුතඋපාසිකාය වත්ථු

මහාගාමෙ රාජවිහාරස්මිං ධම්මසවණසුතඋපාසිකාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

**එකා** මහාගාමවාසී උපාසිකා රාජමහාවිහාරෙ මණි-චෙතියගෙහද්වාරෙ ධම්මං සුණමානා අත්තනා පත්ථෙත්වා ලද්ධං **එකපුත්තකං**[1] ආසිවිසෙන ඩසන්තං දිස්වා ධම්ම-සවණස්ස අන්තරායං මා හොතූ ති වත්වා සයඤ්ච න[2] නිවාරෙසි, අඤ්ඤස්සඤ්ච න දස්සෙසි. පච්ඡා ධම්මසවණ-නිට්ඨිතකාලෙ[3] විසවෙගෙන විසඤ්ඤීභූතස්ස දාරකස්ස සන්තිකං ගන්ත්වා "යෙන ආකාරෙන ධම්මසවණස්ස අන්ත-රායමකත්වා එකපදම්පි අවිනාසෙත්වා අස්සොසිං, එතෙන සච්චෙන නිබ්බිසො ජීවතු මම පුත්තො"ති සච්චකිරියං කත්වා පුත්තස්ස ජීවිතං අරොගං කත්වා තෙනෙව සොම-නස්සෙන පච්ඡා චවිත්වා සග්ගෙ නිබ්බත්තා ති වදන්ති.

**ධම්මසුතඋපාසිකාය වත්ථු තතියං.**

---

5. බී 2. අනන්තරං— 1. බී 1. බී 2. ලද්ධපුත්තකං. 2. කෝ. බී 1. පොත්ථකෙසු නකාරො නත්ථි, 3. කෝ. ධම්මසවණං නිට්ඨිත — 1. බී 2, — පුරක්ඛිතං.

## 4. සද්ධම්මසවණ-මිගලුද්දකස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

ඉතො එකතිංසකප්පමත්ථකෙ සිඛී නාම සම්මාසම්බුද්ධො ලොකෙ උප්පජ්ජිත්වා අරඤ්ඤායතනෙ දෙවතානං චතුසච්ච-පටිසංයුත්තං කත්වා ධම්මං දෙසෙසි. තං එකො මිගලුද්දකො ආසන්නට්ඨානෙ ඨත්වා ධම්මං සුත්වා චිත්තං පසාදෙත්වා චවිත්වා දෙවලොකෙ නිබ්බත්තිත්වා එකතිංසකප්පෙ දුග්ගතියං අනිබ්බත්තිත්වා සුගතියං යෙව දෙවමනුස්ස-සම්පත්තිං අනු-භවන්තො ඉමස්මිං බුද්ධුප්පදෙ පබ්බජිත්වා චතුසච්චපටිසං-යුත්තවචනං සුත්වා චතුපටිසම්භිදාහි අරහත්තං පාපුණිත්වා උදානං උදානෙන්තො ඉමා ගාථා අභාසි:

මිගලුද්දකො පුරෙ ආසිං අරඤ්ඤෙ විවිත්තායතනෙ
අද්දසං විරජං බුද්ධං දෙවසංඝපුරක්ඛතං[1]

චතුසච්චං පකාසෙන්තං[2] නිබ්බුතං අමතං පදං,
අස්සොසිං මධුරං ධම්මං සිඛිනො ලොකසාමිනො.[3]

ඝොසෙ චිත්තං පසාදෙසිං අසමං අප්පටිපුග්ගලං
තත්ථ චිත්තං පසාදෙත්වා අතරිං දුත්තරං භවන්ති.

**මිගලුද්දකස්ස වත්ථු චතුත්ථං**

---

## 5. භුජගවිනාසිත වත්ථු

මහාවාසවිහාරෙ අරියවංසධම්මදෙසනං සවණත්ථාය ගතමග්ගෙ මහාථෙරස්ස භුජගෙන දට්ඨවත්ථුම්හි අත්ථුප්පත්ති.

මහාවාසවිහාරෙ අරියවංස - ධම්මදෙසනාකථනකාලෙ කණ්ඩරජ්ජවාසී[1] එකො මහාථෙරො ධම්මං සොස්සාමී ති වත්වා ගන්ත්වා අත්තනො නිසීදනඔකාසං අලභිත්වා පරිස-පරියන්තෙ එකස්මිං තිණගුම්බෙ අට්ඨාසි. තත්ථ ඨත්වා ධම්මං

1. බී 2. පුරක්ඛිතං 2. බී 2. පකාසන්තං. 3. බී 2. බී1. ලොකනායකො.
4. බී 2. අතානි උත්තරං. 1. ඊ. කණ්ඩජ්ජෙ වාසී.

සුණමානස්ස එකො භුජගො තිණගුම්බතො නික්ඛමිත්වා පාදන්තරෙනාරුය්හිත්වා චත්තාරො දාඨා පාපෙත්වා නිසීදනපස්සෙ ඩසි. ථෙරො ධම්මස්සවණන්තරායො මා හොතූති චින්තෙත්වා හත්ථං ඔතාරෙත්වා භුජගස්ස සීසං දළ්හං ගහෙත්වා උපාහනත්ථවිකාය පක්ඛිපිත්වා මුඛබන්ධනං[2] බන්ධිත්වා එකපස්සෙ ඨපෙත්වා ධම්මං අස්සොසි. ධම්මස්සවණානුභාවෙන දට්ඨට්ඨානතො විසං න උග්ගතං. ධම්මස්සවණෙන[3] අරුණෙ උග්ගච්ඡන්තෙ මනුස්සානං ච ගතකාලෙ "මහාභුජගො[4] මයා ගහිතො" ති භුජගං දස්සෙසි. භික්ඛූ "කතරවෙලාය අයං භුජගො තයා ගහිතො"ති ආහංසු. නිදානකථනකාලෙ යෙව අයං භුජගො මයා ගහිතො ති ආහ. භික්ඛූ "අච්ඡරියං ආවුසො එවරූපං ආසිවිසං ගහෙත්වා ධම්මදෙසනාය අනන්තරායස්ස අකරණං"ති ආහංසු. "සචෙ ආවුසො න සද්දහථ, අහං භුජගෙන දට්ඨකාලතො පට්ඨාය අවික්ඛිත්තචිත්තො හුත්වා එකපදම්පි අවිනාසෙත්වා ධම්මං අස්සොසිං. එතෙන සච්චෙන විසං විනස්සතූ" ති සච්චකිරියං අකාසි. තං ඛණඤ්ඤෙව විසං පථවිං පාවිසි. ධම්මස්සවණං[5] එවං මහානිසංසං මහප්ඵලං සබ්බසත්තානං විසඝාතකමහාඅගදං හොතී ති ඔසධානං සමසංඛාතං විසඝාතං මහාඅගදං.

**භුජගවිසනාසිත වත්ථු පඤ්චමං.**

---

## 6. ආවාටතො නීහටවත්ථු

ආවාටෙ තිණ්ණං ජනානං නිපාතනවත්ථුම්හි අත්ථුප්පත්ති.

එකස්මිං අරඤ්ඤායතනෙ මහානිදාඝසමයෙ සූරියසන්තාපෙන නදී-කන්දර-නිජ්ඣර-සොණ්ඩිකාදීසු උදකෙ පරික්ඛීණෙ නිදාඝවෙගෙන ගච්ඡතිණගුම්බාදීසු අතිවිය මිලායන්තෙසු සකුණකෙසු[1] එකො සුවපොතකො පානීයපිපා-

---

2. බී 2. මුඛ බන්ධං. 3 කෝ ධම්මසවණානන්තරෙ. 4. රා. අයං භුජගො. 5. බී 1. රා. කෝ. ධම්මසවණෙ. 1. බී 1. රා. කෝ. සකුණිකෙසු.

සිතො පානීයං ගවෙසන්තො එකස්මිං සට්ඨිරතන – නරක පපාතෙ පානීයගන්ධං ඝායිත්වා පානීයං පිවිතුං පවිට්ඨො. සො තත්ථ පතිත්වා තතො උග්ගන්තුං නාසක්ඛි. එකො සප්පොපි එවමෙව තස්මිං පතිතො යෙව. එකො මනුස්සොපි තස්මිං පතිතො යෙව. එතෙ තයොපි තතො උග්ගන්තුං අසමත්ථා අඤ්ඤමඤ්ඤං අවිහෙඨෙත්වා මෙත්තචිත්තා හුත්වා මරණභයෙන තජ්ජිතා තයොපි ජනා එකතො හුත්වා තස්මිං යෙව වසිංසු. අථ අපරො මනුස්සො පානීයත්ථාය තං වනං පත්තො තෙ තයො දිස්වා වල්ලිං ආහරිත්වා තත්ථ පසිබ්බකං කත්වා ආවාටමුඛං පපොජෙත්වා පසිබ්බකං ඔතාරෙත්වා තෙ තයොපි තතො උද්ධරි. තෙ තයොපි "ඉමිනා පුරිසෙන අම්හාකං ජීවිතං දින්න"න්ති සොමනස්සා හුත්වා අත්තනො අත්තනො වසනට්ඨානානි තස්ස ආචික්ඛිංසු. සුවපොතකො "බාරාණසීනගරෙ දක්ඛිණද්වාරෙ මහන්තං නිග්‍රොධං අත්ථි, තත්ථ අහං වසාමි; තව කිච්චෙ උප්පන්නෙ මම සන්තිකං ආගච්ඡාහී"ති වත්වා පක්කාමි. සප්පො පි "තස්සෙව නිග්‍රො-ධස්ස අවිදූරෙ මහන්තං එකං වම්මිකං අත්ථි, තත්ථාහං වසාමි. තව කිච්චෙ උප්පන්නෙ මම සන්තිකං ආගන්ත්වා දීඝාති[2] වත්වා පක්කොසාහී"ති වත්වා පක්කාමි. මනුස්සො පි "බාරාණසීනගරෙ දක්ඛිණද්වාරසමීපෙ අසුකවීථියං නාම අසුකගෙහෙ වසාමි; තව කිච්චෙ උප්පන්නෙ මම සන්තිකං ආගච්ඡහී"ති වත්වා පක්කාමි.[3]

අථ අපරභාගෙ තෙසං උපකාරක-මනුස්සො අත්තනො කිච්චෙ උප්පන්නෙ මම සහායකානං සන්තිකං ගච්ඡාමී ති තෙසං සන්තිකං ගන්ත්වා බාරාණසීනගරෙ දක්ඛිණද්වාරෙ නිග්‍රොධමූලෙ ඨත්වා සුවපොතකස්ස සද්දමකාසි. සුවපොතකො තං සද්දං සුත්වා වෙගෙන ගන්ත්වා තෙන සද්ධිං පටිසම්මො-දිත්වා "කිමත්ථාය ආගතොසී" ති ආහ. "ජීවිතුං අසක්කො-න්තො දූරකෙ ඤාතකානං පටියාදෙත්වා තව සන්තිකං

2. කි 2 රා. මං දීඝාති 3. 'මනුස්සො' ති වචනතො යාව 'පක්කාමී'ති කි 2. පොත්ථකෙ න විජ්ජන්ති.

ආගතොම්හී" ති ආහ. සුවපොතකො තෙන හි තිට්ඨාහී ති[4] වත්වා තස්ස ජීවිතූපායං පරියෙසන්තො පක්කාමි. තස්මිං කාලෙ බාරාණසිරාජා සුසජ්ජිතඋය්‍යානෙ කීළිත්වා මජ්ඣන්තිකසමයෙ පවපදුමසංඡන්නං මධුරොදකසම්පුණ්ණං සීතලං සුගන්ධං මනොරමං මඞ්ගලපොක්ඛරණිං දිස්වා නහායිතුකාමො හුත්වා සබ්බාභරණානි ඔමුඤ්චිත්වා රාජපුරිසෙ පතිට්ඨාපෙත්වා නහායිතුං පවිට්ඨො. තදා සුවපොතකො තං ඛණං උප්පතිත්වා සාඛන්තරෙ නිලීයිත්වා රාජපුරිසානං පමාදක්ඛණෙ[5] රඤ්ඤො මුත්තාහාරං ගහෙත්වා ආකාසං පක්ඛන්දිත්වා සීඝං වෙගෙන ගන්ත්වා මුත්තාහාරං තස්ස පුරිසස්ස දත්වා "අප්පමත්තො ඉමං වලඤ්ජාහී" ති ආහ. සො පුරිසො මුත්තාහාරං ගහෙත්වා අනන්තනගරෙ ආවාට්ටතො නීහටස්ස අත්තනො සහායකමනුස්සස්ස සන්තිකං ගන්ත්වා ඉමං මුත්තාහාරං[6] මම සහායසුවපොතකෙන දින්නං. ඉමං ධනං සාධුකං රක්ඛාහී" ති වත්වා තස්ස අදාසි.

තස්මිං කාලෙ රාජා සීසං නහායිත්වා අලඞ්කරොන්තො[7] මුත්තාහාරං අදිස්වා නගරෙ භෙරිඤ්චරාපෙසි: "යො මුත්තාහාරං පස්සති, තස්ස රාජා මහන්තං සක්කාරසම්මානං කරිස්සතී" ති, සො මිත්තද්දුභී[8] පුරිසො භෙරියා ආණං සුත්වා ඉමං පුරිසඤ්ච මුත්තාහාරඤ්ච රඤ්ඤො දස්සෙත්වා සුඛෙන ජීවිස්සාමී ති අත්තනො කතූපකාරං අසල්ලක්ඛෙත්වා තස්ස පුරිසස්ස මුත්තාහාරං අත්තනො සන්තිකං ඨපිතභාවං කථෙසි. රාජපුරිසා තං පුරිසඤ්ච මුත්තාහාරඤ්ච ගහෙත්වා රඤ්ඤො දස්සෙසුං. රාජා තෙන ගහිතභාවං සුත්වා ඉමං[9] දක්ඛිණද්වාරෙ ජීවසූලෙ උත්තාසෙථාති[10] පයොජෙසි. තං ගහෙත්වා මාරෙතුං අගමංසු. සො මාරෙතුං නීයමානො වම්මිකසන්තිකං ගතකාලෙ නාගරාජස්ස සද්දං අකාසි. තං සුත්වාව නික්ඛමිත්වා තං පවත්තිං ඤත්වා එතං අස්සාසෙත්වා මුහුත්තං න මාරෙථා ති වත්වා සීඝං ගන්ත්වා රඤ්ඤො අග්ගමහෙසියා

4. බී 2. තිට්ඨාහි. 5. 2. මහාදක්ඛිණෙ. 6. තස්ස පුරිසස්සාති ආදිං කත්වා යාව මුත්තාහාරං බී 2. පොත්ථකෙ න විජ්ජන්ති. 7. ර. බී 2 අලඞ්කාරෙන්තො. 8. බී 2 මිත්තදූබ්භි. 9. බී 2. ඉමස්ස 10. බී 2. උත්තාපෙථාති.

ඩසිත්වා සකලසරීරෙ විසවෙගං උට්ඨාපෙත්වා අත්තානං විජ-හිත්වා තස්ස මනුස්සස්ස සහායකස්ස මුඤ්ඩවකො හුත්වා රාජානං එතදවොච "මහාරාජ, එසො මාරෙතුං පයුත්තක-පුරිසො[11] විසවෙජ්ජං[12] ජානාති. සො තං ඛණඤ්ඤෙව ඉමං උට්ඨා-පෙස්සති" ති. රාජා තං ආහරාපෙත්වා "එතං තිකිච්ඡාහී" ති ආහ. නාගරාජා තස්ස මනුස්සස්ස ආකාරෙන ජානාපෙසි. සො තං ජනිත්වා නාගරාජස්ස ගුණං ආවජ්ජිත්වා උදකෙන පහරිත්වා දෙවියා තිකිච්ඡං අකාසි. සා සුඛිතා ආරොගා වුට්ඨාසි. තං දිස්වා තස්ස පුරිසස්ස ගාම - නිගම - යාන - වාහනාදීනි දත්වා මහන්තං සක්කාරසම්මානං අකාසි. සො පුරිසො "මම ගෙහං නිග්‍රොධරුක්ඛස්ස ච වම්මිකස්ස ච අන්තරෙ කරොථා" ති ආහ. රාජා තත්ථ ගෙහං කත්වා මහන්තං සක්කාරසම්මානං කත්වා තත්ථ වාසෙසි. තෙ තයො[13] යාවජීවං මෙත්තං අභින්දිත්වා සුඛෙන වසිත්වා ආයුපරියොසානෙ යථාකම්මං ගතා. තිරච්ඡානගතා එවං කතඤ්ඤූ කතවෙදිනො, භවන්ති; මනුස්සා ච ඛො අක-තඤ්ඤූ දුබ්බුද්ධිනො ති.

ආචාමතො නීහටවත්ථු ඡට්ඨං

---

# 7. බුද්ධනියා වත්ථුම්හි[1] අත්ථුප්පත්ති

පාටලීපුත්තනගරෙ එකා සෙට්ඨිධීතා බුද්ධිනීනාමිකා[2] දානාභිරතා බුද්ධෙ මමායිකා සීලාචාරගුණූපෙතා ධම්මචාරිනී ච හොති. සා ඉතො එකතිංසකප්පමත්ථකෙ සිඛී නාම සම්මාසම්බුද්ධෙ චිත්තං පසාදෙත්වා චවිත්වා දෙවලොකෙ නිබ්බත්තිත්වා එකතිංසකප්පෙ දුග්ගතියං අනිබ්බත්තිත්වා සුග-තියං යෙව දෙවමනුස්සසම්පත්තිං අනුභවන්තී[3] ඉමස්මිං බුද්ධුප්පාදෙ පාටලිපුත්තනගරෙ සෙට්ඨිධීතා අහොසි. තස්සා ගුණකථා ජම්බුදීපතලෙ පත්ථරි. අථ අපරභාගෙ රාජා මාතාපිතූනං සන්තිකෙ දූතං පාහෙසි.

11. සී. 2. අයුත්තක පුරිසො. 12. සී 2. විසවිජ්ජං. 13. ර. සී. 1 තෙන සො. 1. කේ. බුද්ධ නියාමක. 2. කේ. බුද්ධ නියාමකා. 3 ඒ. කේ. සී 2 අනුභවන්තා.

සා පන "යදා මමන්තරායො උප්පජ්ජිස්සති, තදා මම සරණං භවිස්සතී" ති එකං අස්සසින්ධවං පොසෙසි. මාතාපිතරො පුත්තපපුත්තං ධීතරං යාචිංසු. සා බුද්ධෙ නිය්‍යාදින්නත්තා කාමානං ආදීනවභූතත්තා ච තං කිරියං න ඉච්ඡි. රාජා පන එතාය ආචාරසම්පන්නාය දානසීලභාවනාරාමෙන මෙත්තාබලෙන විනෙසි. : "ඉමාහං නිස්සාය බුද්ධසාසනෙ දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථං උපවසිත්වා දෙවලොකෙ නිබ්බත්තිස්සාමී" ති. තතො රාජා කෙන නු ඛො උපායෙන එතං ආනෙමී ති රාජපුරිසෙ පයොජෙති. රඤ්ඤා පයොජිත-පුරිසා චොරකම්මෙන ඉමං ආනෙස්සාමාති චින්තෙන්තා පාටලිපුත්තනගරං ආගමිංසු. සෙට්ඨිධීතා තස්මිං කාලෙ ධම්මරක්ඛිතථෙරං "කිං කරොමී" ති ආහ. රඤ්ඤා පයොජිතපුරිසා චොරා නගරාසන්නෙ පුචිමන්දවනෙ අට්ඨංසු. ධම්මරක්ඛිතථෙරො ඉමිස්සා මාලං පූජෙත්වා ගමනකාලෙ "තුය්හං ගමනමග්ගෙන මහාපුචිමන්දවනං සම්පත්තකාලෙ වෙගෙන ගච්ඡාහී" ති ආහ. සා ගච්ඡන්තී පුචිමන්දවනං සම්පත්තකාලෙ ගාමදාරිකා අස්සස්ස පණ්හිසඤ්ඤං දත්වා අස්සං ආකාසං ලංඝාපෙසි. චොරා සමන්තතො ධාවිත්වා වෙගෙන අනුබන්ධිංසු. අස්සො වෙගං ජනෙත්වා ධාවති. චොරා එතං දිස්වා වෙගෙන ධාවිංසු. තතො පි ලංඝි. සා අස්සපිට්ඨිතො පතිත්වා අස්සං එවමාහ. "තාත, එත්තකං කාලං පොසෙන්තී එවරූපෙ ඨානෙ උප්පන්නෙ භයෙ මම පටිසරණං භවිස්සතී ති තං පොසෙසිං; ත්වං කින්නාම පුත්ත එවං කරොසී" ති. සො තං සුත්වා නිවත්තිත්වා ඔලොකෙත්වා වෙගෙන ආගන්ත්වා පිට්ඨියං නිසීදාපෙත්වා ආකාසෙන ගන්ත්වා සකට්ඨානෙ යෙව පතිට්ඨාපෙසි. සා සත්තාසීතිකොටිධනං බුද්ධසාසනෙ දානං දත්වා චවිත්වා දෙවලොකෙ නිබ්බත්තී ති.

**බුද්ධෙනිය්‍යාමක වත්ථු සත්තමං**

---

# 8. ආරක්ඛික-මහාඅභයත්ථෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

මහාවාලිකවිහාරවාසී ආරක්ඛික-මහාඅභයත්ථෙරො නාම. සො එකස්ස නගරස්ස ආසන්නට්ඨානෙ වාසං කප්පෙති. තමෙකො කුලපුත්තො ථෙරං ද්වාදසවස්සානි පටිජග්ගි. සො ථෙරස්ස චීවරසාටකං අදාසි. උපාසකස්ස දින්නං දින්නං සාටකං ඉමස්සෙව අනන්තරභිත්තිගෙහෙ **අරති**[1] නාම එකො චොරො දින්නං සබ්බං වත්ථං රත්තියං ගන්ත්වා ආහරති. අථෙකදිවසං කුලපුත්තො ථෙරස්ස චීවරසාටකං දත්වා එවං චින්තෙසි: "ඉමිනා සද්ධිං සත්තවාරෙ ඉමස්ස ථෙරස්ස චීවරසාටකං අදාසිං; සො තෙන චීවරං කත්වා න නිවාසෙති, අඤ්ඤස්ස දත්තම්පි න පඤ්ඤායති ඉමං කාරණං ජානිස්සාමී" ති. පුන ථෙරස්ස චීවරසාටකං දත්වා රත්තිභාගෙ ආවුධං ගහෙත්වා මග්ගං රක්ඛන්තො අට්ඨාසි. පුන චොරො තස්ස රක්ඛනභාවං අජානිත්වා ගන්ත්වා ථෙරස්ස දින්නං චීවරසාටකං ගහෙත්වා තෙනෙව මග්ගෙනාගච්ඡති. උපාසකො චොරං දිස්වා වෙගෙනාගන්ත්වා චොරං චූළෙ ගහෙත්වා "එත්තකං කාලං මයා දින්නං චීවරසාටකං ගණ්හාසී" ති ආහ. එවං සාමී, එත්තකං කාලං අහමෙව සබ්බං ගණ්හාමී" ති ආහ. උපාසකො තස්ස හත්ථතො චීවරසාටකං ගහෙත්වා අනෙකප්පකාරෙන කොට්ටෙත්වා දුබ්බලං කත්වා ආමකසුසානං ගන්ත්වා අඤ්ඤං මතකමනුස්සං හත්ථතො හත්ථං පාදතො පාදං පිට්ඨිතො පිට්ඨිං ආමොචනං කත්වා තස්ස පිට්ඨියං දළ්හං බන්ධිත්වා තං විස්සජ්ජෙත්වා පුරිමතරං අත්තනො ගාමං ගන්ත්වා "භො ගාමවාසිනො තුම්හෙ ජානාථ, අජ්ජ රත්තිං එකො අමනුස්සො ආගච්ඡිස්සති; සො තුම්හාකං විනාසං කරිස්සති; තුම්හෙ ගෙහද්වාරානි පිධාය තෙන සද්ධිං අභණිත්වා ද්වාරං අවිවරිත්වා අප්පමත්තා හොථා" ති උග්ඝොසෙසි. ගාමවාසිනො තථා අකංසු. සො චොරො මත-

1. රසවා. හරන්තිසො.

මනුස්සෙන[2] සද්ධිං එකාබද්ධො හුත්වා අත්තනො ගෙහද්වාරං ගන්ත්වා භරියං ආමන්තෙත්වා අනෙකප්පකාරෙන යාචිත්වාපි ද්වාරං විවරාපෙතුං අසක්කොන්තො මාතාපිතූනම්පි සබ්බසංඤාතකානම්පි ගෙහද්වාරං ගන්ත්වා අවිවරිත්වා සහායස්සපි ගෙහද්වාරං ගතො. ගතගත-ගෙහෙව යක්ඛො ආගතො ති සඤ්ඤාය ද්වාරං න විවරිංසු. සො සකලගාමෙ ආහිණ්ඩිත්වා අඤ්ඤත්‍ර පටිසරණං අලභන්තො ථෙරස්සෙව පටිසරණං කත්වා ථෙරස්ස සන්තිකං ගන්ත්වා "ඉමං දුක්ඛා[3] මොචෙත්වා මං සුඛිං[4] කරොථා" ති ආහ. ථෙරො තං දිස්වා කරුණාය කම්පමානො මතමනුස්සං මොචෙත්වා දූරෙ ඨපෙත්වා තං උණ්හොදකෙන නහාපෙත්වා තෙලනාළිකෙන සකලසරීරෙ තෙලං අබ්භඤ්ජිත්වා තස්ස ආකොටිතට්ඨානං සම්බාහන්තො නිසීදි. සො මහාඋපාසකො චොරො කහං ගතො ති චින්තෙන්තො ථෙරස්ස සන්තිකං ගන්ත්වා ථෙරෙන තස්ස පටිජග්ගනාකාරං දිස්වා "භන්තෙ එවරූපස්ස මිත්තදූබ්භිනො කස්මා එවං කරොථා" ති ආහ. ථෙරො මහාඋපාසක, ඉමස්ස මිත්තදුබ්භිනො තව චිත්තං මුදුකං කරොමී ති වත්වා ඉමං ගාථමාහ:

උදබින්දුනිපාතෙන[5] උදකුම්භොපි පූරති;
පූරති බාලො පාපස්ස ථොක ථොකම්පි ආචිනං ති.

ඔවදිත්වා තං පෙසෙසි. චොරො ථෙරස්සෙව සන්තිකෙ පබ්බජිත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්තො ති.

චොරභාවං ජහිත්වාන උප්පන්නෙනාපි ච පච්චයෙ
අප්පිච්ඡාගුණ-සම්පන්නො සාසනෙ හොත' චොරකො ති.

අභයත්ථෙරස්ස වත්ථු අට්ඨමං.

---

2. බි. 2. අමනුස්සෙන. 3. (සබ්බෙසු) ඉමං දුක්ඛං.
4. බි 2. සුඛං 5. බි 2. උදකබින්දු —

# 9. මිච්ඡාදිට්ඨිකස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති

කස්සපසම්මාසම්බුද්ධස්ස පරිනිබ්බුතකාලෙ ධාතුං නිධෙත්වා මහන්තං පූජාසක්කාරං අකංසු. තදා එකො අහිගුණ්ඨිකො සප්පං කීළාපෙත්වා ආහිණ්ඩමානො එකස්මිං ගාමෙ රත්තිභාගෙ නිවාසං ගහෙත්වා ඛාදනීය – භොජනීයාදීහි සන්තප්පිතො එකස්මිං ඨානෙ නිසීදි. ගාමවාසී මනුස්සා රත්තිභාගෙ සයනකාලෙ "නමො බුද්ධස්ස, නමො ධම්මස්ස, නමො සංඝස්සා"ති වත්වා සජ්ඣායිංසු. සො අහිගුණ්ඨිකො තිණ්ණං රතනානං ගුණං අජානනභාවෙන ගාමවාසීනං කථං සුත්වා සයම්පි නමො බුධස්සාති පරිහාසකෙළිං කත්වා කථෙසි. පුනදිවසෙ අත්තනො කීළාපනසප්පං ඔලොකෙන්තො එකං නාගරාජං කස්සපබුද්ධස්ස ථූපෙ පූජං කත්වා ආගන්ත්වා වම්මිකං පවිසිත්වා නිපන්නං අහිගුණ්ඨිකො දිස්වා මන්තං පරිවත්තෙසි. සො නාගරාජා මන්තං සුත්වා කුද්ධො නික්ඛමිත්වා තං මාරෙතුකාමො හුත්වා අනුබන්ධි. සො අහිගුණ්ඨිකො මරණභයෙන පලායන්තො එකස්මිං පාසාණෙ පක්ඛලිත්වා[1] භූමියං පතමානො සායණ්හකාලෙ ගාමවාසීහි "නමො බුද්ධස්සා"ති වුත්තවචනං අනුස්සරන්තො පටිසෙවනෙන නමො බුධස්සාති ආහ. නාගරාජා ඉමස්ස කථං සුත්වා තිණ්ණං රතනානං ගරුං කත්වා තං නමිත්වා තිණ්ණං රතනානං ගුණං තයො සුවණ්ණමාලෙන පූජෙතුං අස්ස අදාසි. "තෙසු එකං පුප්ඵං මය්හං පුඤ්ඤත්ථාය පූජෙහි, එකං තව පුඤ්ඤත්ථාය පූජෙහි, එකං වික්කිණිත්වා සුඛෙන ජීවාහී"ති ආහ. සො මාලා ගහෙත්වා චෙතියස්ස සන්තිකං ගන්ත්වා අත්තනො ච නාගරාජස්ස ච අත්ථාය ථූපෙ ද්වෙ පූජෙසි. එකං වික්කිණිත්වා සතසහස්සං ලභිත්වා කපණද්ධික – වණිබ්බකානං දානං දදන්තො අහිගුණ්ඨිකකම්මං පහාය කුසලකම්මං පූරෙත්වා සග්ගගාමී අහොසි.

නිරවජ්ජානානං හදයං මුදුකං රතනත්තයෙ;
ගුණම්පි සො විජානාති; මනුස්සානං හි කා කථා ති.

**මිච්ඡාදිට්ඨිකස්ස වත්ථු නවමං.**

---

1. සී 2. මඛලිත්වා.

# 10. සරණත්ථෙරවත්ථුම්හි අත්ථුප්පත්ති

සාවත්ථියා මහානගරෙ **සුමනසෙට්ඨි** නාම අහොසි. තස්ස මාතුගාමො **සුජම්පති** නාම අහොසි. තෙසං එකො පුත්තො එකා ධීතා ච අහෙසුං. එතෙසං පන මාතාපිතරො කාලංකරොන්තා කණිට්ඨභගිනිං ජෙට්ඨභාතු හත්ථෙ ඨපෙත්වා කාලමකංසු. තතො කාලන්තරෙන භාතා පඨමං කණිට්ඨිකාය ආවාහං කත්වා පච්ඡා සයම්පි ආවාහමකාසි. සො කුලපුත්තො මාතු පිලන්ධනපසාධනං සබ්බං භගිනියා ච රුචියා භොගං දාස-දාසිං නිය්‍යාදෙසි. සා නචිරස්සෙව ගබ්භිනී හුත්වා අත්තනො සාමිකං ආමන්තෙත්වා "සාමි, මම භාතිකස්ස සන්තිකෙ වසිස්සාමී"ති නානප්පකාරෙන සාමිකං යාචි. සාමිකො නිප්පීළිතො නිවාරෙතුං අසක්කොන්තො උපකරණානි සජ්ජෙත්වා යානං සජ්ජෙත්වා මාතුගාමං යානෙ නිසීදාපෙත්වා භාතිකස්ස ගෙහං ගච්ඡන්තො ද්වාරන්තරෙ සත්ථාරං නගරං පවිසන්තං දිස්වා සත්ථාරං වන්දිංසු. සත්ථා තෙසං උපනිස්සයං දිස්වා සරණෙසු පතිට්ඨාපෙත්වා පඤ්චසීලං දත්වා "තුම්හාකං දුක්ඛස්ස උප්පන්නකාලෙ මං අනුස්සරෙය්‍යාථා"ති ආහ. සාමිකො භරියං ආදාය භාතු සන්තිකං ගන්ත්වා භාතුනො පටියාදෙත්වා "සම්මා මම භරියාය ජීවිතාරක්ඛං කරොථා"ති වත්වා සයං අත්තනො ගෙහං අගමාසි. සො භගිනියා පාදපරිචාරිකං පරියෙසන්තො අඤ්ඤං අදිස්වා භරියං පක්කොසාපෙත්වා "භද්දෙ අම්ම, භගිනියා වෙය්‍යාවච්චං කරොහී"ති වත්වා නිය්‍යාදෙසි. එතස්ස පන භරියා තස්ස කණිට්ඨිකාය වෙය්‍යාවච්චං කරොන්තී එතිස්සා අලංකාරපසාධනං දිස්වා ලොභං උප්පාදෙත්වා ආහාරුපච්ඡෙදං කත්වා ගිලානා විය සයි. තස්සා සාමිකො "කිං තුය්හං සරීරෙ අඵාසුකං? කිං කාතුං යුත්ත"න්ති? පටිපුච්ඡි. තව කණිට්ඨිකාය පිලන්ධනෙ ආසං කත්වා පඤ්චමධුරමංසං පත්ථෙමීති ආහ. තස්සා සාමිකො අත්තනො කණිට්ඨිකාය පඤ්චමධුරමංසං අත්තනො භරියාය අදාතුකාමො හුත්වා අත්තනො භරියං ආහ. "භද්දෙ, මනුස්සමාරණං නාම භාරියං" ති වත්වා

අනෙකපරියායෙන තං තතො නිවත්තෙතුං නාසක්ඛි. සො අත්තනො මාතුගාමස්ස අන්තරෙ කාමෙන බජ්ඣිත්වා අත්තනො කණිට්ඨකං මාරෙතුකාමො හුත්වා "එහි උභොපි මාතාපිතූනං දින්නං ඉණං ගණ්හාම; තුය්හඤ්ච මය්හඤ්ච පස්සිත්වා ඉණායිකා ඉණං දස්සන්තී"ති තං සුඛයානකෙ නිසීදාපෙත්වා නගරාසන්නෙ දූරං ගන්ත්වා යානං මග්ගතො ඔක්කමාපෙත්වා වනගහණං පවිසිත්වා කණිට්ඨකං මාරෙතුකාමො හුත්වා කණිට්ඨකං ජීවන්තමෙව මකුලෙ ගහෙත්වා සීසං ඡින්දිත්වා මාරෙස්සාමී ති චින්තෙත්වා මාරෙතුකාමො හුත්වා භූමියං පාතෙසි. තස්මිං සමයෙ කම්මජවාතා චලිංසු. සා භාතරං යාචන්තී තං අපනෙතුං අසක්කොන්තී භාතරං (මුඤ්චිස්සාමි?) මම පුත්තස්ස මුඛං ඔලොකෙත්වා තව භාගිණෙය්‍යස්ස සිනෙහෙන පි මං මා මාරෙහී ති යාචන්තියා පි මකුලෙ ගහෙත්වා ආකඩ්ඪන්තො අවිදූරෙ ඨානෙ නිග්‍රොධමූලෙ සීසං ඨපෙත්වා සීසං ඡින්දිතුං ආරභි. සා චින්තෙසි. සචාහං සද්දං මුඤ්චෙය්‍යං, අත්තනො සද්දෙන අඤ්ඤෙ ආගන්ත්වා මම භාතුනො අයං චොරො ති වත්වා [අඤ්ඤඤ්ඤං වධං ගන්ත්වා?] අනයං කරිස්සතී ති චින්තෙත්වා මම ජීවිතං චජිත්වා මම භාතුනො අනයං න කරොමී ති චින්තෙත්වා අත්තනා ගහිත-සරණං ආවජ්ජමානා අවිස්සජ්ජෙත්වා නිපජ්ජි. තස්සා එවං සයිත්වා[1] භාතුනො අන්තරෙ අත්තනො මෙත්තානුභාවෙන තස්මිං නිග්‍රොධෙ අධිවත්ථා දෙවතා "එවරූපෙ මාතුගාමෙ ඉමස්මිං රුක්ඛමූලෙ මාරිතෙ දෙවසමාගමං පවිසිතුං න ලභිස්සාමී"ති චින්තෙත්වා එතාය සාමිකො වීය හුත්වා තං තජ්ජෙත්වා පලාපෙත්වා තං යානෙ නිසීදාපෙත්වා දාරකෙන සද්ධිං තං දිවසමෙව සාවත්ථිං ගන්ත්වා අඤ්ඤතරනගරෙ එකිස්සාය සාලාය තං නිපජ්ජාපෙත්වා සයං අන්තරධායි. එකිස්සා පන සාමිකො නගරතො නික්ඛමන්තො එතං දිස්වා "ත්වං කෙන සද්ධිං ආගතාසී"ති පටිපුච්ඡි. සා "තයා සද්ධිං ආගතම්හී"ති ආහ. සො තුය්හං දිට්ඨකාලං උපාදාය අජ්ජ චත්තාරො මාසා අතික්කන්තා; එත්තකං කාලං මයා ත්වං න දිට්ඨපුබ්බා. තයා සද්ධිං නගරතො

1. සයිතාය ඉති යුත්තතරං

නාගතොම්හී ති ආහ. සා එතස්ස කථං සුත්වා තෙන හි ඉමං කාරණං මාතාපිතූනඤ්ච අඤ්ඤෙසඤ්ච මා කථෙහි; අප්පමත්තො හොතී ති වත්වා සබ්බං අත්තනො පවත්තිං සාමිකස්ස ආරොචෙසි. සාමිකො තං කථං සුත්වා හසප්පත්තො හුත්වා තං ගහෙත්වා අත්තනො ගෙහං ගන්ත්වා පුනදිවසෙ සත්ථාරං නිමන්තෙත්වා මහාදානං දත්වා සත්ථු සන්තිකෙ ගහිතසරණානුභාවෙන ජීවිතස්ස ලද්ධභාවං කථෙත්වා දාරකස්ස **සරණො** ති නාමං අකංසු. සත්ථා තෙසං අජ්ඣාසයං ඤත්වා ධම්මං දෙසෙසි. උභොපි සොතාපන්නා අහෙසුං. පුත්තො පි වීසතිවස්සකාලෙ බුද්ධසාසනෙ පබ්බජිත්වා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්තො **සරණත්ථෙරො** නාම අහොසී ති.

**සරණත්ථෙරවත්ථු දසමං**

**වග්ගො පඨමො.**

---

# 11. වෙස්සාමිත්තාය[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

කොසම්බියනගරෙ රඤ්ඤො මාතුගාමො වෙස්සාමිත්තා නාම රඤ්ඤා සද්ධිං කොසම්බියවිහාරං ගන්ත්වා ධම්මං සුත්වා සරණෙසු පතිට්ඨාය බුද්ධමාමිකා හුත්වා විහරති. සො අපරභාගෙ කොසම්බියරාජා සංගාමත්ථාය ගච්ඡන්තො අත්තනො මාතුගාමෙන සද්ධිං ගන්ත්වා මාතුගාමං ඛන්ධාවාරෙ ඨපෙත්වා සඞ්ගාමත්ථාය ගච්ඡන්තො "රත්තපතාකං[2] උස්සාපෙමි, තෙන සඤ්ඤාතෙන මමන්තරායෙ සති ත්වං පලායිත්වා කොසම්බියං ගච්ඡාහී"ති වත්වා සයං සංගාමං පාවිසි.[3] තස්මිං ඛණෙ පතිතස්ස රඤ්ඤො මාතුගාමො රත්තධජං දිස්වා පලායමානා අඤ්ඤස්ස රඤ්ඤො මනුස්සා තං අද්දසංසු තෙ තං දිස්වා අත්තනො රඤ්ඤො දස්සෙසුං. රාජා තං දිස්වා "අභිසෙකං කරොහී"ති ආහ. සා තං න ඉච්ඡි. "කස්මා න ඉච්ඡසී"ති? පුච්ඡි. සා "එකස්ස රඤ්ඤො අභිසෙකා හුත්වා තස්ස වියොගදුක්ඛෙන අතිවිය දුක්ඛිතා; පුන අඤ්ඤස්ස මතකාලෙ එවං මෙ භවිස්සතී ති අභිසෙකං න ඉච්ඡාමී"ති ආහ. රාජා "සචෙ අභිසෙකං න ගණ්හාසි, අග්ගිම්හි තං පක්ඛිපාපෙමී"ති වත්වා මහන්තං දාරුචිතකං කාරාපෙත්වා අග්ගිං එකපජ්ජොතකං හුත්වා ජලිතෙ තත්ථ පවිසාහි ති ආහ. සා අග්ගිං න පවිසති. සා රාජානං යාචති: මා මහාරාජ මං එවං කරොහීති[4] තං යාචමානමපි අග්ගිම්හි පාතෙසි. සා පතිතෙ අඤ්ඤං මම සරණං නත්ථීති තිසරණමෙව සරණං කරොමී ති චින්තෙත්වා සරණත්තයමනුස්සරන්තී අග්ගිම්හි නිසීදි. තස්සා රතනත්තයානුභාවෙන අප්පමත්තකමපි උණ්හාකාරං නාහොසි. පදුමගබ්භං පවිට්ඨා විය අහොසි. රාජා තං අච්ඡරියං දිස්වා සංවෙගප්පත්තො හුත්වා වෙගෙන ගන්ත්වා උරෙන නිපජ්ජිත්වා "මම අච්චයං ඛමාහි; අජ්ජ පට්ඨාය මම මාතුට්ඨානෙ ඨත්වා

1 රෝ. බි 2. උපාසිකා - මිත්තාය; සෝ. උපාසිකාවෙස්සාමිත්තාය.
2 බි 1. රත්තධජපතාකං. 3. බි 2. රෝ. සෝ. පවිසිත්වා. 4 සෝ, රෝ. කාරෙහී ති.

මම අත්ථං කරොහී"ති වත්වා මහන්තං සක්කාරසම්මානං අකාසි. තං පාටිහාරියං දිස්වා රාජා ච බහූ මනුස්සා ච සරණෙසු ච සීලෙසු ච පතිට්ඨාය දානාදීනි පුඤ්ඤකම්මානි කත්වා යථා කම්මං ගතාති.

**වෙස්සාමිත්තාය වත්ථු පඨමං.**

---

## 12. බ්‍රාහ්මණපුත්තස්ස සිරිනාගස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති

සීහලදීපෙ සිරිනාගො අනුරාධපුරෙ රාජා භවිස්සාමී ති චින්තෙත්වා ධනං පරියෙසන්තො දක්ඛිණවිහාරෙ චෙතියෙ බහුධනං අත්ථී ති සුත්වා චෙතියං භින්දථා ති ආහ. රාජපුරිසා චෙතියසන්ධිං අපස්සිත්වා න පස්සාමාති ආහංසු. ඉමස්මිං චෙතියෙ සන්ධිං කො නාම ජානාතී ති? ආහ. ගොළියගාමෙ චණ්ඩාලපුත්තො නාම ජානාතී ති ආහංසු. රාජා තං පක්කොසාපෙත්වා "ඉමස්මිං චෙතියෙ ත්වං සන්ධිං ජානාසී ති[1] වදන්ති. සන්ධිං ඤත්වා[2] ඉමං චෙතියං භින්ද"ති ආහ. "අහං මහාරාජ සරණගතො උපාසකො; නාහං සත්ථුනො චෙතියං භින්දාමී"ති ආහ. රාජා තස්ස කුජ්ඣිත්වා එතං ජීවසූලෙ උත්තාසෙථාති[3] ආහ. තස්ස චණ්ඩාලස්ස සත්ත පුත්තා අත්ථි, තෙපි පක්කොසාපෙත්වා "චෙතියං භින්දථා"ති ආහ. තෙපි සත්ථුනො චෙතියං න භින්දාමාති ආහංසු. තෙපි ජීවසූලෙ උත්තාසෙථාති[3] ආහ. ඉමෙසං සග්ගසම්පත්තීනං[4] දස්සනත්ථං දෙවතා දෙවලොකතො රථෙ ආනෙත්වා සබ්බෙසං පස්සන්තානං යෙව සබ්බෙ තුසිතපුරං නයිංසු. තං දිස්වා රාජා ච රාජපුරිසා ච අච්ඡරියා අහෙසුං: අමෙහා චෙතියං අභින්දාපෙත්වා තිසිත්ත-ජනෙ දෙවලොකං නයිංසු ති. තතො පාචීනපස්සං ගන්ත්වා ගඞ්ගාරාජියං මධුපිට්ඨිගාමකම්හි මධුපිට්ඨිචෙතියං භින්දාපෙත්වා ධනං ගණ්හාපෙත්වා ධනෙන

1. සි 1. ර. ජානාති ති. 2. සි 2. ඨත්වා. 3. (සබ්බෙසු) උත්තාපෙථාති. 4. සි 1. සි 2. සබ්බසම්පත්තීනං (සබ්බෙසු)

රජ්ජං ගණ්හිත්වා පච්ඡා ධනං සඞ්කඩ්ඪිත්වා සයං සකටෙන ආහරාපෙත්වා තස්මිං චෙතියෙ පතිට්ඨාපෙත්වා චෙතියං කාරාපෙසි. අථ සො රාජා අපරභාගෙ කුච්ඡිරොගෙන උප-හතො කුච්ඡිං ඵාලෙත්වා කාලකිරියං කත්වා මහානිරයෙ නිබ්බත්ති.

**බ්‍රාහ්මණපුත්තස්ස සිරිනාගස්ස වත්ථු දුතියං**

---

## 13. සද්ධාතිස්සවත්ථුම්හි අත්ථුප්පත්ති

චූළවඩ්ඪිතිස්සාමච්චො[1] නාම සෙනාගමනං ගච්ඡන්තො අනුරාධපුරං ගන්ත්වා සද්ධාතිස්සමහාරඤ්ඤො උපට්ඨානං කත්වා අත්තනො නිවෙසනගෙහං ගච්ඡන්තො එකං සාල-චතුක්කම්හි සුද්දසාන-පිධාන-ගාමවාසිං[2] පිණ්ඩපාතිය-තිස්සත්ථෙරං දිස්වා ථෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා අත්තනො ගෙහෙ භත්තං අලභිත්වා අත්තනො හත්ථෙ අට්ඨ කහාපණෙ දත්වා ථෙරස්ස පිණ්ඩපාතං අදාසි. ථෙරො අරහත්තං පත්වා පච්ඡා පිණ්ඩපාතං පරිභුඤ්ජි. රඤ්ඤො ඡත්තෙ අධිවත්ථා දෙවතා සාධුකාරමදාසි. රාජා එතං පක්කොසාපෙත්වා එතස්ස මාතාපිතූනඤ්ච පක්කොසාපෙත්වා වඩ්ඪමාන - නගරං නාම අදාසි. අථ අපරභාගෙ පිට්ඨිවාලම්හි නාම ඛන්ධාවාරං බන්ධනකාලෙ උදකං දුල්ලභං අහොසි. තස්මිං කාලෙ දෙවතා තස්ස ජාතස්සරං දස්සෙසුං. තතො පානීයං සකටෙන ආහටකාලෙ කාලං ඝොසාපෙත්වා ආගතානං තිංසසහස්සභික්ඛූනං පානීයං අදාසි. රඤ්ඤො ඡත්තෙ අධි-වත්ථා දෙවතා පුන සාධුකාරමදාසි. තදා තං පක්කොසාපෙත්වා රාජා අතිකොට්ඨද්වාරෙ[3] අන්තරගඞ්ගං නාම අදාසි. අථ අන්තරගඞ්ගං ගච්ඡන්තො කණ්ඩද්වාරං[4] ආගතකාලෙ අමච්චො මධුරමංසං[5] ඛාදිතුකාමො අහොසි. පරිවාරමනුස්සා

---

1. සේ. චූළවඩ්ඪ. රසවාහිනියං "චූලරජ්ජ සද්ධාතිස්සාමච්චො"ති දිස්සති. සද්ධම්මාලංකාරෙ සිංහලපොත්ථකෙ "සුලුන්තරු නම් ගම" ඉති දිස්සති. 2. රස. නාලචතුක්කම්හි සුදස්සනපධානසාලාය වසන්තං. 3. රස. කොළද්වාරෙ. 4. සි 2. කණ්ණිකාද්වාරං. 5. රස. මධුරමංසං.

මධුරමංසං[5] පුච්ඡිත්වා අඤ්ඤමඤ්ඤං චොදෙත්වා මධුරමංසං[5] න ලභිංසු. තදා දෙවතා දෙවසංඝෙන සද්ධිං බහුං මධුරමංසං[5] ආහරිත්වා තස්ස අදංසු. එතම්පි භික්ඛුසඞ්ඝස්ස දත්වා පරිභුඤ්ජි. පුන ඡත්තෙ අධිවත්ථා දෙවතා සාධුකාරමදාසි. අථස්ස අපරභාගෙ රාජා චෙතියපබ්බතෙ අම්බත්ථලෙ මහාථූපෙ මනොසිලාවිලෙපනං ගණ්හාපෙතුකාමො හුත්වා තෙන අමච්චෙන සද්ධිං චෙතියපබ්බතවිහාරං ගන්ත්වා අත්තනො මනොරථං පූරෙත්වා සකලචෙතියෙ මනොසිලාවිලෙපනං අකාසි. තදා සො අමච්චො ද්වාදසසහස්සානං භික්ඛූනං තිචීවරමදාසි. භික්ඛූ තෙන දින්නං මනොසිලාවණ්ණං චීවරං පාරුපිත්වා ද්වාදසසහස්සභික්ඛූ මනොරථං පූරෙත්වා මනොසිලාවිලෙපනෙන විචිත්තං චෙතියං පදක්ඛිණං කත්වා ඔතරන්ති. තෙසං ඔතරන්තානං රාජා ච අමච්චො ච දිස්වා සොතාපන්නා අහෙසුං. තෙ තතො පට්ඨාය දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථකම්මං කත්වා තිදසපුරං පූරෙසුන්ති.

**සද්ධාතිස්සවත්ථු තතියං.**

---

## 14. සීවලිත්ථෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

අයම්පන සීවලිත්ථෙරො අතීතෙ සතසහස්සානං කප්පානං මත්ථකෙ පදුමුත්තරබුද්ධකාලෙ මහල්ලකබ්‍රාහ්මණො හුත්වා අත්තනො ජඞ්ඝනට්ඨානෙ නිහිතං ධනං දිස්වා තං විස්සජ්ජෙත්වා මහාදානං දත්වා අරහත්තං පත්ථෙත්වා අපරභාගෙ තතො චවිත්වා බාරාණසියං සෙට්ඨිපුත්තො හුත්වා පච්චෙකබුද්ධානං චතුපච්චයං දත්වා යාවජීවං පටිජග්ගිත්වා අපරභාගෙ විපස්සීසම්මාසම්බුද්ධකාලෙ බන්ධුමතී නාම නගරෙ අඤ්ඤතරස්මිං කුලගෙහෙ නිබ්බත්තිත්වා **සෙනගුත්තො** නාම පරස්ස කම්මකරො අහොසි. තදා උපාසකගණො සත්ථාරං නිමන්තෙත්වා මහාදානං දත්වා සත්ථුස්ස මහාපරිවෙණං කාරාපෙත්වා පරිවෙණෙ යෙව මහාදානං දදන්තො දානගෙහෙ අවිජ්ජමානං ඛජ්ජකං උපධාරෙන්තො අම්බිලදධිඤ්ච

---

5. රස. මයූරමංසං.

දණ්ඩතාහතමධුඤ්ච[1] අදිස්වා සහස්සං දත්වා එතං පරියෙසථාති පයොජෙසුං. තෙ සහස්සං ගහෙත්වා දධිඤ්ච මධුඤ්ච උපධාරෙන්තා විචරිංසු. තදා අයං **සෙනගුත්තො** අත්තනො සාමිකස්ස දධිඤ්ච මධුඤ්ච ආදාය ආගච්ඡන්තො ද්වාරන්තරෙ දධිමධුකත්ථාය ඨිතා මනුස්සා තං පස්සිත්වා එකකහාපණං ආදිං කත්වා යාව සහස්සෙනාපි යාචන්තානං "කිමත්ථාය ගණ්හථා"ති? වත්වා සත්ථු දාතත්ථායාති වුත්තෙන "අහමෙව දස්සාමී"ති ජීරකමරිචාදීහි සද්ධිං සක්ඛර-මධු-ඵාණිතෙහි පයොජෙත්වා සත්ථාරං පමුඛං කත්වා අට්ඨසට්ඨි සතසහස්සභික්ඛුසංඝස්ස (භත්තං)[2] අදාසි. අපරභාගෙ අම්හාකං සත්ථුනො උප්පන්නකාලෙ කොලියනගරෙ නිබ්බත්ති. තස්ස පිතා මහාලී ලිච්ඡවි නාම, මාතා සුප්පවාසා[3] නාම, සයං සීවලි නාම අහොසි. සො සත්තසංවච්ඡර-සත්තමාස-සත්තදිවසෙ මාතුකුච්ඡිම්හි වසි. සත්තදිවසෙ මූළ්හගබ්භා අහොසි. එවං මහාපුඤ්ඤස්ස සත්තස්ස සත්තමාස—සත්තදිවසෙ දුක්ඛානුභවනං කස්මා අහොසී ති චෙ? අත්තනො කත-කම්මානුභාවෙන; අතීතෙ කිර අයං රාජා හුත්වා අත්තනො සපත්තරජ්ජෙන සද්ධිං සංගාමන්තානං පලාපෙත්වා නගරං පරික්ඛිපිත්වා ගණ්හි. අථස්ස මාතා නගරද්වාරංපි පරිරුන්ධාහි ති ආහ. සො තස්සා වචනෙන තථා අකාසි. තෙන කම්මෙන මාතාපුත්තානං එවරූපං දුක්ඛං අහොසී ති වදන්ති. සා මූළ්හගබ්භා සත්තදිවසෙ මහාදුක්ඛං අනුභවන්තී සත්ථාරං අනුස්සරිත්වා සුඛෙන භාරං මුඤ්චිත්වා සත්තදිවසං බුද්ධපමුඛස්ස භික්ඛුසංඝස්ස මහාදානං අදාසි. පුත්තො සත්තමෙ දිවසෙ භික්ඛුසංඝෙන සද්ධිං සත්ථාරං නිමන්තෙත්වා පබ්බජි. කුමාරස්ස සාරිපුත්තත්ථෙරො ආචරියො අහොසි. මහාමොග්ගල්ලානත්ථෙරො උපජ්ඣායො අහොසි. සො තස්මිං යෙව දිවසෙ විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණි. පුබ්බෙ අත්තනො කම්මනිස්සන්දෙන පුඤ්ඤවා අහොසි. අථ සත්ථා අපරභාගෙ රෙවතත්ථෙරං

1. රස. "නවදධිං ච පටලමධුං ච." සද්ධම්මාලංකාරෙ "අලුත් දී හා කැවීම් නැති බව දූක." 2 "තං" ඉති පුත්ථකන්තරං. 3. කි 2 සුප්පවාසී.

පස්සිතුං ගච්ඡන්තො වීසතිසහස්සභික්ඛුසංඝං ගහෙත්‍වා තිංසයොජනිකෙන අමනුස්සාවාසකන්තාරෙන ගච්ඡන්තො දෙවතාහි සීවලිත්‍ථෙරස්ස මාපිතවිහාරෙ වසන්තො දෙවතානං සජ්ජිතමහාදානං පරිභුඤ්ජන්තො අගමාසී ති.

සීවලිත්‍ථෙරස්ස වත්‍ථු චතුත්‍ථං.

---

## සමණගාමපබ්බතවත්‍ථුම්හි[1]
## අත්‍ථුප්පත්ති

චෙතියපබ්බතවාසිනො ද්වාදස භික්ඛූ තස්මිං තස්මිං ඨානෙ චෙතියං වන්දිත්‍වා අනුපුබ්බෙන සමණගාමපබ්බතං අගමංසු. තස්මිං කාලෙ සූරියෙ අත්‍ථඞ්ගමිතෙ රත්ති අහොසි. තෙ අඤ්ඤත්‍ථ ගන්තුං අසක්කොන්තා තස්මිං පබ්බතපාදෙ මාතුලරුක්ඛමූලෙ සයිංසු. එතෙසං අන්තරෙ එකො භික්ඛුසත්‍තාරහගාථං වත්‍වා දෙවතානං පත්තිං අදාසි. තස්මිං රුක්ඛෙ අධිවත්‍ථා දෙවතා ධම්මං සුත්‍වා පසන්නා පුනදිවසෙ ථෙරානං ගමනකාලෙ දෙවපුත්‍තො ආගන්ත්‍වා "භන්තෙ ඉමස්මිං පබ්බතපාදෙ රුක්ඛමූලෙ නිසීදථ; අහං වො පිණ්ඩපාතං දස්සාමී"ති ආහ. භික්ඛූ අධිවාසෙසුං. ඉමස්ස පන දෙවපුත්තස්ස අඤ්ඤං කිඤ්චි නත්‍ථි, එකං බදලතාපණ්ණමෙව[2] නිබ්බත්ති. සො දෙවපුත්තො ථෙරානං දිබ්බොජපුණ්ණබදලතාපණ්ණමෙව අදාසි. භික්ඛූ භත්තකිච්චාති කත්‍වා උක්කණ්ඩිස්සන්ති (?) අමෙහ ගච්ඡාමාති දෙවපුත්තස්ස ආහංසු. දෙවපුත්තො විනෙතසි: අය්‍යා අජ්ජ අම්හාකං සන්තිකෙ ලූඛපණ්ණමෙව[3] පරිභුඤ්ජිත්‍ථ; සෙව මම සහායො දෙවපුත්තො එකදිවසන්තරෙනාගන්ත්‍වා දිබ්බ-භොජනං පරිභුඤ්ජිස්සති; සෙව එතස්සා'ගමනදිවසං; අය්‍යා සෙව භත්තකිච්චං කත්‍වා ගච්ඡන්තූති වත්‍වා නිමන්තෙසි. පුනදිවසෙ එතස්ස සහායො දෙවපුත්තො

1. සි 2 සමණගාමපබ්බතෙ. 2. සි 2. පදලතාපණ්ණමෙව. 3. සී 1. සි 2. සුඛපණ්ණමෙව.

එතස්ස සන්තිකං ආගතො, තස්ස පන යාගුභාජනමෙව තිගාවුතට්ඨානෙ ඨපියති[4]. සො දෙවපුත්තො ථෙරානං යාගුං දත්වා සයම්පි පරිභොගමකාසි. තථා අන්තරඛජ්ජකං ගහෙත්වා තිගාවුතට්ඨානෙ අට්ඨංසු. තථා නානාවිධබ්‍යඤ්ජන-සහිතං දිබ්බභොජනං ගහෙත්වා තිගාවුතට්ඨානෙ අට්ඨංසු. දෙවපුත්තො අන්තරඛජ්ජකං දත්වා දිබ්බභොජනං අදාසි. මහාථෙරො දෙවපුත්තස්ස සම්පත්තිං ඔලොකෙත්වා මනුස්ස-පථෙ ඨත්වා කිං කම්මං නාම අකාසී ති පුච්ඡි. දෙවපුත්තො තස්ස කථං සුත්වා අහං භන්තෙ අතීතභවෙ චෙතිය පබ්බතෙ සමණො හුත්වා මය්හං විස්සග්ගෙන භත්තං ගණ්හන්තො උට්ඨිතභත්තපිණ්ඩපාතතො[5] උපඩ්ඪං සංඝස්සත්ථාය දත්වා උපඩ්ඪං අග්ගහෙසිං. අහං තෙන කම්මෙන භුම්මදෙවපුත්තො හුත්වා නිබ්බත්තිං. නිබ්බත්ත-කාලතො පට්ඨාය තිගාවුතට්ඨානෙ දිබ්බන්නපානභොජනං ගහෙත්වා තිට්ඨාමී ති ආහ. භික්ඛූ දෙවපුත්තස්ස කථං සුත්වා අත්තනො ගතගතට්ඨානෙ දෙවපුත්තස්ස කථිතං වත්වා බහූ මනුස්සෙ දානසීලභාවනාමයපුඤ්ඤකම්මෙසු නියොජෙසුන්ති.

**සමණගාමවත්ථු පඤ්චමං**

---

## 16. නන්දිමිත්තස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති

නන්දිමිත්තො අතීතකාලෙ කොණාගමනසත්ථුකාලෙ අඤ්ඤතරස්මිං කුලගෙහෙ නිබ්බත්ති. සො බුද්ධසාසනෙ දානං දදන්තානං දිස්වා මයාපි දානං දාතුං වට්ටතී ති චින්තෙත්වා එකස්ස භික්ඛුනො සුභොජනං දාතුකාමො අහොසි. සො තීණි කහාපණානි විස්සජ්ජෙත්වා මිගමංසං ගහෙත්වා නානග්ගරසං කත්වා තිවස්සිකගන්ධසාලිතණ්ඩුලෙන භත්තං පචාපෙත්වා නානග්ගරසෙන තස්ස සත්ථුස්ස සාවකස්ස

4. බි 1. බි 2. ඨපිස්සති. 5 “උපඩ්ඪිතභත්ත—” ඉති මඤ්ඤාමි.
1 කෝ. නද්ධිමිත්තස්ස

විරොචනනාමඛීණාසවත්ථෙරස්ස අදාසි. එතස්ස දානස්ස
නිස්සන්දෙන දෙවමනුස්සසම්පත්තිං අනුභවමානො කස්සප-
සම්මාසම්බුද්ධකාලෙ වීසති-වස්සසහස්සානි සඞ්ඝෙ රසඛීර
—සලාකභත්තං දත්වා දෙවලොකෙසු මනුස්සලොකෙසු ච
සිරිසම්පත්තිං අනුභවමානො අම්හාකං සත්ථුනො පරි-
නිබ්බුතකාලෙ සීහළදීපෙ දුට්ඨගාමණිඅභයමහාරාජස්ස
කාලෙ තස්මිං මහාගාමෙ වසන්තෙ කුකුධනාමගාමෙ දිවසෙ
දිවසෙ සහස්සුප්පාදන-කුලගෙහෙ නිබ්බත්ති. තස්ස පරි-
පාකමන්වාය ජනිතස්ස නාමගහණදිවසෙ මිත්තොති නාමං
අකංසු. තස්ස පදසා ගමනකාලෙ මාතාපිතරො බහි
ගච්ඡන්තා ඉමං සන්තප්පෙත්වා තොසෙත්වා නිසීදාපෙතුං
අසක්කොන්තා කටිම්හි චම්මයොත්තෙන බන්ධිත්වා මහන්තෙ
පාසාණෙ බන්ධිංසු. නිසදායපි තං බන්ධන්ති. සො තං
ආකඩ්ඪන්තො තත්ථ තත්ථ පරිසප්පිත්වා යොත්තං ඡින්දති.
අථස්ස මාතාපිතරො මහන්තං චම්මතන්තිං[2] කටිම්හි බන්ධිත්වා
මහන්තෙ පාසාණෙ බන්ධිංසු. සො මාතාපිතූනං ගමනකාලෙ
රොදිත්වා තෙහි සද්ධිං ගන්තුකාමො ඉතො චිතො ච
පරිසප්පන්තො තන්තිං[2] ඡින්දිත්වා තෙසං සන්තිකං අගමාසි.
තන්තිං[2] ඡින්නත්තා තන්තිමිත්තොති[3] නාමං අකංසු. තස්ස
මාතාපිතරො එකස්මිං දිවසෙ අරඤ්ඤං ගච්ඡන්තා ඉමං
නිසීදාපෙතුං අසක්කොන්තා ගහෙත්වාව අගමංසු. තෙ
අරඤ්ඤං ගන්ත්වා එකස්මිං වෙළුගුම්බසමීපෙ තං නිසීදාපෙත්වා
අත්තනො කම්මං කරොන්ති. සො රොදිත්වා තෙසං
සන්තිකං ගන්ත්වා පාදන්තරං පවිසිත්වා මත්තහත්ථී විය
ඉතො චිතොච පරිසප්පන්තො[4] තෙසං කම්මං කාතුං
ඔකාසං න දෙති. තෙ තස්ස කටියා මහන්තෙන තන්ති-
යොත්තෙන බන්ධිත්වා මහාවෙළුගුම්බෙ බන්ධිංසු. සො
මාතාපිතරො ගච්ඡන්තෙ දිස්වා රොදිත්වා සමූලං වෙළුගුම්බං
ආදාය අගමාසි, තස්ස වෙළුගුම්බස්ස පමාණං[5] සට්ඨිසකට-
මත්තං අහොසි. සො අනුපුබ්බෙන වඩ්ඪිත්වා මහල්ලකො

2 සෙ. චම්මතද්ධිං (සබ්බත්ථ) 3 සෙ තද්ධිමිත්තො (සබ්බත්ථ)
4 බී 2. පරිසම්පජ්ජන්තා 5. පොත්ථකෙසු නත්ථි

අහොසි; ථාමූපපන්නරූපසම්පන්නො අහොසි. ඉමස්ස බලසම්පත්තිං දුට්ඨගාමණී මහාරාජා සුත්වා තස්ස සත-සහස්ස-කහාපණං දත්වා ගන්ත්වා එතං ආනෙථාති රාජපුරිසෙ පෙසෙසි. දූතා ගන්ත්වා මාතාපිතූනං සතසහස්සං දත්වා එතං ගහෙත්වා රඤ්ඤො කම්මාරසාලාය නිසීදාපෙත්වා අසිමජ්ජනකාලෙ ආගන්ත්වා රඤ්ඤො වන්දිත්වා අට්ඨංසු. රාජා තස්ස මාතාපිතෙරො සක්කරිත්වා තස්ස ච මහන්තං සක්කාරං කත්වා අසිධාරං ඨපෙහීති ආහ. නන්දිමිත්තො අසිපත්තං ගහෙත්වා අපරාපරං පාසාණෙ ඝංසිත්වා අසිධාරං ඨපෙසි. තං මහන්තං වජිරපබ්බතං විජ්ඣනබ්භෙගන කදලි විය ඡින්දනසමත්ථං අහොසි. රාජා ඉමස්ස මහාවීථියං ගෙහං දත්වා දිවසෙ දිවසෙ සහස්සං පරිබ්බයං දත්වා මහන්තං සක්කාරං කත්වා මහාගාමෙ වසාපෙත්වා පටිජග්ගි. අපරභාගෙ දුට්ඨගාමිණී රාජා ද්වත්තිංස දමිළරාජෙ ගහෙත්වා එකරජ්ජං කාරෙතුකාමො හුත්වා තෙන සද්ධිං තස්මිං තස්මිං ඨානෙ සඞ්ගාමං කරොන්තො බහුසඞ්ගාමං කත්වා වජිරපුරනගරගහණදිවසෙ[6] කණ්ඩුලහත්ථිනා වහි-තෙන අයද්වාරෙන අපවිසිතුකාමො හුත්වා වාමබාහුනා පහරිත්වා ලොහද්වාරං උග්ඝාටෙත්වා හත්ථෙන චතුහත්ථං ඛග්ගරතනං[7] ගහෙත්වා ආකාසෙ අට්ඨාරසහත්ථං උග්ගන්ත්වා අන්තොනගරං පවිසිත්වා දමිළෙ ඝාතෙත්වා[8] රඤ්ඤො රජ්ජං ගහෙත්වා අදාසි. අථ අපරභාගෙ රාජා අනුරාධපුරෙ ඡත්තං උස්සාපෙත්වා නන්දිමිත්තස්ස මහන්තං යසං අදාසි. ජජ්ජරනදිතො පට්ඨාය පරතීරං හත්ථගාමභොගං[9] කත්වා අදාසි. නන්දිමිත්තො අත්තනො භොගගාමං ගච්ඡන්තො ජජ්ජරනදියා තීරෙ මිත්තවිහාරං නාම කාරාපෙසි. රඤ්ඤා සද්ධිං සහායො හුත්වා දානාදීනි පුඤ්ඤකම්මානි කරොන්තො ආයුපරියොසානෙ සග්ගෙ නිබ්බත්තීති.

**නන්දිමිත්තස්ස වත්ථු ඡට්ඨං.**

---

6. මහාවංසාදිසු "විජිතපුර" ඉති දිස්සති. 7. රසවාහිනියං "මහන්තං සකටපඤ්ජරං පග්ගණ්හා" ති දිස්සති. මහාවංසෙපි "මිත්තො සකටපඤ්ජරං"ති දිස්සති. 8. බි 2. ර. කෝ ගහෙත්වා 9. බි 1 බි 2 ර. භුත්තගාමභොගං

# 17. මන්ධාතුමහාරාජස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති

අයං පන මන්ධාතුමහාරාජා ඉතො එකනවුති-කප්පමත්ථකෙ විපස්සීසම්මාසම්බුද්ධකාලෙ තුන්නවායකාරො හුත්වා දන්තකම්මිකස්ස රත්තිකාලෙ තුන්නවායකම්මං කත්වා ලද්ධපරිබ්බයෙන එකස්ස භික්ඛුනො දන්තං දතුකාමො හුත්වා ඔකාසං අලභිත්වා රාජමාසෙ සෙදෙත්වා[1] චඞ්ගොටකෙන ගහෙත්වා එකස්ස භික්ඛුනො සමීපෙ ඨත්වා මාසෙ ආකාසෙ ඛිපි: තං හත්ථතො පතන්තං එකභික්ඛුස්සපි පත්තෙ පතිස්සතීති සොමනස්සජාතො අහොසි. තං පන පතමානං පරිවාරදෙවතානඤ්ච දසබලස්ස ච ආනුභාවෙන සත්ථාරං ආදිං කත්වා සබ්බෙසං සාවකානං පත්තෙසු පතිට්ඨාසි. සො ඉමං කාරණං දිස්වා අතිරෙකෙන පසීදිත්වා "ඉමිනා කම්මෙන මය්හං නිබ්බත්ත-නිබ්බත්ත-අත්තභාවෙ රතන-වස්සං වස්සතූ"ති පත්ථෙසි. තතො පට්ඨාය දීඝමද්ධානෙ දෙවමනුස්සෙසු සම්පත්තිං අනුභවමානො ඉමස්මිං භද්දකප්පෙ නවමො රාජා හුත්වා නිබ්බත්ති. නාමෙන මහාමන්ධාතු නාම අහොසි.

අත්තනො පුඤ්ඤානුභාවෙන චතූසු දීපෙසු ඉස්සරියං පරිභුඤ්ජමානො අහොසි. සො මම පුඤ්ඤතො වරතරො අඤ්ඤො උත්තමො රාජා නත්ථි මඤ්ඤෙ ති චින්තෙත්වා අමච්චානං සන්තිකා පුන චතුමහාරාජිකදෙවලොකඤ්ච තාවතිංසභවනඤ්ච අත්ථීති සුත්වා සයමෙව චතුමහාරාජික-දෙවලොකෙ ච තාවතිංසභවනෙ ච උපඩ්ඪරජ්ජං කත්වා වසන්තො[2] යෙව ඡත්තිංස සක්කදෙවරාජානො චවිංසු. අපරාපරං සක්කසම්පත්තිං අනුභවමානො තං සක්කං මාරෙත්වා පරිපුණ්ණං රජ්ජං කාරෙතුකාමො හුත්වා තණ්හං උප්පාදෙසි. තතො අකුසලචෙතනාවෙගෙන මනුස්ස-ලොකෙ අත්තනො උය්‍යානෙ සිලාපට්ටෙ නිසීදි. තස්ස

1. ඛි 1. පොත්ථකෙ නත්ථි. 2. ඛි 1 රැ. වසන්තො,

පුඤ්ඤානුභාවෙන ජෙට්ඨපුත්තො ආගන්ත්වා "මහාරාජ, තව අච්චයෙන කිං කරොමා"ති ආහ. රාජා තස්ස වචනං සුත්වා "පුත්ත, අහං කාමෙන අතිත්තො යෙව කාලං කරොමි; තං පවත්තිං මහාජනස්ස කථෙහී"ති වත්වා යථාකම්මං අගමාසීති.

මන්ධාතුවත්ථු සත්තමං.

---

## 18. අභයත්ථෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

පච්ඡිමපස්සෙ පුප්ඵවාසවිහාරෙ භික්ඛාචාර–දෙවගාමෙ දෙවො නාම අමච්චො අහොසි. සො අත්තනො වෙය්‍යාවච්චකාරකානං "ඡාතොම්හි භුඤ්ජිස්සාමී"ති ආහ. තෙ තස්ස භත්තං වඩ්ඪෙසුං. භත්තවඩ්ඪිතකාලෙ ඡාතසුනඛො කම්පමානො එතස්ස වඩ්ඪිතභත්තං ඔලොකයමානො තස්ස සන්තිකං ආගච්ඡති. අමච්චස්ස පන චූලුපට්ඨාකො සුනඛං පලාපෙස්සාමීති මුග්ගරං ආදාය උපධාවි. අමච්චො තං නිවාරෙත්වා සුනඛස්ස කාරුඤ්ඤෙන නානග්ගරසෙන භත්තපිණ්ඩං සුනඛස්ස අදාසි. සුනඛො භුඤ්ජිත්වා ගතො. අමච්චො චිත්තං පසාදෙත්වා පච්ඡා කාලකිරියං කත්වා එකස්මිං ගාමෙ මහන්තකුලගෙහෙ නිබ්බත්ති. අනුක්කමෙන වඩ්ඪිත්වා මහල්ලකකාලෙ පුප්ඵවාසවිහාරෙ සමණො අහොසි. නාමෙන **මහාඅභයත්ථෙරො** නාම අහොසි. අථ කාලන්තරෙන බ්‍රාහ්මණතිස්ස – චොරභයං අහොසි.

ඉමස්මිං විහාරාසන්නෙ මනුස්සා විදෙසං ගන්ත්වා ජීවිස්සාමාති ථෙරස්ස ආහංසු. ථෙරො "චෙතියඤ්ච බොධිඤ්ච පහාය ගන්තුං න සක්කොමී"ති ආහ. ථෙරො ද්වෙ දිවසෙ ඡින්නාහාරො අහොසි. ථෙරො තතියදිවසෙ චෙතියඞ්ගණඤ්ච බොධියඞ්ගණඤ්ච සම්මජ්ජිත්වා වත්තං කත්වා විතක්කමාලකෙ අට්ඨාසි. තස්මිං කරඤ්ජරුක්ඛෙ[1] අධිවත්ථො දෙවපුත්තො

1. කෝ. කාරරුක්ඛො

ථෙරං ඔලොකෙත්වා අත්තනො භරියං ආහ: "එසො ථෙරො චෙතියඞ්ගණ බොධියඞ්ගණ පහාය න ගච්ඡාමීති වත්වා එවරූපෙ ඡාතකභයෙ කත්ථචි අගන්ත්වා වත්තං කරොති; ඡින්න-භත්තො ච අහොසි. ථෙරො ආහාරං න ලභි. අජ්ජතො පට්ඨාය තයො දිවසෙ ඡින්නභත්තො අහොසි. තස්මා අජ්ජ ථෙරස්ස භික්ඛාහාරං දදාමී"ති. දෙවධීතා අත්තනො සාමි-කස්ස එවමාහ: "එසො ථෙරො අතීතෙසු භවෙසු චරන්තො පරස්ස කිඤ්චි දත්තං අත්ථි"ති? දෙවපුත්තො අනන්තරෙ අත්තභාවෙ සුනඛස්ස භත්තපිණ්ඩං දින්නං අද්දස. සො එතං කාරණං දිස්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතර-මනුස්සවෙසෙනා'ගන්ත්වා ථෙරස්ස දිබ්බාහාරං දත්වා "එවරූප මෙව භික්ඛාහාරං යාවජීවං තුම්හාකං දස්සාමි, තුම්හෙ කත්ථචි අගන්ත්වා අප්පමත්තා හුත්වා සමණධම්මං කරොථා"ති ආහ. දෙවපුත්තො එවං වත්වා අත්තනො විමානමෙව අගමාසි. තතො පට්ඨාය සතත මෙව ථෙරස්ස දිබ්බාහාරං අදංසු. අථ අපරෙන සමයෙන තං විහාරං මනුස්සමංසඛාදකචොරා ආගන්ත්වා ථෙරං දිබ්බභොජනෙන වඩ්ඪිතසරීරං පස්සිත්වා ඉමං මාරෙත්වා ඛාදිස්සාමාති චින්තෙත්වා ථෙරස්ස චෙති-යඞ්ගණා[2] නික්ඛන්තකාලෙ චොරා මහාසද්දං කත්වා සමන්ත තො පරික්ඛිපිත්වා අට්ඨංසු. ථෙරස්ස පුරිමත්තභාවෙ සුනඛස්ස දණ්ඩෙන පහරිතෙ වාරිතබලෙන පබ්බතං විවරමදාසි. ථෙරො අන්තොපබ්බතං පවිට්ඨො, චොරා අරහන්තො සමණො අයන්ති පලායිංසු. ථෙරො දෙවතානං දින්නභත්තං භුඤ්ජන්තො යෙව ද්වාදස වස්සානි වීතිනාමෙත්වා පච්ඡා විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පත්තො. දෙවපුත්තො ථෙරස්ස චතුවීසති වස්සානි දිබ්බහාරං අදාසි. ථෙරො එතස්මිං විහාරෙ යෙව පරිනිබ්බුතොති.

**අභයත්ථෙරස්ස වත්ථු අට්ඨමං.**

---

2. සි 1. සී 2. සෝ. චෙතියඞ්ගණෙ.

# 19. නාගාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

සට්ඨිමත්තා භික්ඛූ නාගදීපෙ රාජායතනචෙතියං වන්දිතුකාමා හුත්වා නාගදීපං ගන්ත්වා රාජායතනචෙතියං වන්දිත්වා අත්තනො භික්ඛාචාරකාලෙ නාගගාමං භික්ඛාය පවිසිත්වා සකලගාමම්හි භික්ඛාය චරිත්වා කිඤ්චි අලභිත්වා යථා ධොතෙනෙව පත්තෙන නික්ඛමිංසු. තදා නාගගාමෙ කුලගෙහෙ සට්ඨිකහාපණෙන දාසී හුත්වා වසමානා මාතුගාමා (?) නාමෙන නාගා නාම අහොසි. සා උදකඝටං ගහෙත්වා උදකත්ථාය ගච්ඡන්තී ගාමද්වාරෙ එතෙ භික්ඛූ දිස්වා තෙසං සන්තිකං ගන්ත්වා වන්දිත්වා "කිං අය්‍යා භික්ඛාහාරං ලභිංසූ"ති? ආහ. උපාසිකෙ පුරෙභත්තමෙවාති ආහංසු.

සා පන මාතුගාමා එතෙසං භික්ඛූනං කිඤ්චි අලද්ධභාවං ඤත්වා දොමනස්සා හුත්වා "කෙන නාම උපායෙන ඉමෙසං අය්‍යානං ආහාරං දදෙය්‍යාමී"ති චින්තෙසි. පුන අඤ්ඤස්මිං[1] සට්ඨිකහාපණෙන රත්තිකම්මකාරිකා හුත්වා අය්‍යානං භික්ඛං දස්සාමීති චින්තෙත්වා අත්තනො ඝටං ථෙරානං සන්තිකෙ ඨපෙත්වා "භන්තෙ, ඉමං ඝටං දොළ්ලං වට්ටතී ති[2] වත්වා යාව මමාගමනා තාව ඉමං ඝටං ඔලොකෙය්‍යාථා"ති වත්වා අත්තනො වසනට්ඨානෙ කුලස්ස සන්තිකං ගන්ත්වා "අඤ්ඤං සට්ඨිකහාපණං දෙහි අය්‍යා"ති ආහ. සො තස්සා කථං සුත්වා "අම්ම පරෙසං ගෙහදාසී හුත්වා වසමානා ථොකෙන ථොකෙන ඉණං අප්පකං කරොන්ති; ත්වං පන පුනප්පුනං වඩ්ඪෙත්වා ධනං ගණ්හාසී"ති ආහ. සා එවමාහ: තුම්හෙ එතස්සත්ථාය මා චින්තයිත්ථ, රත්තිදාසී හුත්වා කම්මකරණත්ථාය රත්තිඉණායිකා හුත්වා සට්ඨිකහාපණං ගණ්හාමි අය්‍යාති. සො සාධූති වත්වා පණ්ණෙ ලිඛිත්වා සට්ඨිකහාපණං අදාසි. සා තං ගහෙත්වා එකෙකං කහාපණං එකෙකස්මිං කුලෙ දත්වා එකෙකස්ස භික්ඛුනො එකෙකකහාපණග්ඝිකං පිණ්ඩපාතං දත්වා අත්තනා කතාධිකාරං භික්ඛූනං වත්වා ඝටං ගහෙත්වා උදකත්ථාය අගමාසි. භික්ඛූ තස්සා කථං සුත්වා

1. අඤ්ඤදානාති භවිතබ්බං. 2. සී 1. සි 2. දෙවබලං වට්ටතීති.

සංවෙගප්පත්තා හුත්වා පත්තෙන ගහෙත්වා මහාසරෙ මුචලින්දවනං
පවිසිත්වා පත්තෙ ඨපෙත්වා "පුථුජ්ජනෙන ඉමං භත්තං
භුඤ්ජිතුං න යුත්තං"ති වත්වා විපස්සනං වඩ්ඪෙත්වා සබ්බෙ
අරහත්තං පත්වා භත්තං භුඤ්ජිංසු. අථ තං කාරණං දිස්වා
රඤ්ඤො ඡත්තපිණ්ඩෙ අධිවත්ථා දෙවතා සාධුකාරමදාසි:
"සාධු සාධු මාතුගාමෙ, තයා දින්නදානං ඛෙත්තගතන්ති."
රාජා තං සුත්වා "දෙවතෙ, අම්හාකං තුට්ඨාසී"ති ආහ.
"අහං තුම්හාකං සාධුකාරං න දෙමි, නාගදීපෙ එකා මාතු-
ගාමා අඤ්ඤස්ස ගෙහෙ සට්ඨිකහාපණෙන දාසී හුත්වා
වසමානා සට්ඨිමත්තෙ අය්‍යෙ භික්ඛාය චරිත්වා කිඤ්චි අලභිත්වා
නික්ඛමන්තෙ දිස්වා පුන සට්ඨිකහාපණාය රත්තිකම්මකාරී
දාසී හුත්වා කහාපණෙ ගහෙත්වා අය්‍යානං භත්තමදාසි. අය්‍යා
තං භත්තං දින්නාය අධිකාරං සුත්වා විපස්සනං වඩ්ඪෙත්වා
සබ්බෙ අරහත්තං පත්වා ආහාරං පරිභුඤ්ජිංසු, තස්සා අහං
සාධුකාරං අදාසිං"ති ආහ. තස්සා කථං සුත්වා රාජා තුස්සිත්වා
තං අදාසිං කත්වා යෙන කහාපණං දින්නං අහොසි, තස්ස
කුලස්ස කහාපණෙ මනුස්සෙ දාපෙසි. තෙ තං කුලඤ්ච
තං ච ගහෙත්වා ආගච්ඡිංසු. රාජා තං පස්සිත්වා මහන්තං
සක්කාර - සම්මානං කත්වා නාගදීපං තස්සා යෙව අදාසි.
ඉමස්ස පන ගාමස්ස නාගානාම මාතුගාමස්ස දින්නත්තා
නාගගාමං නාම අහොසි. සා තතො පට්ඨාය බහුං කුසලං
කත්වා ජීවිත පරියොසානෙ සග්ගෙ නිබ්බත්තී ති.

**නාගාය වත්ථු නවමං.**

---

## 20. වත්ථුලෙය්‍යපබ්බත වත්ථුම්හි අත්ථුප්පත්ති.

බ්‍රාහ්මණතිස්සනගරවාසිතො[1] හි චොරභයෙහි ආවුධ-
භයෙහි රොගභයෙහි ඡාතකභයෙහීති ඉමෙහි චතූහි භයෙහි
ලඞ්කාදීපෙ මනුස්සා භයතජ්ජිතා අත්තනො අත්තනො
වසනට්ඨානතො නික්ඛමිත්වා තං වත්ථුලෙය්‍යපබ්බතං පවි-

1. බී 1. නගරවාසිනො.

සරණං කත්වා සබ්බෙ ආගමිංසු. තස්මිං සමයෙ තස්මිං පබ්බතසමීපෙ ගාමවාසී මනුස්සො අත්තනො මාතුගාමෙන සද්ධිං පබ්බතං අභිරුහිත්වා එතස්මිං පබ්බතෙ විහරිස්සාමීති චින්තෙත්වා පබ්බතං අභිරුහි. පබ්බතමත්ථකෙ කාරගච්ඡං දිස්වා තං උපනිස්සාය විහාසි. තස්මිං පන කාරරුක්ඛෙ තයො සාඛා අහෙසුං. සො මනුස්සො කාරරුක්ඛෙ ද්වීසු සාඛාසු පණ්ණං අඛෙදසං ආගන්තුකානං ආගතකාලෙ තෙසං හොතූති චින්තෙත්වා තතො අග්ගහෙත්වා එකසාඛාය-මෙව පණ්ණං පචිත්වා සතතං ඛාදිංසු. අථෙකදිවසං එකො සමණො අත්තනො භික්ඛාචාරං ගවෙසන්තො තෙසං ගෙහෙ ධූමං දිස්වා තෙසං ගෙහද්වාරං අගමාසි. සො මනුස්සො ථෙරං දිස්වා අත්තනො පරිභුඤ්ජනසාඛාය පණ්ණං පචිත්වා දස්සාමීති චින්තෙත්වා ථෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා තං නිසීදාපෙත්වා සො උපාසකො පණ්ණං ආහරිස්සාමීති චින්තෙත්වා කාරගච්ඡස්ස සමීපං අගමාසි. තස්මිං දිවසෙ තස්සා සාඛාය පණ්ණං ආදිං කත්වා මකුලපල්ලවම්පි උද්ධරිත්වා පාණකා ඛාදිංසු. සො මනුස්සො භූමිං ඔලොකෙත්වා දුක්ඛී දුම්මනො හුත්වා නිවත්තිත්වා සකං ඝරං අගමාසි. ආගතස්ස මාතුගාමො තං කිඤ්චි අගහෙත්වා ආගතං[2] දිස්වා කිං අය්‍යාති පටිපුච්ඡි.

තස්සා සො සබ්බං කථෙසි. සා "ඉදානි කිං කරොම? ථෙරං දානි නිසීදාපෙත්වා අප්පමත්තකම්පි දාතුං අම්හාකං අදාතුං අයුත්ත"න්ති වත්වා සා අත්තනො මංසං දාතුකාමා හුත්වා ගබ්භං පවිසිත්වා අත්තනො මංසං උක්කන්තිතුකාමා අහොසි. තස්සා සාමිකො ගබ්භං පවිට්ඨං දිස්වා සයම්පි ගන්ත්වා කිං කරොසීති පුච්ඡි. "මම සරීරමංසං පචිත්වා ථෙරං අජාතා-පෙත්වා අජ්ජ ථෙරස්ස දස්සාමී"ති ආහ. තස්සා සාමිකො ඉමිස්සා කථං සුත්වා මාතුගාමා නාම අප්පබුද්ධිනො භීරුකජාතිනො භවන්ති. අහං අත්තනො මංසං ච අජ්ජ පචිත්වා ථෙරං අජාතාපෙත්වා දස්සාමීති චින්තෙසි. භරියා අත්තනො මංසං දාතුං ඉච්ඡති, පුරිසොපි අත්තනො මංසං දාතුං ඉච්ඡති.

2. රූ. කෝ. ආගච්ඡන්තං.

තෙසං අඤ්ඤමඤ්ඤං දාතුං විනෙන්තානං සක්කස්ස දෙව-රඤ්ඤො පණ්ඩුකම්බලසිලාසනං උණ්හාකාරං දස්සෙසි. සක්කො දෙවරාජා තෙසං ද්වින්නං අජ්ඣාසයං පරිසුද්ධං අජ්ඣත්තිකසද්ධං දිස්වා සලිතණ්ඩුලඤ්ච ලොණඤ්ච මංසඤ්ච දධිඝටඤ්ච තෙලඝටඤ්ච ගහෙත්වා ආගන්ත්වා ගෙහද්වාරෙ ඨත්වා ගෙහසමන්තතො අනුවිචරමානො "ඉමස්මිං ගෙහෙ මනුස්සා කුහිං ගතා"ති ආහ. අන්තොගෙහෙති ආහංසු. තෙසං සද්දං සුත්වා අය්‍යානං දානං කිඤ්චි අත්ථීති පුච්ඡි. "කථං ලභාම? සාධු සචෙ කිඤ්චි ලභෙය්‍යාම, අය්‍යස්ස දෙමා"ති වදිංසු. තෙන හි ඉමං තණ්ඩුලඤ්ච ලොණඤ්ච තෙලඤ්ච දධිඤ්ච ගහෙත්වා භත්තං සම්පාදෙත්වා ථෙරස්ස දානං දත්වා සෙසං මය්හඤ්ච භවිස්සතීති වත්වා තං අක්ඛයං කත්වා අධිට්ඨාය "සචෙ අහං තා' ගමිස්සාමි, තුම්හෙ ච භුඤ්ජථ, යථාරුචිං අඤ්ඤෙ ච දස්සථා"ති වත්වා දෙවලොකමෙව අගමාසි. තෙ පන භත්තං සම්පාදෙත්වා ථෙරස්ස දානං දත්වා සයඤ්ච භුඤ්ජිංසු. උක්ඛලියං පන එකස්ස පටිවිංසං ගහිතමත්තට්ඨානං පඤ්ඤායති. තෙ පන මනුස්සා ඉමං අච්ඡරියං දිස්වා සොමනස්සා හුත්වා තතො පට්ඨාය බහුභික්ඛු-සඞ්ඝස්ස ච පබ්බතාසන්නෙ බහුමනුස්සෙහි ච සද්ධිං නිච්චං දිබ්බාහාරමෙව පරිභුඤ්ජිංසු; සබ්බෙසඤ්ච මහාදානං අදංසු. තතො පට්ඨාය දානං දදන්තා සීලං සමාදියන්තා උපොසථං උපවසන්තා යාවජීවං ඨත්වා ආයුපරියොසානෙ දෙවලොකෙ නිබ්බත්තිංසූති.

**චත්ථුලෙය්‍යපබ්බතවත්ථු දසමං.**

**වග්ගො දුතියො.**

# 21. දනදින්න-දුග්ගතස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

එකස්මිං සමයෙ ලංකාදීපවාසිනො සට්ඨිමත්තා භික්ඛූ මහාබොධිං වන්දිතුකාමා මහාතිත්ථෙන නාවං අභිරුය්හ ජම්බුදීපං ගන්ත්වා පාටලිපුත්තනගරෙ පිණ්ඩාය චරිංසු. අථ තෙ භික්ඛූ එකො දුග්ගතමනුස්සො දිස්වා අත්තනො මාතු-ගාමස්ස සද්දං කත්වා තං පක්කොසාපෙත්වා "භද්දෙ ඉමෙසං අය්‍යානං දානං දාතුකාමො; කිඤ්චි දෙය්‍යධම්මං අත්ථී"ති? ආහ. සා පන අත්තනො සාමිකස්ස වචනං සුත්වා අඤ්ඤං කිඤ්චි දාතබ්බං නත්ථීති ඤත්වා "සාමි අඤ්ඤං දාතබ්බ-යුත්තකං නත්ථි; මම පුත්තං මාරෙත්වා දානං දාතුං සක්කොමී"ති ආහ. සො පන උපාසකො තස්සා කථං සුත්වා "මම පුත්තං මාරෙත්වා කීදිසං නාම දානං දස්සසී"ති ආහ. සා "කිං න ජානාසි සාමි, මම පුත්තෙන මාරිතෙ අම්හාකං ඤාතකා මනුස්සා අම්හාකං සන්තිකං ආගච්ඡන්තා කිඤ්චි පණ්ණාකාරං ගහෙත්වා ආගච්ඡිස්සන්ති; තෙහි ආහතෙහි දානං දස්සාමා"ති ආහ. සො උපාසකො "සාධු භද්දෙ, සීඝං තං මාරෙහී"ති ආහ. සා "අහං මම පුත්තං මාරෙතුං න සක්කොමි; ත්වං මාරෙහි සාමී"ති ආහ. උපාසකො අහම්පි මාරෙතුං න සක්කොමි, තව පුත්තං ත්වමෙව මාරෙහීති ආහ. තෙ දාරකස්ස මාරණූපායං[1] ගවෙසමානා පච්ඡිමගෙහෙ වම්මිකම්හි මහන්තො සප්පො අත්ථි. සො සප්පො තං ඩසිත්වා මාරෙස්සතීති මන්තෙත්වා ආහංසු. තෙ උභොපි සාධූති වත්වා පුත්තං ආලිංගිත්වා චුම්බිත්වා පුඤ්ඤ-නියමෙන හත්ථෙ ච'ස්ස හෙණ්ඩුකං[2] ඨපෙත්වා 'පච්ඡිමගෙහෙ වම්මිකම්හි කීළාහි පුත්තා"ති වදිංසු. තෙහි පෙසිතො දාරකො ගන්ත්වා හෙණ්ඩුකෙන කීළන්තො වම්මිකම්හි හෙණ්ඩුකං පාතෙසි. සො හෙණ්ඩුකං ගණ්හිස්සාමීති වම්මිකච්ඡිද්දම්හි හත්ථෙ පවෙසයි.[3] සප්පො කුජ්ඣිත්වා

---

1 ඛි 2. මරණූපායං 2 කෝ. ගෙණ්ඩුකං (සබ්බත්ථ) 3. කෝ පවෙසෙසි

සුසුමායමානො[4] උට්ඨාය ඵණං කත්වා අට්ඨාසි. සො දාරකො අජානිත්වා ගන්ත්වා සප්පස්ස ගීවාය ගණ්හි. සො තස්ස ගණ්හන්තස්සෙව මාතාපිතූනං සද්ධාබලෙන චින්තිත—චින්තිත—(මනි)ධනාහරං (?) ධනදායකං අනග්ඝං අට්ඨං—සමණිරතනං අදාසි. තස්ස මාතාපිතරො ඝරද්වාරං නිස්සාය දාරකස්ස කිරියං ඔලොකයමානා ඝොරවිසස්ස සප්පස්ස ගීවාය ගණ්හන්තං අද්දසංසු. තෙ තස්ස හත්ථෙ ඔභාසන්තං මණිරතනං දිස්වා සීඝං ගන්ත්වා දාරකං උක්ඛිපිත්වා ගණ්හිත්වා හත්ථෙන මණිරතනං ගණ්හිත්වා ගෙහද්වාරෙ මහන්තං මණ්ඩපං කත්වා ආසනං පඤ්ඤාපෙත්වා තෙ සට්ඨිභික්ඛූ නිසීදාපෙත්වා මහාදානං දත්වා අත්තනො කත—කිරියං නගරවාසීනං කථෙත්වා මණිරතනං දානත්ථාය පතිට්ඨාපෙසුං. තෙ යාවජීවං බහුදානං දත්වා සීලං රක්ඛිත්වා ආයුපරියොසානෙ දෙවලොකෙ නිබ්බත්තිංසූති.

**දුග්ගතස්ස වත්ථු පඨමං.**

---

## 22. උත්තරොලියවත්ථුම්හි[1] අත්ථුප්පත්ති.

එකො ගොපාලකො ගොපාලගාමෙ යාගුං පිවිත්වා ගොරූපෙ රක්ඛණත්ථාය ගච්ඡති. ගච්ඡන්තකාලෙ තස්ස මාතුඋපාසිකා[2] [තව සන්තිකං ආගතො භවෙය්‍ය වා මා වාති වත්වා]? අරඤ්ඤෙ ඛාදෙය්‍යාසීති වත්වා කන්දඛණ්ඩං[3] අදාසි. දාරකො කන්දඛණ්ඩකං[3] ගහෙත්වා ගච්ඡන්තො අන්තරාමග්ගෙ පංසුකූලිකත්ථෙරං දිස්වා චිත්තං පසාදෙත්වා කන්දඛණ්ඩකං[3] ථෙරස්ස අදාසි. ථෙරො තං ගහෙත්වා එතස්ස දින්නාහාරං පච්චවෙක්ඛිත්වා කන්දඛණ්ඩ විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණිත්වා පච්ඡා පරිභොගමකාසි. සො ගාමදාරකො පච්ඡා කාලකිරියං කත්වා තස්මිං යෙව ගාමෙ එකස්ස මාතුගාමස්ස කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හි.

4. "සුසුයන්තො"ති භවිතබ්බං. 1. බි 2 උත්තරොකාලියා
2. කෝ මාතා උපාසිකා. 3 බි 1. බි 2. කණ්ඩඛණ්ඩං

තස්මිං ගාමෙ අඤ්ඤතාවාපියං නිධිකුම්භො සබ්බෙසං දිස්ස-
මානො යෙව පවට්ටමානො සඤ්චරති. එකා පන ඉත්ථී තං
දිස්වා වෙගෙන ගන්ත්වා ආලිඞ්ගිත්වා අග්ගහෙසි, තස්මිං
ඨානෙ පරිග්ගහිතදෙවතා තස්සා හත්ථග්ගහිතං මොචෙසි.
සා පුනප්පුනං ගන්ත්වා ගණ්හි. දෙවතා තස්ස එකං හත්ථං
කුම්භියං අල්ලීයාපෙසි. සා භීතතසිතා හුත්වා අත්තනො
පසාධනඤ්ච නිවත්ථසාටකඤ්ච ආදිං කත්වා ඝටෙ පක්ඛිපිත්වා
තතො තං ගණ්හනචිත්තෙන නිවාරිතෙ තතො හත්ථමුත්ත-
මත්තෙන නිධිකුම්භො පථවිං පාවිසි. සා මාතුගාමා[4] ගෙහං
අගමාසි. නිධිකුම්භසඤ්චරණභාවො ච[5] සකලගාමෙ
පාකටො අහොසි. කසන්දඛණ්ඩදින්න—දාරකස්ස මාතා එතස්ස
කුච්ඡිගතෙ යෙව තථාරූපෙන කම්මෙන විරරත්ත[6] අගමාසි.
තදා නිධිකුම්භො උග්ගන්ත්වා පථවිතලෙ සයමෙව වට්ට-
මානො සඤ්චරති. තදා ගාමදාරකස්ස මාතා නිධිකුම්භං
දිස්වා "සචෙ මම පුඤ්ඤෙන උප්පන්නොසි, මම සන්තිකං
ආගච්ඡාහී"ති ආහ. සො තස්සා එවං වුත්තෙන නිධිකුම්භො
දූරං අගමාසි. දාරකස්ස මාතා හට්ඨෙන දාරකං දස්සෙත්වා
"සචෙ මම කුච්ඡිගතස්ස ඉමස්ස පුඤ්ඤානුභාවෙන
උප්පන්නොසි, මම සන්තිකං ආගච්ඡාහී"ති ආහ. එවං
නිධිකුම්භො තස්සා සන්තිකං අගමාසි. එවං සන්තෙ තව
ඨානං ත්වමෙව ජානාහීති ආහ. එවං වුත්තෙ සො
නිධිකුම්භො සයමෙව තස්සා මාතුගාමස්ස ගෙහං ගන්ත්වා
සයමෙව පටිච්ඡන්නට්ඨානෙ අට්ඨාසි. දාරකස්ස අනිච්ඡාය
අඤ්ඤස්ස පරිභොගං නාහොසි. අපරභාගෙ ඉමස්ස දාරකස්ස
මාතුකුච්ඡිතො නික්ඛන්තකාලෙ සික්ඛාපද-ගණ්හනමඞ්ගලෙ
දාරකස්ස මාතා නිධිචාටිතො වත්ථං ගහෙත්වා නිවාසෙසි.
වත්ථසාමිකා මාතුගාමො සඤ්ජානිත්වා මම වත්ථන්ති අග්ග-
හෙසි. ඉමිස්සා කථං සුත්වා සා වත්ථසාමිකස්ස දාරකස්ස
ලද්ධාකාරං විත්ථාරෙත්වා කථෙසි. තං සුත්වා මනුස්සා
"ඉමිස්සා ඉත්ථියා නිධිකුම්භො අත්ථී"ති රඤ්ඤො කථෙසුං.

---

4. කෝ. බි 2. මාතුගාමො. 5. කෝ. බී 2. පොත්ථකෙසු නත්ථි.
6. ර. විරරත්ථං. කෝ. විරරත්තං. ('විවරන්තං'ති මඤ්ඤාමි.)

රාජා ධනං ගණ්හනත්ථාය මනුස්සෙ පෙසෙසි. ගතමනුස්සා ගහෙතුං අසක්කොන්තා "ධනසාමිකස්ස අතිච්ඡාය ගහෙතුං න සක්කොමා"ති වත්වා රඤ්ඤො සාසනං පෙසයිංසු.[7] රාජා එතෙසඤ්ච ගාහාපෙත්වා ආගච්ඡන්තූ ති පටිසාසනං පෙසෙසි. නිධිකුම්භිසාමිකො "රඤ්ඤො ධනං දෙහී"ති වත්වා උදකෙන සිඤ්චිත්වා ධනං උද්ධරිත්වා ගෙහං පරිපූරෙසි. තතො ධනං සකටෙ[8] පූරෙත්වා රඤ්ඤො පාහෙසුං. තතො පට්ඨාය ගාමො උත්තරොලියගාමො[9] නාම අහොසි. රාජා තෙසං තුස්සිත්වා මහන්තං යසං දත්වා තෙන ධනෙන දානං දත්වා තෙසං තමෙව ජනපදං දත්වා පෙසෙසි. තෙ තතො පට්ඨාය දානාදීනි පුඤ්ඤානි කත්වා පුත්තදාරෙහි සද්ධිං සග්ගමග්ගං පූරයමානා අගමංසූති.

**උත්තරොලියවත්ථු දුතියං**

---

## 23 මහාසෙනරඤ්ඤො වත්ථුම්හි අත්ථුප්පත්ති

පාටලිපුත්තනගරෙ මහාසෙනරාජා නාම එකදිවසෙ[1] ද්විසහස්සානං භික්ඛූනං නිච්චදානං දෙති. අථෙකදිවසං රාජා එවං ආණාය දින්නදානතො අත්තනො සහත්ථෙන කම්මං කත්වා දින්නදානං මහප්ඵලන්ති චින්තෙත්වා අත්තනො කණිට්ඨකං ආදාය අඤ්ඤෙසං අජානාපෙත්වා අඤ්ඤාතක වෙසෙන නගරා නික්ඛමිත්වා උත්තරමධුරං නාම නගරං අගමාසි. තස්මිං නගරෙ සෙට්ඨිස්ස ගෙහෙ තීණි වස්සානී භතියා කම්මං අකාසි. සෙට්ඨිපුත්තො තෙසං කම්මං දිස්වා "තුම්හෙ ද්වෙපි සුබුමාලරූපා; තුම්හාකං ඉමස්මිං ගෙහෙ භතියා කම්මකරණං තීණි වස්සානි අහොසි. එවං භතියා කම්මං කරොන්තානං අප්පමත්තම්පි අනාචාරං නත්ථි. අම්හෙහිපි තුම්හාකං දින්නයාගුභත්තං ඨපෙත්වා අඤ්ඤං කිඤ්චි නත්ථි තුම්හාකං යං අත්ථි, තං වදෙථා"ති

---

7. සි 1 සී 2. පෙසෙසිංසු. 8. සි 2 සෝ. ර. සකටෙන.
9. සි ර. සෝ. උත්තරොතාලිය ගාමො. 1. සි 2. එකදිවසං.

පටිපුච්ඡි. තෙ සෙට්ඨිනො කථං සුත්වා ඉමස්මිං ජනපදෙ සාලියො මනාපාති වදන්ති; සාලිඅත්ථාය ආගතම්හාති ආහංසු. සෙට්ඨි තෙසං කථං සුත්වා තුස්සිත්වා සකට-සහස්සමත්තං රත්තසාලිං අදාසි තෙ තං සාලිං ලභිත්වා "අම්හාකං නගරං ඉමං සාලිං පාපෙථා"ති ආහංසු. සො සාධූති වත්වා බහු සකටෙ සාලිස්ස[2] පූරෙත්වා[2] ඉමෙසං පෙසෙසි. එතෙ[3] අත්තනො නගරං ගන්ත්වා සාලිං රාජගෙහෙ ඨපෙත්වා සෙට්ඨිස්ස නානාවණ්ණධනෙන[4] සකටෙ පූරෙත්වා පෙසෙසි. තතො පට්ඨාය තෙ ද්වෙ භාතු—කණිට්ඨකා සයමෙව කොට්ටෙත්වා පප්ඵොටෙත්වා[5] තණ්ඩුලරාසිං කත්වා පඤ්චන්නං භික්ඛුසතානං නානග්ගර-සෙන අම්බිලභත්තං සම්පාදෙත්වා මහාරහං ආසනං පඤ්ඤා-පෙත්වා රාජගෙහෙ යෙව ඨපෙත්වා කාලං ඝොසාපෙසුං පඤ්චභික්ඛුසතානි ආකාසෙනා'ගමිංසු. පියංගුදීපවාසී පන[6] මහාසීවත්ථෙරො නාම පියඞ්ගුදීපසඞ්ඝත්ථෙරො තත්ථාගන්ත්වා අම්බිලභත්තං ගහෙත්වා "එතෙ මං පස්සන්තූ"ති අධිට්ඨාය ආකාසං ලඞ්ඝිත්වා පියඞ්ගුදීපමෙව අගමාසි. රාජා ච කණිට්ඨකො ච පඤ්චසතානං භික්ඛූනං පරිභොගං කරොන්තානං දිස්වා චිත්තං පසාදෙත්වා දින්නදානං අනුස්ස-රන්තා උභොපි සොතාපන්නා අහෙසුන්ති.

මහාසෙනරඤ්ඤො වත්ථු තතියං

---

## 24. තම්බසුමනත්ථෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

සද්ධාතිස්ස – මහාරඤ්ඤො කාලෙ එකො රාජපුරිසො රාජකම්මෙන කොඨසාලගාමං[1] අගමාසි. තස්ස පුරිසස්ස දිවාභොජනකාලෙ තං බලිභත්තං කත්වා ආනෙසුං. තදා එකො සමණො භික්ඛාය චරන්තො තං ඨානං සම්පාපුණි.

---

2. ර. ඛ 2. සාලි පූරෙත්වා. 3. ර. එතෙන. 4. ඛි 2. ර. කේ. නානාවණ්ණධනස්ස. 5. ර. කේ. පොත්ථොසු නත්ථි. 6. ර. – දීපවාසීනං. 1. ඛි 1. කොට්ටලසාලගාමං. කේ. කොට්ටලසාලගාමං.

සො පුරිසො ථෙරං පස්සිත්වා අත්තනො ලද්ධභත්තං දතං දාපෙත්වා සරිත්තසටං[2] දාපෙසි. සො පුරිසො අත්තනො කතකම්මං නිට්ඨාපෙත්වා නගරං ගතො. සො අපරභාගෙ කාලකිරියං කත්වා මාලානාමගාමෙ[3] උප්පජ්ජි, නාමෙන **සුමනො** නාම අහොසි සො සම්පත්තිං පහාය බ්‍රාහ්මණාරාමවිහාරෙ භික්ඛු අහොසි. සො නාමෙන **තම්බසුමනත්ථෙරො** නාම අහොසි. සො අපරෙන සමයෙන විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණි. තස්ස පන ථෙරස්ස ද්වාදසවස්සකාලෙ බ්‍රාහ්මණතිස්සභයං උප්පජ්ජි. සො ථෙරො අත්තනා සහචරකෙ පඤ්චසතෙ භික්ඛූ ආහ: "ආවුසො ජම්බුදීපං ගච්ඡාමා"ති, තස්මිං විහාරෙ මහානිම්බරුක්ඛෙ නිබ්බත්ත - දෙවපුත්තො නිච්චමෙව ථෙරස්ස උපට්ඨානං කරොති. ථෙරො දෙවපුත්තස්ස ආගතකාලෙ "සීහළදීපෙ මහන්තං ඡාතකභයං උප්පන්නං; අම්හාකං සන්තිකෙ පඤ්චභික්ඛුසතානි වසන්ති, තෙ භික්ඛාය කිලමන්ති; තෙ භික්ඛූ ආදාය ජම්බුදීපං ගච්ඡාම දෙවපුත්තා"ති ආහ. දෙවපුත්තො තස්ස කථං සුත්වා මය්හං අය්‍යස්ස භික්ඛාහාරඤ්ච ආරක්ඛඤ්ච මම භාරොති වත්වා "තුම්හෙ කත්ථචි අගන්ත්වා එත්ථෙව වසථා"ති ආහ. තතො පට්ඨාය දෙවපුත්තො ථෙරස්ස දිබ්බභත්තඤ්ච දිබ්බචීවරඤ්ච දෙති. ථෙරස්ස උප්පන්නභත්තං පඤ්චන්නං භික්ඛුසතානං සබ්බෙසං පහොනකං අහොසි. ද්වාදසවස්සානි[4] භයෙ වූපසන්තෙ තතො නික්ඛමිත්වා පඤ්චසතෙහි භික්ඛූහි සද්ධිං චාරිකං චරමානො අනුපුබ්බෙන එකං කණ්ඩරාජගාමං[5] සම්පාපුණිත්වා භික්ඛාය චරිත්වා භත්තං ලභිත්වා භුඤ්ජනත්ථාය නිසීදිංසු. මෙඝපටලසඤ්ඡන්නො වද්දලිභූතෙ[6] ආකාසෙ සූරියො න පඤ්ඤායති. භික්ඛූ කුක්කුච්චං කත්වා අභුඤ්ජිත්වා නිසීදිංසු. ථෙරො එකං පාසාණඛණ්ඩං ගහෙත්වා ආකාසෙ ඛිපි. සූරියො ච ඔභාසං මුඤ්චන්තො ආකාසෙ අට්ඨාසි.

---

2. රස. සතසහිත භත්තං "පරිත්තසතං"ති මඤ්ඤාමි. 3. බි 2. මාලාගාමෙ. රස. වල්ලවහගාමෙ. සද්ධම්මාලංකාරෙ "වලගම" 4. "වස්සෙහි"ති භවිතබ්බං. 5. රස. කණ්ඩරාජිකා නාම මහාගාමං. සද්ධම්මාලංකාරෙ "රජරට කාඩරොද නම් මහගමට". 6 බි 1 බි 2. කෝ-වච්චලිභූතෙ.

තස්මිං කාලෙ භික්ඛූ භුඤ්ජිංසු. තතො පට්ඨාය තං ඨානං "මණිසුරියං" නාම අහොසි. ථෙරො තතො නික්ඛමිත්වා ගඞ්ගාය සමීපෙ චූලකං නාම ගාමෙ[7] භික්ඛාය චරිත්වා භත්තං ගහෙත්වා ගඞ්ගාය තීරෙ නිසීදිත්වා භුඤ්ජති. භත්තස්ස ලූඛත්තා භික්ඛූ භුඤ්ජිතුං න සක්කොන්ති. ථෙරො භික්ඛූ ඔලොකෙත්වා "භත්තං සුගන්ධසප්පිනා භුඤ්ජථා"ති? ආහ. භික්ඛූ "එවං කරිස්සාම භන්තෙ"ති ආහංසු ථෙරො තස්මිං කාලෙ අත්තනො පුරිමත්තභාවෙ එකස්ස භික්ඛුනො දින්න-පරිත්තඝතං[8] ආවජ්ජෙත්වා ගඞ්ගං ඔලොකෙසි මාලගාම-විහාරතිත්ථතො පට්ඨාය යාව හත්ථකතතිත්ථං එත්ථන්තරෙ දියොජනමත්තකෙ ඨානෙ උදකං පරිවත්තිත්වා සුගන්ධඝත-මෙව අහොසි. තං පවත්තිං සුත්වා මහාජනො කුම්භඝට-භාජනාදීහි සකටෙ[9] පූරෙත්වා අත්තනො අත්තනො ඉච්ඡි-තබ්බපමාණං ගහෙත්වා අගමංසූති වදන්ති.

**තම්බසුමනත්ථෙරස්ස වත්ථු චතුත්ථං.**

---

## 25. පූවපබ්බතවාසී – තිස්සත්ථෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

කස්සපසත්ථුකාලෙ **රක්ඛාචුණ්ණවාණිජො** ජනපදගාමං ගන්ත්වා **රක්ඛාචුණ්ණෙ**[1] වික්කිණන්තො ගාමෙ විචරති. එකා යොබ්බනිත්ථී ගාමවාසී වාණිජස්ස හත්ථතො රක්ඛාචුණ්ණෙ[1] ගණ්හන්තී වාණිජස්ස "ඡාතොම්හි අම්මා"ති වදන්තස්ස වචනං සුත්වා සාලිතණ්ඩුලෙන භත්තං පචිත්වා මධුරමංසරසෙන සුගන්ධඝතෙන සද්ධිං භත්තං වඩ්ඪෙසි. තදා ඡාතකසුනඛො පවෙධමානො වාණිජස්ස සන්තිකං ආගතො. සො වාණිජො එතං සුනඛං ඔලොකෙන්තො තස්ස කාරුඤ්ඤෙන තෙලෙන ච රසෙන ච මිස්සෙත්වා එකං භත්තපිණ්ඩං අදාසි. සො තං

7. රස. චුල්ලතවාමගාමෙ. සද්ධම්මාලඞ්කාරෙ. "මහවැලිගං සමීපයෙහි සුලුවැසර නම් ගම." 8. ඝරිත්තඝටං (සබ්බෙසු විය රසවාහිනිං.) 9. සී 1. සී 2. ඝටෙ. 1. රස. මනොසිලාචුණ්ණං.

කම්මං කත්වා ජීවිතපරියොසානෙ දෙවලොකෙ නිබ්බත්ති. සො දීඝමද්ධානං දිබ්බසම්පත්තිං අනුභවිත්වා පච්ඡා චවිත්වා සීහළදීපෙ ගඞ්ගාතීරෙ පූවගාලකගාමෙ[2] නිබ්බත්ති සො අනුක්කමෙන මාතුකුච්ඡිතො නික්ඛමිත්වා තිස්සො නාම අහොසි පච්ඡා පූවගාලකවිහාරෙ පබ්බජිත්වා නචිරෙනෙව අරහත්තං පාපුණි. සො ථෙරො පුඤ්ඤවා අහොසි තස්ස පත්ත ථෙරස්ස පත්තං අඩ්ඪො වා දලිද්දො වා ගණ්හාති, සාලි තණ්ඩුලභත්තෙන සද්ධිං එකං මධුරමංසපිණ්ඩකඤ්ච[3] සුගන්ධ සප්පිනාළිකඤ්ච අලද්ධට්ඨානං නාම නත්ථීති වදන්ති. ථෙරස්ස එතෙනුපායෙන දූතං දෙන්තෙනෙව සට්ඨිසංවච්ඡරං අතික්කමි. අථෙකදිවසං එකො අමච්චො ඉමස්ස ථෙරස්ස යෙ කෙචි භත්තං නිමන්තෙන්ති, තෙ තස්ස සාලිභත්තඤ්ච මධුරමංස-පිණ්ඩකඤ්ච[3] සුගන්ධසප්පිනාළිකඤ්ච දෙන්තීති වදන්ති. තං වීමංසිස්සාමීති චින්තෙත්වා අමච්චො පච්චූසසමයෙ අත්තනො මාතුගාමං එවමාහ. "පූවනාලවිහාරෙ තිස්සත්ථෙරං අජ්ජ නිමන්තෙස්සාමි; ථෙරස්ස ආගතකාලෙ පටිපුච්ඡිත්වා අජ්ජ මිස්සකතණ්ඩුලෙන මිස්සකපණ්ණං පචිත්වා යාගුං දත්වා දිවා එවරූපෙන පණ්ණසූපෙන මිස්සකභත්තමෙව පචිත්වා දෙහී"ති වත්වා විහාරං ගන්ත්වා ථෙරං නිමන්තෙත්වා සයං අඤ්ඤත්ථ අගමාසි. අමච්චස්ස ගෙහෙ වසනදෙවතා එතස්ස කථං සුත්වා "න ජානාති මඤ්ඤෙ ඉමස්ස ථෙරස්ස භවන්තරෙ කතකම්ම"න්ති චින්තෙත්වා සො දෙවපුත්තො තස්ස අමච්චස්ස ගෙහෙ මහල්ලකපුරිසො විය හුත්වා සාලිතණ්ඩුලඤ්ච එකං මධුරමංසපිණ්ඩකඤ්ච[3] සප්පිඝටඤ්ච ගහෙත්වා ගෙහං ගන්ත්වා අමච්චස්ස භරියාය අදාසි. තාය "ඉදං කුහිං ආභත"න්ති වුත්තෙන අමච්චෙන දින්නභාවං කථෙසි. "අජ්ජ පූවගාලක-විහාරවාසී-තිස්සත්ථෙරස්ස භත්තං නිමන්තෙසිං, ඉදං සබ්බං ගහෙත්වා ථෙරස්ස භත්තං දෙහී"ති වත්වා සයං අන්තරධායි. මාතුගාමො තං සබ්බං ගහෙත්වා ථෙරස්ස භත්තං අදාසි. අමච්චො ථෙරස්ස භත්තකිච්චපරිනිට්ඨිතකාලෙ ආගන්ත්වා කෙන පකාරෙන භත්තං අදාසීති මාතුගාමං පටිපුච්ඡි. තදා

2. රස. පූවගල්ලකගාමෙ. 3. රස. මයූරමංස —

සබ්බං අත්තනා[4] ලද්ධභාවං කථෙසි. අමච්චා "කුතො තයා ලද්ධ"න්ති ආහ. සා මෙ තුම්හෙහි සබ්බං පෙසිතන්ති වත්වා එකො මනුස්සො මය්හං අදාසීති ආහ. ථෙරො තං කාරණං සුත්වා දින්නදානෙ ආනිසංසං ජානාපෙස්සාමීති වත්වා විහාරං ගන්ත්වා භෙරිං පහරාපෙත්වා භික්ඛුසංඝං සන්නිපාතාපෙත්වා අත්තනො පරිනිබ්බානභාවං කථෙසි. භික්ඛුසංඝො "භන්තෙ තුම්හෙ මහාපුඤ්ඤවන්තො; කතරකම්මස්ස නිස්සන්දෙන අයං ලාභො භවතී"ති පුච්ඡිංසු. තෙසං කථං සුත්වා ථෙරො කස්සපබුද්ධකාලෙ අත්තනා කතකම්මං කථෙත්වා තස්සෙව[5] කම්මනිස්සන්දෙන පඤ්චජාතිසතෙහි දිබ්බාහාරං ලභතීති වත්වා සයං පරිනිබ්බායි. එතෙසං කථං සුත්වා මහාජනො දානාදීනි පුඤ්ඤානි කත්වා සග්ගපුරං පූරෙත්වා අගමාසීති.

**පූවගාලකතිස්සත්ථෙරස්ස වත්ථු පඤ්චමං.**

---

## 26. පානීයදින්න – බුද්ධවම්ම – වාණිජස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

පාටලිපුත්තනගරෙ බුද්ධවම්මො නාම වාණිජො සකටසත්ථවාහෙ ගහෙත්වා වාණිජකම්මත්ථාය ජනපදෙ විචරන්තො සත්ථරි බහුභික්ඛුසංඝෙන පරිවාරෙත්වා ජනපදචාරිකං චරන්ත දිස්වා සත්ථු සන්තිකං ගන්ත්වා සත්ථාරං නිමන්තෙසි. සත්ථා එවරූපං විකාලභොජනං න වට්ටතීති ආහ. වාණිජො සත්ථුස්ස කථං සුත්වා එවං සන්තෙ විකාලෙ කිං කප්පතීති ආහ. අට්ඨන්නං පානානං[2] වට්ටනභාවං කථෙසි වාණිජො මුද්දික පානං ඛණ්ඩසක්ඛරං[3] මද්දිත්වා පානකං කත්වා බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස අදාසි. සත්ථා වාණිජස්ස අනුපුබ්බිකධම්ම දෙසනං දෙසෙත්වා ජනපදචාරිකං පක්කාමි. සො පන

4 ර. කෝ. අත්තනෙනා 5 බී 1. බී 2. තස්සෙතං.

1 බී 2. ර. පානදින්න — බුද්ධධම්ම වාණිජකස්ස.

2. බී 2. පානකානං 3. රස. සහ සක්ඛරාරසෙහි මුද්දිකපානං කත්වා.

වාණිජෝ තසමිං තසමිං ජනපදෙ වාණිජ්ජාය වාරිකං චරමානො පචඡා මහාවටටවතබණඩං[4] සමපාපුණි. එතෙන ගහිතපානීයං සබබං සකටෙසු පරිකඛයං අගමාසි. අයඤච බුදධවමමවාණිජෝ පානීයපිපාසෙන පිපාසිතො අහොසි. සකටෙසු සබබවාටිසු පානීයං ඔලොකෙනෙතා එකසමිං වාටියං උළුංකමතතං පානීයං අතථීති වදිංසු. වාණිජෝ සීසං ආහරථාති ආහ. වාණිජසස පානීයං පිවනකාලෙ මුදදික-පානරසසදිසං අහොසි. වාණිජෝ සොමනසසො හුතවා සතුථො දිනනපානකනිසසනෙදන එවරූපං පානීයං උපපනනනති චිනෙතතවා සයමෙව කොටඨකං ගහෙතවා වාටිසස පිධානං විවරි. සකලවාටියො මුදදිකපානෙන පරි-පුණණො අදදස. සො සොමනසසො හුතවා සබෙබ මනුසෙස ච සබෙබ ගොණෙ ච මුදදිකපානං පායෙසි. අනෙකෙසං පිවනතානං ගතගතටඨානෙ අකඛයං හුතවා නිබබතති. වාණිජෝ අතතනො කතතබබකමමං නිටඨාපෙතවා සතථාරං පසසිතවා'ව ගෙහං ගමිසසාමීති චිනෙතතවා සීසං වෙළුවන-විහාරං ගනතවා සතථාරං අදදස. සතථා වාණිජෙන සදධිං පටිසනථාරං කතවා කුහිං ගනතවා ආගතොසීති ආහ. "භගවා පටිහාරියං දිසවා තුමහාකං වනදිතවා ගමිසසාමීති ආගතොමහි සබබඤඤූති ආහ. සතථා තෙන හි කථෙහීති ආහ. වාණිජෝ සබබං විතථාරෙතවා "තං පානකං පිවිතවා අඤඤආහාරෙන කිචචං නතථි. තං පානකං එවරූපං රසසමපනනං අහොසී"ති කථෙසි. සතථා තං සුතවා තසස ධමමකථං කථෙසි. ධමමං සුතවා සො වාණිජෝ සතථාරං නිමනෙතතවා පුනදිවසෙ මහා දානං දතවා අතතනො ගෙහං ගනතවා දානාදීනි පුඤඤානි කරොනෙතා අපරභාගෙ චවිතවා දෙවලොකෙ නිබබතති. අටඨපානකං අවිජහිතමෙව හොති; තං පානකං එවරූපං රසසමපනනං අහොසීති

බුදධවමමවාණිජකසස වතථු ඡටඨං.

---

4 රසං: මහාවතතනියං නාම කනතාරං.

# 27. සුවණ්ණතිලකාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

එකා නගරවාසී මාතුගාමො අත්තනො ධීතරං ගහෙත්වා ආරාමං ගන්ත්වා අභයසුන්දරමහාථූපෙ[1] පුප්ඵං පූජෙතුං ගන්ත්වා අත්තනො ධීතු හත්ථෙ පුප්ඵචඞ්ගොටකං ඨපෙත්වා ඝටං ගහෙත්වා පොක්ඛරණිං අගමාසි. සා ගාමදාරිකා මාතරි උදකං ගහෙත්වා අනාගතෙ යෙව අධොතාසනෙ සත්ථුගුණං අනුස්සරිත්වා පුප්ඵමුට්ඨිං පූජෙසි. තස්සා මාතා ආගන්ත්වා "චණ්ඩාලි, කස්මා අධොතාසනෙ මාලං පූජෙසී"ති ආහ. සා මාතරං කුජ්ඣිත්වා "ත්වං චණ්ඩාලීසී"ති ආහ. තස්ස වචනස්ස නිස්සන්දෙන සකත්තභාවා චවිත්වා උත්තර-මධුරනගරෙ ගන්ධබ්බබ්‍රාහ්මණචණ්ඩාලස්ස ධීතා අහොසි. සා උත්තමරූපධරා අහොසි. ද්වින්නං ථනානමන්තරෙ සුවණ්ණවණ්ණං තිලකං[2] අහොසි. තස්සා පන පභා උක්කාමුඛෙ විජ්ජුලතාඔභාසනකාලො විය අහොසි. සමන්තා චතුහත්ථං අන්ධකාරං විධමති. මුඛතො උප්පල-ගන්ධො ච කායතො චන්දනගන්ධො ච පවායති. යෙ කෙචි තං පස්සන්ති, තෙ මනුස්සා උම්මත්තා විය කාමමදෙන[3] විසඤ්ඤීභූතා භවන්ති. ඉමිස්සා මනුස්සා චණ්ඩාලස්ස ධීතු-භාවෙන ආවාහං කරොන්තා නත්ථි; තස්මිං යෙව නගරෙ ජෙට්ඨබ්‍රාහ්මණචණ්ඩාලස්ස පුත්තො තස්සා අත්ථාය පණ්ණාකාරං පෙසෙසි. සා පන චණ්ඩාලධීතා සමාන-ජාතිකෙ චණ්ඩාලෙ[4] න රොචති. සො පන චණ්ඩාලබ්‍රාහ්මණපුත්තො රඤ්ඤො කථෙසි. "අය්‍ය මහාරාජ, සමානජාතිකානං පෙසිතපණ්ණාකාරං න ගණ්හාති, න රොචෙතී"ති ආහ. රාජා තස්ස පිතරං පක්කොසාපෙත්වා තව ධීතා සමානජාතිකානං පෙසිතං පයුත්ත-පණ්ණාකාරං කස්මා න ගණ්හාතී ති? ආහ. සො බ්‍රාහ්මණචණ්ඩාලො "මහාරාජ, මම ධීතා ජාතිසම්පන්න—ඉස්සරකුලස්ස පුත්තං

1. රස. "අභයුත්තරචෙතියෙ. 2. සෝ. සුවණ්ණතිලකං 3. කාමමදන්තන (සබ්බෙසු) 4. සමානජාතිකෙන චණ්ඩාලෙන (සබ්බෙසු.)

කාමෙමී''ති ආහ. එවං සන්තෙ පඤ්චමධුරනගරෙ උද්දාල-බ්‍රාහ්මණො[5] නාම ජාතිසම්පන්නො අත්ථි, සො පන මාතුගාමානං ජෙගුච්ඡපටික්කූලතාය වත්වා මාතුගාමෙන සද්ධිං සංවාසං න කරොති. සො රාජගෙහතො ආගච්ඡන්තො ච රාජගෙහං ගච්ඡන්තො ච සොළසඝටබීරොදකෙන මග්ගෙ සිඤ්චාපෙන්තො ගච්ඡති. සචෙ තව ධීතා සක්කොති, එතෙන සද්ධිං සංවාසං කරොතූති; තං තස්සා කථෙහීති ආහ. තස්සා පිතා ගන්ත්වා රඤ්ඤො කථිතනියාමෙනෙව සබ්බං කථෙසි. සා එවමාහ: "අහං පන රඤ්ඤො වුත්තට්ඨානෙ වසිස්සාමීති චින්තෙමි[6]. එවං සන්තෙ පාතොව ගච්ඡාමි; අහං පන [න]සක්කොමි උජ්ජාලබ්‍රාහ්මණෙන සද්ධිං වසිතු''න්ති ආහ. සො පන ධීතු වචනං සුත්වා සහස්සග්ඝ-නිකං කම්බලකඤ්චුකං පාරුපාපෙත්වා සයං අත්තනො වීණාදිතුරියභණ්ඩං ආදාය පඤ්චමධුරනගරං ගච්ඡන්තො අන්තරාමග්ගෙ එකස්ස රඤ්ඤො ගබ්භං කරොන්තො ධීතරං අත්තනො පිට්ඨිපස්සෙ නිසීදාපෙත්වා ගබ්භං අකාසි. සා රඤ්ඤො ඔලොකෙන්තී[7] අත්තනො සරීරෙ කඤ්චුකං අපනෙත්වා පභං සඤ්ඤාපෙසි. රාජා තං දිස්වා රූපමත්තො හුත්වා විසඤ්ඤී අහොසි. සස්සාමිකස්සාමික-භාවං පටිපුච්ඡන්තො බ්‍රාහ්මණො චණ්ඩාලධීතුභාවං කථෙසි. රාජා එවරූපං වණ්ණපොක්ඛරසම්පන්නඉත්ථියා දස්සන-කාලතො පට්ඨාය ජීවිතෙන කිච්චං නත්ථීති අසිං ගහෙත්වා අත්තනො සීසං ඡින්දිත්වා කාලමකාසි. එවමෙව අන්තරා-මග්ගෙ පඤ්චරාජානො කාලමකංසු. සා අනුක්කමෙන පඤ්චමධුරනගරං ගන්ත්වා අත්තනො ආගතභාවං කථාපෙත්වා රාජානං අද්දස. තදා උද්දාලබ්‍රාහ්මණො රඤ්ඤො පන හත්ථපස්සෙ කම්බලභද්දපීඨෙ නිසින්නො අහොසි. සුවණ්ණ-තිලකා අත්තනො පිතු පිට්ඨිපස්සෙ නිසින්නා "උද්දාල-බ්‍රාහ්මණො නාම කතමො''ති ආහ. එස කම්බලපීඨෙ නිසින්නො උද්දාලබ්‍රාහ්මණොති ආහංසු. සා බ්‍රාහ්මණස්ස

5 (සබ්බෙසු, උජ්ජාල—(සබ්බත්ථ). 6 චින්තෙසි (සබ්බෙසු) 7 රඤ්ඤො, ඔලොකෙන්ති (සබ්බෙසු)

ඉඩ්ඝතං (?) ඔලොකෙන්තස්ස ඉත්ථිකුත්තං දස්සෙත්වා අත්තනො කඤ්චුකං අපනෙත්වා පහං විස්සජ්ජාපෙසි[4] බ්‍රාහ්මණො තං ඔලොකෙත්වා නිසින්නාසනෙ යෙව උම්මත්තො හුත්වා සරීරෙ තං තං පහරිත්වා දුක්ඛං උප්පාදෙසි. සො රොගප්පත්තො විය හුත්වා අත්තනො ගෙහං ගන්ත්වා තස්සා සන්තිකං අත්තනො සුහජ්ජෙ සස්සාමිකාස්සාමිකභාවං ජානනත්ථාය පෙසෙත්වා තං ජානාපෙත්වා අත්තනො ගෙහං ආහරාපෙසි. ඉම්සා අත්තනො ගෙහං ආගතකාලතො පට්ඨාය චත්තාරො මාසෙ රක්ඛෙදු උපට්ඨානං නාගමාසි. අන්තෙවාසිකානං පඤ්චසතරාජ්ජුනං සිප්පඤ්ච න කථෙසි. තස්ස අන්තෙවාසිකා ච රාජානො ච තං කාරණං ඤත්වා "එතිස්සා ජීවමානාය අම්හාකං සජ්ඣායනට්ඨානං වා සිප්පුට්ඨානං[5] වා කිඤ්චි නත්ථි; ඉමං දාරිකං මාරෙමා"ති වත්වා හත්ථිං මත්තං කාරාපෙත්වා සබ්බෙ රාජඞ්ගණෙ නිසීදිත්වා බ්‍රාහ්මණං පක්කොසාපෙත්වා "අම්හාකං ආචරියබ්‍රාහ්මණිං පස්සිතුකාමම්හා"ති ආහංසු. බ්‍රාහ්මණො තං සුත්වා ආගමනත්ථාය පෙසෙසි. රාජානො ච බ්‍රාහ්මණියා ආගමනභාවං ඤත්වා හත්ථිං විස්සජ්ජාපෙසුං. හත්ථි ආගන්ත්වා සොපි තස්සා රූපමත්තො හුත්වා සොණ්ඩාය තං ගහෙත්වා අත්තනො කුම්භෙ නිසීදාපෙත්වා රාජ්ජුනං සන්තිකෙ ඨපෙසි. තෙ රාජානො එතෙන නයෙන මාරෙතුං අසක්කොන්තා පුන දිවසෙ අඤ්ඤසං පයොජෙත්වා මාරාපෙසුං. බ්‍රාහ්මණො එවරූපං මාතුගාමං අලද්ධකාලතො පට්ඨාය ජීවිතෙන කිච්චං නත්ථීති රාජඞ්ගණෙ දාරුචිතකං කාරාපෙත්වා අග්ගිං පවිසිත්වා මතොති වදන්ති ති.

## සුවණ්ණතිලකාය වත්ථු.

---

4 සෝ. විස්සජ්ජෙසි    5 බි 2. ඡපොත්ථකෙ නත්ථි.

# 28. චූළපට්ඨාක-තිස්සවත්ථුම්හි අත්ථුප්පත්ති.

රොහණජනපදෙ දුට්ඨගාමණිඅභයමහාරාජකාලෙ කණ්ඩුලහත්ථී පලායිත්වා පාචීනපස්සං ගන්ත්වා තස්මිං තස්මිං ඨානෙ විචරන්තො මහානිජ්ඣරවිහාරෙ[1] පංසුකූලිකභික්ඛූ දිස්වා තෙ උපට්ඨානං කරොන්තො තත්ථෙව විහාසි. දුට්ඨගාමණී මහාරාජා පන හත්ථිං ඔලොකෙතුං චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙසි. පාචීනපස්සං චූළපට්ඨාකතිස්සං පෙසෙසි. සො පන අමච්චො අනුපුබ්බෙන විචරන්තො තං විහාරං අගමාසි. තස්මිං සමයෙ ච කාරපණ්ණං බහුකං අහොසි. සො පන හත්ථී කාරපණ්ණඤ්ච කාර-සාඛඤ්ච භිඤ්ජිත්වා භික්ඛූනං දෙති. අමච්චො තං දිස්වා එවරූපා තිරච්ඡානගතා පන තෙසං වෙය්‍යාවච්චං කරොන්ති. ඉමෙ පන අත්තනො සමණකිච්චං මත්ථකං පාපෙත්වා වසන්තීති චින්තෙසි. සො නිවත්තිත්වා රඤ්ඤො සන්තිකං ආගන්ත්වා හත්ථිස්ස දිට්ඨභාවං කථෙසි. රාජා ත්වමෙව ගන්ත්වා ගහෙත්වා ආගච්ඡාහීති ආහ. සො අමච්චො බහුසක්ඛරෙ ගාහාපෙත්වා නිජ්ඣරවිහාරං[2] ගන්ත්වා කාර-පණ්ණං සක්ඛරෙන සද්ධිං මද්දිත්වා පානකං කත්වා තෙසං භික්ඛූනං දත්වා හත්ථිං ගහෙත්වා අගමාසි. තං පානකදින්නනිස්සන්දෙන පච්ඡා කාලකිරියං කත්වා උත්තරපස්සෙ අම්බරතිත්ථගාමෙ[3] මහාකුලස්ස ගෙහෙ නිබ්බත්තිත්වා වයප්පත්තො නාමෙන තිස්සො නාම අහොසි: පඤ්ච-ඡ-වස්සිකකාලෙ ඝරාවාසෙ උක්කණ්ඨිත්වා පබ්බජිත්වා අපර-භාගෙ බොධිවන්දනත්ථාය නාවං අභිරුහිත්වා[4] මහාසමුද්දෙ ගමනකාලෙ අයං තිස්සදහරො පානීයපිපාසිතො අහොසි. සො පානීයං ආහරාපෙන්තො අලභිත්වා පත්තං ගහෙත්වා සමුද්දොදකං පාතුං අග්ගහෙසි. තං උදකං පරිවත්තිත්වා මධුපානීයං අහොසි. සබ්බනාවාය මනුස්සා පානකං පිවිංසු

1 (සබ්බෙසු) මහානිම්බරවිහාරෙ. 2, (සබ්බෙසු) නිම්බරවිහාරං, 3 රස. අම්බවිඨීකාමගාමෙ. 4. සී 2. අභිරුය්හිත්වා.

සබ්බෙසං පහොනකං පානකං හුත්වා අක්ඛයං අහොසි. මහාබොධිං වන්දනත්ථාය ගමනකාලෙ ච ආගමනකාලෙ ච සක්ඛරපානීයං අහොසි. පච්ඡා කාලකිරියං කත්වා සො දෙවලොකෙ ද්වාදසයොජනිකෙ කනකවිමානෙ නිබ්බත්තිත්වා අච්ඡරාසහස්සපරිවුතො මහන්තං දිබ්බසම්පත්තිං අනුභවති. අට්ඨවිධපානං නිච්චං අවිජහිතමෙව අහොසි. තතො තතො ආගතා දෙවපුත්තා තස්මිං පානකෙ රසං ජානිත්වා අත්තනො අත්තනො විමානං ආනෙන්ති. තං පානකං එවරූපං රසසම්පන්නං අහොසීති.

චූළපට්ඨාක—තිස්සස්ස වත්ථු අට්ඨමං.

---

## 29. තිස්සාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

රොහණජනපදෙ අම්බතිත්ථගාමෙ[1] එකස්ස කුලස්ස ගෙහෙ මුණ්ඩගුත්තො නාම;[2] ඉමස්ස භරියා තිස්සා නාම. ඉමෙ ද්වෙපි ජනා සට්ඨිකහාපණෙන දාසා හුත්වා වසන්ති. තෙ ගාමවාසිනො දානං දෙන්තෙ දිස්වා මයම්පි දානං දස්සාමාති චින්තෙත්වා තෙ ජයම්පතිකා සංසන්දිත්වා දානං දාතුකාමා හුත්වා සාමිකො භරියං ආහ: "ඉමස්මිං ගාමෙ මනුස්සා දානං දෙන්තා මච්ඡමංසෙන ඛීරදධිනා[3] ච දෙන්ති මයං කිං ගහෙත්වා දෙමා"ති, තස්සා භරියා අහං භතියා ලද්ධෙන යෙන කෙනචි දස්සාමීති වත්වා පුන දිවසෙ මිස්සකතණ්ඩුලෙන භත්තං පචිත්වා කාරපණ්ණෙ-සෙදෙත්වා මත්තිකාපත්තං පූරෙත්වා භත්තං ගහෙත්වා ආසන-සාලං ගන්ත්වා වස්සග්ගෙන ලද්ධස්ස මහල්ලකකාලෙ පබ්බ-ජිතස්ස මුද්ධධාතුකස්ස[4] භික්ඛුස්ස පත්තෙ ඔදහි. සො මහල්ලකො දෙමිතස්සප්පත්තො හුත්වා තං භත්තං ගහෙත්වා පච්ඡා සුනඛදොණියං පක්ඛිපි. සා උපාසිකා තං දිස්වා

---

1. රා. රස. තිස්සම්බතිත්ථගාමෙ. 2 රස. නාම එකො දුග්ගතො අහොසි. 3. (සබ්බෙසු) ඛීරදධිනං. 4. (සබ්බෙසු) ලඬ ධාතුකස්ස.

දොමනස්සප්පත්තා හුත්වා අත්තනො ගෙහං ගන්ත්වා නිපජ්ජි. සාමිකො අරඤ්ඤතො ආගන්ත්වා තස්සා සන්තිකං ගන්ත්වා "කිං අඵාසුක"න්ති පටිපුච්ඡි. සා ඉමස්මිං වාරෙන්තෙ[5]යෙව මයා දානං දින්නන්ති චින්තෙත්වා තස්ස පටිවචනං න දෙති. සො පුනප්පුනං නිබන්ධිත්වා[6] පටිපුච්ඡි. සා සබ්බං අත්තනො සාමිකස්ස කථෙසි. සො තස්සා වචනං සුත්වා එවරූපං බුද්ධුප්පාදං ලභිත්වා දානං දාතුං වට්ටතීති චින්තෙත්වා අත්තනො පුත්තස්ස අග්ඝාපෙත්වා අට්ඨකහාපණං අග්ගහෙසුං. තෙ ජයම්පතිකා අට්ඨකහාපණං පුත්තස්ස මූලං ලභිත්වා එකං ධෙනුං කිණන්ති. සා ධෙනු ච තං දිවසමෙව විජායිත්වා වච්ඡකං ලභි. පුන දිවසෙ ඛීරං දුහනකාලෙ එතෙසං දානසද්ධං[7] ආගම්ම දොනාළිමත්තමෙව තෙලං අදාසි. තෙ ගහෙත්වා භික්ඛූනං අදංසු. තතො පට්ඨාය නිච්චං අඩ්ඪනාළි-මත්තං සුගන්ධං සප්පිමෙව දෙති. පාතොව ලද්ධා චතස්සො නාළියො ගහෙත්වා භික්ඛූනං සප්පිමෙව දෙන්ති. පච්ඡාභත්තෙ චතුනාළීහි දීපඤ්ච පූජෙන්ති; භික්ඛූනං පිවනත්ථාය දෙන්ති; පාදතෙලඤ්ච කරොන්ති. තස්මිං ගාමෙ වසන්තො එකො රාජපුරිසො එතෙසං එතෙන නියාමෙන සප්පිලභනභාවං සුත්වා තෙසං සන්තිකං සප්පිඅත්ථාය පෙසෙසි. තෙ තස්ස කථං සුත්වා "න මයං තං පරිභොගං කරොම, සබ්බං ලද්ධ-නියාමෙන භික්ඛුසඞ්ඝස්ස දෙමා"ති වත්වා තස්ස පුරිසස්ස න කිඤ්චි අදංසු. සො රාජපුරිසො තෙ තජ්ජෙත්වා රඤ්ඤො කථෙස්සාමීති වත්වා භායාපෙසි. තෙ තස්ස භයෙන දානස්ස අන්තරායො මා හොතූති චින්තෙත්වා නිච්චං අඩ්ඪනාළිකං තෙලං තස්ස දෙන්ති. අථ අපරෙන සමයෙන රාජපුරිසො සද්ධාතිස්සමහාරාජස්ස උපට්ඨානං අගමාසි. තතො පට්ඨාය තෙ තස්ස තෙලං නාදංසු. රාජපුරිසො රාජුපට්ඨානා ආගන්ත්වා භරියාය අත්තනො භත්තෙන වඩ්ඪිතෙ සප්පිමාහරාති ආහ. සා තස්ස ගතකාලතො පට්ඨාය සප්පිං න දෙන්තීති ආහ. සො රඤ්ඤො සන්තිකං ගන්ත්වා එවරූපං රාජභණ්ඩං පස්සාමීති ආහ. රාජා එතස්ස කථං සුත්වා එකමෙව ධෙනුං

5. (සබ්බෙසු) ධරන්තෙ. 6. බි 1. බි 2. නිබද්ධං වත්වා. සෙස්. නිබන්ධං වත්වා. 7 (සබ්බෙසු) දානසුද්ධං

ආනෙතුං අයුත්තනන්ති විනෙත්වා ධෙනුසතං කපිලගාවී ගහෙත්වා ආනෙහීති ආහ. අථ සො රාජපුරිසො ගන්ත්වා අත්තනා කප්පිතධෙනුයා සද්ධිං ධෙනුසතං කපිලගාවී ගහෙත්වා ආගන්ත්වා රඤ්ඤො කථෙසි. ධෙනුසාමිකොපි ධෙනුයා සද්ධිං අගමාසි. රාජා ධෙනුං අත්තනො සන්තිකං ආහරාපෙත්වා අත්තනො දෙවියා සබ්බාලඞ්කාරෙන අලඞ්කරිත්වා තෙලං ධොවාති ආහ. දෙවියා තෙලං ධොවනකාලෙ එකබින්දුමත්තම්පි කිඤ්චි නාහොසි. රාජා සීඝං ධෙනුසාමිනිං පක්කොසාපෙත්වා එතං සබ්බාලඞ්කාරෙන අලඞ්කරිත්වා තෙලං ධොවාති ආහ. සා රඤ්ඤො කථං සුත්වා "සාමි, මම ධෙනුයා අධොතං බහුදිවසං; එතෙසු දිවසෙසු චිත්තතෙලම්පි[8] ධොවාමි; ද්වෙ තයො චාටියො ආහරථා"ති ආහ. චාටියො ආහරාපෙත්වා රාජඞ්ගණෙ ඨපෙසි. අථ සො[9] මාතුගාමො අත්තනො සද්ධිං ආවජ්ජෙත්වා ධෙනුං එතෙ අග්ගහෙසි අථ සා චාටියො පූරෙත්වා තෙලං ධොවි. රාජා තෙලං ඔලොකෙත්වා "ධෙනුලද්ධකාලතො පට්ඨාය අතීතදිවසෙසු තෙලං කස්ස අදාසී"ති ආහ. සා නිච්චමෙව අය්‍යස්ස භික්ඛුසඞ්ඝස්ස දෙමීති වත්වා අත්තනො කතවිධානං විත්ථාරෙන කථෙසි. රාජා තං සුත්වා එවං සන්තෙ අම්හාකං වලඤ්ජිතුං න සක්කාති වත්වා භෙරිං පහරාපෙත්වා[10] පඤ්චවාවාසෙ භික්ඛුසංඝං සන්නිපාතාපෙත්වා තං පවත්තිං කථෙත්වා තෙලං සඞ්ඝස්ස දාපෙසි. රාජා තස්සා මාතුගාමස්ස තමෙව ජනපදං සකලමෙව දත්වාන භෙදකාරකං රාජපුරිසං දාසං කත්වා අදාසි. තෙ යාවජීවං කුසලං කත්වා සග්ගපථං පූරයමානා අගමංසූති.

**දුග්ගත - තිස්සාය වත්ථු නවමං.**

---

8. බි 1. චිත්තතෙලම්පි. 9. බි 2. කේ. සා. 10. බි 2. චරාපෙත්වා.

# 30. අරියගාල – මහාතිස්සතිස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

රොහණජනපදෙ ජගාමද්වාරෙ ජගාමකුලෙ බොධිඅඞ්ගණං නාම අහොසි. තස්මිං කාලෙ එකො මනුස්සො බොධිඅඞ්ගණෙ වාලුකං ඔකිරිත්වා පුඤ්ඤං කත්වා අපරභාගෙ චවිත්වා මහාගාමෙ මඞ්ගලවීථියා මහාධනදෙවං නාම පටිච්ච තස්ස භරියාය කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හි සො ගබ්භපරිපාකමන්වාය මාතුකුච්ඡිතො නික්ඛමිත්වා නාමෙන තිස්සො නාම අහොසි. තස්ස පන පඤ්චවස්සික-කාලෙතිව්වං කීළනසීලතාය "කීළියඩ්ඪනතිස්සො"ති නාමං අකංසු. සො අපරභාගෙ පබ්බජිත්වා පඤ්චවස්සිකකාලෙ උක්කණ්ඨිත්වා ගිහී භවිස්සාමීති චින්තෙත්වා චීවරං ධොවිත්වා පත්තචීවරං එවිකාය සාටකං ඨපෙත්වා සයං නග්ගො හුත්වා ගඞ්ගං පතිත්වා උදකෙන ගච්ඡන්තො දාරුක්ඛන්ධං ගහෙත්වා උදකං තරිත්වා හෙට්ඨාගඞ්ගං ගච්ඡති. හෙට්ඨිමතිත්ථෙ ඨිතා ද්වෙ මාතුගාමා තං ගඞ්ගොදකෙන වුය්හමානං දිස්වා එකා "එතං දාරුක්ඛන්ධං මය්හ"න්ති ආහ. එකා "එතස්මිං[1] විජ්ජමානං මය්හ"න්ති ආහ. තා ද්වෙපි ගන්ත්වා රුක්ඛක්ඛන්ධෙන සද්ධිං තං ගඞ්ගාතීරමාහරිංසු. තස්මිං විජ්ජමානං මය්හන්ති වුත්තො මාතුගාමො එතස්ස සාටකං ආහරිස්සාමීති වත්වා අත්තනො ගෙහං අගමාසි. අපරො මාතුගාමො අත්තනො නිවත්ථසාටකං මජ්ඣෙ ඡින්දිත්වා සාටකඛණ්ඩං තස්ස දත්වා අත්තනො මාතාපිතූනං ගෙහං ගහෙත්වා අගමාසි. අයම්පන මාතුගාමො නාමෙන සුමනා නාම අහොසි. එතස්ස පන ගඞ්ගාය ආගතත්තා "ගඞ්ගාතිස්සො"ති නාමං අකංසු. අයම්පන තිස්සො යං කිඤ්චි කම්මං අකත්වා දිවසභාගං තත්ථ තත්ථ විචරති. තස්මා එතස්ස නික්කම්මකත්තා "නික්කම්මතිස්සො"ති නාමං අකංසු. සුමනාය භාතු – භගිනියාදයො ඉමං පන තිස්සං කම්මං අකරොන්තං දිස්වා මාතාපිතූනං කලහං කරොන්ති. සුමනාය මාතාපිතරො එතෙ කලහං කරොන්තෙ දිස්වා අත්තනො පුත්තධීතූනං

1 සි 2. තස්මිං.

සඞ්ඛුපත්ථාය තිස්සස්ස බහිගතකාලෙ තස්ස භරියං සුමනං නාළිමත්තං තණ්ඩුලං දත්වා අඤ්ඤං උපකරණඤ්ච දත්වා "තුම්හෙ අජ්ජ පට්ඨාය පච්චෙකං හුත්වා අඤ්ඤස්මිං ගෙහෙ වසථා"ති වත්වා එතෙසං පච්චෙකමකංසු. අයං පන සුමනා අත්තනො අරුචියා පච්චෙකං අකංසූති රොදමානා නිසීදි. අයං පන නික්කම්මතිස්සො ගතට්ඨානා ආගන්ත්වා අත්තනො භරියං සුමනං රොදමානං දිස්වා "කස්මා රොදසී"ති පුච්ඡි. මම මාතාපිතරො තුම්හාකං නික්කම්මසීලාති වත්වා අම්හාකං පච්චෙකං කරොන්තීති ආහ. තිස්සො අම්හාකං පච්චෙකං කරොන්තා කිං දත්වා අකංසූති ආහ. සා මාතා-පිතූනං (?) දින්නභාවං කථෙසි. තිස්සො "ත්වං මා චින්තයි, මා රොදි, අම්හෙ යෙන කෙනචි ජීවාම. අම්හාකං පච්චෙකං කත-කාලතො පට්ඨාය භික්ඛුසඞ්ඝස්ස අදත්වා න පරිභුඤ්ජා-මා"ති වත්වා මහාවිහාරං ගන්ත්වා සලාකභත්තං ජිඤ්ඤපෙත්වා ආගන්ත්වා අත්තනො භරියාය "මම ගමනක්ඛණෙ සලාක භත්තං යෙන කෙනචි උපායෙන අප්පමත්තා හුත්වා දදෙය්යා-සී"ති වත්වා සයං භතියා ලායනකම්මං ගවෙසන්තො අගමාසි. තස්මිං යෙව දිවසෙ එතස්ස පිතුනො මහාධන-දෙවස්ස සහායො රට්ඨිකො චන්දසුරියො නාම; තස්ස ඛෙත්තං හි[1] පඤ්චසතකරීසමත්තං අහොසි. අයම්පි තිස්සො භතියා කම්මං ගවෙසන්තො විචරති. තස්ස තත්ථ රට්ඨිකස්ස ඛෙත්තලායනභාවං කථෙසුං. සො ගන්ත්වා රට්ඨිකං වන්දි. සො රට්ඨිකො තං දිස්වා "කිං කම්මෙන ආගතොසී"ති ආහ. සො තිස්සො ලාවනකම්මං ගවෙසන්තො ආගතොම්හීති ආහ. රට්ඨිකො "ත්වං සහත්ථා කම්මං අකතපුබ්බො; ඉදානි කිං කරිස්සසි? තුය්හං විරියං න ජානාමී"ති ආහ. තිස්සො මම විරියං පස්සථාති වත්වා ලාවනදාත්තං ගහෙත්වා ඛෙත්තං ඔතරිත්වා පුරෙ පාතරාසමෙව පඤ්චකරීසමත්තං ලාවිත්වා නිට්ඨාපෙසි. තං දිස්වා රට්ඨිකො තස්ස තුස්සිත්වා අත්තනො[2] ආභතභත්තඤ්ච ආගතදාසදාසියො ච අදාසි. අයම්පන තිස්සො සබ්බං ඛෙත්තං සයමෙව රාසිං කත්වා සයමෙව

1. බි 2. ඛෙත්තම්පි. 2. අත්තනා (?)

මද්දිත්වා පලාලං උද්ධරිත්වා සයමෙව පොඨෙත්වා මහන්තං
වීහිරාසිං අකාසි. අථ රට්ඨිකො එතස්ස පුරිසාකාරං පස්සිත්වා
අච්ඡරියප්පත්තො හුත්වා එතෙන කම්මකතවෙතනෙන සබ්බං
ධඤ්ඤං තස්සෙව අදාසි. සො තතො පට්ඨාය අට්ඨන්නං
භික්ඛූනං සලාකභත්තං දදන්තො උදකලොණියෙන[4] දෙති.
තස්මා එතං "උදකලොණියතිස්සො"ති නාමං අකංසු. එතං
පන භත්තං ගහෙත්වා මහල්ලකකාලෙ පබ්බජිත — භික්ඛුනො
අදාසි. සො භික්ඛු තං භත්තං ගහෙත්වා සුතබද්ධෙණියං ඛිපි.
තං දිස්වා තිස්සො ඉතො පට්ඨාය සොළසන්නං භික්ඛූනං
සොළසඛීරසලාකභත්තං අදාසි. තෙන තං "ඛීරසලාකභත්ත
තිස්සො"ති නාමං අකංසු. අථ භික්ඛූනං ඛීරපිවනකාලෙ
යෙව ඛීරෙන භුඤ්ජන්තානං ඛීරං න රුච්චති. තං ජානිත්වා
තිස්සො සද්ධං ආවජ්ජෙත්වා ධෙනුතං එතං අග්ගහෙසි. තස්ස
සද්ධාවෙගෙන ධෙනුතං එතා සුගන්ධසප්පිමෙව පග්ඝරි.
තතො පට්ඨාය සොළසන්නං භික්ඛූනං කල්‍යාණභත්තමදාසි.
තතො පට්ඨාය තං "කල්‍යාණභත්තතිස්සො"ති නාමං අකංසු.
සො අනුපුබ්බෙන වඩ්ඪෙත්වා පඤ්චන්නං භික්ඛුසතානං නිච්චං
තෙලොදකදනං[5] අදාසි. සො එකදිවසං භික්ඛුසඞ්ඝස්ස කන්දමූල
දනං දස්සාමීති චත්වා බහුමනුස්සෙ ගහෙත්වා කුබ්බලපබ්බතං[6]
ගන්ත්වා අයං කල්‍යාණභත්තතිස්සො කන්දං ඛණන්තො
සට්ඨිනිධිකුම්භියො ලභිත්වා සබ්බෙ අත්තනො ගෙහෙ
ඨපෙසි. අථ අපරාපරං දනං දදන්තො දනගෙ භික්ඛූ අප්ප-
තරාති චින්තෙසි. තස්ස එවං චින්තිතදිවසෙ යෙව අනුරාධ-
පුරතො පඤ්චසතභික්ඛූ චෙතියබොධිපටිමාදීනි වන්දනත්ථාය
සමන්තතො ජනපදචාරිකං චරන්තා මහාගාමං අගමංසු.
අයං කල්‍යාණභත්තතිස්සො තෙ භික්ඛූ දිස්වා නිමන්තෙත්වා
භොජෙත්වා භුත්තානුමොදනෙ කතෙ කුතො ආගතත්ථ
අය්‍යාති ආහ. තෙ අත්තනානුපුබ්බෙන අනුරාධපුරතො
ආගතභාවං කථයිංසු උපාසකො භන්තෙ බහුභික්ඛුසඞ්ඝො
කත්ථ විහරතීති ආහ. "උපාසක, චෙතියම්බවිහාරෙ

4 රස. උදකලොණමන්නෙන. 5. රස තෙලුල්ලොපකං නාම.
6 ර. කුබ්බපෙපබ්බතං. රස. කුම්බුලපබ්බතං.

අනුරාධපුරෙ නාගදීපෙති ඉමෙසු තීසු ඨානෙසු බහුභික්ඛු **සඞ්ඝාති** ආහංසු. තිස්සො තං සාසනං සුත්වා සොමනස්සො හුත්වා මයා තත්ථ තත්ථ ගන්ත්වා දානං දාතුං වට්ටතීති. චින්තෙත්වා අත්තනො සාමිරඤ්ඤො අනුරාධපුරං ගන්ත්වා දානං දාතුකාමොති ජානාපෙත්වා අනුඤ්ඤාතො බහුසකටෙසු දානවත්ථුං ආරොපෙත්වා අත්තනො උපකරණං කාරාපෙත්වා තතො නික්ඛමිත්වා චෙතියම්බවිහාරෙ දානං දත්වා තතො අනුරාධපුරං ගන්ත්වා පඤ්චමහාවාසෙ භික්ඛුසඞ්ඝස්ස මහාදානං දත්වා රඤ්ඤො පණ්ණාකාරං පෙසෙත්වා තතො නාගදීපං ගන්ත්වා නාගදීපෙ භික්ඛුසඞ්ඝස්ස දානං දත්වා තතො අරිය–ගාලතිත්ථෙ වසති. සො අත්තනො මාතුගාමං භික්ඛුසඞ්ඝස්ස අප්පමත්තා හුත්වා දානං දෙහීති වත්වා සයං අරියගාලතිත්ථෙ මනුස්සානං ඔරං පාපෙමීති[7] තස්මිං ආගමි. තස්ස අරියගාලෙ වසිතත්තා අරියගාලතිස්සොති නාමං අකංසු.

තදා සක්කො දෙවරාජා තිස්සස්ස සද්ධභාවං ජානිත්වා තං වීමංසිතුකාමො ආගන්ත්වා මහාජෙට්ඨකවණ්ණං[8] ගහෙත්වා නාවාය නිසීදිත්වා නාවං පරතීරසමීපං පත්තකාලෙ "අත්තනො කත්තරයට්ඨිං න සරිතොම්හි අය්‍යා"ති ආහ. පුන නිවත්තිත්වා කත්තරයට්ඨිං ගහෙත්වා ආගතකාලෙ පුන තං අබ්භඤ්ජනතෙලනාළිං න සරිතන්ති ආහ. එතෙනෙව නයෙන චත්තාරි පඤ්ච වාරෙ අපරාපරං ගන්ත්වා තං වීමංසිත්වා එතස්ස සද්ධාය නිච්චලභාවං ඤත්වා සකවිලාසං දස්සෙත්වා අරියගාලතිත්ථසමීපෙ සයංජාතසරෙසු සාලිං බහුං මාපෙත්වා ධනෙන ගෙහං පූරෙත්වා බහුදානං[9] දාතබ්බන්ති ඔවදිත්වා දෙවලොකමෙව අගමාසි. තං දිව–සමෙව පියඞ්ගුදීපෙ භික්ඛුසඞ්ඝා ච කත්ථ නු ඛො සද්ධාවන්තො පුග්ගලාති කථං වඩ්ඪිංසු. තෙසං භික්ඛූනං අන්තරෙ **සතිසම්බොධිථෙරො** නාම සීහලදීපවාසිනො සද්ධා-වන්තොති ආහ. යොනකරාජපුත්තො **මහාබුද්ධරක්ඛිත**–

7. කෝ. ඔරමාපෙමීති. 8. රජ මහල්ලකබ්‍රාහ්මණවණ්ණං සීහළ. වත්ථු. භික්ඛුවෙසං 9. බහුධනං (සබ්බබසු.)

**ථෙරො** නාම[10] යොනකනගරමෙව අගමාසි. තං දිවසමෙව පියඞ්ගුදීපවාසිනො සද්ධාවන්තාති ආහ. අථ තෙ භික්ඛූ සාධු තෙ වීමංසිස්සාමාති වත්වා චතුරඞ්ගුලං පුරෙභත්තකාලෙ ඔලොකෙත්වා දාතං දාතුං න සක්කාති අයං බුද්ධරක්ඛිතත්ථෙරො යොනකලොකං අගමාසි. තදා සතිසම්බොධිත්ථෙරො අරියගාලතිස්සස්ස ගෙහද්වාරං අගමාසි. තස්මිං දිවසෙ අරියගාලතිස්සස්ස භරියා සුමනා ද්වාදසන්නං භික්ඛුසංඝසහස්සානං වාදසවාරෙ දාතං දත්වා අත්තනො සද්ධං ආවජ්ජමානා අත්තනො ඉච්ඡිතිච්ඡිතපුඤ්ඤං පරිගය්හමානා නිසීදි. සා ථෙරං පස්සිත්වා තං කාලං ඔලොකෙත්වා අපචිත්වා දාතං දාතුං න සක්කාති චින්තෙත්වා කුලෙසු දින්නභාවං[11] සුත්වා අට්ඨනාළියං (?) උද්ධනෙ ආරොපෙත්වා සුගන්ධසප්පිං පක්ඛිපිත්වා අම්බිලයාගුයා සිත්ථං පරිස්සාවෙත්වා යාගුසිත්ථං තෙලෙන භජ්ජිත්වා චතුමධුරං පක්ඛිපිත්වා දිබ්බභොජනසදිසං කත්වා පත්තං පූරෙත්වා එකං වත්ථං චුම්බටකං කත්වා ථෙරස්ස අදාසි. ථෙරො ආකාසෙ තං පත්තං විස්සජ්ජෙහීති ආහ. සා "න විස්සජ්ජෙමි අය්‍යාති"ති ආහ. ථෙරො තව සද්ධං ආවජ්ජෙත්වා විස්සජ්ජෙහීති ආහ. සා අත්තනො සද්ධං ආවජ්ජෙත්වා ආකාසෙ පත්තං විස්සජ්ජෙසි. ථෙරො මම භත්තවිස්සග්ගං කරොන්තං මං පස්සතූති අධිට්ඨාය ගතො. අයං පන උපාසිකා සුමනා සද්ධං උප්පාදෙත්වා ඔලොකෙන්තී අට්ඨාසි. භික්ඛූනං භත්තකිච්චපරියොසානෙ අත්තනො ගෙහං පවිසිත්වා උපාසකස්ස ආගතකාලෙ අත්තනො ථෙරානං කතවිධානඤ්ච සබ්බං කථෙසි. තෙ තතො පට්ඨාය අතිරෙකෙන පසීදිත්වා බහුපුඤ්ඤං කත්වා අපරභාගෙ අරියගාලකම්මනාතිස්සස්ස මරණමඤ්චෙ නිපන්නකාලෙ ඡදෙවලොකතො දෙවතා ඡරථෙ ගහෙත්වා අත්තනො අත්තනො දෙවලොකං වණ්ණෙසුං.

---

10. එත්ථ උණකතා දිස්සති රසවාහිනියම්පන "මහාබුද්ධරක්ඛිතත්ථෙරො යොනකරට්ඨවාසිනො සද්ධාවන්තාති ආහ. තං සුත්වා භික්ඛුසංඝො අජ්ජෙව තං කාරණං වීමංසිස්සාමාති තෙ ථෙරෙ යෙව තං තං රට්ඨං පෙසෙසුං. තෙසු බුද්ධරක්ඛිතත්ථෙරො." 11. කෝ. කුසලෙ සුදින්නභාවං

උපාසකො දෙවතානං කථං සුත්වා තුසිතපුරතො ආගතරථං ඨපෙත්වා අවසෙසරථෙ ගහෙත්වා ගච්ඡථාති ආහ. සුමනා පන අත්තනො සාමිකස්ස වචනං සුත්වා "කිං තිස්ස, මරණාසන්නෙන විප්පලාපකම්මං[12] අකාසී"ති ආහ. තිස්සො අත්තනො භරියාය කථං සුත්වා "අහං විපල්ලාසං න කරොමි; දෙවලොකතො දෙවතා ඡරථෙ ආනෙසුං. තාහි දෙවතාහි සද්ධිං කථෙමී"ති ආහ. "තං න පස්සාමි; කුහි"න්ති වුත්තෙ පුප්ඵදාමං ආහරාපෙත්වා ආකාසෙ ඛිපාපෙසි. තං පුප්ඵදාමං රථසීසෙ ඔලම්බමානං දිස්වා සා ගබ්භං පවිසිත්වා සයනෙ සයිත්වා නාසිකාවාතං සංනිරුජ්ඣිත්වා[13] චවිත්වා රථෙ පාතුරහොසි. අත්තනො සාමිකස්ස සාසනං පෙසෙසි "අහං පන පඨමං ආගතොම්හි; ත්වං කස්මා චිරායසී"ති. තෙ උභොපි රථෙ ඨත්වා සබ්බෙසං ඔලොකෙන්තානං යෙව තුසිතපුරෙ අගමිංසූති.

## අරියගාලතිස්සස්ස වත්ථු දසමං

## වග්ගො තතියො

---

12 රු. ඛි 2 විප්පලාසකම්මං 83 "සන්නිරුම්භිත්වා"ති පුත්ථකන්තරං

## 31. රූපදෙවියා වත්ථුම්හි අත්ථුප්පත්ති.*

ගිලානභත්තං දත්වාන සමණකස්ස දාරිකා
භවෙසු තෙන කම්මෙන තණ්ඩුලානක්ඛයං ලභී ති.

තං යථානුසූයතෙ:—

ඉතො භද්දකප්පතො එකනවුතිකප්පෙ විපස්සී සම්මා-සම්බුද්ධකාලෙ එකා ගාමදාරිකා විහාරං ගන්ත්වා ගිලානභික්ඛුං පස්සිත්වා තස්ස භෙසජ්ජං කරොමීති තං පවාරෙත්වා ගෙහං ගන්ත්වා තං පවත්තිං මාතාපිතූනං කථෙසි. පුන දිවසෙ සො භික්ඛු භික්ඛාය චරන්තො තස්සා ගෙහං අගමාසි. සා ථෙරං දිස්වා නානග්ගරසපිණ්ඩපාතං ථෙරස්ස භෙසජ්ජත්ථාය අදාසි. තස්සා සද්ධාබලෙන තස්ස භික්ඛුනො ආහාරෙ පරිභුත්තෙ යෙව රොගො වූපසම්මි. පුන දිවසෙ සා ගාමදාරිකා විහාරං ගන්ත්වා "කස්මා භන්තෙ භෙසජ්ජත්ථාය නාගමිත්ථා"ති ආහ. අම්හාකං රොගො වූපසමති; තස්මා නාගමිම්හාති. සා ගාමදාරිකා එතස්ස භික්ඛුස්ස එකාහමෙව සාලිරසපිණ්ඩපාතං ගිලානභත්තං කත්වා [එකාහමෙව] දත්වා තස්ස කම්මස්ස නිස්සන්දෙන පච්ඡා කාලකිරියං කත්වා දෙවලොකෙ නිබ්බත්තිත්වා තත්ථ බහුකං මහන්තං දිබ්බසම්පත්තිං අනුභවිත්වා පච්ඡා ජම්බුදීපෙ දෙවපුත්තනගරෙ නාගබ්‍රාහ්මණස්ස නාම ධීතා හුත්වා නිබ්බත්ති. සා ගබ්භපරිපාකමන්වාය මාතුකුච්ඡිතො පසූතිකා[1] අහොසි. තං නාමෙන රූපවතීති නාමං අකංසු. තස්සා මාතුකුච්ඡිතො පසූතිකාලතො පට්ඨාය එකෙකදිවසං අට්ඨනාළිමත්තං සාලිතණ්ඩුලං නිබ්බත්තමෙව අහොසි. ඉමිස්සා පන ගාමදාරිකාය තණ්ඩුලනාළිං ගහෙත්වා පචිතුං ආරද්ධකාලෙ[2] ඉච්ඡිතඉච්ඡිතමච්ඡමංසසූප කදලිපනසාදි-ඵලසූප වත්ථුලෙය්‍යකාදිපණ්ණසූප සප්පි—නවනීත—දධි-මධු—ගුළ—ඛීරාදි ච ජීරකමරිචාදිකං ච සබ්බං භාජනං

---

* ඉතො පඨාය නිබන්ධෙ විසදිසතා දිස්සති. 1. 'පසූතා'ති භවිතබ්බං
2. අලද්ධභාවෙන (සබ්බෙසු)

පූරිතමෙව නිබ්බත්තති. තස්සා හත්ථෙන ගහිතං කිඤ්චි ඛාදනීයං වා භොජනීයං වා පූතිභාවං න ගච්ඡති.[3] අයං පන ගාමදාරිකා නිච්චං පඤ්චසතෙ භික්ඛූ ගෙහෙ නිසීදාපෙත්වා භොජෙති. තස්සා එකං භත්තුක්ඛලිකං[4] ගහෙත්වා සකල-නගරවාසීනං භුඤ්ජන්තානම්පි එකස්ස පටිවිංසං ගහිත-මත්තමෙව පඤ්ඤායති, පරිපුණ්ණමෙව තිට්ඨති. එවරූපෙන පතිට්ඨානුභාවෙන[5] සමන්නාගතාති සකලදෙවපුත්තනගරෙ පාකටා අහොසි. ඉමිස්සා දින්නදානං ගණ්හන්තානං භික්ඛූනමන්තරෙ එකො අරහා **මහාසඞ්ඝරක්ඛිතත්ථෙරො** නාම ඉමිස්සා පුඤ්ඤානුභාවං දිස්වා අයං ගාමදාරිකා පුරි-මත්තභාවෙ කිං කම්මං කත්වා ඉමං සම්පත්තිං පටිලද්ධාති ඔලොකෙන්තො විපස්සිස්ස සත්ථුනො කාලෙ කතකම්මං දිස්වා පුනදිවසෙ ඉමිස්සා දානගෙහ භත්තකිච්චං කත්වා දානානුමොදනමඞ්ගලං වඩ්ඪෙත්වා තස්සා පුරිමත්තභාවෙ එවරූපං සම්පත්තිදායකං කතපුඤ්ඤං ජානාසීති ආහ. "න ජානාමි අය්‍යා"ති ආහ. ථෙරො තස්සා පුරිමත්තභාවෙ කතකම්මං සබ්බං විත්ථාරෙන කථෙත්වා "එවරූපං අප්පක-කම්මඵලං නාම එවරූපං මහන්තං සම්පත්තිං දෙති. ඉදානි පුඤ්ඤකම්මෙ අප්පමත්තා හොහී"ති වත්වා දානසීලාදිසු ආනිසංසං කථෙසි. සා පන ථෙරස්ස කථං සුත්වා සොමනස්සජාතා හුත්වා නිච්චං මහාදානං දත්වා සීලං රක්ඛිත්වා තෙනෙව සොමනස්සෙන සොතාපන්නා අරියසාවිකා අහොසීති. තෙන වුත්තං—

ගිලානභත්තං දත්වාන සමණෙකස්ස දාරිකා
භවෙසු තෙන කම්මෙන තණ්ඩුලානක්ඛයං ලභීති.

**රූපදෙවියා වත්ථු පඨමං**

---

3. පූරිතභාවං ගච්ඡති, (සබ්බෙසු) 4 බී 2 අත්තුක්ඛලිකං
5 පුඤ්ඤානුභාවෙන (?)

# 32. ගාමදාරිකාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

පිපාසිතස්ස භික්ඛුස්ස පානීයං ගාමදාරිකා
දත්වා තස්මිං යෙව දිනෙ පානීයමක්ඛයං ලභීති—

තං කථන්ති චෙ?

දක්ඛිණපස්සෙ එකො බ්‍රාහ්මණචොලගාමො නාම අහොසි. තස්මිං ගාමෙ මනුස්සා පිට්ඨියඞ්ගණෙ මාංසං ලුඤ්චන්ති. තදා එකො ගමිකො භික්ඛු පානීයපිපාසිතො තෙසං මනුස්සානං සන්තිකං ගතො. තදා එකා ගාමදාරිකා තං භික්ඛුං පස්සිත්වා තස්ස කිලන්තාකාරං පස්සිත්වා ඝටෙ ඨපිතපානීයං ගහෙත්වා මාංසං ලුඤ්චන්තානං මනුස්සානං අජානාපෙත්වා එතස්ස භික්ඛුනො දත්වා චිත්තං පසාදෙත්වා වන්දිත්වා නිසීදි. අථ පච්ඡා මනුස්සා ඝටෙ පානීයං අදිස්වා කෙන ගහිතන්ති පුච්ඡිංසු. සා ගාමදාරිකා මයා එකස්ස භික්ඛුනො දින්නන්ති ආහ. මනුස්සා "අතිවිය සද්ධාවන්තා අයං දාරිකා; අම්හාකං ආතපෙන සුස්සිත්වා මාංසං ලුඤ්චන්තානං අත්ථාය ආහතපානීයං සමණස්ස අදාසි. සීඝං අම්හාකං පානීයං ආහරා"ති තාය සද්ධිං භණිංසු. සා ගාමදාරිකා තෙසං කථං සුත්වා අත්තනො දින්නපානීයං ආවජ්ජෙත්වා පිට්ඨියඞ්ගණං ඔලොකෙසි. මහන්තං උදකධාරං පථවිං භින්දිත්වා උට්ඨහි. සා ගාමදාරිකා පානීයං දිස්වා නහායිත්වා ච පිවිත්වා ච පානීයඝටමාදාය ගන්ත්වා මනුස්සානං අදාසි. තං පානීයං අච්ඡෙද න පස්සන්ති. සා ගාමදාරිකා පුනප්පුනං තත්ථ ගන්ත්වා නහායිත්වා ච පිවිත්වා ච ආගච්ඡති. මනුස්සා තං ගාමදාරිකං තථා කරොන්තං දිස්වා "කත්ථ නහායසි? කුතො පානීයං ආහරසි? අම්හාකම්පි දස්සෙහී"ති ආහංසු. සා තෙසං කථං සුත්වා "සචෙ මම පුඤ්ඤෙදත උප්පන්නං, සබ්බෙසං පාකටං හොතූ"ති අධිට්ඨාසි. තතො පට්ඨාය මනුස්සා තං පානීයං දිස්වා අච්ඡරියබ්භුතචිත්තා ජාතා[1] අහො පානීයදානස්ස ආනිසංසන්ති සක්කච්චං පානීයදානං

1. ජනා (සබ්බෙසු.)

අදංසු. තං නිස්සාය තත්ථ ගාමං පතිට්ඨාපෙසුං. තං මාසලුඤ්චනපිට්ඨිම්හි සද, සීතභාවෙන මාසපිට්ඨිගො නාම අහොසි. තස්මිං යෙව ඨානෙ පච්ඡා විහාරං පතිට්ඨාපෙසුං, තං උදකං විහාරෙ භික්ඛූනඤ්ච ගාමවාසිමනුස්සානඤ්ච පහොනකං අහොසි. සා යාවතායුකං පුඤ්ඤං කත්වා දෙවලොකෙ නිබ්බත්ති.[2] තත්ථ දෙවලොකෙපි සබ්බං දෙවසම්පත්තිඤ්ච උය්‍යාන—විමාන—කප්පරුක්ඛා ච ආකාසඞ්ගණෙ පොක්ඛරණියාදීනි ච නිබ්බත්තිංසු. ඉමිස්සා පන දිබ්බොදකපුණ්ණං එකං සුවණ්ණකුම්භං තස්සා ගතගතට්ඨානං ගච්ඡති. සබ්බඋදකකිච්චං තෙනෙව කරොන්තා වීසු දෙවලොකෙසු පරිභුඤ්ජන්තෙසු අක්ඛයං අහොසීති. තෙන වුත්තං:—

පිපාසිතස්ස භික්ඛුස්ස, පානීයං ගාමදාරිකා
දත්වා තස්මිං යෙව දිනෙ, පානීයමක්ඛයං ලභීති.

**ගාමදාරිකාය වත්ථු දුතියං**

---

## 33. දුග්ගතිත්ථියා වත්ථුම්හි අත්ථුප්පත්ති.

දුග්ගතා කපණා ඉත්ථී සඞ්ඝෙ දත්වාන සාටකං
තස්මිං යෙව භවෙ රඤ්ඤො සීතුට්ඨානෙ සීතා අහූති.

තං කථන්ති චෙ? යථා ධම්මාය වත්ථු, තථා ජානිතබ්බං.

ලජ්ජිතිස්සමහාරාජස්ස[1] කාලෙ රොහණජනපදෙ ගිරිනිම්බලතිස්සපබ්බතමහාවිහාරෙ[2] භික්ඛාචාරෙ සීවගාමෙ කපණා මාතුගාමා ධම්මා නාම අහොසි. සා අපරභාගෙ භතිං කත්වා ජීවන්ති වස්සාවාසං උපගතකාලෙ අත්තනා දුක්ඛෙන උප්පාදිතං වත්ථං ආසනසාලං ගන්ත්වා එකං භික්ඛුං උපසඞ්කමිත්වා "ඉමං වත්ථං ගහෙත්වා ගිරිනිම්බලතිස්සපබ්බතෙ

---

2. නිබ්බත්තිත්වා (සබ්බෙසු.) 1. බි 2. ලජ්ජතිස්ස ර. ලඤ්ජතිස්ස.
2. බී 2. ගිරිනිම්පල—

භික්ඛුසඞ්ඝස්ස එතස්ස වත්ථස්ස මය්හං දුක්ඛෙන උප්පාදිත භාවං කථෙත්වා වස්සාවාසිකං තත්වා දෙථා''ති වත්වා භික්ඛුසඞ්ඝස්ස දත්වා චිත්තං පසාදෙත්වා සොමනස්සා හුත්වා අගමාසි. සො පන භික්ඛු වත්ථං ගහෙත්වා විහාරං ගන්ත්වා ගිරිතිම්බලතිස්සපබ්බතෙ භික්ඛුසඞ්ඝස්ස වස්සූපනායිකමාලකෙ තං මාතුගාමකපිතං කථෙත්වා "ඉමං ගණ්හිතුං සමත්ථස්ස භික්ඛුස්ස දෙථා''ති වත්වා භික්ඛුසඞ්ඝස්ස අදාසි. තං සුත්වා එකො භික්ඛු "මය්හං තයො මාසෙ දෙථ, අහං ගණ්හාමී''ති ආහ. අපරො භික්ඛු ද්වෙ මාසෙ දෙථාති ආහ. අපරො එකමාසං දෙථාති ආහ. එතෙනුපායෙන හාපෙත්වා එකං දිවසං දෙථාති ආහ. සඞ්ඝො තස්ස අදාසි. සො පන භික්ඛු තං වත්ථං ගහෙත්වා දසං ඡින්දිත්වා සිබ්බෙත්වා බින්දුකම්මං[3] කත්වා පැරුපිත්වා චංකමනමාරුය්හ සත්තපදවීතිහාරං ගන්ත්වා අරහත්තං පත්වා තං චීවරං ධොවිත්වා පුනදිවසෙ භික්ඛුසඞ්ඝස්ස අදාසි. අපරො භික්ඛු තං ගහෙත්වා චංකමං ආරුය්හ නිසීදිත්වා අරහත්තං පාපුණි. එතෙනුපායෙන එකං කපණසාටකං නිස්සාය තස්මිං යෙව අනොනාවසෙස අරහත්තං පත්තා පඤ්චභික්ඛුසතානි අහෙසුං. තස්මිං කාලෙ ලජ්ජීතිස්සමහාරාජා පවාරණඋපොසථදිවසෙ විහාරං සජ්ජෙථාති වත්වා බහුවත්ථං නානාවණ්ණවිතාන - ධජපතාකාදීනි කරොථාති වත්වා විහාරං පෙසෙසි. භික්ඛුසංඝො සකලවිහාරෙ අලඞ්කරොන්තො තං කපණසාටකං බහූනං භික්ඛූනං කිලෙස නාසනාය පච්චයං අහොසීති වත්වා ධජං කත්වා මාලකද්වාරෙ උස්සාපෙසි. රාජා විහාරං ගන්ත්වා මාලකද්වාරෙ අරියධජං කත්වා උස්සාපිතං දිස්වා "මයා නානාවණ්ණං බහුවත්ථං පෙසිතං; මාලකද්වාරෙ ධජං න උස්සාපිතං, ඉමිනා කපණ සාටකෙන කස්මා ධජං උස්සාපිත''න්ති? ජෙට්ඨාරාමිකං පක්කොසාපෙත්වා පුච්ඡි. ආරාමිකො රඤ්ඤො කථං සුත්වා "අය්‍යානං උපකාරවත්ථන්ති උස්සාපෙසු''න්ති ආහ. රාජා තං කථං සුත්වා "කිං උපකාරො'සී''ති පුච්ඡි. ආරාමිකො "අහං න ජානාමි, අය්‍යා''ති ආහ. රාජා භික්ඛුසඞ්ඝස්ස

2. ඞි 2. ගිරිතිම්පල — 3. ඞි. 1. ඞි 2. බන්දුකම්මං 4. ඞී 1. ඞි 2. ර. සම්මජ්ජෙථාති.

සන්තිකං ගන්ත්වා "ඉමං වත්ථුං බහුභික්ඛුසඞ්ඝස්ස උප-කාරකො අහොසීති වදන්ති, කිං කාරණං අය්‍යා"ති පුච්ඡි. තදා භික්ඛුසඞ්ඝො "මහාරාජ, එතං වත්ථුං නිස්සාය ඉමස්මිං අනොත්තාවසෙස පඤ්චභික්ඛුසතානි අරහත්තං පත්තා"ති ආහ. රාජා තං සුත්වා "ඉමං වත්ථුං කෙන දින්න"න්ති ආහ. භික්ඛුසඞ්ඝො "මහාරාජ, එතං වත්ථුං සීවගාමෙ දලිද්ද මාතුගාමො ධම්මා නාම අත්ථි, එතිස්සා දුක්ඛෙන උප්පාදෙත්වා දින්නවත්ථුං මහාරාජා"ති ආහ. තං සුත්වා රාජා තං මාතුගාමං පක්කොසාපෙත්වා බහුධනං දත්වා සීවගාම මෙව එතිස්සා භුත්තගාමං කත්වා අදාසි. එතිස්සා දින්නභාවෙන ධම්මසීවගාමො නාම අහොසි. රාජා තං මාතුගාමං ධීතුට්ඨානෙ ඨපෙත්වා මහන්තං යසසම්පත්තිං අදාසි. සා තතො පට්ඨාය දානං දත්වා සග්ගෙ නිබ්බත්ති. තෙන වුත්තං.

දුග්ගතා කපණා ඉත්ථී සඞ්ඝෙ දත්වාන සාටකං
තස්මිං යෙව භවෙ රඤ්ඤො ධීතුට්ඨානෙ ඨිතා අහූති.

ධම්මාය වත්ථු තතියං.

---

# 34. කපණාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

කපණා මාතුගාමෙකා මහාබොධිම්හි වත්ථකං
පූජෙත්වා කප්පරුක්ඛෙ ච දෙවත්තඤ්ච තතො ලභීති.

තං කථන්ති චෙ?

එකස්මිං සමයෙ භික්ඛූ බොධිං වන්දිස්සාමාති ආගන්ත්වා එතස්මිං යෙව ගාමෙ භික්ඛාචාරං චරිත්වා ආසනසාලාය නිසීදිංසු. තස්මිං ගාමෙ එකා දුග්ගතිත්ථී තෙසං භික්ඛූනං සන්තිකං ගන්ත්වා වන්දිත්වා එකමන්තං ඨිතා කුහිං අය්‍යා ගමිස්සන්තීති ආහ. තස්සා කථං සුත්වා තෙ භික්ඛූ ඉත්ථිං

එතදවොචුං: "තථාගතානං අජ්ඣත්ත - බාහිරූපද්දවනිවා-
රෙන්තං ගුණාධිට්ඨානකභූතං රුක්ඛමහාබොධිවරං වන්ද-
නත්ථාය පූජනත්ථාය මයං සබ්බෙ ගමිස්සාම සබ්බෙසං
සොත්ථිදායක"න්ති. එවං වුත්තෙ සා ඉත්ථී තෙ භික්ඛූ එතද
වොච: "අහං අය්‍යා පරකුලානං ගෙහෙ කම්මං කත්වා
භතියා ජීවාමි. ඉමං මය්හං නිවත්ථසාටකං මහාබොධිමහි
ධජං කරිත්වා පූජෙථා"ති. සා කිලිට්ඨසාටකං ධොවිත්වා
අත්තනො නිවත්ථසාටකං අදාසි. තෙ භික්ඛූ මහාබොධි-
පූජනත්ථාය තං වත්ථං ගහෙත්වා අගමංසු සා ඉත්ථී තස්සා
යෙව රත්තියා සත්ථකවාතෙන උපහතා කාලං කත්වා අන්ත-
රාමග්ගෙ තෙසං භික්ඛූනං නිවාසනට්ඨානෙ එකස්මිං වන
සණ්ඩෙ භුම්මදෙවතා හුත්වා නිබ්බත්ති. අථස්සා පුඤ්ඤානු-
භාවෙන සමන්තා තියොජනිකට්ඨානෙ[1] දිබ්බකප්පරුක්ඛා
පාතුරහෙසුං. සමන්තා දෙවතා විචිත්තධජපතාකා ච දිබ්බානි
නානාපණ්ණාකාරානි ච ගහෙත්වා සමන්තා තං පූජයන්ති.
තෙ භික්ඛූ සායං හුත්වා වනසණ්ඩං පත්වා ඉධෙව වසිත්වා
සෙව ගමිස්සාමාති තත්ථ වාසං උපගමිංසු

තෙ රත්තිභාගෙ තස්සා දෙවතාය මහන්තං දෙවානු-
භාවඤ්ච සමන්තා දෙවතානං[2] කරොන්තං සක්කාරසම්මා-
නඤ්ච සමන්තා තියොජනට්ඨානෙ කප්පරුක්ඛෙ ච නානා-
වණ්ණධජපතාකානි නානාපණ්ණාකාරෙ ච දිස්වා තං දෙවතං
පුච්ඡිංසු "කෙන කම්මෙන ඉධ නිබ්බත්තාසී"ති. සා තෙසං
කථං සුත්වා "මං න ජානාථ අය්‍යා"ති? කථෙති. අජානන්තානං
කිඤ්චි පුට්ඨා ච "අහං භන්තෙ හිය්‍යො ආසනසාලාය මහා
බොධිපූජනත්ථාය වත්ථං දින්නා කපණා ඉත්ථී; සා අහං තස්ස
වත්ථදානස්ස නිස්සන්දෙන කාලංකත්වා ඉධූපපන්නා එවරූපං
සම්පත්තිං පටිලභාමී"ති ආහ. තං සුත්වා භික්ඛූ සබ්බෙ
අච්ඡරියබ්භුතචිත්තා ජාතා අහෙසුං. සා දෙවතා තස්සා
රත්තියා[3] අච්චයෙන තෙ භික්ඛූ නිමන්තෙත්වා පණීතං
ඛාදනීයභොජනීයං පටියාදෙත්වා තෙ භික්ඛූ සන්තප්පෙත්වා

1. කෝ තියොජනට්ඨානෙ. 2. බි 1. බි 2. ර., දෙවතා.
3. බි 2. රත්තියාති නත්ථි.

තෙහි භික්ඛූහි සද්ධිං මග්ගෙ දූතං දදමානා ගන්ත්වා මහා-බොධිමහි[4] ධජපතාකාදිනානාවණ්ණපුප්ඵගන්ධධූපෙහි පූජෙත්වා සබ්බ භික්ඛූ දිබ්බන්නපානවත්ථාදීහි පූජෙත්වා තතො චුතා තාවතිංසකායං පරිපූරෙසි. තෙන වුත්තං

කපණා මාතුගාමෙකා මහාබොධිමහි වත්ථකං
පූජෙත්වා කප්පරුක්ඛෙ ච දෙවත්තඤ්ච තතො ලභී'ති

කපණිය වත්ථු චතුත්ථං.

---

## 35. කුණ්ඩිසඞ්ඝස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

කුණ්ඩිසඞ්ඝ[1]කභික්ඛුස්ස භත්තං වත්ථං නිවත්ථකං
දත්වාන පුඤ්ඤතෙජෙන රොහණාධිපති අහූති.

තං කථන්ති චෙ?

එකස්මිං සමයෙ අනුරාධපුරවාසී මහාසඞ්ඝො නාම අමච්චො[2] අහොසි. රාජා තස්ස මහාගාමං අදාසි. සො මහාගාමෙ වසති. තස්ස පන කණිට්ඨො කුණ්ඩිකසඞ්ඝො[3] නාම අමච්චො අහොසි. සො රාජපාදමූලෙ උපට්ඨානං කරොති. මහාසඞ්ඝඅමච්චස්ස පන එකා ධීතා අත්ථි. සා නාමෙන කුණ්ඩිසඞ්ඝා[4] නාම උත්තමරූපධරා අහොසි. තං පන කුමාරිකං මාතාපිතරො සූපපූරෙන[5] වුත්තනයෙන අනෙකප්ප-කාරං[6] පචනකම්මං උග්ගණ්හාපෙසුං. තාය පන පඨමපක්කං උපකරණං මයං න ඛාදාම, භික්ඛුසඞ්ඝස්ස දෙමාති සඞ්ඝස්ස අදංසු. තෙ සංඝුපට්ඨාකචිත්තතාය සඞ්ඝුපට්ඨාකා අහෙසුං. සො පන මහාසඞ්ඝඅමච්චො නානප්පකාරෙන ජානපදානං උල්ලොලං කරොති. එතස්ස පන උල්ලොලකරණං[7] රඤ්ඤො

4. කෝ. මහාබොධිම්හි.

1. රස. කිණ්ඩිසංඝාය. 2. රස. සඞ්ඝො නාම මහාමච්චො. 3 රස. චුල්ලසඞ්ඝ. 4. රස. කිණ්ඩිසඞ්ඝා. 5. සූපපුරාණෙ (?) 6. (සබ්බෙසු) අනෙකප්පකාරානං. 7. (සබ්බෙසු) උල්ලොලකාරණං

කථෙසුං. රාජා තං සුත්වා එතස්ස කනිට්ඨං කුණ්ඩිසඞ්ඝ-අමච්චං[8] පක්කොසාපෙත්වා "තව භාතිකො ජනපදානං තාව සඞ්ගණ්හනත්ථාය පෙසිතො; ජනපදානං අනෙකප්පකාරෙන පීළං කත්වා උල්ලොළං කරොති කිර. එතං ත්වං ජානාසී"ති? අමච්චො රඤ්ඤො කථං සුත්වා අත්තනො භාතිකස්ස සාසනං පෙසෙසි: "තුම්හාකං ගතරට්ඨෙ රොහණජනපදෙ මනුස්සානං පීළං කරොතීති රාජා මය්හං කථෙසි. තුම්හෙ රාජා නාම දීඝහත්ථභාවං න ජානාථ. අම්හාකම්පි ඔලොකෙත්වා අප්ප-මත්තා හුත්වා වසථා"ති. සො සාසනං සුත්වා මම කණිට්ඨො රඤ්ඤො චිත්තං ඤත්වා සාසනං පෙසෙසි. රඤ්ඤො කුද්ධ-කාලතො පට්ඨාය ඉධ වසිතුං න සක්කාති අත්තනො භරියඤ්ච ධීතරඤ්ච හත්ථසාරඤ්ච ගහෙත්වා පලායන්තො අනුපුබ්බෙන නිග්‍රොධසාලඛණ්ඩං පාපුණි. සො පන අමච්චො තස්මිං ඨානෙ එවං චින්තෙසි: "අහං රඤ්ඤො භයෙන පලා-යාමි; රඤ්ඤො පන සන්තිකං ගන්තුං න සක්කා"ති චින්තෙත්වා අත්තනො මාතුගාමෙන සද්ධිං එවං මන්තෙසි: අනුරාධපුරං අගන්ත්වා සඝරං[8] ගන්ත්වා ජීවාමාති. තස්ස මාතුගාමො එවං කරොමාති ආහ. අමච්චො පන ධීතුයා රූපසම්පත්තිං ඔලොකෙත්වා "අම්හාකං භයං උප්පජ්ජමානං ඉමිස්සා වසෙන උප්පජ්ජිස්සතී"ති චින්තෙත්වා අත්තනො මාතුගාමං ආහ: "මය්හං ධීතා අතිවිය රූපසම්පන්නා, තස්සා වසෙන අම්හාකං පටිච්ඡන්නා හුත්වා වසිතුං න සක්කා; තස්මා මම ධීතරං පහාය පලායාමා"ති. මාතුගාමො "අහං තුම්හාකං අධිට්ඨාමි, එවං කරොථා"ති ආහ. සො සාධූති වත්වා ධීතරං ආමන්තෙත්වා "අම්ම, අන්තොගාමං පවිසිත්වා ආහාරං ගහෙත්වා ආගච්ඡාම, ත්වං ඉධ තිට්ඨාහී"ති වත්වා ධීතරං පහාය පලායිංසු. තං කුමාරිකං මග්ගෙන ආගච්ඡන්තා මනුස්සා ඨිතං දිස්වා "ඉධ කස්මා ඨිතාසි? එහි ගච්ඡාමා"ති වදන්ති. සා තෙසං කථං සුත්වා මාතාපිතූනං වචනං න භින්දාමීති තස්මිං යෙව ඨානෙ අට්ඨාසි. තස්සා තස්මිං යෙව ඨානෙ ඨිතාය සත්තදිවසා අතික්කන්තා. තස්සා

8. රස. දිල්ලසඞ්ඝ 9 රස. මලයං

ධම්මතෙජෙන සක්කස්ස භවනං උණ්හාකාරං අහොසි. තදා සක්කො දෙවරාජා රූපසම්පන්නෙන මාණවවණ්ණෙන එතිස්සා සන්තිකෙ පාකටො හුත්වා එවං කථෙසි: "එහි මම භරියා හුත්වා මම සන්තිකෙ වසාහී"ති සා කුමාරිකා තං සුත්වා මාතාපිතූනං වුත්තට්ඨානෙ වසිතුං සක්කා. තෙ අන්තොගාමං ආහාරත්ථාය පවිට්ඨා තෙසං ආගතකාලෙ ජානිස්සාමීති ආහ. සක්කො එතිස්සා කථං සුත්වා "තෙන හි අතිවිය ජානාසි; ඉමං භත්තං භුඤ්ජාහී"ති භත්තපුටං දත්වා අගමාසි සා තං භත්තං ගහෙත්වා කාලං ඔලොකෙත්වා පුරෙභත්තන්ති ඤත්වා අය්‍යානං දත්වා භුඤ්ජිස්සාමීති චින්තෙත්වා කාලං ඝොසෙසි. තස්සා කාලං ඝොසිතක්ඛණෙ[9] යෙව ධම්මජීවිතත්ථෙරො[10] චිත්තලපබ්බතවිහාරතො ආකාසෙනාගන්ත්වා තස්සා අවිදූරෙ ඨානෙ එකො ඛීණාසවො පාතුරහොසි. සා ථෙරං දිස්වා වන්දිත්වා සොමනස්සා හුත්වා ථෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා භත්තෙන පත්තං පූරෙත්වා චිත්තං පසාදෙත්වා "ථොකං තිට්ඨ අය්‍යා"ති වත්වා තුරිතතුරිතං ගබ්භන්තරං පවිසිත්වා සාඛං නිවාසෙත්වා අත්තනො නිවත්ථසාටකං මොචෙත්වා ධොවිත්වා ථෙරස්ස අදාසි. සො තස්මිං යෙව සාටකෙ පත්තං ඨපෙත්වා "අයං මං පස්සතූ"ති අධිට්ඨාය තං පස්සන්තස්සෙව ආකාසං ලඞ්ඝිත්වා අත්තනො විහාරමෙව අගමාසි. සා ථෙරං වන්දිත්වා අත්තනො දින්නදානං ආවජ්ජමානා සෙසභත්තං භුඤ්ජිත්වා ගබ්භන්තරෙ නිසීදි. තදා රඤ්ඤො ඡත්තෙ අධිවත්ථා දෙවතා තස්සා දින්නදානෙ සොමනස්සා හුත්වා සාධුකාරමදාසි.

"සාධු සාධු කුමාරිකෙ, සද්ධාසි ධම්මජීවිනී;
ත්වං හි දානං දදමානා, සාධුපූජා සදා භවාති ආහ.

රාජා[11] තස්සා කිං තුට්ඨාසීති ආහ. සා මහාගාමෙ දායකස්ස ධීතා කුණ්ඩසඞ්ඝානාම. සා නිග්‍රොධසාලඛණ්ඩ

---

9. බි 8. තංඛණෙ 10. රස. එකො ඛීණාසවො. 11. රස. රාජා තං සුත්වා කස්ස භො සාධුකාරං දදාසීති පුච්ඡි. සා මහාරාජ මහාගාමෙ සංඝාමච්චස්ස ධීතා කිඤ්චිසඞ්ඝා නාම නිග්‍රොධසාලකණ්ඩම්හි දානං අදාසි, තස්සාහං සාධුකාරං අදාසින්ති. 12. රස. සකටගොණගහ

දුතං අදාසි. තස්සා සාධුකාරං අදාසින්ති ආහ. රාජා තං සුත්වා එතං ගහෙත්වා ආනෙතුං යොග්ගසාටකෙ[12] දත්වා පෙසෙසි. තදා සා සෙසභත්තං භුඤ්ජිත්වා ගබ්භන්තරෙව නිසින්නා අහොසි. රාජදූතා ඔලොකෙන්තා තං දිස්වා "අම්හාකං රාජා තුය්හං ආනයනත්ථාය අම්හෙ පෙසෙසි. එහි ගච්ඡාමා"ති ආහංසු. සා සාධූති ගන්ත්වා උදකෙ අත්තනො සාණං පහාය න්හායිත්වා උට්ඨාය ඨිතා නිවාසනං ආහරථාති ආහ. තදා රඤ්ඤො සාටකං ආහරිත්වා අදංසු. සා තං සාටකං ඔලොකෙත්වා ඉදං අමනාපං, අඤ්ඤං ආහරථාති ආහ. මනුස්සා එතිස්සාය සද්ධිං කෙළිං කුරුමානා "සාණං නිවාසෙත්වා නිසින්නාය සාණතො ඉදං සාටකං අමනාප"න්ති ආහංසු. තදා සක්කො දෙවරාජා පඤ්චසාටකෙ ගහෙත්වා එතිස්සා පෙසෙසි. සා තතො එකං සාටකං ගහෙත්වා නිවාසෙත්වා යොග්ගං ආරුය්හ මහියඞ්ගණවිහාරං ගන්ත්වා බහූනං අරියසඞ්ඝානං දිබ්බං වත්ථං දත්වා අත්තනො පරිවාරස්ස දිබ්බවත්ථමෙව අදාසි. සා අනුපුබ්බෙන අනුරාධ–පුරං ගන්ත්වා රාජානං අද්දස. රාජා තස්සා තුස්සිත්වා මහන්තං සම්පත්තිං අදාසි. සා භික්ඛුසඞ්ඝස්ස රඤ්ඤො ආදිං කත්වා සකලනගරවාසීනඤ්ච දිබ්බවත්ථමෙව අදාසි. සබ්බෙසංයෙව දදන්තෙපි සක්කෙන දින්නානි පඤ්චවත්ථානි අක්ඛයානි අහෙසුං. රාජා එතං අත්තනො පුත්තට්ඨානෙ ඨිතස්ස අමච්චස්ස දත්වා එතිස්සා සකලරොහණජනපදං භුත්තගාමං කත්වා අදාසි. සා තත්ථ වසමානා බහුං පුඤ්ඤං කත්වා ආයුපරියොසානෙ දෙවලොකං අගමාසි. තෙන වුත්තං

කුණ්ඩසඞ්ඝකභික්ඛුස්ස හත්තං වත්ථං නිවත්ථකං
දත්වාන පුඤ්ඤතෙජෙන රොහණාධිපතී අහු'ති

කුණ්ඩසඞ්ඝවත්ථු පඨමං

---

15 රස. සකටයොග්ගෙ

## 36. සුසද්ධාසුමනාය වත්ථුම්හි අත්ථුප්පත්ති.

සුසද්ධා සුමනා භත්තං දත්වා වත්ථං තිවත්ථකං
දිබ්බභත්තඤ්ච වත්ථඤ්ච රජ්ජඤ්ච දෙවිත්තමලභීති.

**එකස්මිං සමයෙ අනුරාධපුරෙ වාලුකවීථියා එකා** මාතුගාමා සුසද්ධා සුමනා නාම. තස්සා මාතා ගාමවාසිමනුස්සෙහි සද්ධිං විවාහං කත්වා මහාගාමං ගන්ත්වා නිච්චං අට්ඨන්නං භික්ඛූනං සලාකභත්තං දෙති. සා එකදිවසං ආසනසාලං ගන්ත්වා භික්ඛූනං වත්තං කුරුමානා ආසනසාලායමෙව අහොසි. අථස්සා සාමිකො ගෙහං ආගන්ත්වා එතිස්සා කුජ්ඣිත්වා ගෙහතො නීහරි. සා පන මාතුගාමා සත්තදිවසමත්තං එකභත්තියගෙහෙ වසමානා අත්තනො ආරොචනකං අදිස්වා අනුරාධපුරෙ අත්තනො මාතාපිතූනං සද්ධාය නික්ඛමිත්වා අන්තරාමග්ගෙ තස්මිං තස්මිං ඨානෙ චෙතියඤ්ච බොධිඤ්ච වන්දමානා අනුපුබ්බෙන නිග්‍රොධසාලබණ්ඩචාරං සම්පාපුණි. ඉමිස්සා පන මාතුගාමිස්සා ආහාරකිලන්තං සත්තදිවසං හොති. තදා සක්කො දෙවානමින්දො භත්තපුටං ගහෙත්වා මහල්ලකවණ්ණෙන තස්සා සන්තිකෙ පාකටො අහොසි. අථ සක්කො දෙවරාජා "කත්ථ ගච්ඡසි අය්‍යෙ"ති ආහ. සා අනුරාධපුරං ගච්ඡාමීති ආහ. සක්කො "අතිජාතරූපාසි; ඉමං භත්තං භුඤ්ජාහී"ති භත්තපුටං අදාසි. සා භත්තං ගහෙත්වා අහං පන භත්තං භුඤ්ජාමි, උදකං පන නත්ථීති ආහ තදා සක්කො දෙවරාජා අවිදූරෙ ඨානෙ පඤ්චපදුම සඤ්ඡන්නං පොක්ඛරණිං දස්සෙසි. සා පොක්ඛරණිං ගන්ත්වා පොක්ඛරණියං හත්ථෙ ධොවිත්වා කාලං ඔලොකෙත්වා පුරෙභත්තන්ති ඤත්වා කාලං ඝොසෙසි. එතිස්සා කාලඝොසිතසමනන්තරමෙව ගොළකසමුද්දපබ්බතවාසී[1] මහාධම්මදින්නත්ථෙරො අට්ඨසමාපත්තිං සමාපජ්ජිත්වා සත්තමෙ දිවසෙ උට්ඨිතො තං සද්දං සුත්වා පත්තචීවරං ගහෙත්වා අවිදූරෙ ඨානෙ පාකටො අහොසි.

---

1. රස. තලංගරසමුද්දපබ්බතවාසී.

සා ථෙරං දිස්වා හත්ථතො පත්තං ගහෙත්වා භත්තං පූරෙත්වා පත්තං ගහෙත්වා "මුහුත්තං තිට්ඨ අය්‍යා"ති වත්වා පටිච්ඡන්නට්ඨානං පවිසිත්වා අත්තනො නිවත්ථ—සාටකං ධොවිත්වා ථෙරස්ස පත්තචුම්බටකං කත්වා අදාසි. අථ පන ථෙරො "මාතුගාමො අත්තානං පස්සතූ"ති අධිට්ඨාය ආකාසෙ පක්ඛන්දිත්වා අගමාසි. මාතුගාමො ථෙරං දිස්වා සොමනස්සං උප්පාදෙත්වා ඔලොකෙන්තී අට්ඨාසි; ථෙරෙ අදස්සනං ගතෙ චිත්තං පසාදෙත්වා වන්දිත්වා භත්තං භුඤ්ජිත්වා මග්ගපටිපන්නකාලෙ නිග්‍රොධරුක්ඛෙ නිබ්බත්ත-දෙවතා එකස්මිං පසිබ්බකෙ අට්ඨ දිබ්බවත්ථෙ[2] ඨපෙත්වා එකස්මිං පසෙස දිබ්බභත්තඤ්ච දිබ්බගුළපූවකෙ ච පූරෙත්වා එකං බුද්දකසකටං ආරුය්හ එතිස්සා අවිදූරෙ ඨානෙ පාකටො හුත්වා "කුහිං ගච්ඡසි අම්මා"ති ආහ. සා "නගරං ගච්ඡාමි අය්‍යා"ති ආහ. තෙන හි ආගච්ඡ ඉමස්මිං සකටෙ නිසීද, අහම්පි නගරං ගච්ඡාමී ති ආහ. සා සාධු ගච්ඡාමී ති සාබං නිවාසෙත්වා සකටෙ නිසීදිතුං න සක්කාති ආහ. තදා එකං සාටකං තස්සා අදාසි. තෙන හි ඉමං නිවාසෙත්වා සකටෙ නිසීදාහීති ආහ. සා පන මාතුගාමා සාටකං නිවාසෙත්වා සකටං ආරුය්හ තං මුහුත්තමෙව චෙතියගිරි-සමීපං ආගඤ්ඡි. තදා දෙවපුත්තො [ගුළපූවනිත්තිණීස්මිං සකටං[3] ඨපෙත්වා ඉතො පට්ඨාය අම්හාකං නගරං ගන්තුං න සක්කාති වත්වා එතිස්සා භත්තඤ්ච ගුළපූවඤ්ච වත්ථඤ්ච නික්ඛිත්තපසිබ්බකං දත්වා සයං අන්තරධායි. [තදා ගුළපූවකන්ති දින්නකාලෙ නිබ්බත්ත—දෙවතා[3] ඉමිස්සා භත්තපච්ඡිං ගහෙත්වා ගච්ඡන්තිං දිස්වා ඉමිස්සා වෙය්‍යා-වච්චං[5] කථෙත්වා[5] ඉමිස්සා හත්ථතො භත්තපච්ඡියාදීනි ගහෙත්වා නගරං ආගච්ඡන්තො මහාපාළිම්හි භික්ඛූනං ඔසරණකාලෙ ආගච්ඡි. සාපි මහාභික්ඛුසඞ්ඝස්ස මහා-පාළිම්හි දිබ්බපූවෙ ච දිබ්බසාටකෙ ච අදාසි. තදා රාජා බහිනගරං ගන්ත්වා මහාපාළිම්හි භික්ඛූනං භත්තඤ්ච

2 (සබ්බෙසු) අළුදිබ්බවත්ථං. 3. (සබ්බෙසු) ගුළපූවසාංහි එකස්මිං. 4. රස. තදා තත්ථ නිබ්බත්තා නිහානිණීකාදෙවතා. 5 රස වෙය්‍යාවච්චකාරා හුත්වා.

ගුළපූවකඤ්ච ඨපිතං දිස්වා කෙන ඨපිතන්ති ආහ. තඤ්ච රඤ්ඤො තස්සා දානං දින්නභාවං කථෙසුං. රාජා තං සුත්වා එතං පක්කොසාපෙත්වා දානදින්නප්පකාරං පටිපුච්ඡි. සා අත්තනො දානදින්නප්පකාරං විත්ථාරෙත්වා කථෙසි. රාජා තුස්සිත්වා තස්සාභිසෙකං අදාසි. සා රාජානං ආදිං කත්වා සකලනගරවාසීනං දිබ්බවත්ථමෙව අදාසි. භික්ඛුනීවාසෙ භික්ඛුනීනඤ්ච අදාසි. සා තතො පට්ඨාය දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථකම්මං කත්වා තතො චවිත්වා දෙවලොකෙ නිබ්බත්ති. තෙන වුත්තං

සුසද්ධා සුමනා භත්තං දත්වා වත්ථං තිවත්ථකං
දිබ්බභත්තඤ්ච වත්ථඤ්ච රඤ්ඤො දෙවිත්තමලභී ති.

**සුසද්ධාසුමනාය වත්ථු ඡට්ඨං**

---

## 37. නන්දිරාජවත්ථුම්හි අත්ථුප්පත්ති.

දත්වා පච්චෙකබුද්ධානං නන්දිරාජානුවාතකං
චතුසට්ඨිකප්පරුක්ඛෙ භවභොගඤ්ච සො ලභී'ති

පදුමුත්තරබුද්ධකාලෙ හංසාවතීනගරෙ වෙදෙහො නාම අසීතිකොටිවිභවො එකො කුටුම්බිකො සත්ථාරං නිමන්තෙත්වා බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං අදාසි. එකො ධුතඞ්ගධරානං අග්ගො මහාකස්සපත්ථෙරො නාම භික්ඛාය[1] ද්වාරෙ පතිට්ඨිතෙ කුටුම්බිකෙන "අන්තොගෙහං පවිසථ භන්තෙ"ති වුත්තෙපි අපවිසිත්වා අගමාසීති කුටුම්බිකෙන වුත්තං සුත්වා සත්ථා අනෙකප්පකාරෙන තස්ස භික්ඛුනො වණ්ණං කථෙසි. උපාසකො තං සුත්වා ධුතඞ්ගධරානං අග්ගභාවං පත්ථෙසි. භගවා තතියසාවකභාවස්ස ව්‍යාකරණං අදාසි සො යාවතායුකං පුඤ්ඤං කත්වා දෙවලොකෙ නිබ්බත්තිත්වා දෙවමනුස්සෙසු සම්පත්තිං අනුභවමානො මහාවිපස්සීබුද්ධකාලෙ **එකසාටකො** නාම බ්‍රාහ්මණො හුත්වා

1. රු. භික්ඛත්ථාය.

මහාදානං දත්වා කස්සපසම්මාසම්බුද්ධස්ස • පරිනිබ්බානකාලෙ සෙට්ඨිපුත්තො හුත්වා නීයානිකං වත බුද්ධසාසනන්ති පසීදිත්වා යොජනිකං සුවණ්ණචෙතියං කම්බලකඤ්චුකෙන පරික්ඛිපිත්වා තත්ථ පිට්ඨෙ චක්කප්පමාණෙහි සුවණ්ණපදුම පුප්ඵෙහි අලඞ්කරි. තෙසං ද්වාදසහත්ථා ඔලම්බකා හොන්ති. සො තත්ථ දානාදීනි පුඤ්ඤානි කත්වා තතො චවිත්වා සග්ගෙ නිබ්බත්තිත්වා සග්ගතො චවිත්වා මගධරට්ඨෙ අඤ්ඤතරස්මිං කුලෙ උප්පජ්ජිත්වා අඤ්ඤතරපච්චෙකබුද්ධස්ස අනුවාතකං දත්වා පුන සග්ගෙ නිබ්බත්තිත්වා තත්ථ චිරං වසිත්වා තතො චවිත්වා මගධරට්ඨෙ අඤ්ඤතරස්මිං කුලගෙහෙ නිබ්බත්තිත්වා වයප්පත්තො නන්දියොති නාමං කරිංසු. තස්ස සත්ත-භාතරො හොන්ති. නන්දියස්ස අකම්මසීලභාවෙන භාතරො කුජ්ඣිංසු

මාතාපිතරො නන්දියං ආමන්තෙත්වා තව භාතරො උජ්ඣායන්ති; කස්මා ත්වං අත්තනො කත්තබ්බකම්මං න කරොසීති ආහංසු නන්දියො "අත්තනො අත්තනුරූපකම්මං පුරිසා න කරොන්තී"ති ආහ. මාතාපිතරො අනෙකවාරෙන වත්වාපි තං කම්මං කාරාපෙතුං අසක්කොන්තා සෙසා සත්තභාතරො කලහං කරොන්තා නන්දියස්ස කුජ්ඣිත්වා තං ගෙහතො නීහරිංසු. සො යත්ථ කත්ථචි ගන්ත්වා ජීවිස්සාමීති ගච්ඡන්තො අඤ්ඤතරස්මිං ගාමෙ නිවාසං අග්ගහෙසි තස්මිං ගාමෙ සො සෙනගුත්තස්ස ගෙහෙ කම්මං කරොන්තො විචරන්තො එකදිවසං කම්මං කත්වා අග්ගභත්තං භුඤ්ජිත්වා කම්මකාරකමනුස්සෙහි සද්ධිං නිසීදිත්වා අඤ්ඤමඤ්ඤං සල්ලපන්තො නිසීදිත්වා නිද්දායන්තො සුපිනං අද්දස. තස්ස එවරූපං සුපිනං අහොසි: තස්ස මුඛෙන අන්තං නික්ඛමිත්වා සකලජම්බුදීපෙ පත්ථරිත්වා අත්තනො කුච්ඡිමෙව පාවිසි. සො තං දිස්වා භීතො මහාසද්දං අකාසි. තං සුත්වා සෙන-ගුත්තො "කස්මා එවං සද්දං අකාසී"ති ආහ. සෙනගුත්තෙන එකමන්තං නෙත්වා සුපිනං පුට්ඨො අත්තනො දිට්ඨනියාමං කථෙසි. සෙනගුත්තො තං සුත්වා කස්සචි නාරොචෙහීති ආහ තස්ස පන සෙනගුත්තස්ස කුලූපකා එකා පරිබ්බාජිකා

අත්ථි. සො පරිබ්බාජිකාය සන්තිකං ගන්ත්වා "අය්‍යෙ, මාතුගාමො වා පුරිසො වා එවරූපං සුපිනං පස්සති, තං කිස්ස හෙතූ"ති පුච්ඡි. පරිබ්බාජිකා සෙනගුත්තස්ස කථං සුත්වා තස්මිං සුපිනනිදානං කථෙන්ති "සචෙ ඉත්ථී පස්සති, රඤ්ඤො සත්තදිවසබ්භන්තරෙන අභිසෙකං හොති. අථ පුරිසො පස්සති, සත්තදිවසෙන රාජා හොතී"ති ආහ. සෙනගුත්තො පරිබ්බාජිකාය කථං සුත්වා ඉමස්ස දාරකස්ස මය්හං ඤාතකං කාතුං වට්ටතීති චින්තෙත්වා ගෙහං ගන්ත්වා සබ්බෙ මනුස්සෙ නානාකම්මෙන නියොජාපෙසි. ලහුකං කම්මං කත්වා ආගච්ඡථාති වුත්තෙන තන්දියො සබ්බෙසං පඨමං යෙව ආගච්ඡති, තතො අඤ්ඤෙ ආගමිංසු. සෙනගුත්තො තස්ස තුස්සිත්වා "තුට්ඨාතං කිං කරොන්තී"ති ආහ. සබ්බෙ මනුස්සා "තුම්හෙ ජානාථා"ති ආහංසු. තස්ස පන සෙනගුත්තස්ස සත්තධීතරො හොන්ති. සො සබ්බා ආමන්තෙත්වා අනුපුබ්බෙන ඉමස්ස සන්තිකෙ වසථාති ආහ. සබ්බා "මයං තස්ස ජාතිගොත්තං න ජානාම, දලිද්දො එසො, තස්ස ගෙහෙ න වසිස්සාමා"ති ආහංසු කණිට්ඨිකා පන "අහං මාතාපිතූනං දින්නට්ඨානෙ[2] වසිස්සාමී"ති ආහ. සෙනගුත්තො තන්දියස්ස තං දත්වා අත්තනො භාගිනෙය්‍යං අකාසි. මහන්තං තස්ස සම්පත්තිං අදාසි තන්දියො පන සත්තදිවසච්චයෙන උය්‍යානං පවිසිස්සාමීති ගන්ත්වා මඞ්ගලසිලාපට්ටෙ සයිත්වා සීසතො පට්ඨාය පටං පාරුපිත්වා නිද්දං ඔක්කමි. අථ බාරාණසීරඤ්ඤො මතං සත්තදිවසං හොති. තං දිවසං පන රාජානුච්ඡවිකං පුරිසං ඔලොකෙතුං ඵුස්සරථං විස්සජ්ජෙසුං. සින්ධවා පන ඵුස්සරථං ගහෙත්වා උය්‍යානං ගන්ත්වා· තන්දියස්ස ආරොහනයොග්ගං කත්වා අට්ඨංසු තදා පුරොහිතබ්‍රාහ්මණො පාදතො වත්ථං උක්ඛිපිත්වා ලක්ඛණං ඔලොකෙත්වා රාජානුච්ඡවිකභාවං ජානිත්වා තන්දියස්ස ධිතිභාවජානනත්ථං තූරියසහස්සං වාදපෙත්වා ධීරසම්පත්තිං ඔලොකෙත්වා පබුද්ධකාලෙ අමච්චාපි තං උපගන්ත්වා "සාමි තුම්හාකං රජ්ජං පාපුණාතී"ති ආහංසු. තදා තන්දියො උට්ඨාය නිසීදිත්වා, රජ්ජං කරොමීති ආහ.

---

2. සි 2. කෝ දිට්ඨානෙ.

තදා රාජපුරිසා මහන්තෙන පරිවාරෙන තං නහාපෙසුං. තදා නහාතලිත්තස්ස තං වත්ථං උපනෙසුං. තන්දියො තදා "අඤ්ඤං උත්තමවත්ථං උපනෙථා"ති ආහ. එතස්ස කථං සුත්වා අඤ්ඤං උත්තමවත්ථං නත්ථිභාවං කථෙසුං. තදා තන්දියරාජා වලඤ්ජන දණ්ඩං ගහෙත්වා "තන්දියරාජස්ස ආණා"ති වත්වා පථවියං පහරි පථවිතො චතුසට්ඨිකප්පරුක්ඛා උට්ඨහිංසු. තතො අත්තනො රුචිතං ගහෙත්වා නිවාසෙත්වා නගරං පවිසන්තො "යෙ කෙචි තන්දිරාජස්ස කප්පරුක්ඛා උට්ඨිතාති සුත්වා මං පස්සිතුං ආගතා, තෙ තතො වත්ථානි නිවා සෙන්තූ"ති. තස්මිං ඨානෙ චත්තාරො කප්පරුක්ඛෙ ඨපෙසි. නගරෙ චතූසු වාරෙසු චත්තාරො කප්පරුක්ඛෙ ඨපෙසි. අවසෙසකප්පරුක්ඛෙ නගරමජ්ඣෙ ඨපෙසි තතො ජනපද-තො ආගතමනුස්සා තන්දියරාජස්ස කප්පරුක්ඛා නිබ්බත්තාති සුත්වා නානාජනපදතො බහූමනුස්සා ආගතා හොන්ති. අථ තන්දියරාජා එතෙසං සද්දං සුත්වා ' වලඤ්ජනදණ්ඩං ගහෙත්වා "තස්මිං තස්මිං ජනපදෙ තෙසං තෙසං කුලානං ඝරවාරෙ සබ්බෙසු ඨානෙසු කප්පරුක්ඛා උට්ඨහන්තූ"ති අධිට්ඨාසි. සබ්බත්ථ කප්පරුක්ඛා උට්ඨහිංසු. තන්දියරඤ්ඤො විජිතෙ සුත්තකන්තිකා ඉත්ථියො මා සුත්තං කන්තිංසූති එවං භෙරිං චරාපෙසි. තන්දියරාජා යාවජීවං පඤ්චසතපච්චෙකබුද්ධානං උපට්ඨහිත්වා තතො චවිත්වා සග්ගෙ නිබ්බත්ති. සග්ගතො චවිත්වා මනුස්සලොකෙ රාජා හුත්වා අට්ඨන්නං පච්චෙක-බුද්ධානං මණිආධාරකෙ ඨපෙත්වා යාවජීවං මහාදානං දත්වා අමහාකං සත්ථුනො කාලෙ බ්‍රාහ්මණකුලෙ උප්පජ්ජිත්වා බුද්ධ සාසනෙ පබ්බජිත්වා කස්සපො නාම මහාසාවකො අහොසි තෙන වුත්තං.

දත්වා පච්චෙකබුද්ධානං තන්දිරාජා'නුවාතකං
චතුසට්ඨිකප්පරුක්ඛෙ භවභොගඤ්ච සො ලභීති.

**නන්දිරාජස්ස වත්ථු සත්තමං.**

---

## 38. චොරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

චොරස්ස වත්ථං දත්වාන දෙවො හුත්වාන[1] සො ලභී
තියොජනකප්පරුක්ඛෙ, විමානං වාදසයොජනන්ති.

තං කථන්ති චෙ?

එකස්මිං සමයෙ එකො මනුස්සො ධෙව සාටකෙ නිවාසෙත්වා මහන්තං අටවිං පාපුණි. එකො චොරො තස්ස වත්ථං ගණ්හිස්සාමීති අනුබන්ධි. සො මනුස්සො චොරෙන අනුබන්ධිතො එවං චින්තෙසි: "අයං චොරො මය්හං ගණ්හිතුං අනුබන්ධති. එතස්ස අනිච්ඡාය ගණ්හන්තස්ස පුඤ්ඤත්ථාය දස්සාමී"ති චින්තෙත්වා චිත්තං පසාදෙත්වා "ඉමං වත්ථං මම භවෙසු සුඛත්ථාය[2] භවතූ"ති වත්වා තස්ස වත්ථං දත්වා අරඤ්ඤෙන ජඞ්ඝමග්ගෙන ගච්ඡන්තො ආසීවිසෙන දට්ඨො චවිත්වා හිමවන්තපදෙසෙ ද්වාදසයොජනිකෙ කනකවිමානෙ නිබ්බත්ති. විමානං පරිවාරෙත්වා තියොජනිකඨානෙ කප්පරුක්ඛා නිබ්බත්තිංසු තස්මිං විමානෙ අච්ඡරාසහස්සෙහි පරිවාරෙත්වා දිබ්බසම්පත්තිං අනුභවතීති.

චොරවත්ථු අට්ඨමං.

---

## 39. කාකවණ්ණතිස්ස – මහාරාජස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

මිලක්ඛො[1] පච්චෙකබුද්ධස්ස දූතං දත්වා පනසඵලං
ථූපපූජං කරිත්වාන කාකවණ්ණාභයො අහූති.

කාකවණ්ණතිස්සමහාරාජා පන අම්හාකං සත්ථුනො උප්පන්නපුබ්බභාගෙ එකස්මිං මිලක්ඛජනපදෙ[2] මිලක්ඛ මනුස්සො[2] හුත්වා නිබ්බත්ති. නිබද්ධං පච්චෙකබුද්ධස්ස චතුපච්චයෙ දත්වා පටිජග්ගි. සො පන මිලක්ඛමනුස්සො[2]

---

1. බි 1 සූත්වාන. 2. බි 1. බි 2. සුඛුමත්ථාය 1. බි 2. මිලක්ඛු.
2. බි 2. රු. මිලක්ඛු —

අත්තනො ගෙහස්ස පච්ඡාභාගෙ එකං පනසරුක්ඛං රොපෙසි. සො අනුපුබ්බෙන වඩ්ඪිත්වා මහන්තචාටිප්ප-මාණඵලභරිතො[3] අහොසි. අථෙකදිවසං මිලක්ඛ-මනුස්සො[2] සාඛම්හි යෙව පරිපක්කපනසඵලං ගහෙත්වා ඉතො චිතො ච සඤ්චාලෙත්වා අවස්සයං ලුඤ්චි (ත්වා). අවස්සයං[4] ලුඤ්චිගමානෙ මධුරයූසං[5] පරිපූරෙත්වා ඨපෙසි. සො තං දිස්වා ඉමං යූසං[6] අඤ්ඤස්සං නානුච්ඡවිකන්ති චින්තෙත්වා තං යූසං[6] සාධුකං ඨපෙත්වා පච්චෙකබුද්ධං ආගතං දිස්වා පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා හත්ථතො පත්තං ගහෙත්වා යූසං[6] පූරෙත්වා පච්චෙකබුද්ධස්ස දත්වා චිත්තං පසාදෙත්වා සන්තුට්ඨො අහොසි. පච්චෙකබුද්ධො යූසං[6] පරිභොගං කත්වා අත්තනො වසනට්ඨානමෙව අගමාසි. පච්චෙකබුද්ධො තස්සෙව ඝරෙ භික්ඛං ගණ්හාති. අථෙකදිවසං සො ජනපද මනුස්සො සයං අරඤ්ඤං ගච්ඡන්තො අත්තනො භරියං ආමන්තෙත්වා අම්හාකං අය්‍යස්ස ආගතකාලෙ භික්ඛං දදෙය්‍යාසීති වත්වා අරඤ්ඤං අගමාසි පච්චෙකබුද්ධොපි කාලං ඔලොකෙත්වා ආගන්ත්වා ගෙහද්වාරෙ අට්ඨාසි. තං දිස්වාව මාතුගාමො තස්ස හත්ථතො පත්තං ගහෙත්වා ගෙහං පවෙසෙත්වා ආසනෙ නිසීදාපෙත්වා පිණ්ඩපාතෙන පරිවි-සිත්වා භත්තකිච්චං නිට්ඨාපෙත්වා නිසින්නො සා පච්චෙකබුද්ධෙ ලොභචිත්තං උප්පාදෙත්වා ඉත්ථිකුත්තමායං දස්සෙත්වා මය්හං මනොරථං පූරෙහීති ආහ. පච්චෙකබුද්ධො එතිස්සා කථං සුත්වා අට්ඨිකඞ්කලූපමා කාමාති ආදිනා නයෙන සබ්බත්ථ විවිධාදීනවං දස්සෙත්වා උට්ඨායාසනා පක්කාමි. සො පන ලුද්දමනුස්සො අරඤ්ඤතො ආගන්ත්වා අත්තනො භරියං ආමන්තෙත්වා කිං අම්හාකං අය්‍යො ආගතොති ආහ. ආම ආගතො, එතස්ස කථං මමං මා පටිපුච්ඡීති ආහ. කථෙහි කිං අකාසීති ආහ. අත්තනා සද්ධිං අනනුයුත්තං ලොකාචාරං කරොහීති ආහ. අහං පන අත්තනො පියතරභාවෙන එතස්ස කථිතං න අකාසිං. සො පන අත්තනො රුචිතං න කරොතීති

3. බි 2. කෝ. රු. ඵලභාරතො. 4. බි 2. අපස්සයං. 5. (සබ්බෙසු) මධුසූපං. 6. (සබ්බෙසු) සූපං.

මය්හං කෙසෙ ලුඤ්චිත්වා තචෙන කොට්ටෙත්වා මං දුබ්බලං කත්වා හිංසිත්වා ගතොති ආහ. සො පන මිලක්ඛමලයවාසී[8] මනුස්සො එතිස්සා කථං සුත්වා අහං එත්තකං කාලං පටිජග්ගන්තො මම මාතුගාමස්ස එවරූපං කාතුං පටිජග්ගි-තොති කුජ්ඣිත්වා මිලක්ඛමනුස්සො[8] ධනුං ගහෙත්වා පච්චෙක-බුද්ධං මාරෙස්සාමීති අගමාසි.

තදා තස්සා'ගමනතො පඨමමෙව ආගතමග්ගෙ පොක්ඛ-රණිං මාපෙත්වා ආකාසෙ චිවරකුටිං කත්වා කායබන්ධනං පසාරෙත්වා තස්සූපරි නිවාසනං ඨපෙත්වා චීවරගබ්භතො පොක්ඛරණිං ඔගාහෙත්වා නහායිත්වා ආකාසෙ ඨත්වා චීවරං පාරුපිත්වා අගමාසි. මිලක්ඛමනුස්සො[8] තං කිරියං දිස්වා “එවරූපා නාම එවරූපං කම්මං න කරොන්ති; සා පන අඤ්ඤාණතාය අත්තනො චිත්තං න පූරෙන්ති[9] කුජ්ඣිත්වා එවං කරෙසී”ති චින්තෙත්වා ධනුං ගච්ඡන්තරෙ ඨපෙත්වා පච්චෙකබුද්ධස්ස නහායිත්වා ආරාමං ගතකාලෙ උපසඞ්කමිත්වා පාදමූලෙ උරෙන සයිත්වා “මය්හං ඛමථ අය්‍යා”ති ආහ. “කස්මා එවං වදෙසි උපාසකා”ති? ආහ. “භන්තෙ අහං අඤ්ඤාණතාය මය්හං මාතුගාමස්ස කථං ගහෙත්වා තුම්හාකං මාරෙතුං ආගතොම්හී”ති ආහ. පච්චෙකබුද්ධො “තයා චින්තිතකම්මං කස්මා න කරොසී”ති ආහ. තුම්හාකං නහානඨානෙ කතකම්මං පස්සිත්වා එවරූපා අය්‍යා නාම එවරූපං අයුත්තං න කරොන්ති; මාතුගාමො පන අය්‍යස්ස අත්තනො ඉච්ඡිතං අකරොන්තස්ස කුජ්ඣිත්වා කථිතං භවිස්සතීති චින්තෙමි භන්තෙති ආහ. පච්චෙකබුද්ධො එතස්ස කථිතං සුත්වා “සච්චමෙව උපාසක, සා පන අම්හාකං එවරූපං කරෙසී”ති ආහ. සො පන මිලක්ඛ-මනුස්සො පච්චෙකබුද්ධස්ස කථං සුත්වා “අජ්ජ එතිස්සා කත්තබ්බං කරිස්සාමී”ති ආහ. සො පන මාතුගාමස්ස කුජ්ඣිත්වා ගෙහං ගන්තුමාරභි. තදා පච්චෙකබුද්ධො මිලක්ඛමනුස්සං ආමන්තෙත්වා මාතුගාමා නාම එවරූපා ති ආහ.

8. (සබ්බෙසු). මිලක්ඛු —. 9. “න පූරෙතීති.” භවිතබ්බං.

යථා නදී ච පන්ථො ච, පානාගාරං සභා පපා
එවං ලොකිත්ථියො නාම; වෙලා තාසං න විජ්ජති.
එවං වුත්තනයෙන නදීආදිසදිසා.

සබ්බා නදී වඞ්කගතා, සබ්බෙ කට්ඨමයා වනා,
සබ්බිත්ථියො කරෙ පාපං ලභමානා නිවාතකෙති.
එවං වුත්තනයෙන සබ්බා අසංවරා.

අසා ලොකිත්ථියො නාම, වෙලා තාසං න විජ්ජති.
සාරත්තා ච පගබ්භා ච, සිඛී ච සබ්බඝාසනො[10]
තා හිත්වා පබ්බජිස්සාමි, විවෙකමනුබ්‍රූහයංති
වුත්තට්ඨානෙ විය අග්ගිසදිසා;

මායා චෙසා මරීචී ච, සොකො රොගො චුපද්දවො
ඛරා ච බන්ධනා[11] එසා, මච්චුපාසො ගුහාසයො ති

වුත්තට්ඨානෙ විය අනෙකඋපද්දවසදිසා වො'සාති ආදිනා නයෙන ඔවදිත්වා පෙසෙසි සො පන මිලක්ඛමනුස්සො යාවජීවං පච්චෙකබුද්ධං උපට්ඨහිත්වා කාමාවචර-දෙවලොකෙ නිබ්බත්ති. තත්ථ චිරං වසිත්වා දීඝමද්ධානෙ මහාසම්පත්තිං අනුභවිත්වා පච්ඡා තතො චවිත්වා මනුස්සලොකෙ මලයරට්ඨෙ අමරලෙණසමීපෙ මිලක්ඛමනුස්සස්ස[2] පුත්තො හුත්වා නිබ්බත්ති. අනුපුබ්බෙන වඩ්ඪිත්වා නාමෙන අමරුප්පල-නාමකො[12] අහොසි. සො අඤ්ඤෙහි [සබ්බ]දාරකෙහි සද්ධිං කීළන්තොව සබ්බෙ දාරකෙ තුම්හෙ භික්ඛූති පටිපාටියා නිසීදාපෙත්වා වාලුකාභත්තං[13] පචිත්වා භික්ඛුසඞ්ඝස්ස දානං දෙමීති දානකීළං නාම කීළති. නිච්චමෙව එවං කරොති. අථෙකදිවසං අමරුප්පලො[12] කීළන්තො වාලුකථූපං කත්වා අත්තනො නිවත්ථ—දුකූලසාටකෙන එකං සුත්තං ගහෙත්වා හීළවල්ලකදණ්ඩකං[14] ගහෙත්වා තත්ථ බන්ධිත්වා ධජං කත්වා වාලුකාථූපෙ පූජෙසි. අථ අපරෙන සමයෙන අමරමහාලෙණ-වාසීථෙරස්ස සහායො හුත්වා යාවජීවං බහුපුඤ්ඤකම්මං

10. (සබ්බෙසු) සබ්බඝාතනො. 11. ර. ඛණ්ඩකබන්ධනා
12. (සබ්බෙසු) අමනුප්පලනාමකො. 13. බි 1. ර. වාලුකා. භත්තං.
14. බි 1. ර. හිලවල්ලකරණ්ඩකං. රස තුජ්ජවල්ලරිදණ්ඩකං

කත්වා තතො චවිත්වා මහාගාමෙ ගොඨාභයස්සෙව පුත්තො හුත්වා [නිබ්බත්ති.][13] සො අනුපුබ්බෙන වඩ්ඪිත්වා කාකවණ්ණතිස්සමහාරාජා නාම අහොසි. සො රජ්ජං ලභිත්වා පුබ්බුපනිස්සයෙන මහාදානපති අහොසි. මහන්තො සද්ධාසම්පන්නො අහොසි ගිරිනාමනදීතීරෙ අත්තනො නාමං කත්වා තිස්සමහාවිහාරං අකාසි රාජගාමෙ කල-විහාරඤ්ච(?) කුටඨාතියමහාවිහාරඤ්ච[14] කාරෙසි. අනෙක-සහස්ස—අනෙකසතසහස්ස—මහාභික්ඛුසඞ්ඝස්ස චත්තාරො පච්චයෙ ච පණීතබ්‍යඤ්ජනඤ්ච අනූනං කත්වා අදාසි. සබ්බපරියත්තිධරෙන සද්ධිං තිපිටකධරෙ ගහෙත්වා සද්ධම්ම-සවණං කරොන්තො ථෙරානං චන්දන—ආමලක—කරණ්ඩකෙ සතපාකතෙලෙන පූරෙත්වා පිට්ඨිකණ්ටප්පමාණෙන ඔගාහා-පෙත්වා[15] නිසීදාපෙත්වා මධු—සප්පි—සක්ඛරා—චතුමධුරඤ්ච පච්ඡාභත්තං ඛාදියාපෙත්වා ඛණ්ඩසක්ඛරකෙන පූවෙන කපොතකසකුණසීසසදිසෙන නාළිකෙරඵලඛණ්ඩෙන දබ්බතිණබදලතාසදිසෙන පණ්ණෙන, සාදුලකෙණ්ඩි—සදිසෙන මාලලසුණෙන[16] බිලාලිමූලසදිසෙන[17] අද්දසිඞ්ගි-වෙරෙන[18] ගවක්ඛසදිසෙන චඞ්ගයද්ධකෙන, නීලුප්පල-පුප්ඵසදිසෙන අම්බිලපූවෙන,[19] අපිළිතමධුපටලසදිසෙන පරිපූරෙන සුපක්කතළනඛාවපූවෙන[20] සූපසක්ඛරාගුළ—මොරගුළ — ඛීරගුළ—තිලගුළ — ඵෙණපූවාදිඅනෙකපූවෙන නානාවණ්ණබ්‍යඤ්ජනෙන නානග්ගරසෙන පරිවිසිත්වා තිවස්සිකගන්ධසාලිතණ්ඩුලෙන සක්ඛරාදධියාගුං පායෙත්වා අනන්තරභත්තෙන අට්ඨාරසවණ්ණෙන පූවඛජ්ජකෙන මහාවාපිය සක්ඛරෙන පක්කමධුසක්ඛරෙන, නානාවණ්ණබ්‍යඤ්ජනෙන අනන්තරඛජ්ජකං කත්වා දිවාභොජනකාලෙ ගන්ධසාලිතණ්ඩුල භත්තං නානග්ගරසෙන නානාබ්‍යඤ්ජනෙන දත්වා පච්ඡා-භත්තෙන පඤ්චමූඛවාසසහිතං[21] මුට්ඨිබද්ධතම්බූලං දත්වා

13. පොත්ථකෙසු න විජ්ජති 14 රස. කුච්ඡාලියමහාවිහාරං ච
15. ර. ඔගාහෙත්වා 16. සි 1 ර. සේ. මාලලසුනෙන. 17. සී 1 සේ ර. බිලාමූලසදිසෙන. 18. සි 1. අද්දසිංගුවෙන. සේ. අද්දඅංකුරෙන
19. ර. අම්බිනිපූවෙන. සී 2 අප්පතිපූවෙන. 20. ර. තවුතනෙළුවපූවෙන
21. ර. සේ. පඤ්චධූමවාසසහිතං

අට්ඨවණ්ණකප්පියපානං දත්වා එතෙන නියාමෙන සබ්බ-මහාභික්ඛුසඞ්ඝස්ස ච භික්ඛුනීසඞ්ඝස්ස ච නිරන්තරං මහාදානෙන සංගණ්හිත්වා කපණද්ධික-වණිබ්බක-යාචකානං මහාදානං දත්වා සුඛෙන වසන්තො අථෙකදිවසං කාක-වණ්ණතිස්සමහාරාජා විහාරදෙවියා සද්ධිං චතුරඞ්ගසෙනාය පරිවුතො මහන්තෙන යසෙන මහන්තෙන රාජානුභාවෙන මහාගාමෙ තිස්සවිහාරං ගන්ත්වා තස්මිං තස්මිං මාළකෙ තත්ථ තත්ථ දිවාසයනෙ නිසින්නෙ භික්ඛූ වන්දන්තො ඵාසුකා-ඵාසුකං පුච්ඡන්තො ගිලානභික්ඛූනං භෙසජ්ජං කරොන්තො සකලවිහාරං අනුගන්ත්වා. සායං පරිවෙණං අගමාසි. පරිවෙණෙ බහුස්සුතස්ස ථෙරස්ස සන්තිකෙ උභොපි ධම්මං සුණමානා නිසීදිංසු. ථෙරො ධම්මං දෙසෙන්තො "මහන්තං(?) වො සම්පත්ති, තං තයා පුබ්බෙ කතපුඤ්ඤෙන උප්පන්නං. ඉදානි අප්පමත්තා හුත්වා උප්පන්නට්ඨානෙ සුලභං කරොථා"ති ආහ. තං සුත්වා දෙවී "කිං නාම සම්පත්තිං භන්තෙ ලද්ධා? වඤ්ඣා[22] සම්පත්ති; නො පුත්තො නත්ථී"ති ආහ. "තෙන හි දෙවි, පරිවෙණපච්ඡාභාගෙ ගිලානසාමණෙරො අත්ථි; තං ඔලොකෙහී"ති ආහ. තං සුත්වා දෙවී පරිවෙණ-පච්ඡාභාගං ඔලොකෙන්තී ගිලානසාමණෙරං දිස්වා උපසංකමිත්වා වන්දිත්වා පාදෙ පරිමජ්ජමානා සාමණෙරස්ස සප්පායං භෙසජ්ජං පුච්ඡිත්වා අනධිවාසෙන්තං දිස්වා "තුම්හෙ ඉතො චවිත්වා කත්ථ උප්පජ්ජිතුකාමා"ති ආහ. ඉතො චවිත්වා දෙවලොකෙ උප්පජ්ජිතුකාමොම්හීති ආහ. දෙවී සාමණෙරස්ස කථං සුත්වා "භන්තෙ, දෙවලොකෙ සම්පත්ති නාම කොට්ඨඡිතධඤ්ඤසදිසා; දෙවලොකෙ පුඤ්ඤකම්මං න කරීයති.[23] තත්ථ[24] ගතස්ස තෙ කතපුඤ්ඤං ඛීයති. විපුලං උළාරං පුඤ්ඤකම්මං කරොන්තස්ස රාජකුලසදිසං ඨානං[25] නත්ථි; පස්සථාති වත්වා සාමණෙරස්ස නිපන්නට්ඨානං ගන්ධෙන පරිභණ්ඩං කත්වා සුමනපුප්ඵසන්ථතෙ මුදුකෙ සයනෙ සාමණෙරං සයාපෙත්වා ගන්ධමාල—ධූමවාසිතචුණ්ණෙහි සජ්ජෙත්වා පත්ථරිය—විචිත්ත

22 බී 1. බී 2. පවජා. 23. (සබ්බෙසු) කරිස්සති. 24. බී 1. බී. 2 නස්ස. 25. බී 1. රා.. තං තනු.

විතානෙන[26] සමලංකරිත්වා සුගන්ධසමුග්ග—පුප්ඵසමුග්ග—පදුමුප්පල—පුණ්ඩරීකකලාපෙ නානාවිචිත්තවණ්ණ වත්ථ-සමුග්ගෙ අනෙකසහස්ස—අතිසුඛුම—චීවරසාටකෙ ච සප්පි—නවනීත—තෙල—මධු—ඵාණිතපුණ්ණා අනෙකචාටියො ච අට්ඨවිධෙ සුමධුරපානකෙ ච ආහරාපෙත්වා "ඉදං තුය්හං දම්මි, තව චිත්තරුචියා සඞ්ඝස්ස දානං දෙහි; පස්ස තාත රාජානුභාව"න්ති ආහ. සාමණෙරො පස්සිත්වා අත්තමනො අහොසි. සඞ්ඝස්ස තං නිය්‍යාදෙසි. දෙවී අත්තමනා හුත්වා මධුපානං කුච්ඡිපූරං පායෙත්වා මුඛවාසං මුඛෙ පක්ඛිපිත්වා මාලාගන්ධධූමෙන පූජෙත්වා "ඉම කුච්ඡියං නිබ්බත්තිත්වා සාසනං පග්ගණ්හිත්වා මහාදානං දදහි තාතා"ති වත්වා පක්කාමි. රඤ්ඤො ච දෙවියා ච රථං ආරුය්හ ආගතකාලෙ සාම-ණෙරො චවිත්වා දෙවියා කුච්ඡිම්හි නිබ්බත්ති. දෙවියා නිසින්නපස්සෙ ච රථචක්කං නාභිපමාණෙන පථවියං ඔසීදි. දෙවී ඤත්වා සමණෙරස්ස සන්තිකං දූතං පෙසෙසි. දූතො කාලංකතභාවං ඤත්වා ආරොචෙසි. සා තස්ස සක්කාරං කාරෙසි. තස්මිං ඛණෙ දෙවියා දොහළං උප්පජ්ජි: ඉධ අනුරාධපුරෙ තිස්සවාපියා පානීයං සුවණ්ණකොට්ඨකෙ උප්ප-ලබන්ධනෙනා ආහටමාලං පක්ඛිපිත්වා ච පිලන්ධිත්වා ච සුවණ්ණකුණ්ඩලිකෙ ද්වෙ[27] දමිළරාජූනං සීසෙ ඨත්වා නහායිත්වා සීසච්ඡින්න—අසිධොතපානීයං පාතුං ඉච්ඡා උප්පජ්ජි. ඉමස්ස දොහළස්ස දුල්ලභභාවෙන දෙවී රඤ්ඤො නාරොචෙසි. සා දොහළස්ස අලාභෙන කිසා අහොසි, උප්ප-ණ්ඩුප්පණ්ඩුකජාතා. තං දිස්වා රාජා "කස්මා ත්වං උප්පණ්ඩු-ප්පණ්ඩුකජාතා, ධමනිසන්ථතගත්තා"ති? පුච්ඡි. සා දොහළම්හි දෙවාති ආහ. කීදිසං දොහළන්ති වුත්තෙන සා දුල්ලභභාවෙන අකථෙත්වා රඤ්ඤො පුනප්පුනං නිප්පීළියමානා සබ්බං කථෙසි. රාජා තං සුත්වා අනුරාධපුරෙ එළාරො අමෙහි සද්ධිං වෙරිකො; ඉමං දොහළං ආහරිතුං කො සමත්ථොති ආහ.

(ඉමස්මිං ඨානෙ ඨත්වා වෙළුසුමනඅමච්චස්ස වත්ථු වෙදිතබ්බං.)

---

"26. පට්ට" - ඉති යුත්තතරං. 27. "ද්විකා" ති භවිතබ්බං.

# 40. වෙළුසුමනසස වත්ථු.

කසසපබුඬකාලෙ මනුසෙසා එකභිකඛුනො
පිණඩපාතං දදිතවාන චවිතවා වෙළුසුමනො ති.

තං යථානුසූයතෙ:

කසසපසමමාසමබුඬසස කාලෙ එකො මනුසෙසා අඤෙඤසං අවිහෙඨෙතවා ධමෙමන ලඬාහාරං එකසස භිකඛුනො දතවා සො තෙන කමෙමන චවිතවා දෙවලොකෙ නිබබතතිතවා චිරකාලං සගගසමපතතිං අනුභවිතවා එකං බුඬනතරං මහනතං යසං අනුභවිතවා තතො චවිතවා ලඞකාදීපෙ ගිරි-මණඩලෙ කුමභියඞගණ-නාමගාමෙ[1] වසභො නාම කුටිමබිකො අහොසි, අඩෙඪා මහඬනො මහාභොගො. තසස පුතෙතා හුතවා නිබබතති. තසස පුතෙතා ජාතොති මහාජනො සොමනසෙසා අහොසි. තසස කුටිමබිකසස ඥෙව සහායා අහෙසුං; වෙළුසුමනො, අපරො මනුසෙසා එකො සහායො සුමනො නාම ගිරිභොජකො එකො. තෙ උභොපි සහායසස පුතෙතා ජාතොති සුතවා පණණාකාරමාදාය ගනතවා සහායං පසසිතවා නාමගහණකාලෙ උභොපි සකනාමං දාරකසස කාරෙසුං. තසමා වෙළුසුමනො නාම අහොසි. තං වුඩඪ-කාලෙ ගිරිභොජකො පුතතටඨානෙ ඨපෙතවා අතතනො ගෙහෙ වසාපෙසි. ගිරිභොජකසස පන ගෙහෙ එකො සිනධවො කසසචි ආරොහිතුං න දෙති. කූටසෙසාති තං ඨපෙසුං. සො පන සිනධවො වෙළුසුමනං දිසවා අයං මමානු-රූපො ආරොහකොති චිනෙතතවා මහනතං හෙසිතං[2] අකාසි. තං ඤතවා ගිරිභොජකො වෙළුසුමනං "තං අසස-මාරොහා"ති ආහ. සො තං සුතවා අසසං ආරොහිතවා මණඩලෙ ධාවෙනෙතා කමෙන[3] වඩෙඪතවා සීඝං මණඩලෙ ධාවෙසි. සකලමණඩලෙ එකාබඬො විය අලාතචකකං විය ච අසෙසා පඤඤායති. එවං ධාවනතසස පිටඨියං යථා ච අසසාරොහො පුණණකො යකෙඛා මනොමයසිනධවසස

1. රස. කුටුමබියඞගණ ගාමෙ. 2. (සබෙබසු:) හසිතං. 3. කෝ. කමෙන කමෙන.

පිට්ඨියං නිරාසඞ්කො නිසීදි, තථෙව නිසීදි. තං දිස්වා මහාජනො වෙළුක්ඛෙප—උක්කුට්ඨිආදීනි පවත්තෙසුං. තං සුත්වා ගිරිභොජකො අයං රාජානුච්ඡවිකොති තස්ස සහස්සං දත්වා රඤ්ඤො පටිපාදෙසි. සො රාජපුරිසො හුත්වා රඤ්ඤො සන්තිකෙ පාවසි. සො රඤ්ඤො කායික-බලෙන ආරාධෙතුං උපට්ඨානං අකාසි රාජා තස්ස මහන්තං ඨානන්තරං අදාසි. සො තතො පට්ඨාය නිච්චමෙව උපට්ඨාති. පුනෙකදිවසෙ වෙළුසුම්නො රඤ්ඤො සන්තිකං අගමාසි. රාජා දෙවියා දොහළං තස්ස කථෙසි. තං සුත්වා "අහං තෙ ආහරිතුං සමත්ථො, ආහරිස්සාමී"ති ආහ. සො එවං වත්වා රාජානං වන්දිත්වා අත්තනො ගෙහං ගන්ත්වා නහාපිතං පක්කොසාපෙත්වා සීසං ධොවිත්වා අත්තනො සීසං මුණ්ඩං කාරෙත්වා චූළූපට්ඨාකස්ස යොජෙත්වා අත්තනො පිට්ඨිං පොථාපෙත්වා රාජියො දස්සෙත්වා ද්වෙ රත්තකාසාව-පිලොතික සාටකෙ නිවාසෙත්වා මහාජනස්ස භත්තකාලෙ නික්ඛමිත්වා දීඝවාපියං පාතරාසං කත්වා වඩ්ඪමානකච්ඡායාය වඩ්ඪමානක තිත්ථං සම්පාපුණිත්වා තත්ථ ආරක්ඛං ගහෙත්වා සීත-සහස්ස පුරිසවන්ත-වඩ්ඪමානදම්ලෙන නාම අභිභුය්‍යමානො අනා-ගන්ත්වා සම්පුණ්ණගංගං ලංඝිත්වා පාරගංගෙ පති. තත්ථපි ආරක්ඛමනුස්සා තං ගණ්හිංසු. සො "අහං රඤ්ඤො සන්තිකං ආගතො; මං එළාලරාජානං දස්සෙථා"ති ආහ. තෙ තං නෙත්වා එළාලරාජානං දස්සෙසුං. රාජා "ත්වං කුතො ආග-තොසි? කෙන කම්මෙන ආගතොසි? කිස්මිං කම්මෙ නියුත්තොසී"ති ආහ. සො "අහං සාමි, මහාගාමතො ආග-තොම්හී"ති. කස්මා ආගතොසීති? අහං තුම්හාකං ලද්ධිකෙ සීතො තුම්හාකං අක්කොසන්තෙ නිවාරෙමි. "එළාලරාජා මහිද්ධිකො මහානුභාවො, සයං යොධො යොධපරිවාරො, අසුරපරිවාරො අසුරරාජා විය පච්චත්ථිකෙහි අභිභවිතුං අසක්කුණෙය්‍යො, ධම්මිකො ධම්මරාජා"ති ගුණං වණ්ණෙමි. තෙන මෙ කාකවණ්ණො මුණ්ඩං කත්වා පොථාපෙත්වා දුබ්බලං කත්වා කාසාවපිලොතිකං නිවාසෙත්වා "ගච්ඡ එළාලස්ස සන්තිකෙ සුඛං වසාහී"ති නීහරි. තස්මා ආගතොම්හීති.

රාජා සුට්ඨු ආගතොසි. තත්‍ථ කිංකම්මෙ නියුත්තොසීති,? අස්සගොපකො අහන්ති. සාමි අහං අස්සාරොහණෙ විධිං ජානාමි, කතිපාහෙනෙව කාකවණ්ණතිස්සං තුම්හාකං දස්සං කරොමීති ආහ. රාජා තස්ස කථං සුත්වා සද්දහිත්වා තුස්සිත්වා සක්කාරං කාරෙත්වා අස්සගොපකානං[4] ජෙට්ඨට්ඨානං අදාසි. සො අස්සං ගොපෙත්වා අස්සෙ රොචෙත්වා ජවසම්පන්නං රණමද්දවං නාම සින්ධවං අග්ගහෙසි.

සො එකදිවසෙ කුබ්බලගාමං[5] ගන්ත්වා මහන්තං ඝටං ගහෙත්වා තිස්සවාපිපානීයං ආහරිත්වා ඨපෙසි. මහාලෙණ-උප්පලඛෙත්තං ගන්ත්වා උප්පලකලාපං ආහරිත්වා ඨපෙසි. සො පුනදිවසෙ පාතො යෙව පානීයකුටඤ්ච මාලාකලාපඤ්ච ආදාය රණමද්දවං අභිරුහිත්වා[6] මහාවීථියං ආරක්ඛජනෙ මාරෙත්වා පාචීනද්වාරෙන බහි ගන්ත්වා අත්තනො නාමං සාවෙත්වා "සො අහං වෙළුසුමනො නාම; රණමද්දවඤ්ච ගහෙත්වා පානීයඝටඤ්ච පුප්ඵකලාපඤ්ච ගහෙත්වා අහං මහාගාමං අම්හාකං රඤ්ඤො සන්තිකං ගමිස්සාමි. තුම්හාකං එළාලරඤ්ඤො කථෙථා"ති වත්වා අස්සස්ස පණ්හියා සඤ්ඤං දත්වා චෙතියගිරි-අන්තරං ගන්ත්වා අස්සස්ස වෙගං මන්දං කත්වා සනිකං අගමාසි. තං පවත්තිං එළාලරඤ්ඤො කථෙසුං. රාජා අමච්චානං කථං සුත්වා සෙනාපතිනා සද්ධිං මන්තෙත්වා ද්වෙ දමිළනායකා යොධසතපරිවාරං ගහෙත්වා තං අනුබන්ධිත්වා ගණ්හිත්වා මාරෙත්වා සින්ධවං ගහෙත්වා ආගච්ඡථාති පෙසෙසි. සො දමිළසෙනාපති අත්තනා සදිසං දමිළනායකමෙකං ගහෙත්වා තෙ උභොපි වරභොජනං භුඤ්ජිත්වා සබ්බාලඞ්කාරපතිමණ්ඩිතා[7] සුවණ්ණකුණ්ඩලං පිළන්ධිත්වා උභොපි සින්ධවං ආජානීයං ආරුය්හ චෙතියගිරි-අන්තරං සම්පාපුණිංසු. වෙළුසුමනො එතෙ[8] ආගච්ඡන්තෙ දිස්වා අස්සස්ස බුරෙන භූමියං කොට්ටෙත්වා කොට්ටෙත්වා රජං උට්ඨාපෙත්වා කණ්ඩප්පමාණෙන[9] ගහෙත්වා අට්ඨාසි.

---

4 බී 1· ඨ. කෝ. අස්සගොපකොති 5. කුම්භකාරගාමංති භවිතබ්බං
6. බී 2 අභිරුය්හ 7. (සබ්බෙසු) පතිමණ්ඩිතං 8. (සබ්බෙසු:) එතෙසං
9. ඨ. ඛන්ධප්පමාණෙන බී 2. කණ්හප්පමාණෙන.

තෙසං වේගෙනාගච්ඡන්තානං සීසං ඡින්දිත්වා සීසෙ භූමියං අපතමානෙ යෙව ගහෙත්වා කෙසෙන බන්ධිත්වා ගහෙත්වා උභො අස්සෙ ච ආදාය මහාගංගෙ[10] වඩ්ඪමානකතිත්ථං සම්පාපුණි. තත්ථ ආරක්ඛමනුස්සා සහස්සමත්තා පරිවාරෙත්වා ගණ්හිංසු. සබ්බෙ මාරෙත්වා අස්සං පාදන්තරෙ අල්ලියාපෙත්වා ලඞ්ඝිත්වා පාරගඞ්ගෙ පති. පාරගඞ්ගෙ වඩ්ඪමානකදම්බො නාම සහස්සපුරිසෙ ගහෙත්වා පරික්ඛිපි. සො තෙ සබ්බෙ මාරෙත්වා අස්සෙ ආදාය දීඝවාපියං සම්පාපුණිත්වා තත්ථ වාපියං නහායිත්වා පානීයං පිවිත්වා අත්තනො ඉච්ඡාය ආගච්ඡන්තො සායණ්හකාලෙ මහාගාමං සම්පාපුණිත්වා වෙහාසනෙන[11] (?) බහි ඨත්වා ද්වාරං විවරිත්වා අන්තොනගරං සම්පාපුණිත්වා රාජගෙහද්වාරෙ අස්සපිට්ඨිතො ඔරුය්හ අස්සානං කත්තබ්බං කත්වා අස්සං සාලාය බන්ධිත්වා පානීය ඝටඤ්ච පූපඵලාපඤ්ච සකුණ්ඩලෙ ඡින්නසීසෙ ච ආදාය විවටද්වාරං සම්පාපුණන්තො කාකවණ්ණතිස්සමහා රාජා ච විහාරදෙවී ච වෙළුසුමනස්ස පවාසං ගතදිවසස්ස බහූ; කින්නුඛො තං ගහෙත්වා මාරෙසුන්ති චින්තෙන්තා නිසීදිංසු. තස්මිං ඛණෙ අමච්චො අත්තනො ආගතභාවං ජානාපෙසි.

රාජා අත්තමනො හුත්වා අමච්චස්ස මහන්තං සක්කාරං අකාසි. සො සබ්බං අත්තනො ආහතං රඤ්ඤො දස්සෙසි. තතො අමච්චො කඤ්චුවත්තවට්ටකං ආහරාපෙත්වා තිස්සවාපි පානියා පූරෙත්වා මහාතෙලමාලං පක්ඛිපිත්වා සුවණ්ණකුණ්ඩලිකෙ ද්වෙ දමිළසීසෙ ඨපෙත්වා තත්ථ දෙවිං ඨපෙත්වා නහාපෙත්වා මාලං පිළන්ධාපෙත්වා අසිධොතපානීයං පායෙසි. දෙවියා දොහළො පටිප්පස්සද්ධො අහොසි. "දෙවියා කස්මා එවරූපං දොහළං අහොසී"ති නෙමිත්තිකා පුට්ඨා එවං ව්‍යාකරිංසු: "සූරවීරබලසම්පන්නො පුත්තො තෙ භවිස්සති, සො ඉමස්මිං ලඞ්කාදීපෙ ද්වත්තිංස-දමිළරාජානො ගහෙත්වා එකරජ්ජං කත්වා සයං අනුරාධපුරෙ රජ්ජං ගහෙත්වා ඡත්තං

10. "මහාගංගාය"ති වත්තබ්බං. 11 රස. සායණ්හෙ.

උස්සාපෙස්සතී"ති ආහංසු. වෙළුසුමනො දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථවාසං කත්වා තතො චවිත්වා සග්ගෙ නිබ්බත්ති.

වෙළුසුමනවත්ථු

---

## II. කාකවණ්ණතිස්ස

අථෙකදිවසං රාජා විහාරං ගන්ත්වා භික්ඛුසංඝස්ස මංකුණෙන[1] දට්ඨට්ඨානෙ උට්ඨිතං ගණ්ඩං දිස්වා "කිමෙතං භන්තෙ"ති ආහ. මංකුණෙන දට්ඨට්ඨානං මහාරාජාති ආහ. රාජා සංවෙගප්පත්තො හුත්වා "මංකුණා භන්තෙ කථං න හොන්තී"ති? මට්ඨසාටකෙන න හොන්ති මහාරාජාති. "මට්ඨසාටකං කථං ලභිස්සාම භන්තෙ"ති? තස්මිං දිවසෙ පඤ්චම්බමාලකෙ[2] නිසීදිත්වා තිපිටකමහාතිස්සත්ථෙරො නාම රඤ්ඤො බුද්ධසීහනාදසුත්තන්තං කථෙසි. රාජා ථෙරස්ස අත්තනො උත්තරිසාටකං දාතුකාමො හුත්වා පි එකවත්ථභාවෙන අත්තනො අනනුරූපන්ති චින්තෙත්වා ඉතො උට්ඨාය[3] දස්සාමීති චින්තෙසි. රාජා ථෙරෙන සද්ධිං සල්ලපන්තො පඤ්චම්බමාලකෙ[4] අට්ඨාසි. තස්මිං සමයෙ එකො කාකො අම්බසාඛාය නිසීදිත්වා සද්දමකාසි, "කින්ති කාකවණ්ණතිස්ස මහාරාජ, තව සන්තිකෙ අනත්ථිකං[5] නාම නත්ථි. තුම්හාකං තුට්ඨට්ඨානෙ ධම්මකථිකස්ස උත්තරසාටකඤ්ච අඤ්ඤඤ්ච තුට්ඨට්ඨානෙ දාතබ්බං; අට්ඨපෙත්වා දාතුං වට්ටති මහාරාජා"ති වත්වා අහම්පන තුම්හාකං පඤ්චසාසනානි ආහරිස්සාමීති ආහ. කතමානි පඤ්චසාසනානි? විහාරදෙවි රාජිනී පුඤ්ඤවන්තං පුත්තං විජායීති ඉදං පඨමසාසනං. ආකාසගාමිනී හත්ථිනී ආකාසෙනාගන්ත්වා සෙතං ලක්ඛණසම්පන්නං හත්ථිපොතකං තීරසරසමීපෙ[6] පසූති හුත්වා තං

1. බි 1. බි2. මංකුලෙන 2. බි 2. පඤ්චප්පමාලකෙ. බී 2, පඤ්චසබ්බමාලකෙ. 3 බී 1. උපට්ඨාය 4 (සබ්බෙසු:) පඤ්චමාලකෙ 5 බි 1. බි 2. අනත්තිකං 6. මහාවංසෙ "තිජ්ඣර," (= තොටවිල.) සද්ධම්මාලංකාරෙ "තිත්තිවිල."

ඨපෙත්වා අගමාසීති ඉදං දුතියං සාසනං. වලාහකස්සකුලතො ආගන්ත්වා වළවා වළවාපොතකං ගොණගාමකෙ විජායිත්වා ඨපෙත්වා අගමාසීති ඉදං තතියං සාසනං. පච්ඡා සා තිස්ස ගොණිකා[7] නාම අහොසි. පුන ගොළසමුද්දකුච්ඡියං මට්ඨ-සාටකපුණ්ණා සට්ඨිනාවා සම්පත්තා. අන්තරවඩ්ඪමානසමීපෙ[8] රාජමාණෙන ද්වාදසකරීසමත්තෙ ඨානෙ තාලක්ඛන්ධප්ප-මාණං සුවණ්ණඛන්ධං උට්ඨාසීති ඉදං චතුත්ථං සාසනං. ගිරිපාදකොත්තරකටක—මහාවිහාරෙ[9] මහානාගත්ථෙරො නාම සත්තතාලප්පමාණෙ ආකාසෙ නිසීදිත්වා පරිනිබ්බු-තොති ඉදං පඤ්චමසාසනං. තුම්හාකං ඉමෙ පඤ්චසාසනෙ ආහරින්ති. ධම්මකථිකස්ස තුට්ඨට්ඨානෙ සාටකං දෙහි සාමීති. රාජා කාකස්ස සද්දං සුත්වා හසි. ථෙරො රඤ්ඤො හසන්තං දිස්වා "කිං කාරණා හසි මහාරාජා"ති? ආහ. "භන්තෙ, එසො කාකො එවරූපං සාසනං ආහරති; තස්මා හසිං"ති ආහ රඤ්ඤො කථං සුත්වා ථෙරො ච හසි. රාජා ථෙරං හසන්තං දිස්වා "භන්තෙ තුම්හෙ කස්මා හසථා"ති ආහ. "මහාරාජ, තව අමරුප්පලකාලෙ[10] දින්නදුකූලසුත්තෙන ඵලං දිස්වා හසාමී"ති ආහ. රාජා "අමරුප්පලකාලෙ[10] දින්නසුත්තමෙව මය්හං කථෙථ භන්තෙ"ති ආහ. තෙන හි මහාරාජ සුණොහි: මහාරාජ ත්වං අනන්තරඅත්තභාවෙ කුමාරකාලෙ අඤ්ඤෙහි දාරකෙහි සද්ධිං කීළමානො කීළා-සඤ්ඤාය අත්තනො නිවත්ථසාටකෙන එකං දුකූලසුත්තං ගහෙත්වා හිලවල්ලදණ්ඩකෙ[11] බන්ධිත්වා වාලුකථූපං කත්වා තත්ථ ධජං කත්වා පූජෙසි. තස්ස නිස්සන්දෙන මට්ඨසාටක-සම්පුණ්ණා සට්ඨිනාවා සම්පත්තාති. තදා රාජා තං සුත්වා

7. මහාවංසෙ: දීඝට්ඨිණිකා. 8. බී 1. බී 2. දන්තාපවඩ්ඪමානක; රස අනාකරවඩ්ඪසමීපෙ සද්ධම්මාලංකාරෙ "උතුරු වඩමන්පව්ව" 9. රස. කොත්තරකාටකපබ්බතමහාවිහාරෙ. සද්ධම්මාලංකාරෙ. "කොතුරු-සබු වෙහෙර" (10 සබ්බෙසු:) අමනුප්පලකාලෙ. 11. ර. හිලවණ්ණ-දණ්ඩකෙ. සද්ධම්මාලංකාරෙ "ඉතාවලුදණ්ඩෙක"

ථෙරස්ස සාටකං දත්වා කොන්තරකටක-විහාරං ගන්ත්වා ථෙරස්ස සරීරනික්ඛෙපං කත්වා ධාතුං ගහෙත්වා චෙතියං කත්වා ආගන්ත්වා සුවණ්ණං ආහරාපෙත්වා කොට්ඨං පූරෙත්වා මට්ඨසාටකෙ ආහරාපෙත්වා සබ්බං භික්ඛුසංඝස්ස අදාසි. සො තතො පට්ඨාය බහුං යාවජීවං පුඤ්ඤං කම්මං කත්වා පච්ඡා චවිත්වා දෙවලොකො නිබ්බත්තී ති.

## කාකවණ්ණතිස්සමහාරාජස්ස වත්ථු නවමං.

දුට්ඨගාමණීඅභයමහාරඤ්ඤො වත්ථු මහාවංසෙ විත්ථාරිතමෙව, තං තතො ගහෙතබ්බං.

## වග්ගො චතුත්ථො.

# 41. අම්බාමච්චස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

වෙණීවහාලස්ස පුත්තො අම්බාමච්චො නාම චූළනාගඛණ්ඩවාරෙ[1] විහරති. තස්මිං සමයෙ ජනපදං දුබ්භික්ඛං අහොසි. මනුස්සා භික්ඛාය චරිත්වා ආහාරං දුක්ඛෙන ලභන්ති. සො පන අමච්චො හලිද්දිසිංගිවෙරාදි-අනෙකභණ්ඩං ගාහාපෙත්වා තත්ථ තත්ථ ගන්ත්වා වීහිං ආහරථාති වත්වා ජනපදං පෙසෙසි. රත්තිවිහාරෙ චූලඛණ්ඩපධානෙ[2] වසන්තො චූලපිණ්ඩ-පාතික—නාගත්ථෙරො නාම එතස්ස වසනගාමං පිණ්ඩාය පවිසිත්වා යථාධොතෙන පත්තෙන නික්ඛමි. සො ථෙරං ඔලොකෙත්වා මච්ඡමංසං සජ්ජෙත්වා අත්තනො පුරතො වඩ්ඪිතභත්තං ථෙරස්ස අදාසි. ථෙරො තස්ස චිත්තාචාරං ඔලොකෙත්වා විපස්සනං භාවෙත්වා අරහත්තං පත්වා පරිභුඤ්ජි.

අමච්චස්ස පන භරියා උක්ඛලිං විවරිත්වා ආහාරං ඔලොකෙන්තී උක්ඛලිං පූරෙත්වා ඨපිතං සාලිභත්තං අද්දස. තතො පච්ඡා භත්තකටච්ඡුං ගහෙත්වා පාතියං පක්ඛිපි. පාතිං පූරෙත්වා අට්ඨාසි. කටච්ඡුනා භත්තං ගහිතගහිතට්ඨානං න පඤ්ඤායති. අම්හාකං පුඤ්ඤෙන එවං භවිතබ්බන්ති චින්තෙත්වා සකලගාමවාසීනං ආනෙත්වා භොජෙසුං. තස්මිං නිබ්බත්ත—දෙවතා තස්ස සන්තුට්ඨා තස්ස ගෙහෙ මනුස්සා වීය බහුසකටං පූරෙත්වා සාලිං ආහරිංසු. තතො සාලි-පච්ඡිං ගහෙත්වා කොට්ඨෙ පක්ඛිපිංසු. සබ්බකොට්ඨං සාලි-පුණ්ණමෙව අහොසි. තස්ස ගෙහෙ වසනදෙවතා[3] තුස්සිත්වා වංසෙන සාලිධාරං අබ්බොච්ඡින්නං පවත්තෙසි. තතො පට්ඨාය දානං දත්වා බහුපුඤ්ඤං කත්වා සග්ගෙ නිබ්බත්තොති.

අම්බඅමච්චස්ස වත්ථු.

---

1. රස. රාජරට්ඨෙ චූළනාගනාම ඛණ්ඩචාරෙ වෙණීගාමෙ නාමෙකො ඉස්සරො අහොසි සද්ධම්මා. "රජරට සුලුන්නරු නම් කඳවුරෙහි මහත්වූ ඉසුරුමත්වූ වෙණීශාල නම් අමාත්‍යයෙක් විය" 2. රස නළඛණ්ඩපධානෙ සද්ධම්මා. "බටකඩු නම් භාවනාගෙයි 3. "තස්ස සන්තුට්ඨා"ති ඉතො පට්ඨාය "තස්ස ගෙහෙ වසනදෙවතා"ති පාඨො කෝ-ළපොත්ථකෙ රසවාහිනියම්පි විජ්ජන්ති

වග්ගෙන අධිකං කත්වා ලිඛිතං හොති, දුට්ඨගාමණි-අභයමහාරාජස්ස දසමහායොධා, කතමෙ දස?

නන්දිමිත්තො සුරනිම්මලො, මහාසොණො ගොඨයිම්බරො
ථෙරපුත්තාභයො භරතො වෙළුසුමනො තථෙව ච.
ඛඤ්ජදෙවො ඵුස්සදෙවො, ලභියො වසභොපි ච
එතෙ දසමහායොධා අහෙසුං තෙ මහබ්බලාති.

තෙසං වත්ථු විත්ථාරතො එවං වෙදිතබ්බං. තත්ථ නන්දි-මිත්තස්ස[1] වත්ථු හෙට්ඨා විත්ථාරිතමෙව.

---

## 42. සුරනිම්මලස්ස වත්ථු[1] එවං වෙදිතබ්බං.

කස්සපමුනිනො කාලෙ, නෙසාදෙ එකභික්ඛුනො
රසෙන භත්තං දත්වාන, ස සුරනිම්මලො අහූති.

තං යථානුසූයතෙ:

කස්සපසම්මාසම්බුද්ධස්ස කාලෙ පච්චන්තගාමවාසී එකො මනුස්සො ලොභෙන මෙණ්ඩසූකරාදයො ගොපෙත්වා නිරන්තරං පාණාතිපාතකම්මං කත්වා ජීවති. සො අථෙකදිවසං සංඝනවකං එකං භික්ඛුං දිස්වා හට්ඨතො පත්තං ගහෙත්වා ආසනං පඤ්ඤපෙත්වා නිසීදාපෙත්වා අනන්තරභත්තෙන මුදුකමංසං දත්වා දිබ්බරසසදිසං[2] පිණ්ඩපාතං දත්වා පුනදිවසං නිමන්තෙත්වා එතෙනෙව නයෙන තීණි දිවසානි දානං දත්වා චිත්තං පසාදෙත්වා වන්දිත්වා සීලං ගණ්හි. තතො කාලකිරියං කත්වා දෙවලොකෙ නිබ්බත්තිත්වා තත්ථ මහන්තං යසසම්පත්තිං අනුභවිත්වා තතො චවිත්වා ඉධ ලංකාදීපෙ කොට්ඨිවාලජනපදෙ[3] කණ්ඩකපිට්ඨිගාමෙ[4] අඩ්ඪො මහද්ධනො මහාභොගො සංඛකුටිම්බිකො නාම ඉස්සරො අහොසි. තස්ස සත්තපුත්තා අහෙසුං. තෙසං සත්තන්නං කණිට්ඨො නිම්මලො නාම

1. සෝ. නන්දිමිත්ත (සබ්බත්ථ) 2 සෝ. දිබ්බරසපිණ්ඩපාත රස දිවා මංසරසපිණ්ඩපාතං, 3 රස. කොඨියවාලජනපදෙ. සද්ධම්මා: "සොටසර කීලවාපි ජනපදයෙහි" 4 රස ඛණ්ඩකවිඨිගාමෙ. සද්ධම්මා: "කඩවිටි නම් ගම"

අහොසි. තදා කාකවණ්ණතිස්සමහාරාජා පන දමිළෙ නිවාරෙතුං මහාගඞ්ග සබ්බතිත්ථෙසු සදා රක්ඛං සංවිධෙසි. රක්ඛෙසු පන අඤ්ඤභරියාය පුත්තො දීඝාභයො නාම අහොසි. ගංගාය පන ගච්ඡන්ත තිත්ථෙ[5] ආරක්ඛං කාරෙසි. සො පන ආරක්ඛකරණත්ථාය සමන්තතො යොජන-ද්වියොජනට්ඨානෙ මහාකුලානං එකෙකකුලතො එකෙකං පුත්තං ආණාපෙසි. තස්සපි සංඝකුටුම්බිකස්ස පුත්තස්සත්ථාය දූතං පාහෙසි. තං සුත්වා කුටුම්බිකො සත්තපුත්තෙන ආමන්තෙත්වා සත්තපුත්තෙසු සබ්බකණිට්ඨො සූරනිම්මලො නාම දසනාගබලො. තස්ස අකම්මසීලත්තා සෙසා ඡ භාතරො උජ්ඣායන්තා තස්ස ගමනං අනුජානිංසු. සෙසා ඡ භාතරො "තුම්හාකං පුත්තො ද්වෙ මට්ඨසාටකෙ නිවාසෙත්වා තයොවාරෙ පණීතභොජනං භුඤ්ජිත්වා අකම්මසීලො හුත්වා විහරති, තං පෙසෙථා"ති ආහංසු

තං සුත්වා කුටුම්බිකො තං යෙව පෙසෙසි. සො තෙසං ඡන්නං භාතූනං කුජ්ඣිත්වා පාතො යෙව ඡ යොජනමග්ගං ගන්ත්වා සුරියුග්ගමනවෙලායමෙව රාජපුත්තං පස්සි. රාජපුත්තො මහාගාමං ගන්ත්වා මම පිතු සන්තිකෙ වසාහීති මහාගාමං පෙසෙසි තදා රාජා කම්මාරානං රාසිං කාරෙත්වා කම්මාරසාලං කාරෙත්වා නානාවිධෙ ආයුධභණ්ඩෙ කාරෙසි. නිම්මලො පන ගන්ත්වා රක්ඛෙසු කම්මාරසාලායමෙව වන්දිත්වා අට්ඨාසි. රාජා තං දිස්වා "භො ත්වං කුතො ආගතොසි? කොසි ත්වං? කිං කම්මං කාතුං ජානාසී"ති? පුච්ඡි. "කොට්ඨිවාලජනපදෙ කණ්ඩකපිට්ඨිතො[4] ආගතොම්හි"ති ආහ. කිමත්ථාය ආගතොසීති? සාමි අහං යොධො; තුම්හාකං උපට්ඨානත්ථාය ආගතොම්හීති ආහ. කම්මරා එතස්ස සරීරං ඔලොකෙත්වා "අහො ඊදිසො නාම මහායොධො හොතී"ති පරිහාසකෙළිං අකංසු. රාජා තෙසං පටිබාහෙත්වා නිම්මලං ඔලොකෙත්වා තං පක්කොසාපෙත්වා දීඝසො චතුහත්ථ සොළසංගුලං පුථුලතො එකරතන—අට්ඨඞ්ගුලං නිට්ඨිතං සොළස-

5. රස. කසවජ්ජතිත්ථෙ. සද්ධම්මා: "කසාතොට."

අසිපත්තං ධොවිත්වා තිඛිණං කත්වා දෙහීති වත්වා රාජා කම්මාරසාලතො ඉමිනා කොට්ටිතා අසිආදීනි පස්සන්තො පරකොට්ටිං අගමාසි. සො පන රඤ්ඤො පුන අනාගතෙ යෙව සොළස-අසිපත්තෙන පාසාණෙ ඝංසිත්වා මට්ඨං කත්වා ධාරං ඨපෙත්වා සුපරිනිට්ඨිතෙ ඨපෙත්වා එවං චින්තෙසි: "ඉමෙ කම්මාරක-මනුස්සා මම පරිහාසං අකංසූ"ති, තෙ කුජ්ඣිත්වා එකං අසිපත්තං ගහෙත්වා වීහි අඞ්ගුලීහි ගණ්හිත්වා කොටියං නිසින්නකම්මාරස්ස විස්සජ්ජෙසි, පඤ්චසතානං කම්මාරානං සරීරං විනිවිජ්ඣිත්වා පථවිං පාවිසි. රාජා ආගන්ත්වා දිස්වා කස්සෙතං කම්මන්ති පුච්ඡිත්වා තෙන කතකම්මං ඤත්වා සන්තුට්ඨො අහොසි. තෙ පන පඤ්චසතකම්මාරා තස්මිං යෙව ඨානෙ විනට්ඨා අහෙසුං තෙ පන පඤ්චසත-කම්මාරා අත්තනො අත්තනො ගෙහං ගතකාලෙ මරිංසු. රාජා තස්ස ඉමිනා කම්මෙන තුට්ඨො සහස්සභණ්ඩිකං දාපෙත්වා මහාවීථියා ගෙහං කාරෙත්වා දිවසෙ දිවසෙ සහස්සං පරිබ්බයං දාපෙත්වා අත්තනො උපට්ඨානං කරොහීති ආහ.

**සූරනිම්මලවත්ථු දුතියං.**

---

## 43. මහාසොණස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

කස්සප-බුද්ධකාලම්හි, මනුස්සො සංඝමුත්තමෙ
ඛීරභත්තං දදිත්වාන, මහාසොණාභයො[1] අහූති.

තං කථන්ති චෙ:-

අතීතෙ කස්සපබුද්ධකාලෙ අඤ්ඤතරමනුස්සො සංඝං උද්දිස්ස ඛීරසලාකභත්තං දත්වා ආයුපරියොසානෙ දෙව-මනුස්සෙසු සම්පත්තිං අනුභවමානො පච්ඡා ඉමස්මිං ලංකාදීපෙ රොහණජනපදෙ කුටුම්බරිකණ්ණිකාය[2] කුන්දවාලික

1. බී 1. මහාසෙන - 2. රස. කදලුම්බරිකණ්ණිකායං. කම්බොජ මහාවංසෙ. කුළුම්බරිකණ්ණිකායං. සඩ. කාලඹුරුකණ්ණ.

තිස්සො[3] නාම කුටුම්බිකො අහොසි. තස්ස අට්ඨ පුත්තා අහෙසුං; තෙසං සබ්බකනිට්ඨො සොණො නාම අහොසි. සො මහබ්බලො සත්තවස්සිකොව තරුණතාලගච්ඡෙ[4] ලුඤ්චන්තො දසවස්සකාලෙ මහාතාලරුක්ඛෙ ලුඤ්චි. තතො උද්ධං තාල-නාළිකෙරාදීනි බාහුනා පහරිත්වා පාතෙන්තො විචරි. සො වුඩ්ඪිප්පත්තො දසනාගබලො අහොසි. රාජා තං සුත්වා පිතුසන්තිකං ආණෙත්වා ගාමණිස්ස දාපෙසි. සො ගාමණිං උපට්ඨහන්තො ලංකාදීපෙ සාසනං පතිට්ඨාපෙසීති.

**මහාසොණවත්ථු තතියං.**

---

## 44. ගොඨඉම්බරවත්ථුම්හි අත්ථුප්පත්ති.

කස්සපමුනිනො කාලෙ මනුස්සො සංඝමුත්තමෙ
ඛීරභත්තං දදිත්වාන ගොඨඉම්බරකො අහූති.

තං යථානුසූයතෙ:–

කස්සපබුද්ධකාලෙ එකො මනුස්සො සඞ්ඝස්ස ඛීරසලාකභත්තං දත්වා එකං බුද්ධන්තරං දෙවමනුස්සෙසු සම්පත්තිං අනුභවිත්වා ඉමස්මිං ලංකාදීපෙ රොහණගිරිමණ්ඩලෙ තිට්ඨුල-විට්ඨිගාමෙ[1] මහානාගො නාම කුටුම්බිකො අහොසි; තස්ස සත්තපුත්තෙසු කනිට්ඨො හුත්වා නිබ්බත්ති. නාමෙන අභයො නාම අහොසි. පුනෙකදිවසං ජ භාතරො මාසඛෙත්ත[2] මහාවනං කොට්ටෙන්තා ඉම්බරරුක්ඛසඤ්ඡන්නං විසමට්ඨානං තස්ස භාගන්ති ඨපෙත්වා ආගන්ත්වා තස්ස කථෙසුං: තව භාගං ඨපිතන්ති. සො තස්මිංයෙව ඛණෙ ගන්ත්වා සබ්බං ඉම්බරරුක්ඛං ලුඤ්චිත්වා හත්ථතලසදිසං කත්වා ආගන්ත්වා ජභාතූනං ආරොචෙසි. තෙ තං අබ්භුතකම්මං දිස්වා ගොඨඉම්බරඅභයො නාමාති සඤ්ජානිංසු

---

3 කේ. කුඤ්ජවාසිකතිස්සො. රස. හුඤ්ජරිවාපිගාමෙ. සඬ. "රුහුණුරට මල්වතු මඩුල්ලෙහි කලඹුරුකණ උන්දුරු කරවිට් නම් ගම." (කරගොඩ උයන්ගොඩද?) 4. (සබ්බෙසු) තරුණකාලෙ ගච්ඡෙ.

1 බී 1 ර. කේ. තිට්ඨුලවිට්ඨිගාමෙ. සඬ: තිවුල්විටිගම. 2 ඛී 1 මාසඛෙත්තං.

උත්තරවිහාරවාසිනො පන එවං වදන්ති: සො පන අභයො අත්තනො වයප්පත්තකාලෙ බහූහි නෙසාදෙහි සද්ධිං වනං ගන්ත්වා වාකුරජාලං අපවිසිත්වා පලායන්තං මිගං අනුබන්ධිත්වා පච්ඡාපාදෙ ගහෙත්වා සීසමත්ථකෙ පරිබ්භමිත්වා අනුබන්ධො ගොඨඉම්බරරුක්ඛෙ පහරි. මිගො ද්විධා ඡින්දිත්වා අගමාසි. තතො පට්ඨාය ගොඨඉම්බරඅභයො නාම අහොසීති වදන්ති. තතො පට්ඨාය දුට්ඨගාමණී මහාරාජා ද්වත්තිංස-දමිළරාජූනං ගහෙත්වා එකරජ්ජං කරිස්සාමීති බලවන්තා යොධපුරිසා මහාගාමෙ සන්නිපතන්තූති භෙරිං චරාපෙසි. තං සුත්වා සො අභයමහාඅමච්චො මහාගාමං ගන්ත්වා රාජානං පස්සිත්වා ආගච්ඡාමීති වත්වා මාතාපිතරො වන්දිත්වා මහාපරි-වාරෙන ගච්ඡන්තො අන්තරාමග්ගෙ කප්පකන්දරනදියාසන්නෙ කන්දරවිහාරං[3] පාවිසි. තස්මිං විහාරෙ නාළිකෙරං බහුකං. මනුස්සා නාළිකෙරඵලං ඛාදිස්සාමාති[4] ගොඨඉම්බරස්ස ආරොචෙසුං. සො මනුස්සානං කථං සුත්වා සාධූති වත්වා වනං පවිසිත්වා ජණ්ණූහි පහරිත්වා බාහුනා ඝට්ටෙත්වා හත්ථෙන ඛන්ධෙ ගහෙත්වා සඤ්චාලෙත්වා බහුං[5] නාළිකෙරඵලං පාතෙත්වා පණ්හියා පොථෙත්වා තච්ඡිත්වා අදාසි. මනුස්සා යාවදත්ථං ඛාදිත්වා අතිරෙකං තහිං තහිං ඡඩ්ඩෙත්වා පරි-වාරෙත්වා අගමංසු. සො මහාගාමං ගන්ත්වා දුට්ඨගාමණී අභයරාජානං පස්සි. රාජා "කුතො ආගතොසි? කින්නා-මොසී"ති? ආහ. "ගිරිමණ්ඩලෙ නිට්ඨුලවිට්ඨිනාමගාමතො[8] ආගතොම්හි; අහං ගොඨඉම්බරඅභයො නාම සාමී"ති ආහ. රාජා තස්ස සක්කාරසම්මානං කත්වා දිවසෙ දිවසෙ සහස්සං දත්වා නිච්චං උපට්ඨානං කරොහීති ආහ. පච්ඡා දුට්ඨගාමණී අභයමහාරඤ්ඤො ද්වත්තිංසදමිළරාජූනං ගහණකාලෙ මහා-ගොඨපිට්ඨතෙ[7] මහා-ඡත්තදමිළරාජා දුට්ඨගාමණී-අභය මහාරඤ්ඤො පරාජිත්වා පලායන්තො මහාඡත්තං නාම සරං

---

3. සී 2. කප්පකන්දරවිහාර.. සදධ: "සප්පඳුරු ඔය සම්පයෙහි සප්පඳුරු නම් විහාරයට" (සිංහල පොත අශුඩ යැයි සිතමි) 4. රූ: භවිස්සාමාති. 5. (සබ්බෙසු) බාහුනා 6. (සබ්බෙසු:) නිට්ඨුල විට්ඨි— 7. රස. මහාතිත්ථපට්ටනෙ 8. සී 1. සී 2 පරිච්ඡින්දිත්වා

පාවිසි. සො පන ගොඨයිම්බරො සරං පවිට්ඨ-චොරරඤ්ඤො අනුබන්ධන්තො ගන්ත්වා සහස්සමත්තෙ යොධදමිළෙ මාරෙත්වා මහාජත්තදමිළරඤ්ඤො සීසං ගහෙත්වා දුට්ඨගාමණී-මහාරඤ්ඤො අදාසි.

පච්ඡා රඤ්ඤො අනුරාධපුරෙ ඡත්තං උස්සාපිතකාලෙ ගොඨයිම්බරස්ස මහන්තං යසසම්පත්තිං දත්වා මහාවීපියා ගෙහං කාරෙසි. සො පන අමච්චො අනුරාධපුරෙ වසන්තො එකයොජනමත්ථකෙ ඨිතං දූරතිස්සවාපිං ගන්ත්වා සරීර-පරිකම්මං කත්වා නිච්චං ආගච්ඡති කිර. අථෙකදිවසං තිස්ස-වාපිමරියාදෙ ඉස්සරසමණවිහාරං අගමාසි. තස්මිං විහාරචාරෙ මහන්තො එකො වෙළුගුම්බො විහාරමග්ගං ආවරිත්වා අට්ඨාසි. තස්මිං විහාරෙ එකො මහාථෙරො බහුං කුද්දාල-පරසුඤ්ච[9] ගාහාපෙත්වා තං වෙළුගුම්බං හරාපෙතුං අගමාසි. අමච්චො ථෙරං දිස්වා "කිං කරොථ භන්තෙ"ති ආහ. ථෙරො ඉමං වෙළුගුම්බං හරාපෙමාති ආහ. අමච්චො ථෙරස්ස කථං සුත්වා මහාචම්මයොත්තං ආහරාපෙත්වා තස්මිං වෙළුගුම්බපාදෙ බන්ධිත්වා වාමහත්ථෙන සමූලං උද්ධරිත්වා මග්ගත ඔක්කමිත්වා බහි පාතෙත්වා සයං නගරං අගමාසි. තං පන වෙළුං පරිගය්හමානං[10] සට්ඨිසකටමත්තං අහොසි.

අපරකාලෙ අමච්චො අත්තනො අත්ථාය නගරෙ පාසාදං කාරාපෙත්වා තත්ථ වසන්තො අථෙකදිවසං සකල-ආකාස-ඞ්ගණෙ චෙලවිතානං පසාරෙත්වා චෙලවිතානඅන්තරෙ නඞ්ගලසීසප්පමාණං සුගන්ධපුප්ඵෙන ගන්ධිතසුරභිකුසුමදාමං ඔලම්බෙත්වා භූමිං චතුජාතිගන්ධෙන[11] පරිභණ්ඩං කත්වා සුමනචම්පකාදිපුප්ඵං උපරි සන්ථරිත්වා නීලුප්පල—රත්තුප්පල—පුණ්ණඝටෙ ඨානෙ ඨපාපෙත්වා අමච්චො වත්ථාභරණඅලංකාරෙහි දෙවො විය සජ්ජිත්වා රතනපල්ලංකෙ නිසීදිත්වා අත්තනො මාතුගාමං පාදඞ්ගුලික—පාදජාල—පාදකටක—කප්පරවසන—ඌරුජාල—ගුය්හාලංකාර — හත්ථඞ්ගුලි— කටකම්බරවසනාදි-

9. බි 1. ඕ 2. කුඨාලපරසුඤ්ච. 10. රස. පරිමිණියමානං 11. බි 1. ජාතිගන්ධෙන

නානාලංකාරෙහි දෙවකඤ්ඤා විය සජ්ජිත්වා සොවණ්ණමය-සුරාවිත්තං ගාහාපෙත්වා දක්ඛිණහත්ථපස්සෙ ඨපාපෙසි. අවසෙසමාතුගාමානං තථෙව නානාවණ්ණආවුධභණ්ඩං ගාහාපෙත්වා විසුං ගීතෙ ඡෙකා ගායන්තු, තථෙව ඡෙකා නච්චන්තු, වාදිතෙ ඡෙකා වාදෙන්තූති වත්වා දිබ්බනාටකසමාගමං විය සකලපාසාදං කත්වා අමච්චො මහන්තං ආපානමණ්ඩලං බන්ධිත්වා සුරං පාතුං ආරභි. තස්මිං කාලෙ අරිට්ඨපබ්බතවාසී[12] ජයසෙනො නාම යක්ඛො යක්ඛෙහි පරිවාරෙත්වා තම්බපණ්ණිසුසානං ගච්ඡන්තො ගන්ධ-මාල-ධූමගන්ධඤ්ච ඝායිත්වා දිබ්බසදිසං සද්දං සුණන්තො දිබ්බවිමානසදිසං එතස්ස විමානසම්පත්තිං ඔලොකෙත්වා ආකාසතො ඔතරිත්වා ගෙහං පවිසිත්වා එතස්ස සුරාවිත්තං ගහෙත්වා ඨිතමාතුගාමස්ස සිනෙහං කත්වා තස්සා සරීරෙ ආවිසි. සා පන මාතුගාමො යක්ඛෙන ආවිසමත්තෙන[13] සුරාවිත්තං ඡඩ්ඩෙත්වා විසඤ්ඤී හුත්වා භූමියා අපරාපරං පරිවත්තන්තී මුඛෙන සෙතඵෙණං ඡඩ්ඩෙන්තී අක්ඛීනි පරිවත්තෙත්වා උත්තානා සයි. අමච්චො මාතුගාමං දුබ්බලං හුත්වා නිපන්නං දිස්වා ඔලොකෙත්වා දොමනස්සප්පත්තො හුත්වා පල්ලංකතො උට්ඨාය ඨත්වා "සචෙ ඉමිස්සා ගහිතො යක්ඛො අක්ඛිමහි පඤ්ඤායති, තං ඛණ්ඩාඛණ්ඩං කත්වා උදකපිට්ඨෙ අම්බිලපත්තං විය චුණ්ණං කරෙය්‍යං; අක්ඛිමහි අපඤ්ඤායනභාවෙන ත්වං මය්හං බලවන්තං විය න[14] ඛායති. සචෙ ත්වං පුරිසො, පඤ්ඤායමානො තිට්ඨසී"ති ආහ. අමනුස්සො අමච්චස්ස කථං සුත්වා යක්ඛමානං උප්පාදෙත්වා මාතුගාමසරීරතො අපගන්ත්වා අදිස්සමානො[15] හුත්වා ඨත්වා "ත්වං මයා සහ පොදං (?) කීළිතුං[16] සමත්ථො"ති ආහ. අමච්චො සමත්ථොම්හීති ආහ.

---

12. සී 1. සී 2. අරිට්ඨාමච්චස්ස 13. "ආවිට්ඨමත්තෙනා"ති භවිතබ්බං. 14 සෙ. නකාරො න විජ්ජති. 15. සෙ. අපරියමානො. බි 1. බි 2. අරියමානො. රස. දිස්සමානසරීරෙන. 16. පොදං කීළිතුං = "පොර බදන්ට." ඉදනිපි වංගභාසාය ඊදිසො වොහාරො අත්ථි "දේව ප්‍රස ද් ගුහා" මනුස්සයො වදති.

සචෙ යක්ඛො සමත්ථොසි, අඤ්ඤෙන සත්තදිවසෙන තම්බපණ්ණිසුසානං ගච්ඡාහීති ආහ. තත්ථෙව යක්ඛානං කම්මං තව දස්සෙස්සාමීති ආහ. අමච්චො තව යක්ඛභාවො වා අයක්ඛභාවො වා මං කිං කරිස්සති? අඤ්ඤෙන සත්තදිවසෙන තෙ කත්තබ්බං කරිස්සාමි. ඉදානි ත්වං ගච්ඡාහීති ආහ. අමච්චො සත්තාහෙ අතික්කන්තෙ රත්තියා සායණ්හෙන[17] උට්ඨාය නිසීදිත්වා ජයසෙනයක්ඛෙන වුත්තවචනං සරිත්වා තස්මිං යෙව ඛණෙ නික්ඛමිත්වා තම්බපණ්ණිසුසානං ගතො. තස්ස ආගතමග්ගෙ ච සුසානෙ ච සමන්තතො වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා "කිං කම්මෙන ආගතොසි සාමී"ති ආහංසු ජයසෙනයක්ඛෙන සද්ධිං පොදං කීළිතුං ආගතොම්හීති ආහ. දෙවතා අමච්චස්ස කථං සුත්වා "කිං කථෙසි සාමි, එතෙන යක්ඛෙන සද්ධිං යුජ්ඣිත්වා ජයං ගහෙතුං සමත්ථො නාම නත්ථි. යක්ඛො නිච්චමෙව ජයං ගණ්හාති ඉති ජයසෙනො නාම (යක්ඛො) අහොසි. එතෙන යක්ඛෙන සද්ධිං පොදං කීළිතුං ආගතකාලතො පට්ඨාය තුම්හාකං මනුස්සලොකං අප්පියං ති මඤ්ඤෙ; ජීවිතස්ස සම්පත්තිං අප්පියන්ති වත්වා වාරෙසුං. අමච්චො එතෙසං කථං සුත්වා "තුම්හෙ මම වචනං සුණාථ; එසො යක්ඛො අත්තනො බලවතරං අදිට්ඨකාලෙ[18] බලවා විය මඤ්ඤති; බලවතරං දිට්ඨකාලෙ පන අඤ්ඤො බලවා අත්ථීති ජානිස්සති, අහම්පන එතස්ස කත්තබ්බං ජානාමී"ති ආහ. ජයසෙන යක්ඛොපි අජ්ජ මනුස්සෙන සද්ධිං පොදං කීළිස්සාමීති අවචං;. සො ඉදානි අනාගතො මඤ්ඤෙති අවච. අමච්චො එතස්ස කථං සුත්වා "අහං ආගතොම්හි යක්ඛා"ති ආහ.

යක්ඛො යක්ඛකච්ඡං බන්ධිත්වා යක්ඛසද්දං ගජ්ජිත්වා[19] මුඛෙන මහන්තං ජාලබන්ධං විස්සජ්ජෙන්තො වෙගසා අප්පධෙන්තො ආගන්ත්වා අමච්චස්ස පුරතො අට්ඨාසි. අමච්චො "තව සදිසස්ස යක්ඛස්ස මම දක්ඛිණහත්ථෙන නෙව

17. රස. ආයොගවත්ථෙන පාණතාව තත් අගමාසි. සධම්මා. "තමා ඇඳි කඩින් පටක් එකාංශකොට පෙරවා ගෙන". 18. බි 1 බී 2. අධිට්ඨකාලෙ.
19. බී 2. ගච්ජිත්වා.

පහරාමි, න වාමහත්ථෙන, න දක්ඛිණපාදෙන, වාමපාදෙනෙව තං පහරිස්සාමී"ති වත්වා දක්ඛිණපාදෙන ඨත්වා වාම පාදෙන යක්ඛස්ස ඛන්ධට්ඨිකං පිට්ඨිපාදෙන පහරිත්වා යක්ඛස්ස සීසං ඡින්දිත්වා යාව උන්දම්නදලං[20] තාව සද්දායන්තො අගමාසි: "සාධු සාධු, ගොඨඉම්බර, කස්සපබුද්ධසාසනෙ සුදින්නස්ස[21] තුය්හං බීරසලාකභත්තස්ස ඵල"න්ති. තත්ථ සමාගතා දෙව පරිසා යක්ඛපරිසා ච කස්සපබුද්ධකාලෙ බීරසලාකභත්තඵලන්ති වත්වා සාධුකාරං පවත්තෙසුං. අමච්චො තාවදෙව අත්තනො ගෙහං ආගතො. අමච්චස්ස මාතුගාමො "තුම්හෙ කත්ථ ගන්ත්වා ආගතත්ථා"ති ආහ. අත්තනො ගතට්ඨානං විත්ථාරෙන කථෙසි. අමච්චො අභින්නමද්දනං කත්වා සත්තාහං ජයපානං අපායි. අමච්චො මත්තො හුත්වා විස්සජ්ජිත්වා මහා විතානං පසාරෙත්වා කුන්තසිරිවඩ්ඪමානං පි උස්සාපෙත්වා සබ්බතාලාවචරෙ ච පතාකඤ්ච පග්ගණ්හාපෙත්වා දුට්ඨගාමණි අභයමහාරඤ්ඤො පස්සිතුං අගමාසි. තදා රාජා "කස්ස පනෙස සද්දො"ති ආහ. රඤ්ඤො වචනං සුත්වා අමච්චා "ගොඨඉම්බරො අරිට්ඨපබ්බතෙ ජයසෙනයක්ඛෙන සද්ධිං පොදං කීළිත්වා ජයසෙනං පරාජෙත්වා සත්තාහං ජයපානං පිවිත්වා තුම්හාකං දස්සනාය ආගච්ඡති; තස්ස පුරෙතරං හෙරිසද්දො"ති ආහංසු. රාජා "එත්ථ පවිසිතුං වාරෙථා"ති ආහ. අමච්චා තං වාරෙසුං. සො ගොඨඉම්බරො කිං ඉදන්ති ආහ. රඤ්ඤො කථිතං අමච්චස්ස කථෙසුං. තං සුත්වා ගොඨඉම්බරො එවං සන්තෙ නත්ථි රඤ්ඤො පූජා දස්සනන්ති වත්වා ගෙහං ගන්ත්වා ච තස්මිං ඛණෙ නික්ඛමිත්වා ද්වාදසයොජනිකං මග්ගං ඛෙපෙත්වා නාගදීපං ගන්ත්වා තතො ගොඨසමුද්දං ගන්ත්වා ගොඨසමුද්දෙ පතිත්වා චතුවීසයොජන සමුද්දං තරිත්වා කාවීරපට්ටනං ගන්ත්වා තත්ථ දිට්ඨමනුස්සානං "ඉමස්මිං ඨානෙ ගුණවන්තො භික්ඛූ කත්ථ වසන්තී"ති? පුච්ඡි. ඉමස්මිං සාමන්තවිහාරො නත්ථි, ඉමස්මිං ගාමෙ භික්ඛං චරන්තා හිමවන්තෙ ද්වාදසයොජනිකාය ගුහාය

20. බි ඊ. උන්දුම්නදලං. සඹ: "අඩසතක් පමණතැන්." 21. (සබ්බෙසු) සුදින්නං.

පබ්භාරෙ වසන්තා භික්ඛූ ඉමස්මිං ඨානෙ ඔතරන්ති, ඉමස්මිං යෙව ඨානෙ ඨත්වා ආකාසං උප්පතිත්වා සකට්ඨානං ගච්ඡන්තීති ආහංසු. සො සාධූති වත්වා හිමවන්තාභිමුඛො ගච්ඡන්තො තෙසං යෙව භික්ඛූනං දූතං දත්වා වසනකම්මනුස්සානං[22] වසනට්ඨානං අද්දස; සමණෙ නාද්දස. තත්ථ මනුස්සානං පුච්ඡිත්වා තථෙව පුරතො පුරතො දිට්ඨමනුස්සානං පුච්ඡන්තො පුරත්ථාභිමුඛො ගච්ඡන්තො ඡින්නපපාතට්ඨානෙ පබ්භාරං අද්දස. ඡින්නපපාතට්ඨානං අභිරුය්හිත්වා ඨත්වා තත්ථ විහාරං රමණීයං දිස්වා ගුණවන්තානං වසනට්ඨානං භවිස්සතීති තෙසං දස්සනත්ථාය ගන්තුං මය්හං වරන්ති චින්තෙත්වා පබ්භාරෙ පති. පතන්තං අමච්චං එකො ඛීණාසවො පස්සිත්වා හත්ථං පසාරෙත්වා ගහෙත්වා අත්තනො සන්තිකෙ නිසීදපෙත්වා තස්ස ආගතකාරණං පුච්ඡි. සො ආදිතො පට්ඨාය ආගත-කාරණං විත්ථාරෙන කථෙසි. ථෙරො තස්ස කථං සුත්වා කෙසමස්සුං ඔහාරෙත්වා පබ්බාජෙත්වා කම්මට්ඨානං අදාසි. සො විපස්සනං වඩ්ඪෙත්වා අරහත්තං පාපුණිත්වා නිබ්බාණ-පීතිසුඛෙන සොමනස්සං උප්පාදෙත්වා උදානං උදානෙසි.

සඞ්ගාමසොණ්ඩො පරසත්තුමද්දනො[23]
සූරො ච වීරො බලවා පරාභිභූ
ලුද්දස්ස යක්ඛස්ස සීසං (සයං) විනාසයී;
අවිජ්ජාසීසඤ්ච අහං විනාසයිංති.

ගොඨුම්බරස්ස වත්ථු චතුත්ථං.

---

## 45. මහානෙලස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

කප්පකන්දරනජ්ජා තීරෙ, වත්ථුරනාමගාමකෙ
කපණො මනුස්සො මච්චො, හත්තං දත්වා සුඛී අහූති.

තං යථානුසූයතෙ:–

රොහණජනපදෙ කප්පකන්දරනදියා තීරෙ වත්ථුරවිහාරෙ[1] භික්ඛූනං සන්තිකෙ නිච්චං භික්ඛාය චරිත්වා ජීවතකපණො

22. සෝ. වසනකමනුස්සානං. 23. (සබ්බෙසු:) – මද්දනාගො
1. රස. වත්තුර විහාර. සඛ: චතුරු නම් විහාරයක්.

**කුරුණ්ඩදෙවො** නාම අහොසි. සො සමණානං සන්තිකෙ භික්ඛාය චරිත්වා භත්තං භුඤ්ජිත්වා තස්මිං තස්මිං ඨානෙ මාළකෙ වා රුක්ඛමූලෙ වා සයිත්වා නිද්දායති. එතස්ස එවං වසන්තස්ස බහූසංවච්ඡරා අතික්කන්තා අහෙසුං. අපරෙන සමයෙන තස්මිං විහාරෙ සට්ඨිවස්සිකමහාථෙරො තස්ස කුරුදෙවස්ස භුඤ්ජිත්වා[2] නිද්දායන්තං දිස්වා අයං සත්තො කත්ථ නිබ්බත්තිස්සතීති දිබ්බචක්ඛුනා ඔලොකෙන්තො අසඞ්ඛෙය්‍ය සතාදිවසෙන චවිත්වා නිරයෙ නිබ්බත්තමානං දිස්වා පක්කොසාපෙත්වා ඔවාදං අදාසි: උපාසක, ත්වං ඉතො පට්ඨාය භුඤ්ජනභත්තතො[3] ආලොපං ඨපෙත්වා තව චිත්තං පසාදෙත්වා මච්ඡානං දානං දෙහීති ආහ. සො ථෙරස්ස කථං සුත්වා චිත්තං පසාදෙත්වා වන්දිත්වා සීලං ගණ්හි. සො පන තතො පට්ඨාය භුඤ්ජිත්වා එකං පිණ්ඩං ගහෙත්වා දානං හොතීති වත්වා මච්ඡානම්පි දානං[4] දෙති. සො තං පුඤ්ඤ කම්මං කත්වා චවිත්වා තස්ස නිස්සන්දෙන මහාගාමාසන්නෙ මහාභොගසම්පන්නස්ස කුටුම්බිකස්ස ගෙහෙ නිබ්බත්ති. තස්ස නාමකරණමඞ්ගලෙ[5] නීලමහාතෙලං ආහරිංසු, තෙන මහා තෙලො ත්වෙවස්ස නාමං අකංසු. තස්ස සත්තභාතරො අහෙසුං. සො පන මහාතෙලො අපරාපරං වඩ්ඪන්තො සොභග්ගප්පත්තො බලසම්පන්නො අහොසි; නික්කම්මසීලො හුත්වා විචරති. සෙසභාතරො මාතාපිතූනං එතදවොචුං: තුම්හාකං පුත්තො මහාතෙලො අමෙහසු කම්මං කරොන්තෙසු කසනකම්මං වා වපනකම්මං[6] වා න කරොතීති වදිංසු. අථ මාතාපිතරො තං පක්කොසාපෙත්වා කස්මා ත්වං කසනකම්මං වා වපනකම්මං වා මද්දනකම්මං වා න කරොසීති වදිංසු.

සො තෙසං කථං සුත්වා "එවරූපං කම්මං පුරිසා නාම න කරොන්තී"ති ආහ. තස්ස මාතාපිතරො "තව සුඛසීලො හුත්වා විචරණකාලතො පට්ඨාය සුඛකම්මමෙව තුය්හං දස්සෙස්සාමා"ති වත්වා පුත්තස්ස කුජ්ඣිත්වා පුත්තං ගහෙත්වා

2. බී 1. බි 2. කුජ්ඣිත්වා. 3. ර. භත්තෙන 4. බී 2. සෝ. භත්තං. 5. බි 1. බී. 2, නාම ගහණකරණ මංගලෙ. 6. සෝ. වපනකම්මං මද්දනකම්මං වා.

මහාගාමං ගන්ත්වා දුට්ඨගාමණිඅභයමහාරඤ්ඤො සාසනං ගාහාපෙත්වා නික්ඛමිත්වා මහාගාමං ආගන්ත්වා මහාතෙලස්ස හත්ථං ගහෙත්වා "අයං දාරකො මය්හං පුත්තො මහාතෙලො නාම; එතං තුම්හාකං සන්තිකෙ පාදමූලෙ කත්වා වසාපෙථා"ති ආහ. රාජා සාධූති වත්වා තස්ස මහාගාමෙ වාලුකවීථියං නිවාසෙසි. නන්ද-මාතුලගෙහෙ නිවාපං ගහෙත්වා වසාහීති ආහ. සො තතො පට්ඨාය රඤ්ඤො නිච්චං උපට්ඨාසි. අථ දුට්ඨගාමණි අභයමහාරාජා සාධූති වත්වා සත්තබ්‍රාහ්මණානං චන්දග්ගාහ—සූරියග්ගාහ—නක්ඛත්තගාහ—දෙවදුන්දුභි—භූමිචලනාදි අහොසීති කථං සුත්වා "කිං හොන්තා භවිස්සතී"ති පුච්ඡි. මහන්තං ජානකභයං භවිස්සතීති ආහංසු. තං සුත්වා රාජා සයමෙව ආවරණමාතිකා ඛනන—වපනකරණාදීනි කරොති. අථෙකදිවසං රාජා කුද්දාලං[7] ගහෙත්වා මාතිකං කරොති තස්මිං සමයෙ මහාතෙලො උපකච්ඡකෙ හත්ථං පවෙසෙත්වා අට්ඨාසි. රාජා තං ඔලොකෙත්වා "භො මහාතෙල, වපනකරණට්ඨානෙ යං කිඤ්චි කම්මං කරොහී"ති ආහ. සො "එවරූපං කම්මං පුරිසා න කරොන්තී"ති ආහ.

රාජා මයා කරණීයං කම්මම්පි එස න කරොතීති චින්තෙත්වා පුනප්පුනං වුච්චමානොපි න කරොසි; "මහාතෙල කතමං තුම්හාකං පුරිසානං කත්තබ්බකම්ම"න්ති ආහ. සො රඤ්ඤො එතං කම්මන්ති චිත්තො ඨපෙත්වා න කිඤ්චි ආහ. රාජා පන චින්තෙසි, වප්පපුණ්ණමාසෙ[8] තෙරසියං චාතුද්දසියා පණ්ණරසියඤ්ච භික්ඛුසඞ්ඝස්ස සඞ්ඝං පවාරෙමාති චින්තෙත්වා මහාගාමං ගන්ත්වා පණ්ණං ලිඛාපෙසි. අනුරාධපුරෙ අත්තනො සහායවාණිජස්ස "චීනපටසතඤ්ච සෙතපටසතඤ්ච වාලබ්‍යග්ඝාදිරූපචිත්තපටසතඤ්ච මාලාකම්ම—ලතාකම්මචිත්තපටසතඤ්ච ගන්ධධූප—මුඛවාස—අනෙකවිධ—සයන—මහාසයන—පීඨක-ගොණක-පවිළික—උද්දලො

7. බි 2. කුටලං. 8. (සබ්බෙසු:) වප්පන - 9. බි 1. බි 2. චිත්තපටසතං.

මිකා—එකන්තලොමිකාදීනඤ්ච අනෙකවිධ-සාටකභණ්ඩංච[10] සබ්බකටුකභණ්ඩඤ්ච[11] දත්වා පෙසෙතූ''ති ලිඛිත්වා මහානෙලං පක්කොසාපෙත්වා තස්ස දත්වා වෙගෙන අනුරාධපුරං ගන්ත්වා මම සහායවාණිජස්ස ඉමං පණ්ණං දත්වා තෙන දින්නභණ්ඩං ගහෙත්වා ආගච්ඡාහීති ආහ. මහානෙලො තං සුත්වා රාජානං වන්දිත්වා නික්ඛමිත්වා අත්තනො තන්දමාතුල ගෙහං ගන්ත්වා භත්තං භුඤ්ජිත්වා පුටකභත්තං ගහෙත්වා චාතුද්දසියං ද්වාරං විවරිතක්ඛණෙ යෙව බහි හුත්වා සුරියුග්ගමනකාලෙ දීඝවාපිං ගන්ත්වා තතො නික්ඛමිත්වා මහාගඞ්ග වඩ්ඪමානකතිත්ථෙ දන්තකට්ඨං ඛාදිත්වා පුටකභත්තං භුඤ්ජිත්වා මහාපාලිම්හි භත්තං අගණ්හනකාලෙ මහාඅන්තරභත්තම්හි යෙව ආගතො වාණිජං පස්සිත්වා පණ්ණං දත්වා රඤ්ඤො දින්නසාසනං කථෙත්වා පණ්ණාකාරං සජ්ජෙථාති වත්වා තතො නික්ඛමිත්වා පඤ්චයොජනං ගන්ත්වා අත්තනො පිතුසහායං පස්සිත්වා තත්ථ භුඤ්ජිත්වා තතො නික්ඛමිත්වා වාණිජං පස්සිත්වා පටියත්තං සබ්බං හත්ථාලම්බකෙන ගණ්හිත්වා අට්ඨාසි. තස්මිං තණ්ඩුලෙ භාරං එකතණ්ඩුලමූලභාරං හොතීති වදන්ති. වාමහත්ථෙන ඔලම්බකං ගහෙත්වා ගඞ්ගං තරිත්වා දීඝවාපියං අගමාසි. තතො මහාගාමං ගන්ත්වා රඤ්ඤො පණ්ණං දස්සෙසි. රාජා අමච්චස්ස තුස්සිත්වා සොළසසහස්සකහාපණෙ දාපෙසි. මහාවීථියා ච ගෙහං දාපෙත්වා මහායසං දාපෙසි. සො තතො පට්ඨාය මහානෙලො දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථකම්මං කත්වා දෙවලොකෙ නිබ්බත්තීති.

**මහානෙලවත්ථු පඤ්චමං.**

---

10. බී 1. සාලිකභණ්ඩං. 11. බී 1. බී 2. සබ්බකටකභණ්ඩං.

# 46. දුට්ඨගාමණිරඤ්ඤො වත්ථු.

පච්ඡා දුට්ඨගාමිණී අභයමහාරාජා මහාගාමෙ සත්ත දිවසෙ භෙරිං චරාපෙත්වා අහං ඉමස්මිං ලඞ්කාදීපෙ ද්වත්තිංස රාජූනං ගහෙත්වා, එකරජ්ජං කරිස්සාමීති වත්වා රථයොධ-අස්සයොධ-හත්ථියොධ-පුරිසා සඞ්ගාමං ආගච්ඡන්තූති වත්වා භෙරිං චරාපෙත්වා මහන්තෙන රාජානුභාවෙන මහාගාමා නික්ඛමිත්වා චිත්තලපබ්බතවිහාරං[1] ගන්ත්වා මහාදානං දත්වා භික්ඛුසඞ්ඝං වන්දිත්වා තතො නික්ඛමිත්වා කුබ්බන්තගාමං ගන්ත්වා තතො කලම්බදීපං ගන්ත්වා තතො දීඝවාපිං ගන්ත්වා ද්වෙ දමිළරාජානො ගහෙත්වා තතො නික්ඛමිත්වා අම්බරගාම සමීපෙ මහාඅම්බිලපිට්ඨියංගණො නාම අත්ථි තස්මිං ඛන්ධාවාරං බන්ධිත්වා නිසින්නකාලෙ සොළසනාළිසුරාගණ්හනකං කත්වා නික්ඛසහස්සෙන සුරාචිත්තං කාරාපෙසි. තයො අම්මණකහාපණෙ ආහරාපෙත්වා ඨපෙසි. තස්මිං කඤ්චනචිතෙන සුරං පූරාපෙත්වා සබ්බෙ යොධෙ පක්කොසාපෙත්වා ඉමං සුරාචිත්තං පිවිත්වා තයො කහාපණ-අම්මණෙ ගණ්හථාති ආහ. තං සුත්වා යොධා නිස්සද්දා අහෙසුං. රාජා ගොඨඉම්බරඅභයමහාඅමච්චං පක්කොසාපෙත්වා ඉමං සුරාචිත්තං පිවාහීති ආහ. අමච්චො රඤ්ඤො කථං සුත්වා අහං සුරාචිත්තං පාතුං නානුච්ඡවිකොති ආහ. කස්මාති පටිපුච්ඡිතො "මය්හං දහරකාලෙ මය්හං මාතා මම වසනගබ්භෙ සයනපිට්ඨෙ සයාපෙත්වා අත්තනො කම්මං කරොන්තී මං සරිත්වා වෙගෙනාගම්ම මය්හං චුම්බිත්වා උක්ඛිපිත්වා ගණ්හනකාලෙ සුමනමකුලෙහි හරිතමකුලං බද්ධ පවට්ටිත්වා[2] මම හදයෙ පති. මය්හං දහරකාලෙ තදා භයසඤ්ඤං උප්පජ්ජි. තස්මා තදා භීතභාවෙන අහං සුරං න පිවාමී"ති වත්වා සුරාචිත්තපානං නාම පුරිසානං කම්මං න හොතීති ආහ. රාජා ගොඨඉම්බරස්ස සුරාචිතෙන පටික්ඛිතෙන ථෙරපුත්තාභයාමච්චං පක්කොසාපෙත්වා තං සුරාචිත්තං පිවාහීති ආහ. අමච්චො රඤ්ඤො කථං සුත්වා අහං සුරාචිත්තං පාතුං

1. රස. තිස්සමහාවිහාරං 2. සි 2. ඵ. සෝ. පවත්තනත්වා.

නානුච්ඡවිකොති ආහ. කස්මාති පටිපුච්ඡිතො "සාමි, මය්හං මාතුකුච්ඡිගතකාලෙ මම මාතා පසාධනභණ්ඩං ගහෙත්වා ගච්ඡන්ති සමුග්ගනෙත්ත අත්තනො භණ්ඩෙ ගණ්හාපෙසි. තං සමුග්ගනත්තං මම සීසෙ අග්ගහෙසි, තදා මය්හං අප්පමත්තකං භයසඞ්කං උදපාදි. තස්මා භීතභාවෙන සුරාවිත්තං පාතුං (පුරිසානං) නානුරූපන්ති ආහ රාජා තස්ස කථං සුත්වා අට්ඨයොධෙ පක්කොසාපෙත්වා ඉමං සුරාවිත්තං පිවාහීති ආහ අම්බෙවා රසඤ්ඤු කථං සුත්වා අහං සුරාවිත්තං පාතුං නානුච්ඡවිකොති ආහ. කස්මාති පුච්ඡිතො මය්හං දහරකාලෙ ගුළං කීළමානෙ මය්හං කීළාගුළං[3] අවිදූරෙ දබ්බගුම්බෙ පති. අහං ගන්ත්වා ගුළං ගණ්හිතුං හත්ථං පසාරෙමි, තදා දබ්බගුම්බෙ සයිතආසිවිසො සුසූති ඵණං කත්වා උට්ඨහි, තදා මය්හං භයසඞ්කං අහොසි, තස්මිං දිවසෙ භීතභාවෙන අහං සුරං න පිවාමීති වත්වා සුරාවිත්තං පාතුං නානුරූපොති ආහ. රාජා තස්ස කථං සුත්වා සුරාවිත්තං පූරෙත්වා දීඝගොණවලවං පායෙථාති ආහ, වලවාය සුරාවිත්තං උපනෙසුං වලවා ච සුරාවිත්තං න පිවි. කස්මා න පිවීති චෙ? දුට්ඨගාමිණිඅභයරාජා ච තස්ස කණිට්ඨො සද්ධාතිස්සමහාරාජා ච ඉමෙ ද්වෙ භාතිකරාජානො අත්තනො මාතරං විහාරදෙවිං පොසිස්සාමාති වාදං අකංසු. කණිට්ඨො මාතරං ගහෙත්වා පලායි. රාජා මාතුපට්ඨානධම්මෙ ගිද්ධභාවෙන සද්ධාතිස්සමහාරාජෙන සද්ධිං දීඝවාපියං සංගාමං ඔතිණ්ණදිවසෙ කණ්ඩුලහත්ථිං සද්ධාතිස්සො ආරුය්හි, දීඝගොණිවලවං දුට්ඨගාමිණි ආරුය්හි. ද්වෙ භාතිකා මාතුපට්ඨානත්ථාය යුජ්ඣිත්වා සද්ධාතිස්සමහාරාජා ජිනාති, දුට්ඨගාමණි පරාජෙති. සද්ධාතිස්සො මම මාතරං අහමෙව පොසිස්සාමි ජග්ගිස්සාමීති භාතුනො න දෙති. දුට්ඨගාමණි අභයමහාරාජාපි ත්වං කණිට්ඨො, අහං මහල්ලකො, මාතරං අහමෙව පොසිස්සාමි පටිජග්ගිස්සාමීති කණිට්ඨස්ස කුජ්ඣිත්වා දීඝතෙත්ත[4] චතුරතනඅට්ඨංගුලිකං පුථුලතො සොළසංගුලිකං බහලතො චතුරංගුලිකං අසිපත්තං ගහෙත්වා සීසමත්ථ-

---

3. කීළමානා (සබ්බෙසු:) 4. රු. කෝ. දීඝතෙත්ත.

කෙ පරිබ්භමිත්වා විජ්ජුලතං පරික්ඛිපන්තො විය වළවාය වාරෙත්වා සද්ධාතිස්සස්ස ච කණ්ඩුලහත්ථිනො ච මජ්ඣෙ අසි-පත්තෙන ඡින්දිස්සාමීති චින්තෙත්වා වාරකම්මභාවම්මගුණං අදිස්වා වළවං කණ්ඩුලහත්ථිස්ස සමන්තතො වාරෙත්වා වළවං කණ්ණෙසු මන්තෙත්වා පණ්හිසඤ්ඤං දත්වා කණ්ඩුලහත්ථිං ච සද්ධාතිස්සං ච ද්වෙ ජනෙ පලාපෙත්වා[5] අපරභාගෙ පති. තදා කණ්ඩුලහත්ථී අපරාපරං සොණ්ඩං ඉතො චිතො ච චාලෙත්වා සද්ධාතිස්සං ගණ්හාමීති ගහෙතුං නාසක්ඛි. තදා වළවාය අප්පකං භයසඤ්ඤං අහොසි; තදා භීතොම්හීති චින්තෙත්වා සුරාවිත්තං න පායි. තම්පන කාරණඤ්ච දිබ්බ-චක්ඛුනා අරහන්තා එවං දිට්ඨාති වදන්ති. තදා රාජා අඤ්ඤෙසං යොධානං අපීතසුරාවිත්තං නිම්මලාමච්චං පක්කොසාපෙත්වා සුරාවිත්තං පිවාති ආහ.

නිම්මලො "මයි අපිවන්තෙ කො අඤ්ඤො පිවිස්සතී"ති ආහ. සාමි මයා සුරාවිත්තං පීතභාවං ඤත්වා මය්හං උපට්ඨාක මනුස්සා[6] බහූ ආගච්ඡන්ති; තෙසං දාතුං අප්පතරන්ති ආහ. රාජා සාධූති වත්වා අඤ්ඤෙ තයො කහාපණඅම්මණෙ දෙථාති ආහ. පුන අමච්චො පිවාහීති වුත්තෙ "සාමි, මය්හං සුරාවිත්තං පිවිතසාසනං සුත්වා මය්හං දුග්ගතඤාතකා බහූ ආගච්ඡන්ති; තෙසං දාතුං අප්පකං අය්‍යා"ති ආහ. රාජා පුන තස්ස කථං සුත්වා තයො කහාපණඅම්මණෙ දාපෙසි. එවං රාජා සුරාවිත්තං පරිවාරානං පිවිතත්තා තයො කහා-පණඅම්මණෙ, උපට්ඨාකානං අත්ථාය තයො කහාපණඅම්මණෙ, ඤාතකානං අත්ථාය තයො ති නවකහාපණඅම්මණෙන සුරං පායෙසි. තතො පට්ඨාය සො අමච්චො සුරනිම්මලො අහොසි. තතො පච්ඡා දුට්ඨගාමණි අභයමහාරඤ්ඤො විජිත නගරං ගණ්හනදිවසෙ අඤ්ඤෙසං යොධානං ගතද්වාරෙන න පවිසිස්සාමීති වත්වා අට්ඨාරසහත්ථං ආකාසං ආරුය්හ සහපාකාරං ආකාසං ලංඝිත්වා නගරං පවිසිත්වා වෙරිජනං ගහෙත්වා අදාසි. පච්ඡා රඤ්ඤො දෙවගිරිඅන්තරෙ සංගා-

5. "ලංඝෙත්වා"ති භවිතබ්බං. 6. බී 1. බි 2. උපට්ඨාන මනුස්සා.

මප්පත්තදිවසෙ බහුඅමිත්තමද්දනං කත්වා බලකොට්ඨසහස්සං භින්දි. තස්මිං ඨානෙ ද්වත්තිං රාජූනං සසෙනානං ගහෙත්වා දුට්ඨගාමණිඅභයමහාරාජා අනුරාධපුරෙ ඡත්තං උස්සාපෙත්වා නිම්මලාමච්චං පක්කොසාපෙත්වා ඨානන්තරං ච යානවාහනං ච බහුධනං ච මහාසම්පත්තිං ච දාපෙසි. පච්ඡා මහාඅම්බල-පිට්ඨතො නික්ඛමිත්වා මහාගඞ්ග වඩ්ඪමානකතිත්ථෙ නිසින්නො ථෙරපුත්තං අභයාමච්චං පක්කොසාපෙත්වා උභො ගඞ්ගං ගන්ත්වා ගඞ්ගාතීරෙන උද්ධං ගඞ්ගං ගන්ත්වා අවන්තිං-සකොලමහාමලං (?) ආරුය්හ චොරානං ගහෙත්වා නිච්චොරං කත්වා චොරරඤ්ඤො ගහෙත්වා මහාකොළනාමකෙ රට්ඨෙ රාජගෙහවත්ථුං උය්‍යානං ච මනාපං කාරෙත්වා අම්හාකං පණ්ණං පෙසෙහීති ආහ. අථ රඤ්ඤො වචනං සුත්වා ථෙර-පුත්තාභයාමච්චො රාජපුරිසෙ ගහෙත්වා අනෙකසතයොධගණෙ චෙව ආදාය ගඞ්ගාතො පාරගඞ්ගං ගන්ත්වා කොල-මහාමලං පවිසිත්වා චොරානං ගහෙත්වා නිච්චොරං කත්වා තස්මිං දීපෙ සිනෙරුසදිස—සුමනකූටපබ්බතං ආරුය්හ අම්හාකං මහාගොතමසම්මාසම්බුද්ධස්ස සුමනපබ්බතකූට-මත්ථකෙ සහස්සාරචක්කංකිතපාදතලං මාලෙන ගන්ධෙන පූජෙත්වා වන්දිත්වා තතො ඔරුය්හ මරුකන්දජනපදමහාතලෙ වසන්තං පාලන්ති නාම යොධදමිළරාජානං සහස්සයොධෙහි සද්ධිං ගහෙත්වා මාරෙත්වා තතො බාල්හගාමතලකෙ දුට්ඨගාමිණිඅභයමහාරඤ්ඤො රාජගෙහවත්ථුං ච මහාඋය්‍යානෙ පොක්ඛරණිංච බාළ්හගාමතලකෙ සජ්ජාපෙත්වා රඤ්ඤො සාසනං පෙසෙසි. රාජා ආගන්ත්වා බාළ්හගාමතලෙ නිසීදිත්වා අමච්චස්ස කතකාරණං විත්ථාරෙන සුණිත්වා රාජා තුස්සිත්වා එතස්ස බහුධනං දත්වා උය්‍යානං කීළිත්වා තතො නික්ඛමිත්වා තස්මිං තස්මිං ඨානෙ දමිළරාජූනං ගණ්හන්තො එකරජ්ජං කත්වා අනුරාධපුරෙ ඡත්තං උස්සාපෙත්වා ගඞ්ගාය ඔරිමතීරෙ විහාරසතං කාරාපෙසි. අපරභාගෙ රතනවාලුකමහාථූපෙ අනිට්ඨිතෙ යෙව රාජා මරණමඤ්චෙ නිපජ්ජි. ද්වෙ භාතිකා

අමච්චා රඤ්ඤො සන්තිකෙ ඨත්වා රඤ්ඤො කතපුඤ්ඤං කථෙත්වා සරාපෙන්ති, රාජා වරකහත්තාදිනානාභාවට්ඨානං අනුස්සරිත්වා තුසිතපුරෙ නිබ්බත්තීති.

**සඞ්ඛෙපෙන දුට්ඨගාමණිරඤ්ඤො වත්ථු පඨමං.**

---

47. සාලිරාජකුමාරවත්ථු මහාවංසෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං.

**සාලිරාජකුමාරවත්ථු දුතියං.**

---

## 48. විසමලොමකුමාරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

කස්සපසම්මාසම්බුද්ධකාලෙ අඤ්ඤතරමනුස්සො සීලං රක්ඛති; නානාකාරෙන භික්ඛුසඞ්ඝස්ස දානං දෙති. සො පන දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථං උපවසිත්වා තතො චවිත්වා දෙවලොකෙ නිබ්බත්ති. තත්ථ මහාසම්පත්තිං අනුභවිත්වා තතො චවිත්වා ජම්බුදීපෙ පාටලිපුත්තනගරෙ ආණාචක්කවත්ති—ධම්මාසොකමහාරාජානං පටිච්ච අග්ගමහෙසියා කුච්ඡිම්හි නිබ්බත්ති. සො ගබ්භපරිපාකමන්වාය මාතුකුච්ඡිතො නික්ඛමිත්වා පච්ඡා සීසං නහාපෙත්වා නාමං ගණ්හන්තා සීසෙ ලොමං විසමං හුත්වා සඤ්ජාතත්තා "විසමලොමකුමාරො"ති සංජානිංසු සො අපරාපරං වඩ්ඪන්තො විඤ්ඤුභාවං[1] පාපුණි. බලසම්පන්නො යසසම්පන්නො රූපසම්පන්නො අහොසි. අථාපරෙන සමයෙන ධම්මාසොකමහාරාජා චතුරාසීතිරාජසහස්සපරිවාරො අනන්තබලවාහනං ගහෙත්වා හිමවන්තං කීළිතුං අගමාසි. තං කීළිත්වා ආගච්ඡන්තො චන්දභාගසිරිගඞ්ගාසමීපං ආගතො ගඞ්ගාය උභො-

1. බී 2, විස්සුතභාවං. බී 1. විඤ්ඤූතභාවං.

රාජගහනගරෙ මිච්ඡාදිට්ඨිකස්ස පුත්තො ච සම්මාදිට්ඨිකස්ස පුත්තො ච ද්වෙ ජනා ගුළකීළං කීළන්ති. සම්මාදිට්ඨිකස්ස පුත්තො ගුළං ඛිපන්තො "නමො බුද්ධස්සා"ති වත්වා ගුළං ඛිපති; මිච්ඡාදිට්ඨිකස්ස පුත්තො ගුළං ඛිපන්තො "නමො බ්‍රහ්මුනො"ති වත්වා ඛිපති. සම්මාදිට්ඨිකස්ස පුත්තො ජිනාති; මිච්ඡාදිට්ඨිකස්ස පුත්තො පරජ්ජති. තතො මිච්ඡාදිට්ඨිකස්ස පුත්තො නිච්චං[1] ජිනන්තං දිස්වා ත්වං කින්ති වත්වා ගුළං ඛිපසීති ආහ. සො නමො බුද්ධස්සාති වත්වා ඛිපාමීති ආහ. සො තතො පට්ඨාය එවං වත්වා ගුළං ඛිපති. අථෙකදිවසං මිච්ඡාදිට්ඨිකස්ස පුත්තො සකටං ගාහාපෙත්වා අත්තනො පිතරා සද්ධිං දාරුඅත්ථාය අගමාසි. දාරූනි ගහෙත්වා ආගච්ඡන්තො ද්වාරසමීපෙ සකටං විස්සජ්ජෙත්වා තිණං ඛාදනත්ථාය ගොණෙ විස්සජ්ජෙසි. ගොණා අඤ්ඤෙහි ගොණෙහි සද්ධිං අන්තොනගරං පවිසිංසු. පිතා "ගොණෙ යොජෙත්වා සායණ්හසමයෙ සකටං ගහෙත්වා ආගච්ඡෙය්‍යාසී"ති වත්වා සයං නගරං පාවිසි. පුත්තො සායණ්හසමයෙ නගරං ගන්තුකාමො ගොණෙ අදිස්වා බහිනගරෙ හෙට්ඨාසකටෙ සයි. රත්තිකාලෙ සම්මාදිට්ඨියක්ඛො ච මිච්ඡාදිට්ඨියක්ඛො ච ද්වෙ ගොචරං ගවෙසන්තා ඉමං දාරකං දිස්වා මිච්ඡාදිට්ඨියක්ඛො සම්මාදිට්ඨියක්ඛෙන යාවතතියං වාරියමානොපි තස්ස වචනං අනාදියිත්වා දාරකං ඛාදමීති වත්වා

1 පුත්තිකාසු අයං පාඨො ඌනො. මයා රසවාහිනිතො උද්ධටො. සහස්සවත්ථුම්හි "පරාජිතනාමා"ති එත්තකමෙව දිස්සති.

ගහෙත්වා පාදෙසු අග්ගහෙසි, තස්මිං ඛණෙ දාරකො "නමො බුද්ධස්සා"ති ආහ. යක්ඛො භයප්පත්තො හුත්වා පටික්කි-පිත්වා[2] අට්ඨාසි. සම්මාදිට්ඨියක්ඛො "ත්වං අයුත්තං අකාසී"ති ආහ; වත්වා ච පන දණ්ඩකම්මත්ථාය දාරකස්ස භොජනං ආහරාහි වත්වා සයං ආරක්ඛං ගහෙත්වා අට්ඨාසි. අපරො-යක්ඛො ගන්ත්වා බිම්බිසාරමහාරඤ්ඤො කඤ්චනතට්ටකෙ අභිසංඛත-රසභොජනං වඩ්ඪිතකාලෙ ආහරිත්වා එතස්ස පිතුවණ්ණෙන හුත්වා දාරකං භොජෙත්වා සකලරත්තිං එතස්ස ආරක්ඛං කරිත්වා තස්ස දාරකස්ස සත්ථුනො සරණගත-භාවඤ්ච අත්තනො කතඤ්ඤුකාරභාවඤ්ච තට්ටකෙ අක්ඛරං ලිඛිත්වා රඤ්ඤො යෙව පඤ්ඤායතූති අධිට්ඨාය සයං අගමංසු. රාජපුරිසා භොජනභණ්ඩං අදිස්වා තං ගවෙසන්තා දාරකස්ස[3] සකටෙ දිස්වා දාරකං ච තට්ටකං ච ගාහාපෙත්වා රඤ්ඤො සන්තිකං ගන්ත්වා රඤ්ඤො දස්සෙසුං. රාජා තට්ටකෙ අක්ඛරං දිස්වා වාචෙත්වා දාරකස්ස ගුණෙ බහුමානෙන තුට්ඨො නගරෙ සෙට්ඨිඡත්තං පෙසෙසීති.

**මිච්ඡාදිට්ඨිකස්ස වත්ථු පඨමං.**

---

## 70. මිච්ඡාදිට්ඨිකස්ස සරණගමනවත්ථුම්හි අත්ථුප්පත්ති.

දක්ඛිණපසෙ පච්චන්තනගරෙ සද්ධාසම්පන්නො උපා-සකො භික්ඛාය චරන්තං භික්ඛුං දිස්වා තස්ස භික්ඛුස්ස අනුකම්පාය නගරාසන්නෙ ඵාසුකෙ වනසණ්ඩෙ පණ්ණසාලං කත්වා චතූහි පච්චයෙහි පටිජග්ගි. සො පන භික්ඛු තස්මිං වසන්තො සත්ථුපරිභුත්තං පාදජඞ්ඝඛණ්ඩං නිධාය වාලුකථූපං කත්වා නිබද්ධං පූජෙසි. තස්ස පන උපාසකස්ස සහාය-මනුස්සො තස්ස අනන්තරගෙහෙ වසන්තො දෙවතාභත්තිකො

---

2. රස. පටික්කම්ම .. (සබ්බෙසු) දරකං.

අත්තනො දෙවතානං නිබද්ධං නමස්සති. සම්මාදිට්ඨිකො බුද්ධගුණං කථෙසි. මිච්ඡාදිට්ඨිකො දෙවතානං ගුණං කථෙසි. තෙසං[1] අඤ්ඤමඤ්ඤං කලහං කත්වා රඤ්ඤො ආරොචෙසුං. රාජා එවං සන්තෙ තුම්හාකං සත්ථාරානං මහන්තභාවං ඉද්ධිපාටිහාරියෙන ජානිස්සාම; ඉතො සත්තාහෙ වීමංසිස්සාමීති වත්වා නගරෙ භෙරිං චරාපෙසි "ඉතො සත්තමෙ දිවසෙ අත්තනො අත්තනො සත්ථාරං ඉද්ධිපාටිහාරියෙන වීමංසිස්සාමා"ති. තං සද්දං සුත්වා නානාදිසාවාසී බහූ මනුස්සා අවකාසං කාරයිත්වා අට්ඨංසු. සම්මාදිට්ඨිකා පන අම්හාකං සත්ථුනො ආනුභාවං පස්සථාති වත්වා සබ්බෙ රඤ්ඤො සද්ධිං වාලුකථූපස්ස සන්තිකං ගන්ත්වා මාලාගන්ධධූමෙහි ථූපං පූජෙත්වා පදක්ඛිණං කත්වා අඤ්ජලිං පග්ගහෙත්වා ඨත්වා එවං සච්චකිරියං අකංසු: "අම්හාකං සත්ථා පරිනිබ්බුතො, සාවකා ච ඉමස්මිං ඨානෙ නත්ථි; අම්හාකං සත්ථාරං සරණංගත-උපාසකානං අනුකම්පං පටිච්ච මහාජනස්ස මිච්ඡාදිට්ඨිභින්දනත්ථං පාටිහාරියං දස්සෙය්‍යාථ සාමී"ති ආහංසු. තස්මිං එවං වුත්තෙ වාලුකථූපං ද්විධා කත්වා පාදපීඨං ආකාසං උග්ගන්ත්වා ඡබ්බණ්ණරංසී විස්සජ්ජෙන්තො අට්ඨාසි. තං දිස්වා සමාගතා මහාජනා මිච්ඡාදිට්ඨිං භින්දිත්වා සරණෙ පතිට්ඨහිංසූති.

**මිච්ඡාදිට්ඨිකස්ස සරණෙ පතිට්ඨිතවත්ථු ඡට්ඨං**

---

## 71. උත්තරසාමණෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

රාජගහනගරෙ බ්‍රාහ්මණස්ස පුත්තො උත්තරසාමණෙරො නාම පුබ්බහෙතුසම්පන්නො අහොසි, උත්තමරූපධරො පරමසුඛුමාලො තිණ්ණං වෙදානං පාරංගතො අහොසි. වස්සකාරො[1] නාම බ්‍රාහ්මණො තස්ස කුමාරස්ස ගුණං සුත්වා

1. තෙහි නිහවිතබ්බං 1. ර. නස්සකාරො.

තං පක්කොසාපෙත්වා අත්තනො ධීතරං තස්ස දාතුකාමො අහොසි. සො පන කුමාරො පුබ්බහෙතුසම්පන්නත්තා බ්‍රාහ්මණස්ස කථාය විප්පටිසාරී අහොසි සො පුනප්පුනං කථෙන්තොපි අතිච්ඡි යෙව. සො පච්ඡිමභවිකත්තා ඝරා-වාසෙ [වසන්තො] නාභිරමති. සො තෙසං වචනං අනාදියිත්වා සාරිපුත්තත්ථෙරස්ස සන්තිකෙ පබ්බජිත්වා ආචාරසම්පන්නො අහොසි වත්තසම්පන්නො ච. අථෙක-දිවසං ථෙරස්ස අඵාසුකං අහොසි; සාමණෙරො භෙසජ්ජත්ථාය ථෙරං වන්දිත්වා පාතො යෙව රාජගහං පාවිසි. තස්මිං ඛණෙ චොරා සන්ධිං ඡින්දිත්වා භණ්ඩං ආදාය පලායන්තා ගාමරක්ඛිකෙහි අනුබන්ධන්තා සාමණෙරං දිස්වා තත්ථෙව තං ගහෙත්වා බලක්කාරෙන එකං මණිරතනං පත්තෙ පක්ඛිපිත්වා මුත්තාහාරං ගීවාය බන්ධිත්වා අවසෙසවත්ථුං තස්ස සන්තිකෙ ඛිපිත්වා පලායිංසු. ගාමරක්ඛිකා ගන්ත්වා සාම-ණෙරං දිස්වා තස්ස පුබ්බකම්මනිස්සන්දෙන රඤ්ඤො දස්සෙසුං. රාජා ඉමං සූලෙ උත්තාසෙථාති ආහ. රාජදූතා සූලෙ තං උත්තාසෙසුං[2]. සො සාමණෙරො සූලග්ගෙ නිසින්නො සාරිපුත්තත්ථෙරං අනුස්සරි.[3] මම එවං අහොසි, "ථෙරස්ස භෙසජ්ජං කො නාම හරිස්සතී"ති, තං ඤත්වා සාරිපුත්තත්ථෙරො සත්ථු සන්තිකං ගන්ත්වා තං පවත්තිං කථෙසි. සම්මාසම්බුද්ධො අසීතිමහාසාවකෙහි පරිවාරෙත්වා තත්ථ ගන්ත්වා ධම්මං දෙසෙසි, ධම්මපරියොසානෙ සාම-ණෙරො සූලග්ගෙ යෙව අරහත්තං පාපුණිත්වා උට්ඨාය ආකාසෙ ඨත්වා ධම්මං දෙසෙසි "න පිතා න ච තෙ මාතාති" ආදිගාථාය. චතුරාසීති-පාණසහස්සානං ධම්මාභි-සමයො අහොසි. ඉදම්පන තස්ස පුබ්බකම්මං අනන්ත-රජාතියා මාතුයා පදුට්ඨො "ජීවසූලෙ නිසීදනං ලභතූ"ති ආහ. මාතාපිතු-ගරු-සාමී ති ආදිකා එවං න භාසියන්ති. තෙන එවං අහොසීති වදන්ති.

### උත්තරසාමණෙරස්ස වත්ථු සත්තමං

---

2. (සබ්බෙසු:) උත්තාපෙසුං. 3. "තස්ස" ඉති භවිතබ්බ.

## 72. නන්දිවාණිජස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

මහාරට්ඨනගරවාසී[1] භොගවන්තො සීවඅමච්චො නාම එකස්මිං ඡණදිවසෙ මහාතිත්ථං සජ්ජාපෙත්වා සයම්පි සජ්ජිත්වා මහාපසාධනං පසාධෙත්වා රථෙ ඨත්වා මහාරට්ඨ-නගරං[2] පදක්ඛිණං කරොන්තො නන්දිවාණිජස්ස නාම මාතුගාමො සබ්බාලංකාරෙහි අලංකරිත්වා අත්තනො පාසාදෙ ඨත්වා ඡණං ඔලොකෙසි. සො තස්සා උපඩ්ඪකායං දිස්වා සීවඅමච්චො උම්මත්තො හුත්වා එසා කස්ස භරියාති ආහ. නන්දිනාම-වාණිජස්ස එසා භරියාති ආහංසු. සො කහන්ති ආහ. තස්ස විදෙසං ගතස්ස තීණි සංවච්ඡරානි අතික්කන්තානීති ආහංසු. අමච්චො අත්තනො ගෙහං ගන්ත්වා තස්සා ඉත්ථියා සහස්සං පෙසෙසි. සා තං සුත්වා න සම්පටිච්ඡි, පුන ද්විසහස්සං පෙසෙසි. තම්පි න අග්ග-හෙසි. පුන තිසහස්සං පෙසෙසි, තම්පි න ගණ්හි. සා අමච්චස්ස එවං සාසනං පෙසෙසි: "සචෙ අමච්චො ධනං ඉච්ඡති, ඉතො ගණ්හාතු; අම්හාකං වාණිජස්ස විදෙසං ගතස්ස තීණි සංවච්ඡරානි හොන්ති. තස්ස ජීවභාවං වා මතභාවං වා න ජානාමි; තස්ස පවත්තිං ඤත්වා මය්හං කථෙථා"ති වත්වා කහාපණං[3] න අග්ගහෙසි. සො තස්සා පතිම්හි මාරිතෙ මය්හං කථං ගණ්හිස්සතීති චින්තෙත්වා වෙ භූතවෙජ්ජකෙ පක්කොසාපෙත්වා "ඉධ නිසීදිත්වා විදෙසං ගතමනුස්සං මාරෙතුං සක්කොසී"ති ආහ. තත්ථෙකො මනුස්සො අහං මාරෙතුං න සක්කොමීති ආහ. එකො පන මනුස්සො අහං මාරෙතුං සක්කොමීති ආහ. සො අමච්චො තං ගහෙත්වා රත්තිං ආමකසුසානං ගන්ත්වා මතමනුස්සං මන්තං පරිවත්තෙත්වා උදකෙන පහරි[4]. සො මතමනුස්සො උට්ඨාය "කිං කරොමී"ති ආහ. සො "ඉමං අසිපත්තං ගහෙත්වා නන්දිවාණිජං මාරෙත්වා ආගච්ඡාහී"ති ආහ. සො සාධූති වත්වා අමනුස්සො

1. රජ. සීහළදීපෙ කිර මහාතිත්ථපට්ටනෙ. 2. "මහාතිත්ථනගරං"ති භවිතබ්බං. 3. බි 2. මහාධනං. 4. පරිභරි (සබ්බෙසු)

ගච්ඡන්තො නන්දිවාණිජං අත්තනො කතකම්මං නිට්ඨාපෙත්වා ආගච්ඡන්තං සමුද්දමජ්ඣෙ දිස්වා මාරෙස්සාමීති වත්වා මුඛෙන ජාලං විස්සජ්ජෙන්තො නාවාභිමුඛො පක්ඛන්දි, නාවාය මනුස්සා තං දිස්වා භයප්පත්තා මහාසරෙන විරවිංසු. තෙසං සද්දං සුත්වා නන්දිවාණිජො කිමෙතන්ති පටිපුච්ඡි, තෙ තං කාරණං කථෙසුං. සො සාධූති වත්වා සබ්බෙ මෙත්තං කරොථාති වත්වා සබ්බෙසං බුද්ධං සරණං අදාසි. සරණෙසු පතිට්ඨිත-කාලෙ සො අමනුස්සො සෙලෙ පහත-පාසාණං විය නිවත්තිත්වා ආගන්ත්වා අම්ඩචස්ස අසිං දත්වා මරිත්වා පති. පුන පි තං පෙසෙසි තෙපි පුන සරණං ගණ්හිංසු. අමනුස්සො පුන ආගන්ත්වා පති. තීසු වාරෙසු පයොජෙසි, අමනුස්සො පුන ආගන්ත්වා පති. චතුත්ථවාරෙපි නිවත්තිත්වා අමනුස්සං උට්ඨාපෙත්වා මාරෙහී ති වත්වා පෙසෙසි. සො අමනුස්සො එතස්ස සරණෙ පතිට්ඨිත-භාවෙන මාරෙතුං අසක්කොන්තො පටි ආගන්ත්වා අමච්චං ච භූතවෙජ්ජං ච මාරෙත්වා සයං භූමියං පතීති.

**නන්දිවාණිජස්ස වත්ථුං අට්ඨමං.**

---

## 73. කාවීරපට්ටනෙ[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

කාවීරපට්ටනෙ[1] මිච්ඡාදිට්ඨිකා දෙවකුලෙ ඵලකෙ චිත්තකම්මං කත්වා මහාදෙවතං උජුකං ඨිතං කත්වා අකංසු; සත්ථාරං තස්ස වන්දනාකාරං කත්වා අකංසු. උපාසකා දෙවකුලං ගන්ත්වා තස්මිං තස්මිං ඨානෙ චිත්තකම්මං ඔලොකෙන්තා ඵලකෙ චිත්තකම්මං ඔලොකෙත්වා "සත්ථාරං නො අනනුරූපං කත"න්ති රොදිත්වා පරිදෙවිත්වා රාජද්වාරං ගන්ත්වා උග්ඝොසෙසුං. රාජා තෙ පක්කොසාපෙත්වා කස්මා උග්ඝොසෙථාති පටිපුච්ඡි. "මහාරාජ, අම්හාකං සත්ථා සදෙවකෙ ලොකෙ මහන්තො. දෙවකුලෙ ච අම්හාකං

1. බී 1. බී 2 සෝ. කප්පිරපට්ටනෙ. ර. කප්පීරපට්ටනෙ.

සත්ථාරං මහාදෙවස්ස වන්දනං කත්වා අකංසු. අම්හාකං සත්ථුනො අයුත්තං කතන්ති උග්ඝොසෙමා''ති ආහංසු. රාජා තෙසං කථං සුත්වා "සබ්බෙව අත්තනො අත්තනො සත්ථාරානං මහන්තභාවං කථෙන්ති. තුම්හාකං සත්ථුනො මහන්තභාවං කථං ජානාමා''ති ආහ. තෙපි "තුම්හාකං අම්හාකං සත්ථුනො මහන්තභාවං ජානාපෙස්සාමා''ති අහංසු. "මහාරාජ, තුම්හෙ ඵලකං[2] ආහරාපෙත්වා තථෙව නිසීදාපෙත්වා දෙවකුලෙ කම්මිකානං ලඤ්ජෙන ලඤ්ජිත්වා සත්තාහං ගොපෙත්වා වාරං විවරාපෙත්වා ඔලොකෙථ; තදා අම්හාකං සත්ථුනො මහන්තභාවං ජානෙය්‍යාථා''ති ආහංසු. රාජා සාධූති වත්වා තෙසං කථිත-නියාමෙනෙව ඨපාපෙසි[3]. තෙ පන උපාසකා දානං දත්වා සීලං රක්ඛිත්වා උපොසථං උපවසිත්වා සත්තාහං මෙත්තං කත්වා "අම්හාකං කත-කුසලනිස්සන්දෙන මහිද්ධිකා මහානුභාවා දෙවතා අම්හාකං සත්ථුනො උට්ඨාය ඨිතභාවං දස්සෙථා''ති ආහංසු. තස්මිං ඛණෙ සක්කස්ස දෙවරඤ්ඤො පණ්ඩුකම්බලසිලාසනං උණ්හාකාරං දස්සෙසි. තතො සක්කො දෙවරාජා ආගන්ත්වා සත්ථාරං ඨිතං කත්වා මහාදෙවං සත්ථුනො පාදවන්දනං කරොන්තං කත්වා උපාසකස්ස කථෙසි. තතො උපාසකො සුරියෙ උග්ගතෙ පාතො යෙව රඤ්ඤො සන්තිකං ගන්ත්වා "අම්හාකං සත්ථා උට්ඨාය ඨිතො; මහාදෙවො සත්ථාරං වන්දමානො ඨිතො''ති ආහ. රාජා සාධූති වත්වා නාගරෙ සන්නිපාතාපෙත්වා දෙවකුලං ගන්ත්වා සාටකං මොචාපෙත්වා සත්ථාරං උට්ඨාය ඨිතං අද්දසංසු, මහාදෙවො[4] ඔනමිත්වා තථාගතං [illegible]තං අද්දසංසු. රාජා තං දිස්වා මිච්ඡාදිට්ඨිං පහාය උ[illegible] පතිට්ඨිතො දෙවකුලං භින්දිත්වා විහාරං කාරපෙසි [illegible]දිට්ඨිකෙ අත්තනො විජිතා[5] නීහරාපෙත්වා යාවජීවං [illegible] කත්වා සුගතිං ගතොති.

[illegible]රපට්ටනවත්ථු[6] නවමං.

---

2. ඵ[illegible]කං හවිතබ්බං. 3 බී 1. බී 2. ඨපෙසි. 4. "මහාදෙවං" ති [illegible]සු:) ජීවිතා. 6. (සබ්බෙසු:) කාජීරපට්ටනවත්ථු.

# 74. නකුලස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

රොහණජනපදෙ අඤ්ඤතරස්මිං ගාමෙ උපාසකො නකුලො නාම. සො උච්ඡුයන්තභතිං කත්වා ද්වාදස කහාපණෙ ලභිත්වා මහාගාමෙ කුලගෙහෙ අත්තනො ධීතරං ද්වාදසකහාපණෙන ඉණෙන වසන්තිං ඉණතො නීහරිස්සාමීති ගච්ඡන්තො අන්තරාමග්ගෙ සකටභින්නඛණ්ඩ[1] නිස්ස මහාවිහාරවාසී චූළපිණ්ඩපාතිකතිස්සත්ථෙරං දිස්වා පුටකභත්තං ආදාය ගච්ඡන්තං මනුස්සං දිස්වා පුටකභත්තං මෙ දෙහීති වත්වා තෙන අදින්නෙ ද්වාදසකහාපණෙ දත්වා එකං පුටකභත්තං ගහෙත්වා ථෙරස්ස අදාසි. ථෙරො අරහත්තම්පා පුණිත්වාව පරිභුඤ්ජි. උපාසකො ධීතුසන්තිකං අගමාසි. ධීතරි පුච්ඡන්තෙ තං කාරණං කථෙත්වා පත්තිං අනුමොදාහීති ආහ. සා තං අනුමොදි. ථෙරො විහාරං ගන්ත්වා අත්තනො අරහන්තභාවං[2] ආරොචෙත්වා උපාසකෙන[3] ආගන්ත්වා කූටාගාරෙ ගහිතකාලෙ කූටාගාරං උට්ඨහතූති අධිට්ඨාය පරිනිබ්බායි. පඤ්චසතා බහුමනුස්සා තාව කූටාගාරං චාලෙතුං නාසක්ඛිංසු. කාකවණ්ණතිස්සමහාරාජා සෙනඞ්ගෙන සද්ධිං ආගන්ත්වා චාලෙතුං නාසක්ඛි. සො පන භත්තදින්න-උපාසකො[4] ථෙරස්ස පරිනිබ්බුතභාවං සුත්වා ආගන්ත්වා කූටාගාරකණ්ණෙ අග්ගහෙසි. තස්ස ගහිතමත්තෙ යෙව කූටාගාරං උට්ඨහි. තං කාරණං කාකවණ්ණතිස්සමහාරාජා සුත්වා තං උපාසකං පක්කොසාපෙත්වා මහන්තං සම්මානං කත්වා තස්ස වසිතගාමං කණ්ණිකගාමං නාම කත්වා තං තස්ස භුත්තගාමං කත්වා අදාසි. තස්ස දින්නභාවෙන පච්ඡානකුලනගරකණ්ණිකං නාම අහොසීති.

**නකුලස්ස වත්ථු දසමං.**

---

1. කෝ. ර. සාටකභින්නඛණ්ඩ බි 1. බි 2. සකටභින්නඛණ්ඩං 2. කෝ. ර. අරහත්තං පත්තභාවං. 3. (සබ්බෙසු:) උපාසකො: 4. ර. අත්ථදින්නක උපාසකො.

# 75. අම්බාමච්චස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

වෙණිගාලස්ස[1] පුත්තො අම්බාමච්චො නාම චූළනාගඛණ්ඩාවාරෙ[2] විහරති, තස්මිං සමයෙ ජනපදං දුබ්භික්ඛං අහොසි. මනුස්සා භික්ඛාය චරිත්වා ආහාරං දුක්ඛෙන ලභන්ති. සො පන අමච්චො හලිද්දි-සිඞ්ගිවෙරාදි-අනෙකවණ්ණභණ්ඩං ගාහාපෙත්වා තත්ථ තත්ථ ගන්ත්වා වීහිං ආහරථාති වත්වා ජනපදං පෙසෙසි. රතනවිහාරෙ[3] තලඛණ්ඩපධානෙ[4] වසන්තො චූළපිණ්ඩපාතික—නාගත්ථෙරො නාම එතස්ස වසනගාමං පිණ්ඩාය පවිසිත්වා යථාධොතෙන පත්තෙන නික්ඛමි. සො ථෙරං ඔලොකෙත්වා මජ්ඣිමස්සකෙන[5] සජ්ජෙත්වා අත්තනො පුබ්බවඩ්ඪිතභත්තං[6] ථෙරස්ස අදාසි. ථෙරො තස්ස චිත්තාචාරං ඔලොකෙත්වා විපස්සිත්වා අරහත්තං පත්වා භුඤ්ජි. අමච්චස්ස පන භරියා උක්ඛලිං විවරිත්වා ආහාරං ඔලොකෙන්තී උක්ඛලිං පූරෙත්වා ඨිතං සාලිභත්තං අද්දස. තතො භත්තං කටච්ඡුනා ගහෙත්වා පාතියං පක්ඛිපිත්වා පාතිං පූරෙත්වා අට්ඨාසි; කටච්ඡුනා භත්තං ගහිතට්ඨානං න පඤ්ඤායති. අම්හාකං පුඤ්ඤෙන එවං භවිතබ්බන්ති චින්තෙත්වා සකලගාමවාසීනං ආනෙත්වා භොජෙසුං. තස්මිං ගාමෙ නිබ්බත්තදෙවතා තස්ස සන්තුට්ඨා තස්ස ගෙහෙ මනුස්සා විය බහුසකටං පූරෙත්වා සාලිං ආහරිංසු. තතො සාලිපච්ඡිං ගහෙත්වා කොට්ඨකෙ පක්ඛිපිංසු. සබ්බෙ කොට්ඨා සාලිපුණ්ණා යෙව අහෙසුං. තස්ස ගෙහෙ සා දෙවතා තුස්සිත්වා වංසෙන[7] සාලියො අබ්බොච්ඡින්නා පවත්තෙනාසි. අමච්චො තතො පට්ඨාය දානං දත්වා බහුං පුඤ්ඤං කත්වා සග්ගෙ නිබ්බත්තොති

**අම්බාමච්චස්ස වත්ථු එකාදසමං.**

**වග්ගො පරිපුණ්ණො.**

1. රස. වෙණිගාම. 2. (සබ්බෙසු:) ඛණ්ඩවාරෙ. සඩ; "සුලුත්හරු නම් සාදමුරෙහි" 3 රස. රතනීයං විහාරෙ. (අසුද්ධපාඨො) 4. සඩ. "ඛවනාඩ නම් නාවනා ගෙයි. 5. (සබ්බෙසු:) මජ්ඣිමස්සකෙ 6. (සබ්බෙසු) පුබ්බවඩ්ඪිතභත්තං ("පුරතො වඩ්ඪිතභත්ත."ති යුත්තතරං 7. ශ්‍රී 2 සෝ. ර. වංසෙන

## 76. චොරඝාතක වත්ථුම්හි අත්ථුප්පත්ති.

සාවත්ථිනගරෙ පඤ්චසතා චොරා බහිනගරෙ හුත්වා රත්තිං ආගන්ත්වා චොරකම්මං කරොන්ති. අථෙකදිවසං අඤ්ඤනගරං පවිසන්තා ජනපදමනුස්සං පස්සිත්වා කත්ථ වාසිකොති පුච්ඡිංසු. සො අත්තනො ජනපදවාසිභාවං කථෙසි. කිං අම්හාකං කම්මං කරිස්සසීති ආහංසු; සාධු සාමීති ආහ. තෙ තං ගහෙත්වා අඤ්ඤනගරං පවිසන්තා චොරකම්මෙන ජීවිකං කප්පෙසුං. අථෙකදිවසං තෙ චොරකම්මෙ අග්ගහෙසුං. තෙ රඤ්ඤො දස්සෙසුං. රාජා තෙ දිස්වා "තුම්හාකං අන්තරෙ ඉමෙ සබ්බෙ මාරෙතුං සමත්ථස්ස ජීවිතං දම්මී"ති ආහ. පඤ්චසතා චොරා අඤ්ඤමඤ්ඤසම්බන්ධා අඤ්ඤමඤ්ඤසහායකාති මාරෙතුං[1] න ඉච්ඡිංසු. සො පන ජනපද මනුස්සො "අහං මාරෙමී"ති වත්වා සබ්බෙ මාරෙසි. රාජා තස්ස තුස්සිත්වා චොරඝාතකම්මං අදාසි. සො පඤ්චවීසති වස්සානි චොරඝාතක-කම්මං අකාසි.

රාජා තස්ස මහල්ලකොති වත්වා අඤ්ඤස්ස චොරඝාතක කම්මං අදාසි සො චොරඝාතකකම්මෙන[2] අපනීතො අඤ්ඤතර-මනුස්සස්ස හත්ථතො නාසිකවාතං උග්ගණ්හිත්වා හත්ථ පාද-කණ්ණ-නාසාදීහි භින්දිතබ්බක-රුච්චනකට්ඨානං[3] කත්වා භින්දන්තානං මාරෙතබ්බයුත්තානං නාසිකවාතං විස්සජ්ජෙත්වා මාරෙතබ්බමත්තං ලභි. සො රඤ්ඤො සාසනං පෙසෙසි: "අහං පුබ්බෙ මහල්ලකභාවෙන මනුස්සෙ දුක්ඛාපෙත්වා භින්දිතබ්බානං භින්දාමි, මාරෙතබ්බානං මාරෙමි. ඉදානි පන නාසික වාතං විස්සජ්ජෙත්වා භින්දිතබ්බානං භින්දාමි, මාරෙතබ්බානං මාරෙමී"ති. රාජා සාධූති වත්වා චොරඝාතකකම්මං තස්සෙව අදාපෙසි. එතස්ස පන චොරඝාතකකම්මං කරොන්තස්සෙව

1. සේ. ර., අඤ්ඤමඤ්ඤං මාරෙතුං. 2. ර. පොත්ථකෙ නත්ථි.
3. බි 2. රුජ්ජනකට්ඨානං.

තිංසවස්සානි අතික්කමිංසු. සො පච්ඡා මහල්ලකො හුත්වා මරණමඤ්චෙ නිපජ්ජි. අඩ්ඪසත්තදිවසෙන[4] කාලං කරිස්සන්ති මහන්තං වෙදනං අහොසි. සො මහානිරයෙ නිබ්බත්තො විය මහාසද්දං කත්වා දුක්ඛිතො හොති. තස්ස සද්දෙන භීතා මනුස්සා උභොපස්සෙ ගෙහං ඡඩ්ඩෙත්වා පලායිංසු. එතස්ස මරණදිවසෙ සාරිපුත්තත්ථෙරො දිබ්බචක්ඛුනා ලොකං ඔලොකෙන්තො එතස්ස කාලං කත්වා මහානිරයෙ නිබ්බත්තනභාවං[5] ඔලොකෙත්වා අනාගතො ගතෙ එතස්ස සග්ගෙ නිබ්බත්තනභාවං ඔලොකෙත්වා එතස්ස අනුකම්පං පටිච්ච තස්ස ගෙහද්වාරෙ පාකටො අහොසි. සො ථෙරං දිස්වා දුට්ඨො හුත්වා ථෙරං විරජ්ඣිත්වා පලාපෙස්සාමීති වත්වා නාසිකවාතං විස්සජ්ජෙසි. ථෙරො අතිරෙකෙන විරොචමානො අට්ඨාසි; වෙ තයො වාරෙ නාසිකවාතං විස්සජ්ජෙත්වා විජ්ඣාපෙතුං[6] අසක්කොන්තො ථෙරං අතිරෙකෙන විරොචමානං දිස්වා චිත්තං පසාදෙත්වා අත්තනො පක්කපායාසං ථෙරස්ස දාපෙසි. ථෙරො මඞ්ගලං වඩ්ඪෙත්වා අගමාසි. චොරඝාතකො ථෙරස්ස දින්නදානං අනුස්සරිත්වා චවිත්වා සග්ගෙ නිබ්බත්ති. භික්ඛූ තස්ස තථාසාසනං සුත්වා කතරමහානිරයෙ වා තිරච්ඡානයොනියං වා නිබ්බත්තතීති (?) සත්ථාරං පුච්ඡිංසු. සත්ථා තෙසං කථං සුත්වා සාරිපුත්තත්ථෙරස්ස දින්න-පායාසදානනිස්සන්දෙන දෙවලොකෙ නිබ්බත්තො; තස්සෙව නිස්සන්දෙන අනාගතෙ පච්චෙකබුද්ධො භවිස්සතීති.

**චොරඝාතකවත්ථු පඨමං.**

---

4. සී 2. දිවසෙ. 5. (සබ්බෙසු;) නිබ්බත්තමානං. 6. ර. විජ්ජාපෙතුං.

# 77. චූළගල්ලකරට්ඨෙ ආසනසාලං ජග්ගන්තස්ස උපාසකස්ස වත්ථුම්හි[1] අත්ථුප්පත්ති.

තං යථානුසූයතෙ:–

මලියමහාදෙවත්ථෙරො චෙතියවිහාරං ගන්ත්වා පධානඝරෙ වසති.[2] අථෙකදිවසං රත්තිභාගසමනන්තරෙ ථෙරස්ස උදරවාතො චලි. තස්ස එකාදසභාගයාගුං පිවිතකාලෙ සුඛං හොති, අථ සො තං යාගුං කුතො ලභිස්සාමීති දිබ්බචක්ඛුනා ඔලොකෙන්තො චූළගල්ලගාමෙ උපාසකස්ස ගෙහෙ පක්කා තරුණයාගුං අත්තනො පීතක්ඛණෙ යෙව සුඛං භවිස්සතීති ඤත්වා පාතොවු'ට්ඨාය සරීරපටිජග්ගනං කත්වා සංඝිකවත්තං කත්වා චෙතියංගණෙ බොධියංගණෙ වත්තං කත්වා පත්තචීවරමාදාය ආකාසං උල්ලංඝිත්වා චූළගල්ලගාමද්වාරෙ ඔතරිත්වා චීවරබෙන්තෙ ඨත්වා චීවරං පාරුපිත්වා පත්තමාදාය අන්තොගාමං පවිසිත්වා ඝරපටිපාටියා භික්ඛාය චරමානො ආසනසාලං පාවිසි. තස්මිං කාලෙ ආසනසාලා ජග්ගනකො උපාසකො තං ථෙරං දිස්වා "කින්නු ඛො භන්තෙ පාතොව අන්තොගාමං පවිට්ඨාසී"ති පුච්ඡි; ථෙරො අත්තනො යාගු අත්ථාය ආගතභාවං කථෙසි. උපාසකො "සාධු භන්තෙ, යාගුං පටිසම්පාදනකාලං ආගමයමානො මය්හං ආසනසාලාය නිසීදථී"ති ආහ. ථෙරො ච උපාසකස්ස කථං සුත්වා තස්ස හෙතුසම්පන්නභාවං ඔලොකෙත්වා "උපාසක, යාව යාගුපචනකාලො තාව තාවතිංසදෙවලොකං ගන්ත්වා චූළාමණිචෙතියං වන්දිත්වා ආගච්ඡාමී"ති ආහ. තතො උපාසකො "භන්තෙ අහං කථං ගමිස්සාමි, දෙවලොකං මාදිසෙන නාම ගන්තුං න සක්කා"ති ආහ. ථෙරො තස්ස කථං සුත්වා කෙවලං ත්වං ගන්තුකාමො අහං තං ආදාය ගමිස්සාමීති වත්වා තස්ස උපාස

1. රස. චූළගල්ල වත්ථුම්හි. 2. රස. වෙරියවිහාරෙ පටිවසති පධානඝරස්මිං (චූළගල්ලකවිහාරො ජජ්ජරනදියා සමීපෙ පතිට්ඨිතො එකො මහාවිහාරොති රසවාහිනියං වුත්තං

කස්ස අංසෙ අත්තනො නිසීදනචම්මං දත්වා ඨපෙත්වා අත්ත-
නො පච්ඡතො පච්ඡතො ආගමනං කත්වා අධිට්ඨාය ආකාසං
උල්ලංඝිත්වා තාවතිංසදෙවලොකං ගන්ත්වා චූලාමණිචෙතිය
ද්වාරෙ පතිට්ඨාසි තතො තෙසං ගන්ත්වා ඨිතසමනන්තර
මෙව මෙත්තෙය්‍යො පුණ්ණපාරමී චූලාමණිචෙතියං වන්දිස්සා-
මීති වත්වා ඡදෙවලොකෙ දෙවරාජානං ආදිං කත්වා දෙවගණ
පරිවුතො මෙත්තෙය්‍යො පුණ්ණපාරමී අනෙකබොධිසත්ත
පරිවාරො රතනචංගොටකෙන රතනචුණ්ණං රතනමාලං
රතනගන්ධං ගාහාපෙත්වා අනෙකකොටිසතසහස්ස—මණි
දණ්ඩකෙ දණ්ඩදීපං ජාලාපෙත්වා දිබ්බපාරිච්ඡත්තක-කොවි
ළාර-කණිකාර – කණවීර – චම්පක – නාග – පාටලි-මුචලින්ද-
කෙතක-පුන්නාග-පියංගු- තිලක – ජාතිසුමන – කොන්ද – වන
මාලී – කතවෙර – මධුගන්ධික – සින්ධුවාර – උප්පල – පදුම –
පුණ්ඩරීක – සොගන්ධික – නීලුප්පල – රත්තුප්පල – සෙතුප්ප
ලාදි – නානාවණ්ණ දිබ්බකුසුම – චන්දන – චුණ්ණාදි – අනෙක
විධ – විචිත්‍රධජපටාකායො ගාහාපෙත්වා මහානුභාවෙන
අත්තනො විමානා නික්ඛමි. අථ තස්මිං කාලෙ බොධිසත්තස්ස
පරිසාසු එකො දෙවපුත්තො එකෙකපස්සෙ තිගාවුත-තිගා
වුතෙ රජතඅලංකාරෙන ,අලංකත – මහාදෙවකායං පරිවා
රෙත්වා තිගාවුත – රජතයට්ඨියා රජතධජපතාකායො ගාහා
පෙත්වා තිගාවුත – රජතකුන්තියො උස්සාපෙත්වා තිගාවුත
රජතවණ්ණ – ඡත්තසහස්සං අත්තනො මත්ථකෙ ධාරෙත්වා
සයං රජතවණ්ණං වත්ථං පරිදහිත්වා රජතවණ්ණං විලෙපනං
ගණ්හිත්වා සෙතඅස්සයුත්තෙන සෙතරථෙ පතිට්ඨාය දෙවතානං
පරිවාරෙත්වා ආගච්ඡති. තං ආගච්ඡන්තං දෙවපුත්තං දිස්වා
උපාසකො මෙත්තෙය්‍යො නාම එසොති ථෙරං පුච්ඡි. තං
සුත්වා ථෙරො "උපාසක, න එසො මෙත්තෙය්‍යො පුණ්ණ
පාරමී; එසො ලංකාදීපෙ හත්ථිබන්ධවිහාරෙ භික්ඛාචාරකම්මාර
ගාමෙ එකො ගොපාලකො අඤ්ඤෙහි දාරකෙහි සද්ධිං දිවසං
ගාවො රක්ඛිත්වා සායං ගෙහං ආගමනකාලෙ සුපුප්ඵිතං
අඤ්ජනගුම්බං[1] දිස්වා තතො මාලං ඡින්දිත්වා වල්ලිකෙන

1. සෙ. අඤ්ජනගුම්බං, රස. සෙතකාලවල්ලිගුම්බං

කොඤ්චවට්ටියං ලග්ගෙත්වා අතිරේකං හිරෙ පවෙසෙත්වා එකංසං කත්වා ගවරක්ඛනදණ්ඩං ඛන්ධෙ ඨපෙත්වා උභොහි හත්ථෙහි දණ්ඩකෙ ගහෙත්වා ගායන්තො ගච්ඡති. අථ තස්මිං කාලෙ අන්තරාමග්ගෙ එකං වම්මිකං දිස්වා අත්තනො පිළන්ධිතමාලං සබ්බං ඔමුඤ්චිත්වා වම්මිකමත්ථකෙ පූජෙත්වා, තත්ථ උදකං සිඤ්චිත්වා වන්දිත්වා ගච්ඡන්තස්ස මග්ගාසන්නෙ අඤ්ඤතරස්මිං වම්මිකෙ නිබ්බත්තො[2] ආසිවිසො නික්ඛමිත්වා ඩසිත්වා මාරෙසි. සො තතො චුතො තස්ස නිස්සන්දෙන දෙවලොකෙ නිබ්බත්ති-ත්වා එවරූපං සම්පත්තිං පටිලභීති ආහ. උපාසකො තං සුත්වා "අහො කම්මස්ස විපාකො මහා වතා"ති සොමනස්ස ජාතො අහොසි.

තතො අඤ්ඤො දෙවපුත්තො උභො හත්ථපස්සෙ තිගාවුතෙ තිගාවුතෙ පවාළඵලකාවුධෙ ගහිත - දෙවපුත්තෙහි පරිවාරෙත්වා පවාළයට්ඨියා පවාළධජෙ උස්සාපෙත්වා තිගා-වුතෙ තිගාවුතෙ පවාළකූටෙන උස්සාපෙත්වා පවාළවණ්ණං වත්ථං පරිදහිත්වා පවාළවණ්ණ—විලෙපනං ගණ්හිත්වා පවාළවණ්ණ-සින්ධවයුත්තරථං ආරුය්හ පවාළවණ්ණ-ඡත්තං මත්ථකෙ ධාරයමානො දෙවසංඝපරිවුතො මහානුභාවෙන ආගච්ඡති. තං දිස්වා උපාසකො එසො මෙතෙනයොග්‍යා පුණ්ණපාරමීති පටිපුච්ඡි. "නෙසො උපාසක මෙතෙනයොග්‍යා; ලංකාදීපෙ වෙදිස්ස-විහාරෙ[3] භික්ඛාචාරගාමෙ එකො ගොපාලකො අඤ්ඤෙහි දාරකෙහි සද්ධිං ගාවො ජජ්ජර නදීසමීපං ඔතාරෙත්වා රතනමාලවතං පවිසිත්වා තතො මාලං ඡින්දිත්වා වාළුකථූපං කත්වා නානාවිධෙන පූජෙත්වා උදකං ආසිඤ්චිත්වා චිත්තං පසාදෙත්වා මත්ථකෙ සාඛාමණ්ඩපං කත්වා ගෙහෙ අගමාසි. තස්මිං යෙව රත්තියා උදරවාතාබාධෙන මරිත්වා එතස්ස කම්මස්ස නිස්සන්දෙන ඉමස්මිං දෙවලොකෙ නිබ්බත්තිත්වා එවරූපං සම්පත්තිං පටිලභීති කථෙසි. අථ අඤ්ඤො දෙවපුත්තො කඤ්චනඵලකගහිතෙහි[4] උභොපස්සෙ

2. (සබ්බෙසු) නිබ්බත්තිතො. 3. රස. චෙතියවිහාරාසන්නෙ (පුබ්බෙ වුත්ත වෙරිය විහාරාසන්නෙති මඤ්ඤාමි.) 4. (සබ්බෙසු) ගහිතෙ.

තිගාවුතෙ තිගාවුතෙ පරිවාරෙත්වා සබ්බකඤ්චනමයං ධජං සමන්තා තීණි ගාවුතානි උස්සපෙත්වා සබ්බකඤ්චනමයකුන්තො තිගාවුතෙ උස්සාපෙත්වා සයං කඤ්චනමයං වත්ථං පරිදහිත්වා කඤ්චනවණ්ණසින්ධවයුත්තෙන කඤ්චනමයරථෙ පතිට්ඨාය දෙවතාහි පරිවාරෙත්වා ආගච්ඡති; උපාසකො තම්පි දිස්වා ථෙරං පුච්ඡි ථෙරො "උපාසක මෙතෙනාභයො න හොති එසො; ලංකාදීපතලෙ ගංගාසන්නෙ තින්දුකගාමෙ එකො ගාමදාරකො පාතො වුට්ඨාය ගවං[5] ගංගාසන්නං ඔතාරෙත්වා විවරන්තො සුපුප්ඵිතං එකං කොසාතකිගුම්බං දිස්වා තතො පුප්ඵං විචිනිත්වා වාලුකාථූපං උස්සාපෙත්වා නානාවිධෙන මාලං පූජෙත්වා මත්ථකෙ මණ්ඩපං කත්වා උදකං ඔසිඤ්චිත්වා චිත්තං පසාදෙත්වා වන්දිත්වා ගතො. අථ සො පච්ඡා කාලංකත්වා එතස්ස කම්මස්ස නිස්සන්දෙන ඉමස්මිං දෙවලොකෙ නිබ්බත්තිත්වා එවරූපං සම්පත්තිං පටිලභතී"ති කථෙසි. අථ අඤ්ඤො දෙවපුත්තො මණිමයඵලකාය උභොහත්ථපස්සෙ තිගාවුතෙ තිගාවුතෙ අනුබන්ධං කත්වා පුන තිගාවුතෙ මණිධජං උස්සාපෙත්වා මණිකුන්තං පුරතො කත්වා සයං මණිවණ්ණවත්ථං පරිදහිත්වා මණිවණ්ණවිලෙපනං ගණ්හිත්වා මණිවණ්ණසින්ධවයුත්තෙන මණිවණ්ණරථෙ පතිට්ඨාය දෙවසංඝපරිවුතො මහානුභාවෙන ආගච්ඡති, තං දිස්වා උපාසකො තථෙව පුච්ඡි. ථෙරො "උපාසක, එසො ලංකාදීපෙ ලංකාපබ්බතපාදෙ[6] මහානිස්සගාමෙ එකො ගොපාලදාරකො අඤ්ඤෙහි දාරකෙහි සද්ධිං ගාවො ඔතාරෙත්වා පබ්බතපාදෙ විචරන්තො සුපුප්ඵිතං ගිරිකණ්ණිකමාලාව තං දිස්වා තතො මාලං ඔචිනිත්වා ආසන්නෙ කන්දරෙ වාළුකථූපං කත්වා වණ්ටෙන වණ්ටං පත්තෙන පත්තං සමං කත්වා නානාවිධෙන පූජෙත්වා උදකං ඔසිඤ්චිත්වා මත්ථකෙ මණ්ඩපං කත්වා සොමනස්සජාතො වන්දිත්වා අගමාසි. සො පච්ඡා කාලංකත්වා එතස්ස කම්මස්ස නිස්සන්දෙන ඉමස්මිං දෙවලොකෙ නිබ්බත්තිත්වා එවරූපං මහාසම්පත්තිං පටිලභතී"ති වත්වා අට්ඨාසි

---

5 (සබ්බෙසු) භවං. රස. ගොගණං. 6 (සබ්බෙසු;) ලංකාරපබ්බතපාදෙ

අථ අඤ්ඤො දෙවපුත්තො උභො හත්ථපස්සෙ තියොජනෙ තියොජනෙ ඨානෙ සත්තරතනමයං ඵලකපන්තිං පරිවාරෙත්වා පුරතො සත්තරතනමය-යට්ඨියා සත්තරතනමිස්සක දුස්සපටධජං ඔලම්බකං කත්වා තියොජනට්ඨානෙ සත්තරතනමයං කූටාගාරසහස්සං උස්සාපෙත්වා සත්තරතනමයං වත්ථං පරිදහිත්වා සත්තරතනමයපසාධනෙන පසාධිත්වා තියොජනට්ඨානෙ රතනවිතානං මත්ථකෙ ධාරයමානො සත්තරතනමය සින්ධවයුත්තෙන සත්තරතනමය-රථෙ පතිට්ඨාය සත්තරතනචුණ්ණං ගාහාපෙත්වා තාවතිංසදෙවලොකෙ තාවතිංසදෙවපරිසාතං අභිභවන්තො ආගච්ඡති. උපාසකො තං දිස්වා තථෙව පුච්ඡි. ථෙරො තස්ස එවං බ්‍යාකරොන්තො "උපාසක, එසො න මෙත්තෙය්‍යො; අථ සො ලංකාදීපෙ චිත්තලපබ්බතවිහාරස්ස භික්ඛාචාර — කප්පකන්දරගාමෙ සද්ධාසම්පන්නො සීලං රක්ඛමානො අඤ්ඤතරො පුරිසො තස්මිං ගාමෙ ආසනසාලං කාරාපෙසි. අඤ්ඤෙ මනුස්ස මහාගාමෙ සාලං කුරුමානෙ දිස්වා ඵලකං අදාසි; ගොපානසී දණ්ඩං ච අදාසි; වල්ලිමුට්ඨිකං ච අදාසි. අථ අඤ්ඤෙ මනුස්සෙ[7] පොක්ඛරණිං ඛණමානෙ දිස්වා තෙහි සද්ධිං තිණි චත්තාරි පංසුපිණ්ඩකානි ආදාය ඵලෙ ඔකිරි. අථ අඤ්ඤෙ මනුස්සෙ[7] බොධිමූලෙ පක්ඛිපියමානෙ දිස්වා තත්ථ පිණ්ඩං පක්ඛිපි. අථ එකස්ස ධම්මකථිකස්ස සන්තිකෙ ධම්මං සුත්වා තුට්ඨමානසො අත්තනො උත්තරසාටකං තස්ස අදාසි. තස්මිං ගාමෙ සෙතුකාරකෙ දිස්වා සෙතුපදරඛණ්ඩං අදාසි. ධම්මඝොසකො හුත්වා ධම්මසවණං ඝොසෙසි. ගණබන්ධො හුත්වා දානං අදාසි බුද්ධධම්මසංඝමාමකො හුත්වා පුඤ්ඤකම්මං අකාසි අථ පච්ඡා කාලංකත්වා ඉමස්මිං දෙවලොකෙ නිබ්බත්තිත්වා ආසනසාලානිස්සන්දෙන උබ්බෙධෙන සට්ඨියොජනං ආයාමෙන තිංසයොජනං අනෙක භූමිකං කඤ්චනවිමානං පටිලභි; පොක්ඛරණිනිස්සන්දෙන ආවාටතො එකසතඋදකධාරා සට්ඨියොජනං සතයොජනං ආකාසං උල්ලංඝිත්වා දෙවපුත්තස්ස මත්ථකෙන පරිවත්තෙත්වා

7. (සබ්බෙසු:) අඤ්ඤෙ මනුස්සා

සබ්බකාමදදෙ හුත්වා භූමියං පටිවසති. බොධියඞ්ගණෙ පිණ්ඩදානනිස්සන්දෙන අලඞ්කතදෙවපරිසා පටිලභි. සෙතුකරණට්ඨානෙ පදරදානනිස්සන්දෙන තිංසයොජනිකං[8] සහස්සසින්ධවයුත්තරථං පටිලභි. ධම්මඝොසිතනිස්සන්දෙන දෙවතානං අන්තරෙ උත්තරිතරො අහොසි. සීලරක්ඛිතනිස්සන්දෙන අච්ඡරාසහස්සකඤ්ඤායො පරිවාරෙසුං. ධම්මකථිකස්ස උත්තරිසාටකස්ස දින්නනිස්සන්දෙන බහු - අනෙකවිධ - කප්පරුක්ඛං අහොසි. එසො දෙවපුත්තො න මෙත්තෙය්‍යො උපාසකා"ති කථෙසි.

අථ තතො චතුරාසීති-මණි-කඤ්චන-ලොහිතඞ්ක-මසාරගල්ල - සත්තරතනමය - දසසහස්සකූටාගාරානි පුරතො කත්වා සත්තරතනමයං පුණ්ණඝටසහස්සං රත්තුප්පල-සෙතුප්පලානි කලාපං කත්වා මුඛවට්ටියං පවෙසෙත්වා චූළාමණිචෙතියෙ පූජනත්ථාය පත්ථිතො උග්ගච්ඡමානං විය ගාහාපෙත්වා තියොජනරතනඡත්තං මත්ථකෙ ධාරයමානො සත්තරතනමයං කිංකිණිකං වාදියන්තො කඤ්චනකාසිකවත්ථං මහාවිතානං සිරස්මිං ධාරයන්තො තියොජනික - සත්තරතනමයරථෙ පතිට්ඨාය දෙවගණපරිවුතො දිබ්බචන්දන - චුණ්ණානි ච නානාවිධකුසුමානි ච රතනවංගොටකෙන ගාහාපෙත්වා මෙත්තෙය්‍යො නාම පුණ්ණපාරමී බොධිසත්තො ඡදෙවලොකෙ දෙවතානං චක්ඛූනි අත්තනො දස්සනෙන අතිත්තං කත්වා සබ්බදෙවතාහි පරිවුතො පථවී-ආකාසං එකනින්නාදං කාරෙන්තො ආගච්ඡති. උපාසකො තං දිස්වා ථෙරං පුච්ඡි, ථෙරො එසො මෙත්තෙය්‍යො බොධිසත්තොති තං කථෙසි. අථ සො මෙත්තෙය්‍යො පුණ්ණපාරමී ථෙරං දිස්වා වෙගෙන රථා ඔරුය්හ පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා උට්ඨාය "භන්තෙ කෙන කම්මෙන ආගතොසී"ති? පුච්ඡි, ථෙරො තතො චූළාමණිචෙතියං[9] වන්දනත්ථාය ආගතම්හාති අවොච. අථ සො උපාසකො තස්ස පාදෙ උරෙන නිපජ්ජිත්වා ඨිතො. තතො මෙත්තෙය්‍යො තං "කතරගාමවාසිකො? කෙන

8 ඨ. තියොජනිකා, 9. චූළාමණියං (සබ්බෙසු)

කම්මෙන ආගතොසී"ති? පුච්ඡි, තතො ථෙරො, උපාසකස්ස අඛණ්ඩං කත්වා පඤ්චසීලරක්ඛණභාවඤ්ච ආසනසාලං ජග්ගනභාවඤ්ච කථෙසි. තතො මෙත්තෙය්‍යො උපාසකස්ස දිබ්බසාටකං දත්වා පටිසන්ථාරමකාසි. අථ ථෙරො උපාසකං ආදාය චූලගල්ලගාමං ආගන්ත්වා තස්ස ගෙහෙ එකාදසභාග යාගුං ගහෙත්වා ඵාසුකට්ඨානෙ නිසීදිත්වා පච්චවෙක්ඛිත්වා පරිභුඤ්ජි; තතො පරිභුත්තමත්තෙන බ්‍යාධි වූපසමිත්වා සුඛිතභාවං අහොසි. අථ සො සුඛිතො ආකාසං උල්ලංඝිත්වා චෙතියවිහාරං අගමාසි. තතො තස්මිං ගාමෙ බහුමනුස්සා උපාසකස්ස නිවත්ථසාටකං ඔලොකෙත්වා "උපාසක, ඉදං දිබ්බවත්ථං කුතො ලභි, ඉදං මනුස්සලොකෙ නත්ථී"ති පුච්ඡිංසු. අථ උපාසකො තං කාරණං විත්ථාරෙන සබ්බං කථෙසි. තං සුත්වා මහාජනො සද්ධාසම්පන්නො අහොසි. උපාසකො තතො සත්තමෙ දිවසෙ චවිත්වා තුසිතපුරෙ නිබ්බත්තීති.

චූලගල්ලඋපාසකස්ස වත්ථු දුතියං.

---

## 78. වෙණිසාලස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහලදීපෙ වෙණිසාලස්ස[1] පුත්තො තිස්සඅමච්චො නාම මහාගාමං අත්තනො භොගගාමං කත්වා පටිවසති. අථ තිස්සමහාවිහාරෙ අත්තනො කුලූපගථෙරස්ස සන්තිකෙ දක්ඛිණාවිභඞ්ගසුත්තන්තං සුත්වා මහාභික්ඛුසඞ්ඝස්ස දානං පවත්තෙමීති අග්ගභත්තං භික්ඛූනං අදත්වා න පරිභුත්තපුබ්බො. අථ සො අමච්චො අපරභාගෙ පච්චන්තජනපදවාසීමනුස්සානං ආගතකාලෙ තෙසං තහාතසජ්ජං කාරාපෙන්තො තං දිවසං අතික්කාමෙසි. තතො භික්ඛූ භුඤ්ජිත්වා විහාරං අගමංසු. තතො අමච්චගෙහෙ මනුස්සා අග්ගභත්තං ආහරිත්වා අමච්චස්ස පුරතො ඨපෙසුං. අමච්චො තං දිස්වා කෙන කාරණෙන "ඉදං අග්ගභත්තං භික්ඛූනං

1. සෝ. වෙණීයසාලස්ස, රස. පණ්ඩරංගස්ස

න දින්න''න්ති ආහ; මනුස්සා "සාමි, තයා පකතියා ආණත්ත-කාලෙ දස්සාම; ඉදානි ත්වං අග්ගභත්තං අසරිත්වා කාලං අතික්කාමෙසී''ති කථෙසුං. "තෙන හි සීඝං සමණසමණීනං දස්සථා''ති අවොච. "සාමි, ඉදානි විකාලො''ති ආහංසු. අම්බෙවා තෙසං කථං සුත්වා ඉමස්මිං කාලෙ භුඤ්ජනකො අත්ථීති පුච්ඡි. ඉමස්මිං කාලෙ නඞ්ගලභාවී-අන්තරසුසානෙ වසන්තො එකො පණ්ඩරඞ්ගො අත්ථි, තස්ස විකාලෙ භුඤ්ජනභාවං මනුස්සා ආරොචෙසුං. අම්බෙවා තං සුත්වා තෙන හි ඉමං භත්තං හරිත්වා තස්ස දෙථාති අවොච. මනුස්සා සාධූති භත්තං ආදාය පණ්ඩරඞ්ගස්ස වාපියා[2] බලිසෙන මච්ඡබන්ධනකාලෙ අගමංසු. අථ පණ්ඩරංගො තෙසං ආගමනසද්දං සුත්වා අත්තනා ගහිතමච්ඡෙ ච බලිසඤ්ච ඡඩ්ඩෙත්වා පාදෙන අක්කමිත්වා අට්ඨාසි. අථ භත්තං ගහෙත්වා ගතමනුස්සා පණ්ඩරඞ්ගස්ස තං කිරියං දිස්වා අත්තනා ආනීතභත්තං තස්ස අදත්වා අම්බවස්ස සන්තිකං අගමංසු. අම්බෙවා මනුස්සානං ආගතෙ දිස්වා තුම්හාකං දිස්වාව පණ්ඩරංගො කිං අකාසීති පුච්ඡි මනුස්සා පණ්ඩරඞ්ගෙන කතකිරියං කථෙසුං. අම්බෙවා තං සුත්වා තුට්ඨමානසො "තුම්හෙහි එවරූපස්ස හිරොත්තප්පසම්පන්නස්ස අදත්වා කස්ස දස්සථා''ති වත්වා පුන ගන්ත්වා භත්තං තස්සෙව දත්වා සෙව භත්තෙන නිමන්තෙථා''ති අවොච. මනුස්සා අම්බවස්ස කථං සුත්වා තථා අකංසු. අම්බෙවා පුනදිවසෙ පණ්ඩරඞ්ගස්ස මහාදානං අදාසි. අථ අපරභාගෙ අම්බෙවා මරණකාලෙ අත්තනා පණ්ඩරඞ්ගස්ස දින්නදානං අනුස්සරිත්වා තතො චුතො කාලතිස්සකවිහාරෙ[3] මහාසත්තපණ්ණිරුක්ඛෙ භුම්මදෙව-පුත්තො හුත්වා නිබ්බත්ති තස්ස නිබ්බත්තසමනන්තරමෙව නානාවිධානි ඛජ්ජක-භොජනානි අපරිමාණානි අහෙසුන්ති.

වෙණිසාලස්ස[1] වත්ථු තතියං.

---

1 සී ඃ ර ගාථයා 2 ... 3. කොධහිඥසාවිහාරෙ (සබ්බෙසු.) "කාල ... හාරෙ''ති රස වාහිනියං.

# 79. දුබ්බිටඨි-මහාතිස්ස-වත්ථුම්හි අත්ථුප්පත්ති.

ලඞ්කාදීපෙ මහෙලනගරෙ දුබ්බිටඨිමහාතිස්සො නාම පටිවසති. සො සද්ධාසම්පන්නො අහොසි. තස්ස ගෙහෙ එකදිවසං වප්පමඞ්ගලං අහොසි. තස්මිං යෙව දිවසෙ තස්ස ධාරණකො[1] එකො මනුස්සො අස්ස වප්පමඞ්ගලස්ස අන්තරායං කරිස්සාමීති අනුරාධපුරෙ අභයවිහාරෙ[2] ගන්ත්වා තිස්සදත්තත්ථෙරං වන්දිත්වා "භන්තෙ, සෙව පඤ්චසතෙ භික්ඛූ ආදාය දුබ්බිටඨිමහාතිස්සස්ස ගෙහං ආගමිස්සථා"ති නිමන්තෙත්වා අගමාසි. තතො පුනදිවසෙ දුබ්බිඨිමහාතිස්සො වප්පමඞ්ගලත්ථාය ඛෙත්තං අගමාසි. අථ ථෙරො පාතො වුට්ඨාය සරීරපටිජග්ගනං කත්වා පඤ්චසතෙ භික්ඛූ ආදාය දුබ්බිටඨිමහාතිස්සස්ස ගෙහද්වාරං සම්පාපුණි. තතො දුබ්බිටඨිමහාතිස්සස්ස භරියා ථෙරං දිස්වා සොමනස්සජාතා ථෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා සබ්බෙ භික්ඛූ ගෙහෙ නිසීදාපෙත්වා වන්දමානා අට්ඨාසි. ථෙරො "මහාඋපාසිකෙ, තව ගෙහෙ මහාපපඤ්චො විය ඛායතී"ති ආහ. අථ සා ථෙරස්ස කථං සුත්වා "තුම්හෙ මා ගච්ඡථා"ති ආහ. අථ උපාසිකා ගන්ත්වා "භන්තෙ, ඉදං භත්තං සකදරකානං පටියත්තමත්තං; දිවා තුම්හාකං භත්තං පටියාදෙමී"ති වත්වා පුන නානග්ගරසෙන භත්තං පටියාදෙතුං ආරභි. අථ දුබ්බඨිමහාතිස්සො කම්මන්තා ගෙහං ආගන්ත්වා ථෙරං දිස්වා සොමනස්සජාතො වන්දිත්වා එකමන්තං අට්ඨාසි. තස්මිං කාලෙ ථෙරො "උපාසක, තව ගෙහෙ වප්පමහලභාවං ජානිත්වා නාගතම්හ. අථ ඛො තයා පෙසිතමනුස්සෙන නිමන්තිතෙන ආගතම්හා"ති ආහ. තතො උපාසකො ථෙරස්ස කථං සුත්වා "අහො, මම ධාරණකො මනුස්සො මය්හං වප්පමංගලන්තරායං කරිස්සාමීති අකාසීති ජානිත්වා සො මය්හං වප්පමඞ්ගලස්ස අන්තරායං කරෙන්තො තුම්හාදිසානං

1. රස. ඉණසන්ධාරකො. 2. රස. අභයුත්තරවිහාරං.

සප්පුරිසානං මම ගෙහං ආගතභාවං අකාසි. තං පුරිසං නිස්සාය ඉමං පටිලාභං අලභින්ති වත්වා "සො අජ්ජතො පට්ඨාය මම සහායො"ති වත්වා තෙන සද්ධිං මිත්තසන්ථවං කත්වා තං ධාරණකං කහාපණෙ ලිඛිත-පණ්ණං ඵාලෙත්වා ඡඩ්ඩෙසි. අථ තෙ තතො පට්ඨාය මිත්තධම්මං යාවජීවං අභින්දිත්වා යථාකම්මං ගතාති.

**දුබ්බිධිමහාතිස්සස්ස වත්ථු චතුත්ථං.**

---

## 80. තිස්සදහරසාමණේරස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහළදීපෙ තිස්ස-දහරසාමණේරො නාම මහාගාමෙ තිස්සමහාවිහාරෙ වසන්තො අනුපුබ්බෙන ජනපදචාරිකං චරන්තො පුරත්ථිමපස්සෙ පානවාපිගාමෙ[2] භික්ඛං චරන්තො නවසප්පිනා භත්තං පටිලභිත්වා ගාමද්වාරෙ ඨිතො එකං මනුස්සං උදකඵාසුකට්ඨානං පුච්ඡි. අථ සො මනුස්සො "භන්තෙ කත්ථ ගමිස්සථා"ති ආහ. සාමණේරො උපාසක මහාගාමං ගමිස්සාමීති ආහ. උපාසකො "භන්තෙ, තුම්හාකං පුරතො ගමනමග්ගෙ කකුධකන්දරං[3] නාම අත්ථි; තත්ථ උදකඵාසුකට්ඨානං නාම රමණීයං අත්ථි; ගච්ඡාහී"ති ආහ. සො සාමණේරො සාධූති වත්වා භත්තමාදාය කකුධබන්ධනදිං ගන්ත්වා උදකඵාසුකට්ඨානෙ නිසීදිත්වා භත්තං භුඤ්ජිතුං ආරභි. තස්මිං කාලෙ එකෙන මනුස්සෙන සද්ධිං ගතා අරඤ්ඤෙ එකා සුනඛී කන්දරට්ඨානෙ විජායිත්වා දාරකෙ පුරතො කත්වා නිපන්නා අහොසි. අථ සා භත්තගන්ධං ඝායිත්වා නිපන්නට්ඨානතො උට්ඨාය ගච්ඡන්තී සාමණේරස්ස සන්තිකං ගන්ත්වා එකමන්තෙ අට්ඨාසි. තතො සාමණේරො

1 රසවාහිනියං "කුණ්ඩලියා වත්ථු"ති දිස්සති. 2. රස. පාසාණවාපිගාමෙ. 3. රස සානුබන්ධකන්දරං.

අත්තනො භුඤ්ජනත්ථාය උපට්ඨිතං පඨමං භත්තපිණ්ඩං තස්සා සුනඛියා කාරුඤ්ඤං කත්වා තස්සා පුරතො ඨපෙසි. තතො සා සොමනස්සා හුත්වා භුඤ්ජිතුං ආරභි. අථ සාමණෙරො තාය තුට්ඨමානසා හුත්වා භුඤ්ජමානං දිස්වා සයං අභුඤ්ජිත්වා පුනප්පුනං ඔකිරිත්වා තස්සා යෙව භොජෙත්වා උට්ඨාය පත්තං පටිසාමෙත්වා ආදාය අගමාසි. තතො සුනඛී ථෙරස්ස පසන්නචිත්තා න චිරෙනෙව කාලංකත්වා ජම්බුදීපෙ දෙවපුත්තනගරෙ රඤ්ඤං[4] පටිච්ච අග්ගමහෙසියා කුච්ඡිස්මිං[5] පටිසන්ධිං ගණ්හිත්වා දසමාසච්චයෙන මාතුකුච්ඡිතො නික්ඛන්තා සිඛාමඞ්ගලදිවසෙ **කුණ්ඩලා** නාම අහොසි. අථ අපරභාගෙ සො දහරතිස්සසාමණෙරො මහාබොධිං වන්දිස්සාමීති නාවං අභිරුය්හ පරතීරං ගන්ත්වා අනුපුබ්බෙන විචරන්තො දෙවපුත්තනගරං භික්ඛාචාරත්ථාය පාවිසි. තදා රාජධීතා සීහපඤ්ජරං විවරිත්වා රාජවීථිං ඔලොකෙන්තී සාමණෙරං අන්තොවීථියා භික්ඛාචාරං[6] දිස්වා පුබ්බසිනෙහං පටිලභිත්වා ජාතිස්සරඤාණෙන උප්පන්නජාතිං[7] අනුස්සරිත්වා සාමණෙරෙන අත්තනො කතකම්මං දිස්වා සාමණෙරං පක්කොසාපෙත්වා රාජගෙහෙ නිසීදාපෙත්වා නානග්ගරස භොජනං භොජෙත්වා භත්තකිච්චාවසානෙ එකමන්තං නිසීද-පෙත්වා සාමණෙරෙන සද්ධිං සල්ලපන්තී "මං ජානාථා"ති ආහ. සාමණෙරො "න ජානාමී"ති අවොච. තතො "භන්තෙ සීහලදීපෙ කකුධබන්ධනදියා[8] නිසීදිත්වා තුම්හාකං භුඤ්ජනකාලෙ එකාය සුනඛියා භත්තං දින්නභාවං ජානිස්සථා"ති පුච්ඡිත්වා තදා සා හසන්තී සබ්බං විත්ථාරෙන කථෙත්වා සාමණෙරස්ස ඤාතකාලෙ[9] "භන්තෙ, මම අනුග්ගහං පටිච්ච ඉමස්මිං යෙව නගරෙ වසථා"ති පටිඤ්ඤං ගහෙත්වා තස්ස විහාරං කාරාපෙත්වා තත්ථ මහාභික්ඛුසංඝස්ස මහාදානං අදාසි. චතුපච්චයෙන සුලභං කත්වා වසාපෙසි. අථ සාමණෙරො සුනඛියා දින්නදානං අනුස්සරිත්වා සොමනස්සං උප්පාදෙත්වා

---

4. සෙ. රඤ්ඤො. 5. රූ. පොත්ථකෙ නත්ථි. 6. "භික්ඛාය චරන්තං" ති භවිතබ්බං. 7. "පුබ්බජාතිං"ති යුත්තතරං. 8. බී 1. බී 2. කකුබන්ධනදියා. 9 (සබ්බෙසු) සඤ්ජාතකාලෙ.

උප්පන්න-පීතිං ඛයතො සම්මසිත්වා අරහත්තං පත්වා තස්මිං යෙව විහාරෙ වසිත්වා ආයුපරියොසානෙ තත්ථෙව පරිනිබ්බායීති.

**තිස්සදහර-සාමණෙරස්ස වත්ථු පඨමං.**

---

## 81. II. තිස්ස (දහර) සාමණෙරස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහළදීපෙ උත්තරපච්ඡියං නාගවිහාරෙ වසන්තො තිස්ස දහරසාමණෙරො නාම හත්ථසාරධනං විස්සජ්ජෙත්වා භික්ඛු-සඞ්ඝස්ස මහාදානං දාපෙසි. අථ සයං යාගු භුත්තකාලෙ[1] ගන්ත්වා මහාමග්ගෙ ඕතො ච ඉතො ච ගච්ඡන්තෙ භික්ඛූ දිස්වා "භන්තෙ ඉමස්මිං විහාරෙ යාගුභත්තං පණීතන්ති" කථෙසි. ආගන්තුක-භික්ඛූනං සක්කච්චං වත්ත-පටිවත්තං කරොති. අථ අපරභාගෙ භික්ඛුසඞ්ඝස්ස පසන්නචිත්තොතෙව කාලකිරියං කත්වා තස්මිං විහාරසාමන්තෙ යෙව එකස්මිං මහානිග්‍රොධරුක්ඛෙ භුම්මදෙවො හුත්වා නිබ්බත්ති. සො මහානුභාවො නාමෙන තිස්සො නාම අහොසි. තස්ස දිබ්බන්නපානං ගහෙත්වා සීතදෙවපුත්තා පඤ්චයොජනමත්තකෙ ඨානෙ පත්ථරමානා අහෙසුං. අථෙක-දිවසං සට්ඨිමත්තා භික්ඛූ තස්මිං විහාරෙ ධූරගාමෙ භික්ඛාය චරිත්වා කිඤ්චි අලභිත්වා යථාධොතෙන පත්තෙන නික්ඛමිත්වා ආගච්ඡන්ති. අථ සො දෙවපුත්තො තෙ භික්ඛූ භික්ඛං අලභිත්වා ගච්ඡන්තෙ දිස්වා "අහං පුබ්බෙ අඩ්ඪදසං සන්තකං අපරිභාපෙත්වා පරිනාමෙත්වා දින්නභාවෙන ඉමං සම්පත්තිං පටිලභිං; ඉදානාහං මම සන්තකං භික්ඛූනං දස්සාමී"ති චින්තෙත්වා අත්තනො දෙවධීතාය සද්ධිං මන්තෙත්වා තාය සද්ධිං තෙසං සට්ඨිමත්තානං භික්ඛූනං සන්තිකං ගන්ත්වා පඤ්චපතිට්ඨිතෙන භික්ඛූනං වන්දිත්වා සඞ්ඝත්ථෙරස්ස හත්ථතො

1. කෝ. යාගුභත්තකාලෙ

පත්තං ගහෙත්වා භික්ඛූ ආදාය පබ්බතාභිමුඛො ගච්ඡති. අථ තෙ භික්ඛූ "ආවුසො උපාසක, ඉමස්මිං පබ්බතෙ මනුස්සවාසො නත්ථි; තස්මා අම්හ ගහෙත්වා පබ්බතං ගච්ඡසී"ති ආහංසු. එවං වුත්තෙ දෙවපුත්තො "භන්තෙ, අම්හාකං නිවාසගාමො එතස්මිං"ති වත්වා තෙ භික්ඛූ ආදාය ගන්ත්වා අත්තනො විමානෙ නිසීදාපෙත්වා දිබ්බන්නපානං ආහරථාති අත්තනො දෙවපුත්තෙ ආණාපෙසි. තතො දෙවපුත්තා දිබ්බන්නපානං ගහෙත්වා පඤ්චයොජනෙ පත්ථරිත්වා දිබ්බන්නපානං ගහෙත්වා ආගච්ඡන්ති. අථ තස්මිං කාලෙ අරිට්ඨපබ්බතෙ වසන්තො මහාසුමනදෙවපුත්තො නාම අත්තනො දහරපරිවාරකෙ ගහෙත්වා නාගදීපෙ රාජායතනචෙතියං වන්දිස්සාමීති ආගච්ඡන්තො අන්තරාමග්ගෙ තෙසං දෙවපුත්තානං පඤ්චයොජනෙ පත්ථරිත්වා දිබ්බන්නපානං ගහෙත්වා ආගච්ඡන්තෙ දිස්වා "කස්ස ඉමං පණ්ණාකාරං හරිස්සථා"ති පුච්ඡි. අථ දෙවපුත්තා "නාගවිහාරෙ තිස්සදෙවපුත්තස්ස හරිස්සාමා"ති ආහංසු. තං සුත්වා මහාසුමනදෙවපුත්තො අත්තනො ච දිබ්බන්නපානං ගහෙත්වා තෙහි යෙව සද්ධිං තිස්සදෙවපුත්තස්ස සන්තිකං ගන්ත්වා තෙන සද්ධිං පටිසන්ථාරං කත්වා භික්ඛූනං වන්දිත්වා එකමන්තං නිසීදි. අථ තෙ උභොපි දෙවපුත්තා භික්ඛූනං මහාදානං අදංසු. අථ තෙ භික්ඛූ තිස්සදෙවපුත්තස්ස පුබ්බෙ කතකම්මං පුච්ඡිංසු. තතො දෙවපුත්තො අත්තනො නාගවිහාරෙ වසනකාලෙ කතකම්මං කථෙසි. අථ භික්ඛූ "තිස්ස, ඉමං සම්පත්තිං කිත්තකං කාලං අනුභොසී"ති පුච්ඡිංසු. තතො දෙවපුත්තො "භන්තෙ, කිං වදෙථ, අහං ඉමිස්සා සම්පත්තියා අවසානකොටිං න පස්සාමී"ති ආහ අථ තෙ භික්ඛූ තිස්සස්ස කථං සුත්වා අත්තනො ගතගතට්ඨානෙ දෙවපුත්තස්ස කතකම්මං වත්වා බහුමනුස්සෙ දානෙ නියොජෙසුන්ති.

තිස්ස [දහර] සාමණෙරස්ස වත්ථු ඡට්ඨං.

# 82. ගොළඋපාසකස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහළදීපෙ ගොළසමුද්දකවෙජ්ජ[1] ගොළගාමෙ එකො උපාසකො [නාම] අහොසි. සො එකදිවසං පාතොව නික්ඛමිත්වා සමුද්දන්තං ඔලොකෙන්තො විචරති. තස්මිං කාලෙ පියඞ්ගුදීපවාසී ද්වාදසමත්තා භික්ඛූ සමුද්දපිට්ඨෙන ආකාසතො ආගච්ඡන්ති. සො ථෙරෙ දිස්වා සොමනස්සජාතො භික්ඛූනං චීවරං පාරුපනට්ඨානං ගන්ත්වා "භන්තෙ ඉමස්මිං ගාමෙ අසුකවීථියා භික්ඛාය චරිතුං[2] ඵාසුක"න්ති වත්වා සයං පඨමතරං ගෙහං ගන්ත්වා ආසනානි පටියාදෙත්වා ඨිතො භික්ඛූනං අත්තනො ගෙහද්වාරං ආගතකාලෙ හත්ථතො පත්තං ගහෙත්වා ආසනෙ නිසීදාපෙත්වා භොජෙසි. තතො භත්තකිච්චං නිට්ඨිතකාලෙ එකමන්තං නිසින්නො "භන්තෙ, ඉමිනා නියාමෙන භික්ඛං දස්සාමි; නිබද්ධං ආගමිස්සථා"ති ආහ. සමණා තං සුත්වා න ඉච්ඡිංසු. තතො උපාසකො "තෙන හි අට්ඨසලාකභත්තං තුම්හාකං දස්සාමී"ති ආහ. අථ භික්ඛූ ධුරවිහාරෙ භික්ඛුසංඝස්ස දෙහීති අවොචුං. තං සුත්වා උපාසකො "අහං භන්තෙ තුම්හාකං නිවාසවිහාරෙ දස්සාමී"ති වත්වා තෙසං තුණ්හීභාවෙන අධිවාසිතකාලෙ අට්ඨ-සලාකභත්තං අත්තනො නාමෙන සලාකං භින්දිත්වා[3] තෙසං භික්ඛූනං අදාසි. අථ තෙ භික්ඛූ සලාකං ආදාය පියඞ්ගුදීපං ගන්ත්වා නිබද්ධං වස්සග්ගෙන භත්තං පාපෙත්වා අට්ඨසමණෙ පයොජනං අකංසු. තතො පට්ඨාය නිබද්ධං ආගන්ත්වා අට්ඨ සමණා භත්තං ගණ්හන්ති. අථ එකදිවසං සො උපාසකො අත්තනො මාතුගාමං පක්කොසිත්වා "භද්දෙ භික්ඛූනං වසනට්ඨානං මා පුච්ඡාහී"ති වත්වා සයං අත්තනො කම්මන්තජග්ගනට්ඨානං ගච්ඡන්තො සලාකභත්තං අප්පමාදා හුත්වා දෙහීති වත්වා කම්මන්තං අගමාසි. අථ උපාසකස්ස භරියා අත්තනො සාමිකස්ස වචනං අකත්වා භික්ඛූනං භත්තං

---

1. ගොළසමුද්දකුච්ජ (සබ්බෙසු.) රස. ගොඨසමුද්දතීරෙ.
2. (සබ්බෙසු.) භික්ඛාචරිතුං. 3. ඨ. රස. ජින්දිත්වා.

දත්වා ඨිතා "භන්තෙ කත්ථ වාසිකා? ඉදානි කත්ථ ගමිස්ස-ථා"ති පුච්ඡි. තතො භික්ඛූ අත්තනො වසනට්ඨානං අවත්වා අගමිංසු. පුනදිවසෙ භික්ඛූ අම්හාකං වසනට්ඨානං පුච්ඡතීති භත්තං ගණ්හනත්ථාය න ආගමිංසු. අථ උපාසකො කම්මන්තා ආගන්ත්වා පුනදිවසෙ සමණානං අනාගතකාරණං ජානිත්වා අත්තනො භරියාය පරිභාසිත්වා දොමනස්සජාතො අහොසි. අථ භික්ඛූ උපාසකස්ස අනුකම්පං පටිච්ච සලාකභත්තං ගණ්හනත්ථාය ආගමිංසු. තතො පට්ඨාය උපාසකො සලාකභත්තං දදන්තො විදෙසං ගන්ත්වා වාණිජකම්මභණ්ඩං ආහරිස්සාමීති ගෙහජනෙ සලාකභත්තං පටියාදෙත්වා සයං නාවං ආරුය්හ සමුද්දපිට්ඨෙන ගච්ඡති. අථ සා නාවා සමුද්දපිට්ඨෙ උදකෙන පූරිත්වා අවසීදති. අවසෙසමනුස්සා තස්මිං යෙව ඨානෙ මතා. සො උපාසකො උදකං තරිතුං ආරභි. අථ පියඞ්ගුදීපෙ භික්ඛූනං අන්තරෙ සංඝත්ථෙරො තං උපාසකං සමුද්දෙපිට්ඨෙ සීදන්තං දිස්වා "ආවුසො තුම්හාකං උපාසකො සමුද්දපිට්ඨෙ සීදතී"ති වත්වා සාමණෙරං පක්කොසිත්වා "සාමණෙර, තුම්හාකං උපාසකො මහාසමුද්දෙ සීදති; එතස්ස උපකාරං කාතුං වට්ටතී"ති ආහ. තං සුත්වා සාමණෙරො ආකාසෙනාගන්ත්වා උපාසකං ආනෙත්වා භොජන-සාලාය[4] නිසීදාපෙසි. අථ තස්මිං කාලෙ සක්කො දෙවරාජා භික්ඛූනං උපට්ඨානත්ථාය අගමාසි. තදා උපාසකො දෙවරාජං දිස්වා භීතො භොජනසාලද්වාරං ථකෙත්වා අග්ගලං අදාසි. අථ සාමණෙරො ද්වාරෙ ඨිතො අහොසි. තස්මිං කාලෙ දෙවින්දො සාමණෙරස්ස සන්තිකං ගන්ත්වා පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා එකමන්තං අට්ඨාසි. තතො සාමණෙරො "මහාරාජ, ගොළඋපාසකං පස්සසී"ති වත්වා උපාසකං පක්කොසිත්වා දෙවානමින්දස්ස දස්සෙසි. අථ සක්කො උපාසකං දිස්වා පටිසන්ථාරං කත්වා "උපාසක, තව දානෙ අප්පමාදභාවං සකලදෙවලොකෙ පාකට"න්ති වත්වා සාමණෙරං ආමන්තෙත්වා "භන්තෙ, අයං උපාසකො ඉමං ඨානං කස්මා ආගතො"ති ආහ. තතො සාමණෙරො "මහාරාජ, අයං උපාසකො

4. සී 2. භොජනසාලෙ.

භික්ඛුසංඝස්ස අතිවිය උපකාරො; තං මහාසමුද්දෙ නාවං භින්දිත්වා[5] සීදන්තං ඉධානෙසිං”ති ආහ. සක්කො තං සුත්වා විස්සකම්මදෙවපුත්තං ආමන්තෙත්වා “ඉමං උපාසකං තයො නිම්මිතනාවාය ආරොපෙත්වා තස්ස ගෙහෙ පතිට්ඨාපෙහී”ති අවොච. අථ විස්සකම්මදෙවපුත්තො[6] සක්කස්ස වචනං සුත්වා සාධූති තං උපාසකං ආදාය සමුද්දමජ්ඣෙ ගන්ත්වා “උපාසක, තව නාවා කතරස්මිං පදෙසෙ අවසීදතී”ති පුච්ඡි. උපාසකො අත්තනො නාවාය සීදනට්ඨානං දස්සෙසි. තතො විස්සකම්මදෙවපුත්තො තං ඨානං ඔලොකෙසි. තස්මිං ඛණෙ යෙව නාවා උට්ඨාය උදකපිට්ඨෙ අට්ඨාසි. තතො විස්සකම්ම දෙවපුත්තො නාවං සත්තහි රතනෙහි පූරෙත්වා උපාසකං නාවං ආරොපෙත්වා නාවං විස්සජ්ජෙසි. තතො නාවා එක වෙගෙන ගන්ත්වා උපාසකස්ස ගෙහෙ පාකටො අහොසි. තං දිස්වා මහාජනො බහුකුසලකම්මං කත්වා පරියොසානෙ සග්ගෙ නිබ්බත්තන්තීති.

**ගොල-උපාසකස්ස වත්ථු සත්තමං.**

---

## 83. කුසලකම්මකත-මනුස්සස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

අතීතෙ කස්සපදසබලස්ස කාලෙ උච්ඡුයන්ත-කත-කම්මෙන ජීවන්තො එකො මනුස්සො එකං ගිලානභික්ඛුං දිස්වා තස්ස ගුළපිණ්ඩං අදාසි. පුන එකස්ස සප්පිඋළුංකං අදාසි. එකදිවසං එකස්ස සුනඛස්ස භත්තපිණ්ඩං අදාසි. එකස්ස ඉණට්ඨකස්ස භික්ඛුනො කහාපණං අදාසි. එකස්ස ධම්මකථිකස්ස භික්ඛුනො සාටකං අදාසි. අථ අපරභාගෙ කාලං කත්වා දෙවලොකෙ නිබ්බත්තො තත්ථ මහාසම්පත්තිං අනුභවිත්වා අම්හාකං සත්ථුනො උප්පන්නකාලෙ දෙවලොකා චවිත්වා සාවත්ථියං මහාධනකුලෙ නිබ්බත්තිත්වා පච්ඡා සරා-

5 “භිජ්ජිත්වා” ති භවිතබ්බ.. 6. ඊ. (සබ්බත්ථ) විස්සුකම්ම

වාසෙ ආදීනවං දිස්වා ඝරා නික්ඛම්ම පබ්බජිත්වා නචිරස්සෙව
අරහත්තං පාපුණි. අපරභාගෙ සත්ථාරං වන්දිත්වා පඤ්චසතෙ
භික්ඛූ ආදාය උග්ගනගරං අගමාසි. තත්ථ උග්ගනගරෙ
සෙට්ඨිස්ස ධීතා සුමනා නාම ථෙරං පඤ්චසතෙහි භික්ඛූහි
සද්ධිං භික්ඛාය චරන්තං දිස්වා පසන්නචිත්තා හුත්වා ථෙරං
නිමන්තෙත්වා පඤ්චසතකූටාගාරං කාරාපෙත්වා තෙසං භික්ඛූනං
තෙසු කූටාගාරෙසු වසාපෙත්වා නිබද්ධං චතූහි පච්චයෙහි
පූජං අකාසි. ථෙරො සෙට්ඨිධීතාය පඤ්චසු සීලෙසු පතිට්ඨා
පෙත්වා තත්ථ තත්ථ යථාභිරන්තං විහරිත්වා අඤ්ඤත්ථ ගන්තු-
කාමො අනුපුබ්බෙන විචරන්තො නාවං අභිරුය්හ සමුද්ද
පිට්ඨෙන ගච්ඡති. තස්මිං කාලෙ ථෙරස්ස උදරවාතො චලි.
තතො භික්ඛූ "තුම්හාකං කීදිසං පරිභුත්තකාලෙ ඵාසු
හොතී"ති ආහංසු. ථෙරො තෙසං භික්ඛූනං කථං සුත්වා
"ආවුසො පුරිමස්මිං කාලෙ උළුංකමත්තෙන සප්පිනා සත්ත-
වස්සං ඵාසු හොතී"ති ආහ. තං සුත්වා භික්ඛූ භන්තෙ
සමුද්දපිට්ඨෙන ගමනභාවෙන කුතො ලභිස්සාමාති වත්වා
අධිවාසෙහීති අවොචුං. තතො ථෙරො තෙසං කථං සුත්වා
තෙන හි ආවුසො මම පත්තං ගහෙත්වා සමුද්දතො උදකං
උද්ධරිත්වා ආනෙථාති අවොච. භික්ඛූ ථෙරස්ස කථං සුත්වා
පත්තං ගහෙත්වා උදකං උද්ධරිංසු. අථ තෙසං උද්ධටමත්තෙව
උදකං පරිවත්තිත්වා සප්පි අහොසි තං දිස්වා භික්ඛූ ථෙරස්ස
උපනාමෙසුං. ථෙරෙ සප්පිං ගහෙත්වා පිවිතක්ඛණෙ යෙව
බ්‍යාධි වූපසමිත්වා අනුප්පත්තිභාවං අගමාසි. අථ භික්ඛූ තං
පාටිහාරියං දිස්වා අච්ඡරියබ්භුතජාතා අහෙසුං. ථෙරො
භික්ඛූනං විම්හයජාතෙ දිස්වා "ආවුසො මම පුඤ්ඤං පස්ස-
ථා"ති වත්වා සමුද්දං ඔලොකෙසි. තතො චක්ඛුපථෙ සමුද්දෙ
උදකං පරිවත්තිත්වා සප්පි අහොසි. තං භික්ඛූ දිස්වා අතිවිය
අච්ඡරියජාතා "භන්තෙ, අඤ්ඤං පි තෙ පුඤ්ඤං අත්ථී"ති
පුච්ඡිංසු. ථෙරො ආවුසො කිං කථෙථාති වත්වා චක්ඛුදස්සනෙ
භත්තභාජනානි දස්සෙසි. තතො හිමවන්තං ඔලොකෙසි.
චක්ඛුපථෙ සකලවනසණ්ඩං නානාවිධවිචිත්‍රසාටකෙන පරි
පුණ්ණං අහොසි. තතො සකලපබ්බතං සත්තරතනමයං

අහොසි. තතො හිමවන්තෙ පාසාණං ඔලොකෙසි. තතො[1] ඔලොකිතක්ඛණෙ සමන්තා පාසාණා ගුළපිණ්ඩානි අහෙසුං. භික්ඛූ පාටිහාරියං දිස්වා "භන්තෙ ඉමං පාටිහාරියං අතිවිය අබ්භුතං. පුබ්බෙ කීදිසෙන කම්මෙන එතං ජාත"න්ති පුච්ඡිංසු. ථෙරො අත්තනො කතකම්මං විත්ථාරෙන කථෙසි. තං සුත්වා මහාජනො බහුං දානාදිකුසලකම්මං කත්වා සග්ගෙ නිබ්බත්තන්තීති.

**කුසලකම්මකතමනුස්සස්ස වත්ථු අට්ඨමං.**

---

## 84. කපණමනුස්සස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

බාරාණසියං එකො දුග්ගතමනුස්සො පරගෙහෙ භතිං කත්වා ජීවන්තො මහාජනෙන ච ධනකුටුම්බිකෙන ච භික්ඛුසඞ්ඝස්ස දානං දීයමානං දිස්වා සයං පි දානං දාතුකාමො හුත්වා මාසෙ මාසෙ භික්ඛාචරියාය තිලතණ්ඩුලෙ සංහරිත්වා මණ්ඩපං[2] කත්වා තස්මිං නිසීදාපෙත්වා භික්ඛුසංඝස්ස පායාසදානං අදාසි. තතො පච්ඡා මරණකාලෙ තං දානං අනුස්සරිත්වා තතො චුතො දෙවලොකෙ කනකවිමානෙ නිබ්බත්ති. තස්ස තිගාවුතං පඤ්චඞ්ගතුරියමණ්ඩලං අහොසි. අච්ඡරාසහස්ස-දෙවධීතායො පරිවාරා අහෙසුං. අථෙකදිවසං සුවණ්ණසෙල මහාවිහාරවාසී මහාසංඝරක්ඛිතත්ථෙරො දෙවලොකං චාරිකං චරන්තො තං දෙවපුත්තං අතිවිය මහාසම්පත්තියා සොභමානං දිස්වා තස්ස පුබ්බකම්මං පුච්ඡි. තතො දෙවපුත්තො අත්තනො කතකම්මං විත්ථාරෙන කථෙසි. තං සුත්වා ථෙරො මනුස්සලොකං ආගන්ත්වා මහාජනස්ස කථෙසි. තං සුත්වා මහාජනො බහුකුසලකම්මං කත්වා සග්ගෙ නිබ්බත්තන්තීති.

**කපණමනුස්සස්ස වත්ථු නවමං.**

---

1 "තෙන" ඉති භවිතබ්බං. 2. මණ්ඩලං.

## 85. ඵරාමණිමාතුගාමස්ස[1] වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහළදීපෙ රොහණජනපදෙ කප්පකන්දරනදියාසන්නෙ[2] ඵරාමණි නාම ගාමො අත්ථි තස්මිං ගාමෙ එකා ඉත්ථි අත්තනො කෙනචිදෙව කරණීයෙන අනුරාධපුරං ගමිස්සාමීති පුටභත්තං ආදාය නික්ඛමිත්වා ගච්ඡති. අන්තරාමග්ගෙ එකං ඛීණාසවත්ථෙරං දිස්වා තස්ස හත්ථතො පත්තං ගහෙත්වා භත්තං ඔකිරිත්වා "භන්තෙ ඉධෙව ආගමෙථා"ති වත්වා සයං කන්දරං ඔතරිත්වා සාටකං පරිදහිත්වා අත්තනො නිවාසනං ධොවිත්වා ථෙරස්ස අදාසි. ථෙරො අයං මං පස්සතූති අධිට්ඨාය ආකාසං උප්පතිත්වා අගමාසි. සා ථෙරං ආකාසෙන ගච්ඡන්තං දිස්වා පසන්නචිත්තා වන්දමානා අට්ඨාසි. තස්මිං කාලෙ කන්දරාය ආසන්නරුක්ඛෙ නිබ්බත්තදෙවපුත්තො එකස්මිං සමුග්ගෙ සාටකං නික්ඛිපිත්වා මාතුගාමස්ස හත්ථෙ ඨපෙසි. තතො මාතුගාමො සමුග්ගං විවරිත්වා සාටකං දිස්වා කාලං ඝොසෙසි. අථ තස්මිං ඛණෙ අරියාකරවිහාරවාසී[3] ද්වාදස-සහස්සභික්ඛූ ආගන්ත්වා පුරතො අට්ඨංසු. තෙ භික්ඛූ දිස්වා සොමනස්සජාතා චිත්තං පසාදෙත්වා පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා ද්වාදසසහස්සභික්ඛූනං සාටකං අදාසි. එත්තකානං භික්ඛූනං දදන්තෙ සමුග්ගෙ අක්ඛයං කත්වා ඨපිතං අහොසි. අථ සා භික්ඛූනං ගතකාලෙ තතො සාටකං ගහෙත්වා පරිද-හිත්වා ගෙහං ගන්ත්වා බහුපුඤ්ඤකම්මං කත්වා ආයුපරියොසානෙ කාලං කත්වා ද්වාදසයොජනිකෙ කනකවිමානෙ නිබ්බත්ති. අථස්සා විමානෙ චතූසු දිසාසු සට්ඨිකප්පරුක්ඛානි නිබ්බත්තිං-සූති.

**ඵරාමණිමාතුගාමස්ස වත්ථු දසමං.**

---

1. රස පුටභත්තදායිකාය. 2. සඩ. "සප්පඳුරු නාම ඔය සමීප-යෙහි". 3. සෝ. ඨ. අරියකාර විහාරවාසී.

# 86. සංඝඅමච්චස්ස වත්ථුම්හි අත්ථුප්පත්ති.

සීහළදීපෙ මහාගාමෙ එකො අමච්චො පටිවසති. තස්ස පඨමං එකා ධීතා අහොසි. සා උත්තමරූපධරා වත්තසම්පන්නා සතිසම්පන්නා. තස්සා විවරණකාලෙ පුත්තො උප්පජ්ජි තස්ස නාමගහණදිවසෙ සංඝොතිනාමං අකංසු. අථස්ස සත්තවස්සදාරකකාලෙ යෙව පිතා අමච්චො අත්තනො මරණාසන්නෙ ජෙට්ඨධීතරං පක්කොසාපෙත්වා පුත්තං තස්ස හත්ථෙ ඨපෙත්වා මම පුත්තස්ස මහල්ලකකාලෙ දෙහීති වත්වා අත්තනො පරිදහනකං සතසහස්සග්ඝනකං සාටකයුගළඤ්ච අත්තනො ඛග්ගරතනඤ්ච මුත්තාහාරඤ්ච මහාජූරිකං ච ධීතුයා නිය්‍යාදෙත්වා කාලමකාසි. අථ සො දාරකො අනුපුබ්බෙන වඩ්ඪිත්වා දසවස්සප්පදෙසෙ අට්ඨාසි. සො රූපෙන ච බලෙන ච සකලමහාගාමෙ පාකටො අහොසි. තස්මිං යෙව සමයෙ බ්‍රාහ්මණතිස්සචොරභයං උප්පජ්ජි. අථ සො සංඝඅමච්චො භයෙ වූපසන්තකාලෙ ආගමිස්සාමීති භගිනියා ගෙහෙ යෙව කත්වා සයං පච්චන්තගාමජනපදං ගන්ත්වා තත්ථ වසිත්වා පච්ඡා භයෙ උපසන්තකාලෙ මහාගාමං ආගන්ත්වා භගිනියා ගෙහෙව නිවාසං කත්වා පුනදිවසෙ තිස්සවාපිං[1] සීසං නහාපනත්ථාය අගමාසි. තස්මිං කාලෙ කොටපබ්බතවාසී[2] මහානාගත්ථෙරො නාම සකලමහාගාමං භික්ඛාය චරිත්වා යථාධොතෙන පත්තෙනෙව නික්ඛමිත්වා ගච්ඡති. අථ අමච්චො ථෙරං දිස්වා "භික්ඛාහාරං ලභිත්ථ භන්තෙ"ති පුච්ඡි. ථෙරො "ලභිස්සාමී"ති අවොච. අමච්චො තෙන හි භන්තෙ ඉධෙව අච්ඡථාති[3] වත්වා සයං අත්තනො භගිනියා ගෙහං ගන්ත්වා "පක්කාහාරො[4] අත්ථී"ති පුච්ඡි. අථස්ස භගිනී නත්ථීති ආහ. සො තතො තුරිතතුරිතො හුත්වා සහස්සග්ඝනිකං මුත්තාහාරං මූලෙන ඨපෙත්වා එකකහා-

1. (සබ්බෙසු) තිස්සස්ස. 2. රස. කොට්ටගල්ලපබ්බතවාසී. 3. බි 1. බි 2. අජ්ඣාවසථාති. 4 කෝ. භත්තාහාරො. බී 1 බි 2, සකාහාරො.

